## 01.සභාපතිතුමා විසින් කෙරෙන විශේෂ නිවේදන.

සභාපතිතුමා:- සුභ උදෑසනක්! ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු අමාත්‍යවරුන්, ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා සියළු දෙනාම ඉතාමත්ම ගෞවරයෙන් යුක්තව මේ අවස්ථාවේදි පිළිගනු ලබනවා. 2019 අප්‍රේල් 08 වෙනිදා පළාත් සභාවේ රැස්වීම ආරම්භ කරමින් විශේෂ නිවේදන යටතේ පළාත් සභාවේ ක්‍රිෂාන්ත පුෂ්පකුමාර මන්ත්‍රීතුමා ඉල්ලා අස්වුණා. ඒ ඉල්ලා අස්වීමේ පුරප්පාඩුවට අලුතින් දේනෙත්ති ගරු මන්ත්‍රීතුමා දිවුරුම් දීලා අද සභාවට පැමිණ සිටිනවා. එතුමා ඉතාමත් ගෞරවයෙන් යුක්තව මේ අවස්ථාවේදි පිළිගනු ලබනවා. ඒ වගේම ක්‍රිෂාන්ත පුෂ්පකුමාර ගරු මන්ත්‍රීතුමා කාලයක් මේ සභාවේ කටයුතු කළා. එතුමාටත් ස්තුතිය ප්‍රකාශ කරනවා. මන්ත්‍රීවරයෙක් වශයෙන් සභාවේ කටයුතු වලට සහාය දැක්වීම පිළිබඳව. මීලඟට තිබෙන්නෙ මන්ත්‍රිවරුන්ගේ නිවාඩු යෝජනා.

## 02.මන්ත්‍රීවරුන්ගේ නිවාඩු යෝජනා.

මන්ත්‍රිවරුන්ගේ නිවාඩු යෝජනා නැත.

සභාපතිතුමා:- ඊලගට රජයේ කායර්යන්.

## 03.රජයේ කායර්යන්.

1.2019 අංක ... දරන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රඥප්ති කෙටුම්පත සභාවට ඉදිරිපත් කිරීම.

මනෝජ් සිරිසේන මහතා(අමාත්‍ය):- ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද අපි සභාව රැස්වුණේ පළාත් සභාවේ අවසාන සැසිවාරය විදියට. අද දවසේ මෙම ප්‍රඥප්තිය සභාවට ඉදිරිපත් කරලා සියලුම මැති ඇමතිතුමන්ලාගේ සහයෝගය මේ සම්බන්ධයෙන් බලාපොරොත්තු වෙනවා. මීට ප්‍රථම මම අවස්ථාවක් කර ගන්නවා අද දවසේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් පත්වෙලා පැමිණී දෙනෙත්ති මන්ත්‍රීතුමාට සුභ පතන්නට. ගරු සභාපතිතුමනි දකුණු පළාතේ අමාත්‍යධුරය රාජකාරි භාරගෙන අදට හරියට වසරකුත් මාස 02 ක් දින 18 ක කාලයක් තමයි ගතවෙලා තියෙන්නේ. ඒ කාල සීමාව තුල අමාත්‍යාංශයේ සියලුම නිලධාරින් සමග එකතු වෙලා කණ්ඩායමක් වශයෙන් හැකි උපරිම උත්සාහයක නිරත වුණා ක්‍රීඩා යෞවන කටයුතු ග්‍රාම සංවධර්න කියන මගේ අමාත්‍යාංශයේ විෂයන් 11 කින් යුක්ත අමාත්‍යාංශයට සාධාරණයක් ඉෂ්ඨ කරන්න. ඒ වගේම මීට පෙර මෙම අමාත්‍ය ධූරය දරපු මම භාර ගත්තේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා වැඩ බලමින් සිටි අමාත්‍යාංශය. ඊට පෙර වීරසුමන වීරසිංහ ගරු අමාත්‍යතුමා අමාත්‍යවරයෙක් වශයෙන් ඉතාමත් සක්‍රීය වු සේවයක් කරන්නට යෙදුණා කියන එක මේ පළාත් සභාවේ මැති ඇමතිවරුන් මන්ත්‍රීතුමන්ලා වගේම සියලු දෙනා දන්නවා. ඒ නිසා අපට ලැබුණ අභියෝගය අපි සක්‍රීයව, කායර්ක්ෂමව වංචාව, දූෂණය පිටු දකිමින් ඒ කාල සීමාව තුල ඉෂ්ඨ කළා කියන කාරණාව එක්ක අද දවසේ අවසාන සභා වාරයේදි මේ ප්‍රඥප්තිය ඉදිරිපත් කරන්නේ ගරු සභාපතිතුමනි, වතර්මානයේ ජන ජිවිතය අලුත් මාවතකට අවතීරණය වෙලා තියෙනවා කියපා අපි විශ්වාස කරනවා. ඒ වගේම අද දවසේ සාමාන්‍යයෙන් අපේ යුගයේ ගෘහයේ ආථරීකය වෙනුවෙන් පෙනි සිටියේ අපේ පුෂර් පාශර්වයේ පියා. සහෝදරයා වතර්මානයේ අළුත් පරපුරේ කාන්තාවත් මේ ආථරීක කතර්ව්‍යට කරඋර දීලා තියෙන යුගයක බොහෝ වෙලාවට දරුවන් බලා ගැනිම සම්බන්ධයෙන් තියෙන වාතාවරණයත් එක්කලා දිවා සුරැකුම් මධ්‍යස්ථාන කියන සංකල්පය අපේ රටට අලුත් වුණත් රටේ සාමාන්‍ය යෙන් අනෙකුත් සාමාන්‍ය බටහිර රටවල් වල දිවා සුරැකුම් මධ්‍යස්ථාන දීඝර් කාලයක් තිස්සේ සක්‍රීයව ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා අපි දැක්කා අධ්‍යයනය කළා අපි අමාත්‍යාංශයේ ලේකම්තුමා වණර්න් පෙරේරා මහත්මයා, මහේෂ් කරුණාරත්න කොමසාරිස්තුමා අපි සාකච්ජා කරලා අපි තීරණයකට ආවා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රඥප්ති කෙටුම්පත හරහා හා ප්‍රඥප්තිය හරහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන වලට අපේ මැදිහත්වීම පාලනයත් නතුවීමකට ගන්න ඕන කියලා. ඒ අනුව අද දවසේ මෙම ප්‍රඥප්තිය ඉදිරිපත් කරන්නට කටයුතු කරලා තියෙනවා. ගරු සභාපතිතුමනි, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනනය මගින්. පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු විමධ්‍යගත විෂයයක් ලෙස 9 වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවට ඉදිරිපත් කරලා තියෙනවා. ළමයීන්ට ආරක්ෂාව සහ රැකවරණය සැලසීම සඳහා ස්ථාපිත කර ඇති දිවා සුරැකුම් මධ්‍යස්ථාන සේවා ඍජුවම ළමාරක්ෂක සේවා යටතේ පළාත් සභා මඟින් නියාමනය කළයුතු වුවද, එය සිද්ද වෙලා නැති නිසා තමයි මේ මෙම ප්‍රඥප්තිය අපි අද ඉදිරිපත් කරන්නේ. මෙම ප්‍රඥප්තියේදි මාස 4 බිළිදාගේ සිට අවු: 12 දක්වා

වයස් කාණ්ඩවල ළමුන්ට රැකවරණය ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ලියාපදිංචි වෙලා තියෙන්නේ මෙම වකවානුව තුල ප්‍රාදේශීය ලේකම් කායර්ාලවල. අපි ඉදිරියට බලාපොරොත්තු වන්නේ අපේ අමාත්‍යාංශයේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ලියාපදිංචි වෙලා තියෙන්නේ මේ කාල වකවානුව තුල ප්‍රාදේශීය ලේකම් කායර්ාලවල. විශේෂයෙන් වර්ධනය වන දරුවාගේ මානසික, ශාරීරික අවශ්‍යතාවයන් නිසි අයුරින් ක්‍රියාත්මක වනවාද කියන අධීක්ෂණය අපේ අමාත්‍යාංශය යටතට ගන්න. ඒ හරහා අපි විශ්වාස කරනවා බලාපොරොත්තු වෙනවා එක පැත්තකින් දරුවන්ට හොඳ පරිසරයක් නිමර්ාණය වෙයි කියලා. අනෙක් පැත්තෙන් යම්කිසි මවකට රැකියාවක් කරන්නට දිවා සුරැකුම් ඒ සඳහා තමන්ගේ වෙනත් කටයුත්තක් සඳහා නිරත වෙන්න අවශ්‍ය කාලය ලබාදෙනවා වාගේම අපි විශ්වාස කරනවා මේ හරහා අලුත් ආරක ප්‍රබෝධයක් ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථාන දකුණු පළාත පුරාවට නිමර්ාණය වෙයි කියලා. මේක මෙතනින් ආරම්භ කරලා ඉදිරියට මම විශ්වාස කරන්නේ ළමා මනෝවිද්‍යාව වගේ තියෙනවා පිටරටවල නම් මේ සුරැකුම් මධ්‍යස්ථානයක් භාරව කටයුතු කරන කෙනා මනොවිද්‍යාව Diploma කරපු කෙනෙක් වෙන්න ඕන. මේ වැඩ සටහන කරන්න පුළුවන් වෙයි කියලා විශ්වාස කරනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා අද දවසේ ප්‍රඥප්තිය ඉදිරිපත් කරන්නට අපි උත්සාහ කළේ මීට පෙර අවස්ථාවක ගේන්න. නමුත් යම්කිසි කාල සීමාවක් ගත වෙනවා අමාත්‍ය මණ්ඩලයේ තීරණය අරගෙන කැබිනට් එකේ ඊට පස්සේ ආණ්ඩුකාරතුමාට ගිහිල්ලා ගැසට් පත්‍රය මුද්‍රණය කරලා එන කාල සීමාව තුල සමහර දේවල් අපේ පාලනයෙන් තොරයි. අවසාන සභාවට ඉදිරිපත් කරන්නට අපට සිද්ධ වුණා. ප්‍රධාන අමාත්‍යතුමා අමාත්‍ය මණ්ඩලය අපේ විපක්ෂ නායකතුමා ප්‍රමුඛ මැති ඇමතිතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා පසුගිය කාලසීමාව තුල අමාත්‍යාංශයක් විදියට අපට ලබාදුන්න සහයෝගය දායකත්වය ආශිවර්ාදය සියල්ලත් එක්ක සැලකිය යුතු වැඩ කොටසක් දකුණු පළාත තුල ඉෂ්ඨ කරයි කියලා අපි විශ්වාස කරනවා. ඒ වගේම අදින් අවසන් වන පළාත් සභාව අපි දන්නේ නැහැ මැතිවරණයක් පවත්වනවද කියලා. ඒ කාල සීමාව තුල විශේෂයෙන්ම ප්‍රධාන ලේකම්තුමා සියලු දෙනාටම ස්තුතිවන්ත වෙන ගමන් හිටපු මහජන නියෝජිතයින් පළාත් සභාව පත්වෙනකම් ඒ අවස්ථාවේ හිටපු මහජන නියෝජිතයින් මහජන නියෝජිතයින්සේ සලකලා කටයුතු කරන්නට සියලුම අමාත්‍යාංශවල නිලධාරින් ලේකම්තුමන්ලා ප්‍රමුඛ කටයුතු කරයි කියලා විශ්වාසයත් පළ කරමින් අවසන් වශයෙන් ගරු සභාපතිතුමනි සුභ පතනවා සියලුම සභපතිතුමන්ලාට නැවත වතාවක් දකුණු පළාතේ ජනමාධ්‍ය Social Media හරහා හෙණ ගහන්න කියලා ප්‍රාථර්නා කරනවා දකුණු පළාත් සභාවට හෙණ ඉල්ලලා තියෙනවා දැක්කේ නැහැ. අපි කාගේත් සතුටට අභිමානයට පාත්‍ර වෙන්න ඕන කාරණයක් විදියට ප්‍රධාන අමාත්‍යතුමා, අමාත්‍ය මණ්ඩලය ඒ වගේම අපිත් එක්ක ඉතාම සහයෝගයෙන් වැඩ කරපු විපක්ෂ නායකතුමා විපක්ෂ සංවිධායක අශෝක ධනවංශ මැතිතුමා ඒ දෙපලම විශාල වැඩ කොටසක් කරපු පළාත් සභාවේ ජොෂ්ඨතම අමාත්‍යවරයෙක් විදියට යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා, චන්දිමා රාසපුත්‍ර අමාත්‍යතුමා වාතර්ාගත ආකාරයකට අධ්‍යාපනය මෙහෙයවලා තියෙනවා. අභිමානවත් වූ පළාත් සභාවක කටයුතු කරන්නට ලැබීම ගැන සතුටු වෙනවා.යම් යම් කාරණා නිසා අමාත්‍යාංශවල හොඳින් වැඩ කරපු වීරසුමන විරසිංහ ඇමතිතුමා, ඩී.වී උපුල් ඇමතිතුමා එක්තරා දෛවපසහගත මම මතක් කරන්නට ඕන. ඇමතිතුමන්ලා විශාල සේවයක් කළා. ඒ නිසා අපිට තියෙන කායර් භාරය විදියට මම දකින්නෙ තවත් මැතිවරණයක් ඉල්ලනවාටත් වඩා මම හිතන්නෙ දකුණේ ජනතාව මේ වෙනකොටත් විසි දෙදහසකට ආසන්න පිරිසකට පිරිසිදු වැසිකිලි පහසුකම් නැති පරිසරයක තමයි මේ රටේ දකුණු පළාතේ ජනතාව කල්ගත කරන්නේ. ඒ නිසා මෙන්න මේවා නිවැරදි කරලා මේවා නිසි තැනකට ගෙනල්ලා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය හරහා ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ගරු සභාපතිතුමනි,මා විශ්වාස කරන්නෙ මේ වෙනකොට රට බිලිගත්ත ශුද්ධමූල්‍ය ගැටළුවක් තියෙනවා. ගම්මාන, බිලිගත්ත බරපතල ගැටළුවක් තියෙනවා. අපිට ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය හරහා ඉදිරියේ පත්වන අමාත්‍යවරයෙකුට අපේ නලින් හේවගේ මැතිතුමන්ලා යෝජනා ගේන්න මේ අමාත්‍යාංශයට පුළුවන් ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගෙන බැංකුවක් නිමර්ාණය කරන්න. ඒ බැංකුවක් නිමර්ාණය කලෝතින් මම හිතන්නෙ බහුතරයක් රටේ මහජන මුදල් වලින් යැපෙන පිරිස් ස්වයං රැකියාවලට යොමුකරලා ව්‍යවසායකයින් බවට පරිවතර්නය කරලා ඒ අයට ආථර්ීකයක් නිමර්ාණය කර ගැනීමේ පරිසරයක් නිමර්ාණය කරන්න හදන්නට අපිට හැකියාවක් තියෙනවා.අන්න එවැනි කාරණාත් සමඟ

ගොනුවෙන අලුත් පළාත් සභාවක් පිහිටුවන්නට, නිමර්ාණය වන්නට දකුණේ අධ්‍යාපනයෙන් සහ සෞඛ්‍ය සේවයෙන් අපට ගරු ප්‍රධාන අමාත්‍යතුමා මතක් කරන්න ඕන අධ්‍යාපනය වාගේම සෞඛ්‍ය සේවයේත් අද දකුණු පළාත අනිත් පළාත්වලට වඩා ඉහළින්. ඒකනිසා අද මේ සියළුම අංශයන්හි නව නිමර්ාණශීලී වැඩසටහන් ක්‍රියාත්මක වන නව අලුත් පළාත් සභාවක් බිහි කරන්නට නිමර්ාණය කරන්නට හැකියාව දකුණේ අපේ ආදරණීය ජනතාවට කාලසීමාවක් ඉදිරියේදී උදාවේවා! කියා ප්‍රාථර්නා කරමින් මේ ප්‍රඥප්තියට ගරු සභාවේ ආශිවර්ාදය ලබාදෙන්නට කියා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.ගරු සභාපතිතුමනි, ඔබතුමාට බොහොමත්ම ස්තුතියි.

සභාපතිතුමා:- ප්‍රඥප්තිය පිළිබඳව මන්ත්‍රීතුමන්ලා අදහස් දක්වන්න. නැත්නම් අපි සභා සම්මත කරගත යුතුව තියෙනවා. එහෙම නම් මේ ප්‍රඥප්තියට පක්ෂව ඡන්දය පාවිච්චි කරන්න. තමන්ගේ ආසනවලට යන්න. ඒකඡන්දයෙන් සභා සම්මත වෙනවා, ප්‍රඥප්තිය. අද දවසේ ප්‍රඥප්තිය සම්මත වූ බව නිවේදනය කරනවා. මීළඟට රජයේ කාය්‍ර්යන් 02. 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 8.(4)(ආ), 37(1)(ඇ) හා 58 වැනි වගන්ති යටතේ දකුණු පළාත් සමුපකාර ඇමතිතුමා විසින් පනවනු ලබන රීති සභාවට ඉදිරිපත් කිරීම.

යූ.ජී.ඩී.ආරියතිලක අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, මෙම රීති මාලාව සකස් කෙරෙන්නේ මෙම ගරු සභාවේ පක්ෂ විපක්ෂ බේදයකින් තොරව අති මහත් බහුතරයක් මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ඇතිව සම්මත කරන ලද පළාත් සභා සමුපකාර ප්‍රඥප්තිය ප්‍රකාරව. ගරු සභාපතිතුමනි, ඒ අනුව සකස් කරන රීති මාලාව මෙම ගරු සභාවට ඉදිරිපත් කරලා මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය ලබාගැනීම මගේ වගකීමක්ව තියෙනවා.මේ රීතිවලින් අපි අලුත් නීති පැනවීමක් සිදුවන්නේ නැහැ. ඒ වෙනුවට සිදුවෙන්නේ මේ ගරු සභාවේ ගරු මන්ත්‍රීවරුන් පසුගිය 26 වෙනිදා සම්මත කරන ලද ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේලා අත්‍යාවශ්‍යම රීතිමාලාව සම්මත කිරීම. දැන් ඒ ප්‍රඥප්තිය නීතියක් බවට පත්වෙලා තියෙනවා. සභාවේ අනුමැතියෙන් පසුව ගරු ආණ්ඩුකාරතුමා විසින් එතුමාගේ අනුමැතිය පසුගියදා ලබාදුන්නා. ඒ අනුව නීතියක් බවට පත්වෙලා තියෙනවා. දැන් මේ නිසා ඒ ප්‍රඥප්තිය ප්‍රකාරව දකුණේ සමුපකාර නියාමනය කිරීමේලා අත්‍යාවශ්‍ය වන රීති මාලාවයි මා මෙම ගරු සභාවේ අනුමැතිය සඳහා අද ඉදිරිපත් කරනු ලබන්නේ. ගරු සභාපතිතුමනි, මෙහිදී මා සංශෝධනයක් ඉදිරිපත් කරනවා. සමුපකාර රීති මාලාවේ 44/15 වගන්තියෙන් පසුව 44/16 ලෙස පහත වගන්තිය ඇතුලත් කිරීමට මා යෝජනා කරනවා.

සභාපතිතුමා:- ගැසට් එකට අමතරවද?

යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා:- අලුත් එකතුවීමක් ගරු සභාපතිතුමනි. ඉදිරිපත් කරලා තියෙන රීති මාලාවට තව එකතු වීමක් සංශෝධනයක් හැටියට ඉදිරිපත් කරන්නේ. මෙම ගරු සභාවට මන්ත්‍රීවරුන්ට අපි යොමුකරලා තියෙනවා අවධානය සඳහා රීති මාලාවක්.ඒ රීති මාලාවට තවත් එක් රීතියක් පමණක් එකතු කිරීමට සංශෝධනයක් හැටියට මා ඉදිරිපත් කරන්නෙ.

සභාපතිතුමා:- ඕක ලිඛිතව ඕන. බෙදලා දෙන්න ඕන ඔක්කොටම.

යූ.ජී.ඩී.ආරියතිලක අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, මා ඔබතුමාගේ උපදේශය අභියෝගයකට ලක් කරනවා නෙවෙයි. නෑ. ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් පාලර්මේන්තුවේ වුණත් සම්ප්‍රදාය මේ සභාවෙත් තිබ්බ්ව සම්ප්‍රදාය වෙන්නෙ සහ අනුගමනය කරපු රීතිය වුණේ ගරු සභාවට ප්‍රඥප්තියක් හෝ ගරු සභාවේ අනුමැතිය සඳහා යමක් ඉදිරිපත් කිරීමෙන් පසුව සාකච්ඡා සභාවේදී මේ ගරු සභාවේ ඕනම මන්ත්‍රීවරයෙකුට සංශෝධනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. එතකොට ඒක ඉදිරිපත් කරන්නෙ අමාත්‍යවරයෙක් නම් අමාත්‍යවරයා එකඟ නම් සභාවේ බහුතරය එකඟ නම් ඒක සංශෝධනයක් හැටියට එකතු කිරීමට බාධාවක් නැහැ. දැන් රීති මාලාව මේ අවස්ථාවේ සභාවට ඉදිරිපත් කරලා තියෙනවා. මේ මොහොතේ සංශෝධනයක් ඉදිරිපත් කරන්න කිසිම බාධාවක් නැහැ. කව්ද මේ ගරු සභාවේ රැස්ව සිටින සියළු මන්ත්‍රීවරුන් හමුවේ ඔවුන් හැමෝටම තේරෙන සිංහල භාෂාවෙන් නේ මේ මේක ඉදිරිපත් කරන්නෙ.

සභාපතිතුමා:- ඔබතුමා ඇමතිතුමා වුණාට මම මේ කියන්නෙ මේ සංශෝධන ඉදිරිපත් කලා නම් ලිඛිතව දෙන්න.

යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා:- මේ ලිඛිතව තියෙනවා.

සභාපතිතුමා:- මම ලිඛිතව ඉල්ලන්නෙ හැමෝටම කියවාගන්න. හරි. හරි. ඔබතුමා කියවන්නකො. නෑ. ඔබතුමා කියවන්න ප්‍රශ්නයක් නැහැ.

යූ.ජී.ඩී.ආරියතිලක අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, අද උදේත් මේ සම්බන්ධව සමුපකාර සභාපතිවරු පිරිසක් සමඟ සාකච්ඡාවක් කළා. මුල් අවස්ථාවට අපි සංශෝධනයක් ඉදිරිපත් කරන්න අදහස් කළා. අද උදේ සමුපකාර කොමසාරිස්වරයා අදාළ නිලධාරීන් සහ සභාපතිවරුන් පිරිසක් ඉදිරිපත් කරපු ඔවුන් සමඟ සාකච්ඡාවෙන් පසුවයි මේක කරන්නෙ. මේ සංශෝධනය ඉදිරිපත් කරන්න හේතුව මම පැහැදිලි කරන්නම්. මේ සංශෝධනය ඉදිරිපත් කරන හේතුව පැහැදිලි කරන්නම්. සභාව තියනවා නම් මේක ඕන නැහැ කියලා, ඒක සභාවේ වැඩක්. මේක කරන්නම ඕන කියලා මේක නොකලොත් සියල්ල විනාශයි කියලා මම කියන්නෙ නැහැ. මේ සංශෝධනය වෙන්නෙ 44/16 වගන්තිය අනුව රීති මාලාවේ බේරුම්කරණය නිමාවූ දින සිට ණයකරුගෙන් පොලී ගණනය කිරීම ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ අදහසක් තියෙන නිසා අවධානය ඉල්ලන්නෙ. මේ සංශෝධනය කිරීම....

චම්ලි විතානාච්චි මහතා:- මේ ඇමතිතුමා, ඔබතුමා එකපාරට කරුණු ඉදිරිපත් කළාම අපි කවුරුවත් දන්නෙ නැහැ මේ ගැන.

යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා:- මේ දැන් දැනුවත්වෙනවනේ.

චම්ලි විතානාච්චි මහතා:- දැනුවත් කළාට ක්ෂණිකව තීන්දුවක් ගන්න බැහැනේ ඇමතිතුමා. ....(සභාවේ ඝෝෂා) ..අපහැදිලියි) ........

යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා:- මේකෙ සංශෝධනයක් අවශ්‍ය වෙන්නෙ මේක නිසා. සභාපතිවරු ගාල්ල දිස්ත්‍රික්කයේ විශාල පිරිසක් අද උදේ මගේ අමාත්‍යාංශයේ රැස්වුණා. ....(සභාවේ ඝෝෂා) ..අපහැදිලියි) ........

චන්න සාලිය මෙන්ඩිස් මහතා:- ගරු සභාපතිතුමනි, සභාපතිවරු අපිට අත්සන් කරලා දීලා තියෙනවා ඒකට විරුද්ධයි කියලා. මෙතුමා කියනවා සභාපතිවරු පිරිසක් කියලා. එහෙනම් ඔබතුමා ඉදිරිපත් කරන්න ගාල්ල, යක්කලමුල්ල ආවා කියලා එහෙම කියන්න ඇමතිතුමනි.

යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, මම මේ ගරු මන්ත්‍රීවරුන්ගේ නියෝග පිළිපදින්න මෙතෙන්ට ආවෙ නැහැ. ගරු සභාපතිතුමනි, ඔබතුමාට විතරයි නියෝගයක් දෙන්න පුළුවන්.

සභාපතිතුමා:- ..(අපහැදිලියි) ........ ඊට පස්සෙ ඒක පිළිබඳව කරන්න මේ කරුණු පැහැදිලි කිරීම්. ..අපහැදිලියි) ........ ඊටපස්සෙ සාකච්ඡා කරන්න.

යූ.ජී.ඩී.ආරියතිලක අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, 44/16 වගන්තිය හැටියට අලුතින් ඉදිරිපත් කරන්න යෝජනා කරන්නේ බේරුම්කරණයක් නියමානුකූල වූ දින සිට ණයකරුගෙන් පොලී ගණනය කිරීම නතර කළ යුතුය. ඇයි එහෙම අවශ්‍ය වෙලා තියෙන්නෙ? ගරු සභාපතිතුමනි, සමුපකාරයකින් ණයක් ගත්තම අපේ සමුපකාර සාමාජිකයෙක් මේ ප්‍රදේශයේ පුරවැසියෙක් විවිධ හේතූන් නිසා ඔහුට ගෙවන්න බැරි වෙනවා. දැන් 18% ක පොලියට ණයක් ගත්තම සාමාන්‍ය ණය පොලිය දෙන්නෙ ඒක සමුපකාරයට. එතකොට කල්පසුවූ ඍණයට යොමු කරන්නෙ ණය පැහැර හැරීම ආරම්භ වෙලා මාස හයකට පසුව. දැන් ක්‍රියාත්මක වන ක්‍රමය අනුව ඒ මාස හයටම කල් පසුවූ මාස හයට 18.5 ක පොලියක් අය කරනවා. ගිවිසුමේ තියෙන සාමාන්‍ය පොලිය. කල්පසුවූ ඍණයට ඇතුලත් කල වහාම කවදා හෝ මේක අධිකරණයට යනවා නම් මේක අධිකරණයට යන දිනය දක්වාම දැන් නියමිත දිනය දක්වාම විවිධ පිරිසක් 20% ක වාෂරීක පොලියක් අය කරනවා ණයකරුගෙන්. එතකොට සිදුවෙලා තියෙන්නෙ මොකක්ද? සමහර වෙලාවට අපිට අභියාචනා එනවා ගත්ත ණය ලක්ෂයයි, අධිකරණයට යවන දිනය දක්වාම පොලී ගණනය කරන නිසා මේ විදියට ලක්ෂය ගත්ත එක්කෙනා එකහමාරක් ගෙවනවා පොලිය හැටියට. හැබැයි කල්පසුවූ ඍණයට ඇතුලත් කිරීම සමුපකාරයේ වැඩක්, දෙපාතර්මේන්තුවේ වැඩක්. කල්පසුවූ ක්‍රමයට ඇතුලත් කළාට පස්සෙ සමුපකාර කොමසාරිස්වරයාට යොමුවුණාම ඒ සම්බන්ධව බේරුම්කරණය කරන්න සමුපකාර කොමසාරිස් දෙපාතර්මේන්තුවේ අවම මාස තුනක් හතරක් මේ බේරුම්කරණ ක්‍රියාවලිය යනවා. ඒකත් වෙලා අභියාචනයක් ඉදිරිපත් කරන්නත් දින 60 ක කාලයක්, ඒකත් ඉවර වුණාට පස්සෙ උසාවි ගත කරන්න සමහර වෙලාවට ගිහිල්ලා තියෙනවා අවුරුද්ද, දෙක. ණයකරුගේ වරදක් නෙවෙයි. දෙපාතර්මේන්තුවේ ක්‍රියාදාමයේ තියෙන යම් යම්

අඩුලුහුඩුකම්, සමිතියේ තියෙන අඩුලුහුඩුකම්. දුප්පත්කම නිසා, නැතිබැරිකම නිසා, හදිසි තත්ත්වයක් නිසා ණයක් ගෙවන්න බැරිවෙච්ච එක්කෙනා මාස හයකින් කල්පසුවූ ණයට ගැනෙනවා. ඒකට පොලී ගෙවනවා. එතන ඉදන් දෙපාතර්මේන්තුව හරි සමුපකාර සමිතියේ අවුරුදු පහක් මේක උසාවිගත නොකර තිබුණත් ඒ අවුරුදු පහටම 20% ක පොලියක් ගෙවන්න ඕන. අමානුෂික නැද්ද? අසාධාරණ නැද්ද? මේකට සහනයක් දෙන්න ඕන නැද්ද? මේක දකුණේ සමුපකාර සාමාජිකයාගේ අයිතිය රකින්න එන සංශෝධනයක් නෙවෙයිද? එහෙම හිතනවා නම් දෙන්න මේකට විරුද්ධව ඡන්දය. එහෙම නම් මේක පරාජය කරන්න. මේ සමුපකාර සේවකයින්ට තමුන්නාන්සේලා ගාවට කොච්චර එනවද අපි ණය ගත්තෙ ලක්ෂයයි. එකහමාරක් දෙකක් ගෙවන්න වෙලා තව වැඩිපුර. එන්නෙ නැද්ද? අපේ සිසිර ගරු මන්ත්‍රීතුමා හිටපු සභාපතිවරයෙක්. ඔබතුමා දන්නෙ නැද්ද මෙහෙම තත්ත්වයක් තියෙන බව. මෙන්න මේක වලක්වන්න තමයි අපි කියන්නෙ. මේ සංශෝධනය ඉදිරිපත් කරන්නෙ බේරුම්කරණය. ඒ කියන්නෙ බේරුම්කරණය දක්වාමත් අර අය කරන්න ණයකරුවන්ට පාඩුවක්. බේරුම්කරණය ඉවරවුණාට පස්සෙ උසාවිගත කරන දිනය දක්වා සමුපකාර දෙපාතර්මේන්තුවේ වරදක්නේ මේක උසාවියට යන්නෙ නැති එක. මේක අවුරුදු තුනක් පහක් තිබිලා. ඒත් 20% ගෙවන්න වෙන එක අර සාමාජිකයාට අසාධාරණයක් වුණාද? ණයකරුවා කබලෙන් ලිපට වැටීමක් නෙවෙයිද? අන්න ඒ සීමාව විතරයි මේ යෝජනා කරන්නෙ.

සිංහ සමන් කුමාර මහතා:- ගරු ඇමතිතුමනි, ඔබතුමාට බාධා කරනවා නෙවෙයි. තව සුළු දෙයක් ඔබතුමාට මතක් කරනවා. ණයකරුවා සඳහා පමණක් ඔය සංශෝධනය වැටෙනවා නම් ඉතාමත්ම හොඳයි. වංචා කරපු හොරු සමහර අය ඉන්නවා. ඒ අය සඳහා සංශෝධනය කෙරෙනවද?

යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා:- නෑ. පැහැදිලිවම නැහැ ගරු සභාපතිතුමනි. .......අපහැදිලියි ........

සිංහ සමන් කුමාර මහතා:-.. සභාපතිවරු ඉන්නවා, නිලධාරීන් ඉන්නවා. දැන් එනවා ඔබතුමා පස්සෙන්. මම අහනවා ඔබතුමාගෙන් ණයකරුවා අහනවා සුළු ණය ගැනීම් සඳහා සේවා දායකයින්.ඒ නිසා හොඳට අඋර් දක්වන්න.

යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, සිංහ ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මෙන්න මේකයි සංශෝධනය. පැහැදිලිව ඔබතුමා කියන දේ තියෙනවා. බේරුම්කරණය නිමාවූ දින සිට ණයකරුගෙන් පොලී ගණනය කිරීම නතර කළ යුතුය.

සිංහ සමන් කුමාර මහතා:- සභාපතිවරයා නිල වශයෙන් කරපු වංචා දූෂණවලට අදාළ නොවේ කියලා ඇතුලත් කරන්න සභාපතිතුමනි.

කේ.පී.ජී. සිසිර කුමාරරත්න මහතා:- සභාපතිවරයාත් සාමාජියෙක්. එහෙම කරන්න බැහැ. සාමාජික අංකයක් තියෙනවා. එයාටත් ණය ගන්න අයිතියක් තියෙනවා. එහෙම කරන්න බැහැ.

යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා:- ... හරි. එහෙම නම් පරාජය කරන්නකො. මම මේ සංශෝධනය ඉදිරිපත් කරනවා.

චමිලි විතානාච්චි මහතා(සභානායක):- ඇමතිතුමා එහෙම කරන්න එපා.

යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා:- පැහැදිලි නැත්නම්, මදි නම් මේක පරාජය කළාම තියෙන ටික සම්මත කරමු. මේ සංශෝධනය පරාජය කරමු. මා මේක මෙච්චර සිංහලෙන් කියද්දිත් පැහැදිලි මදි නම් මට ඒකට කරන්න දෙයක් නැහැ. හැමෝටම තේරෙන සිංහල භාෂාවෙන් කාටද බලපාන්නෙ, කාටද සහනය කියන එක මේ ගරු සභාවේ පැහැදිලි කළා මම. එතකොට ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා සභාවේ මතය විමසන්න, සංශෝධන සහිතව මේ සභාවට එකඟද මේ සභාව කියලා. එහෙම නැත්නම් සංශෝධනය පිළිබඳ...

සභාපතිතුමා:- ඔබතුමා දීපු සංශෝධනය මම දන්නෙ කොහොමද? මොකක්ද සංශෝධනය.

යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා:- නෑ. ගරු සභාපතිතුමනි, ඔබතුමා නියෝගයක් දෙන්න මේක නිත්‍යානුකූලව ඉදිරිපත් කළාද නැද්ද කියලා. එතකොට ඉවරයිනේ. ....(සභාවේ ඝෝෂා) ..අපහැදිලියි) ........

චමිලි විතානාච්චි මහතා(සභානායක):- ගරු සභාපතිතුමනි, ගැටළුව තියෙන්නෙ මේ පිළිබඳව ඔබතුමාට ගියපාර මේ සභාවේ අනුමැතිය දුන්නෙ

නඩු දෙකක් උසාවියේ තියෙද්දි. ඒක අමතක කරන්න එපා. අධිකරණයේ නඩු දෙකක් විභාග වෙද්දි තමයි මේ පිස්කල් මහදි දුවගෙන එනවා. තව නීතීඥයෙක් දුවගෙන එනවා උසාවියට, පොලිසියට. මේ මහා කරුණු රාශියක් එක්ක තමයි මේ සභාවෙ ඔබතුමාට මේ ගියපාර ප්‍රඥප්තියට අනුමැතිය දුන්නෙ.ඒක අමතක කරන්න එපා. ... ....(සභාවේ ඝෝෂා) ..අපහැදිලියි) ........

චන්න සාලිය මෙන්ඩිස් මහතා:- මේ අහිංසක තැන්පත්කරුවන්ගේ සල්ලි ටික තමයි මේ තක්කඩියන්ට හොරකම් කරපු මේ සහනයක් දෙන්න හදන්නෙ.

කේ.පී.ජී. සිසිර කුමාරරත්න මහතා:- ගරු සභාපතිතුමනි, මේ කලින් තිබ්බව දැන් අපේ තීරකකරණයට ගියාට පස්සෙ උසාවි බලගන්වන්න දෙපාතර්මේන්තුවට එව්වට පස්සෙ සැහෙන කාලසීමාවක් දෙපාතර්මේන්තුවේ මේක තියෙනවා. මේකෙ තියෙන සම්පූර්ණ කාලසීමාවට පොලිය ගණනය කරනවා. දැන් මේ අලුත් නීතිවලින් කරලා තියෙන්නෙ, ගරු ඇමතිතුමා ඉදිරිපත් කරන නීතිවලින් කරලා තියෙන්නෙ තීරකකරණයෙන් පස්සෙ උසාවි ගත කිරීම කරන තෙක් පොලිය කපා හරින්න. මේක ණයකරුගේ පැත්තෙන් ණයකරුවන්ට සහනයක්. මේ කලින් කියපු විදියට තමයි පොඩි ණයකරුවන්ගේ පැත්තෙන් පොඩි සහනයක් අරන් දීලා තියෙන්නෙ. ....(සභාවේ ඝෝෂා) ..අපහැදිලියි) ........

කේ.පී.ජී. සිසිරකුමාර රත්න මහතා:- දෙපාතර්මේන්තුව පරක්කු වෙනවා නම් වගකියන්න ඕන දෙපාතර්මේන්තුව. ණයකරු නෙවෙයි. ඒ නිසා මම විශ්වාස කරනවා මේ නීති මාලාවේ සංශෝධනයකින් ඉදිරිපත් කිරීම ඉතාමත් හොඳයි ණයකරුවන්ගේ පැත්තෙන්. ....(සභාවේ ඝෝෂා) ..අපහැදිලියි) ........

චන්න සාලිය මෙන්ඩිස් මහතා:- එහෙම නම් සියළුම මන්ත්‍රීවරුන්ට මේක අධ්‍යයනය කරන්න දෙන්න ඕන. ....(සභාවේ ඝෝෂා) ..අපහැදිලියි) ........

කේ.පී.ජී. සිසිරකුමාර රත්න මහතා:- ගරු සභාපතිතුමනි, මේ සංශෝධනය ඉදිරිපත් කරන්න කියලා ඉල්ලනවා අපි.

ඒ.ජී.සී. පියසිරි මහතා:- ගරු සමුපකාර ඇමතිතුමා 2019 අංක:06 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තියට රීති මාලාවක් ඉදිරිපත් කරලා ඒක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරලා තියෙනවා. ගරු සභාපතිතුමනි, ඊට පසුව මීට අමතරව සභාවට ඉදිරිපත් කරපු වාතර්ාවට අමතරව ගරු සමුපකාර අමාත්‍යතුමා මේ සඳහා නව සංශෝධනයක් ඉදිරිපත්කරලා තියෙනවා. මේක පිළිබඳව අපි ඉල්ලීම කරන්නෙ මේ දුන්නා වගේම දැන් සභාවට ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කළාට පස්සෙ සභාපතිතුමාට දීපු සංශෝධනයේ පිටපතක් මේක සභාවේ සමස්ථ සභාවේ අනුමැතියට පෙර පිටපතක් සියළුම ගරු මන්ත්‍රීවරුන්ට ලබාදෙන්න. ලබාදීලා ඊටපස්සෙ සභාවේ මතය ප්‍රකාශ කිරීම සුදුසුයි කියන කාරණය තමයි මම වරප්‍රසාද ප්‍රශ්නයක් හැටියට මතු කරන්නෙ. මේක සාකච්ජා කරනවාද නැද්ද කියන කාරණය නෙවෙයි. ඒකෙ තියෙනවා සම්ප්‍රදායක්. සංශෝධනයක් ඉදිරිපත් කළාට පස්සෙ ඒක මන්ත්‍රීවරුන්ට දීලා ඒක සාකච්ඡාකරලා තමයි මේක. අපි මේ ටික සාකච්ඡා කරලා මේ සභාවට .... ඇතුව මේ ප්‍රඥප්තිය කරුණු ඉදිරිපත් කරන්න ආවා. නමුත් මේ සංශෝධනය ලිඛිතව ගරු මන්ත්‍රීතුමා සියළුම ගරු මන්ත්‍රීවරුන්ට ලබාදෙන්න කියන එක ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනවා.

සභාපතිතුමා:- ඒක තමයි ගරු ඇමතිතුමා සංශෝධනයක් කරනවා නම් සංශෝධනය ලිඛිතව භාරදෙන්න ඕන සභාපතිවරයාට. දැන් ඒක මට ලැබිලා තියෙනවා. මෙන්න සංශෝධනය. සමුපකාර රීති මාලාවේ 44 /x, v වගන්තියෙන් පසුව 44/x,vi ලෙස පහත වගන්ති ඇතුලත් කොට යෝජනා කිරීම. 44/x,vi වගන්තිය බේරුම්කරණය නිමාවූ දින සිට ණයකරුගෙන් පොලී ගණනය කිරීම නතර කළ යුතුය. මෙන්න සංශෝධනය. සංශෝධනය 01. සංශෝධනය පිළිබඳව තමුන්නාන්සේලා දැන්, සංශෝධනය ඉදිරිපත් කළා. මේ තියෙන රීති මාලාවේ ගැසට් නිවේදනයට අලුතින් ඉදිරිපත් කරපු සංශෝධනය තමයි මම කිව්වෙ. මම පිටපත ලබාදුන්නා.

යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, තවම ගැසට් එකට ගියේ නැහැ. ගරු සභාපතිතුමනි, ප්‍රඥප්තිය අනුව නේ මේක හැදුවෙ. ප්‍රඥප්තියේ තියෙන්නෙ සභාව අනුමත කිරීමෙන් පසුව ගැසට් නිවේදනයට යන්න. ප්‍රඥප්තිය ඉස්සෙල්ලා ගැසට් කරලා සභාවට එන්න ඕන. මේකෙ සිද්ධ වෙන්නෙ සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව ගැසට් නිවේදනයට යන එක. ඒ කියන්නෙ ගැසට් කරපු ලේඛනයක් ඔබතුමා හමුවෙත් නැහැ,

සභාව හමුවෙත් නැහැ, මම ඉදිරිපත් කරන්නෙත් නැහැ. ඊළඟට ගරු සභාපතිතුමනි, පිළිතුරු කතාව හැටියට මම යම් කරුණු කීපයක් ඉදිරිපත් කරන්න ඕන.

සභාපතිතුමා:- පිළිතුරු කතාව නෙවෙයි, මේගොල්ලන්ට මේක පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව දෙන්න එපාය.

ඒ.ජී.සී. පියසිරි මහතා:- සමුපකාර ඇමතිතුමා රීති මාලාවක් ඉදිරිපත් කළා. ඒක සභාවේ අනුමැතිය සඳහා. ඊට පස්සෙ තමයි සාකච්ඡා කරලා අනුමත කරන්නෙ. මම කියන්නෙ ඒක. අපිට පිටපතක් ලබාදෙන්න. ඒකයි මම කියන්නෙ.

සභාපතිතුමා:- හරි. මේ සංශෝධනය අපි ලිඛිතව ලබාදෙනකම් න්‍යාය පත්‍රයේ ඊළඟ එකට යනවා. ලිපි හා වාතර්ා ඉදිරිපත් කිරීම.

ලාල් ප්‍රේමනාත් මහතා:- ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව අදහසක් ඉදිරිපත් කරන්න අවස්ථාවක් දෙනවද?

සභාපතිතුමා:- අර වාතර්ාව ආවට පස්සෙ දෙන්නම්. ලිපි හා වාතර්ා ඉදිරිපත් කිරීම. මට ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා.

## 04. ලිපි හා වාතර්ා ඉදිරිපත් කිරීම.

එස්. තෙන්නකෝන් නිලමේ මහතා(විපක්ෂනායක):- ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙත ලිපි 12 ක් ඉදිරිපත් කරනවා. පාසැල් වල ගැටළු හා ප්‍රශ්න. තෝලංගල සුමනාරාමාධිපති නායක ස්වාමීන් වහන්සේ එතුමන්ලා උඩමළල විද්‍යාලය පිළිබඳව ගැටළුවක් ඉදිරිපත් කරනවා. එම්.එන්. නිලුක්ෂි දිල්හානි, පරණ වත්ත, ඉහළගොඩ, නාකුළුගමුව. ක්‍රිෂාන්ති ගජවීර, 70, එස්.එල්.එස්. ගම්මානය, මයුරපුර, හම්බන්තොට. අම්බලන්තොට මහා විද්‍යාලයේ දෙමව්පියන් පිරිසක් කේ.ඩී. වීරසිංහ විදුහල්පති, ඔසුවින්න කණිෂ්ඨ විද්‍යාලය, තිස්සමහාරාමය. ඒ.ඒ. ගයානි අවන්තිකා, ගයනි, තංගල්ල පාර, පුවක්දණ්ඩාව, බෙලිඅත්ත. ලේකම්, පාසැල් සංවධර්න සමිතිය හා බූන්දල කණිෂ්ඨ විද්‍යාලය, වැලිගත්ත, හම්බන්තොට. එම ලිපි 12 ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ විශේෂ අවධානය සඳහා ඉදිරිපත් කරමින් ගරු ඔබතුමාට පිළිගන්වමින් ගරු සභාපතිතුමනි සභාගත කරනවා. ගරු සභාපතිතුමනි, දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය, ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමා වෙත ලේකම්, වයි. බී.එස්. අපි සංවිධානය, ශ්‍රී ලංකා සස්මිත, දික්කුඹුර. රෝහල්වල ප්‍රශ්න සම්බන්ධව දීඝර් ලිපියක් ඉදිරිපත් කරනවා. සභාපති, ගාමිණී උපුල් ශාන්ත, ලේකම්, නාමල්, ප්‍රසංග අබේසේකර ගරු ඔබතුමාට පිළිගන්වමින් සභාගත කරනවා. ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත. විශේෂ අවධානය සඳහා ලිපි 09 ක් සභාගත කරනවා. කේ.පී. මැණික්හාමි, හබරත්තවෙල, කොග්ගල්ල. ශාන්ත මහානාම, අංක:41/23, අම්බලන්තොට, සූරියවැව. ඩී.ජී. මාලනී, ජඳුර, අඟුණුකොළපැලැස්ස. එන්.එස්. ජයවීර, අංක:62/2, වීරකැටිය පාර, තංගල්ල. ඒ.පී. නිලූකා දිල්ශානි, බූන්දල, හම්බන්තොට. එන්.ජී. සුමනාවතී, 5894, කඳවුර පෙදෙස, සූරියවැව. එම්.ඩබ්ලිව්. හෂර්ණී සෙව්වන්දි, අංක:90/1, තලංපෝරුව, දික්කුඹුර, හකුරුවෙල. ආයතන භාර නිලධාරී, ගරු සභාපතිතුමනි, මෙම අයගේ ලිපි ගරු ඔබතුමා වෙත පිළිගන්වමින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ විශේෂ අවධානය සඳහා සභාගත කරනවා. ගරු සභාපතිතුමනි, අපේ සංස්කෘතික ගරු අමාත්‍යතුමා වෙත. ලිපි 45 ක් තියෙනවා ගරු සභාපතිතුමනි. ගුණසිංහපුර, සෝමිස්සර හිමි, ශ්‍රී බෝධි මහා විහාරය, ගජමන්ගම, මැදගිරිය, හුංගම. දහම් පාසැල් අවශ්‍යතාවය සඳහා මිරිස්සේ දබරංශ හිමි වජිරගිරි පුරාණ විහාරය, තංගල්ල. දහම් පාසැලේ අඩුපාඩු සම්බන්ධව ලේකම්, කේ. අබේසිංහ මහතා, නෙටොල්පිටිය, උතුර. ප්‍රධානාචාර්ය, ඉසිපතන විහාරය, ගොඩගමුව වත්ත, නෙටොල්පිටිය. උඩුගම ශ්‍රී බෝධිරාජ විහාරය, උඩුගම, ගාල්ල. ආචාර්ය පියදස්සි හිමි, ඉසිපතනාරාමය, ගොඩිගමුව, යායවත්ත, නෙටොල්පිටිය.තෙල්වත්තේ, ධමර්විජය හිමි, පුරාණ ඇඳගල ආරණ්‍ය සේනාසනය, කොමලිගම, ඕමල්විල. ඇතුළු ලිපි 45 ම ගරු සංස්කෘතික අමාත්‍යතුමාගේ අවධානය සඳහා ඉදිරිපත් කරමින් සභාගත කරමින් ගරු ඔබතුමාට පිළිගන්වමින් සභාගත කරනවා.

ලාල් ප්‍රේමනාත් මහතා:- ගරු සභාපතිතුමනි, කිරින්ද, පුහුල්වැල්ල, ශ්‍රී සාරානන්ද මාවත, දිරියපුර සමිතියේ ලේකම්තුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය පිණිස ඉදිරිපත් කරන ලද ලිපියක් කොටපොල ජාතික පාසැලේ ක්‍රිකට් පුහුණුකරු පී.එච්.එස්.පී. ආනන්ද මහතා විසින් ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ අවධානය පිණිස ඉදිරිපත් කරන ලිපියක් දෙණියාය, දෙමළ පාසැල්වල

දෙමව්පියන්ගේ සංවිධානය විසින් ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය පිණිස ඉදිරිපත් කරන ලද ලිපියක් සභාගත කරනවා.

චන්දන ප්‍රියන්ත මහතා:- ගරු සභාපතිතුමනි, රුවිරා කළ්‍යාණි, අකුරැස්ස, ලේනබටුව, ඉඩම් ඔප්පු ලබාගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ලිපියක් සභාගත කරනවා.

ජයන්ත පතිරණ මහතා:- ගරු සභාපතිතුමනි, මාතර, කොටුව, ජනාධිපති විද්‍යාලයේ පාසැල් සංවර්ධන සමිතිය විසින් වතර්මාන විදුහල්පතිවරයාගේ අනුයුක්ත සේවා කාලය දීඝර් කරන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ අවධානය පිණිස යොමු කරනවා.

ටී.වී.කේ.ගාමිණී මහතා:- ගරු සභාපතිතුමනි, වැකන්දල, ධම්ර්ගිරි විහාරයේ පවත්නා විශාල අඩුපාඩුවක් සම්බන්ධව ගරු මනෝජ් සිරිසේන ඇමතිතුමා වෙත ලිපියක් ඉදිරිපත් කරනවා. ඒ වගේම කෝම්පෝරුව ශ්‍රී තප්පෝදාරාම විහාරස්ථානයේ ශබ්ද විකාශන යන්ත්‍රයක් ලබාගැනීම සඳහා ගරු මනෝජ් සිරිසේන අමාත්‍යතුමාට ලිපියක් ඉදිරිපත් කරනවා.

සරත් ද අල්විස් මහතා:- ගරු සභාපතිතුමනි, මාතර, කුමාරතුංග මාවතේ, අංක:294/1 හි පදිංචි, සමන් ලියනගේ මහතා විසින් ඉදිරිපත් කර ඇති අධිවේගී මාගර්ය දෙපස සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති වාතර්ාව සභාගත කරනවා.

සභාපතිතුමා:- මට ලිපියක් යොමු කරලා තියෙනවා. දොඩම්පහල දකුණ, ධීවර සමුපකාර සමිතිය. ධීවර සමුපකාර සමිතියට වූ හානිය සම්බන්ධව ඒගොල්ලො ඒ පිළිබඳව කටයුතු කරන්න කියලා. එය සභාගත කරනවා.

ප්‍රධාන අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, 2019.03.11 දින පැවති දකුණු පළාත් සභාවේ මහජන පෙත්සම් කාරක සභාවේ සංක්ෂිප්ත වාතර්ාව මා සභාගත කරනවා.

සභාපතිතුමා:- සංශෝධනය ආවා නේද ගරු මන්ත්‍රීතුමන්ලාට? ඒ සංශෝධනය සහ ඒ රීති පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව තිබෙනවා. ඒ පිළිබඳව සභා සම්මත කිරීමට පෙර.

ප්‍රධාන අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, සමුපකාර විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද රීති මාලාවට අදාලව ඉදිරිපත් කල සංශෝධනය පිළිබඳ සභාවේ මත, අදහස් කීපයක් පල වුණා. ගරු සභාපතිතුමනි, 13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සමුපකාර විෂය පළාත් සභාවට පැවරෙනවා. ලබාදෙන ලද බලතල පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමේදී තමයි ප්‍රඥප්ති සාදනු ලබන්නේ. ඒ අනුව තමයි සමුපකාර ප්‍රඥප්තිය සකස්කරනු ලැබුවේ. නමුත් සමහර අවස්ථාවල ගරු සභාපතිතුමනි, ප්‍රඥප්තිය තුළ සියළු කාරණා ප්‍රඥප්තියට ඇතුලත් කිරීමට බැරිවෙන තැන ගරු විෂයභාර අමාත්‍යවරයාට ඒ වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවල රීති සම්පාදනය කිරීමේ බලය ලබාදීලා තියෙනවා. ගරු සමුපකාර අමාත්‍යතුමා මේ රීති මාලාව සකස්කරලා තියෙන්නේ දීපු බලයන් අනුව. ඒ අනුව සකස්කල රීති මාලාවේ කෙටුම්පත මේ වනවිටත් ගැසට් එකට යවලා තියෙනවා. අති විශේෂ ගැසට් පත්‍රයක් මඟින් ඒක ප්‍රකාශයට පත්වෙලා තියෙනවා කෙටුම්පත. මොකද ඒ පිළිබඳව යම් විරුද්ධත්වයක් දක්වන කෙනෙක් ඉන්නවා නම් ඒ පිළිබඳව විරුද්ධත්වය පල කරන්නට හෝ සමස්ථ අයගේ දැනගැනීම සඳහා තමයි ගැසට් පත්‍රය පල කරන්නේ.මොකද ප්‍රමාණවත් දැනුම්දීමක් ඇති කරන්න. දැන් ඒ අනුව ගැසට් පත්‍රයේ කෙටුම්පත ගැසට් වෙලා තියෙනවා රීති මාලාවේ. දැන් ඊට අමතරව ගරු අමාත්‍යතුමා අද දවසේ තවත් සංශෝධනයක් ඉදිරිපත් කළා. හැබැයි සභාවට බලය තියෙනවා ගරු සභාපතිතුමනි, සංශෝධනය ගැන සළකා බලලා ඒකට එකඟ වෙනවද මේකට විරුද්ධ වෙනවද කියලා බලලා ඒපිළිබඳව තීන්දුවක් ගන්න. සංශෝධනය මෙම රීති මාලාවට එකතු කරන්න තීන්දු කළොත් සභාව ඊළඟට පලවන ගැසට් පත්‍රයේ එය ඇතුලත් වෙලා ප්‍රකාශයට පත්වේවි. සමහර විට විරුද්ධ වුණොත් ඒක ඇතුල් වෙන්නේ නැහැ. දැනට මේ කෙටුම්පත ඊට පස්සෙදි නීතිය බවට පත්වෙනවා. අන්න ඒකයි තියෙන්නෙ ගරු සභාපතිතුමනි. ඒ නිසා සභාපතිතුමා අද දවසේ මම කිව්වා සභාපතිතුමන්ලා සාකච්ඡා කරලා ගත්ත අවස්ථාවක් කියලා. සභාවට බලය තියෙනවා මේ සංශෝධනය පිළගන්නවාද නැද්ද කියන එක පිළිබඳව තීන්දුවක් ගන්න. පිළිගත්තොත් ඒකත් ඇතුලත්ව මේ කෙටුම්පත නැවත ගැසට් වෙනවා. ප්‍රතික්ෂේප කළොත් දැනට මේ ඉදිරිපත්කල කෙටුම්පත තමයි ඉදිරියේ වලංගුභාවයට පත්වෙන්නෙ. ඒකයි තත්ත්වය ගරු සභාපතිතුමනි.

සිංහ සමන් කුමාර මහතා:- ගරු සභාපතිතුමනි, ඒ කාරණය සම්බන්ධයෙන් මටත් අදහසක් ප්‍රකාශ කරන්න තියෙනවා. ගැසට් කරපු ප්‍රඥප්තිය අපිට ලැබිලා තියෙනවා තැපෑලෙන්. එහි XV අපේ ඇමතිතුමා ඉල්ලන්නෙ සමුපකාර රීති මාලාවේ 44 XV වගන්තියෙන් පසුව 44(XV1) ලෙස පහත වගන්තිය ඇතුලත් කිරීමට යෝජනා කිරීම. එතකොට XV වල තියෙන්නේ ප්‍රඥප්තියේ ගරු සභාපතිතුමනි, රෙජිස්ට්‍රාර් හෝ බේරුම්කරුවෙකු හෝ බේරුම්කරුවන් හෝ ඉදිරියේදී කිසිම පාශර්වකරුවෙකු වෙනුවෙන් නීතිඥයෙකුට පෙනී සිටීමට නුපුළුවන කියලා. ඒ වෙනුවට තමයි ගරු ඇමතිතුමනි, ඇතුලත් කරන්න කියන්නේ බේරුම්කරණය නිමා වූ දින සිට ණයකරුගෙන් පොලී ගණනය කිරීම නතර කළයුතුයි කියලා. එතකොට බේරුම්කරණය කියන්නෙ සාමාන්‍යයෙන් බේරුම්කරණ මණ්ඩලයකට යන තනතුරක්. ස්ථානයක්. එතකොට ගරු සභාපතිතුමනි, එතන ඉඳලා මේ යම් ණයකරුවෙකුගේ මුදල් අයකර ගැනීමේ කාලය බේරුම්කරණයෙන් දෙන නියෝගය තහවුරු කරලා ගන්න නම් උසාවියකට යන්න ඕන. එතකොට ඒ උසාවියට යන කාලසීමාව අවුරුදු 5 ද 10 ද කියලා කියන්න බැහැ. එතකොට ඒ කාලසීමාවටත් පොලියක් ගණනය කරන්න බැහැ මේ වගන්තිය සම්මත වුණොත් ගරු ඇමතිතුමනි. ඊට අමතරව තවත් එකක් තියෙනවා. සුළු ණය ගන්න අය සඳහා නෙවෙයි මේක වඩාත්ම බලපාන්නෙ. සුළු ණය ගන්නවට වඩා මහා පරිමාණයෙන් හොරකම් කරපු සභාපතිවරු ඉන්නවා. ඒ අයටයි මේ අවශ්‍යතාවය තියෙන්නෙ. මොකද ඒ අයට ගෙවන්න වෙනවා කවදාහරි නඩු දාලා අයකර ගන්න වුණොත් ඒ අයට මිලියන ගණන් නෙවෙයි බිලියන ගණන් ගෙවන්න වෙනවා මේ ගණන් හැදුවොත් පොලී ගණන් හැදුවොත්. ඉතින් මේ ඒක නැතිකර ගන්න තමයි ගරු සභාපතිතුමනි, මම නම් හිතන්නෙ මේක ඇතුලත් කරන්නෙ ගරු ඇමතිතුමන්ලා ඔය සභාපතිතුමන්ලා කවුරුහරි ඇවිල්ලා රවට්ටලා තියෙන්නෙ. මම කියන්නෙ එහෙම නම් සීමාවක් දාන්න. අඩු අයට දෙනවා නම් අඩුගානෙ ලක්ෂ පහක සීමාවක් දාන්න. ලක්ෂ පහට සීමාවක් දාලා ඒ පොලියෙන් ඇතුලත් කරන්න. ඒකට මානව හිමිකම් බලපාන්නෙ නැහැ. මොකද අඩු අය සඳහා අපි යම්කිසි සහනයක් දෙන්න ඕන මේ අයට.මේ මහා පරිමාණ වංචා දූෂණ සිදුකරපු මිනිස්සුන්ට පොලියත් ගණනය කරන්නෙ නැතුව මේක මේ විදියට සම්මත කළොත් ඒක අසාධාරණයි ගරු සභාපතිතුමනි. මම මෙ ප්‍රඥප්තියට අත ඉස්සුවෙ ගරු සභාපතිතුමනි බොහොම සද්භාවයෙන්. ඉතින් මේ වගේ එකක් ඇතුලත් කරපු එක ගැන නම් මම කණගාටු වෙනවා ගරු සභාපතිතුමනි. මම කැමති නැහැ, මම ඒකට විරුද්ධ වෙනවා.

යූ.ජී.ඩී.ආරියතිලක අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, මා කරුණු පැහැදිලි කිරීමක් කරන්නම් ගරු සිංහ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණය ගැන. දැන් සමුපකාරයකින් ණය ලබා ගැනීමේදී යම් සීමාවක් ඔස්සේ, බොහෝ විට මා දන්නා තරමින් ලක්ෂ තුනෙන් වැඩි සියළු ණය සඳහා දේපල ඇපයක් සමුපකාරය ලබාගන්නවා. ලක්ෂ පහ, දහය ඒ විදියට යනවා නම්, විස්ස, විසිපහ යනවා නම් යම් සමුපකාර සමිතියක්, ඒකත් දේපලක් සුරුකුමක් හැටියට ලබා ගැනීම අනිවාර්යයි. එවැනි බැහැර හැරීමක් කිසිසේත්ම මේ බේරුම්කරණයට ඉදිරිපත් වෙන්නෙ නැහැ. නීතිය ක්‍රියාත්මක වීමෙන්ම දැන් අපි දේපලක් තියලා බැංකුවකින් ණයක් ගත්තම බැංකුව උසාවියේ නඩුව දාලා ඒක අයිතිකර ගන්නවනේ. අයිති කරගෙන වෙන්දේසි කරලා ඒ මුදල් ලබා ගන්නවානේ. ඒක නිසා,

ටී.වී.කේ. ගාමිණී මහතා:- ඇමතිතුමා, සමාවෙන්න. සමුපකාර ඉතිහාසයේ එහෙම අයකරපු තැනක් තියෙනවා නම් මට කියන්න.

යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා:- මට ඒකට පිළිතුරු දෙන්න තරම් අවශ්‍යතාවයක් නැහැ. ගරු සභාපතිතුමනි, දේපලක් ඇපයට අරගෙන තියෙනවා ණයක් සම්බන්ධව බේරුම්කරණය කරන්න බැහැ මේ ඇපකරුවො දෙන්නෙක් අත්සන් කරලා තියෙන ණය විතරයි මෙතෙන්දි එන්නෙ. මොකද ඒවාට නීතිය ක්‍රියාත්මක වෙන්නෙ වෙනත් ආකාරයකට. ගරු සභාපතිතුමනි, ඒ නිසා සිංහ මන්ත්‍රීතුමා කියන කාරණය මේ නීතියට අදාළ වෙන්නෙ නැහැ. මොකද දේපල ණයක් තියලා ලක්ෂ 5, 10, 20, 30 ක් ඊට වැඩි ගානක් යමෙක් සමුපකාරයකින් අරගෙන තියෙනවා නම් ඒ දේපල පවරා ගැනීම සඳහා දිස්ත්‍රික් උසාවියට ගිහිල්ලා නඩුවක් දානවා. ඊටපස්සෙ දිස්ත්‍රික් උසාවියේ නියෝගය අරගෙන වෙන්දේසි කරලා සමුපකාර සමිතියේ සල්ලි ටික ගන්නවා. දැන් මේ තියෙන්නෙ ඇපකරුවො දෙන්නෙක් අත්සන් කරලා තියෙන ණය. එතකොට ඒක තමයි බේරුම්කරණයට එන්නෙ. ඒ නිසා,

සිංහ සමන් කුමාර මහතා:- එහෙනම් හරි. ..... (සාධාරණයි.) ...... හරි, ඇමතිතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීම හරි. බොහොම ස්තුතියි.

සිසිර කුමාරරත්න මහතා:- ගරු සභාපතිතුමනි, ඔය කියන විදියට සමුපකාර සමිතිවල ණය ගන්න බැහැ. මහා සභාව අනුමත කරනවා අපි දේපල ඇපයක් නැතිව පුද්ගලිකව ඇපකරුවන් දෙන්නෙක් ඇතුව කොච්චර ණය වෙන්න පුළුවන්ද කියන කාරණය. ඒක මහා සභාවේ තීන්දුවක්. ලක්ෂයක්, ලක්ෂ එකහමාරක්, ඕනම සමිතියක ලක්ෂ එකහමාරකට වැඩිය නැහැ ඔය විවිධ සේවා සමුපකාර සමිතිවල. අනිත් උපරිමයම යන්න පුළුවන් ලක්ෂ පහක් නැත්නම් ලක්ෂ දහයම දේපල ණය. ඒවා දේපලක් ඇපයට තියාගෙන දෙන ණය. ඒ නිසා මේකෙ පුද්ගලිකව අපි ගන්න ණයක් කල්පසුවුවොත් කරන ක්‍රමවේදය තමයි මේ පොලිය කපාහැරීම පිළිබඳව කියන්නෙ. දෙපාතර්මේන්තුවේ දැනටත් අවුරුදු හතර, පහ තීකර්කරණයෙන් පස්සෙ නඩු ප්‍රමාද වෙනවා. ඒ කාලසීමාවේ පොලී කපා හැරීමක් පිළිබඳව විතරයි කියන්නෙ. මේක ඒ දෙපාතර්මේන්තුවේ වරදින් වෙන සිද්ධියක්. දැනට අපි මුලින්ම වැඩකරන දෙපාතර්මේන්තුව සමුපකාර දෙපාතර්මේන්තුව. ඉතින් ඒක තමයි මේ කියන්නෙ. එහෙම නැතුව මේ දේපල ණය පිළිබඳව ගැටළුවක් නෙවෙයි ගරු සභාපතිතුමනි.

එස්. තෙන්නකෝන් නිලමේ මහතා(විපක්ෂනායක):- ගරු සභාපතිතුමනි, ගරු විෂයභාර අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරපු සංශෝධනය ඉතාමත්ම සුහදශීලී, සද්භාවයෙන් කරපු සංශෝධනයක්. මේක ඇතැම් අයට පොඩි අනවබෝධයකුත් තියෙනවා. මේ ඉස්සෙල්ලා ලැබුණෙ නැහැ කියන මතය ටේබල් වලට. මේ සංශෝධනයේ පිටපතක් ආවෙ නැහැ කියන එක. ගිය සභාවේ කතා කළේ සභාපතිවරු මේක ආරක්ෂා කරන්න කටයුතු කරනවා කියන එක. දැන් කියනවා සභාපතිවරු කියන දේ කරන්න දෙනවා කියලා. මේක සභාපතිවරුත් එක්ක සාකච්ඡා කරපු එක හොඳයි. සභාපතිවරුත් ඉල්ලලා තිබුණා සාකච්ඡා කරන්න වෙලාවක් දෙන්න කියලා. ඔබතුමා එක්ක සාකච්ඡා කරලා තියෙනවා. මේ සංශෝධනයේ සමුපකාරයේ පහළම සාමාජිකයා වෙනුවෙන් සද්භාවයෙන් ගත්ත තීරණයක්. ඒ නිසා මේක ගැසට් එකට යවනවා, මේක සම්මත වුණාට පස්සෙ ගැසට් එකේදි විරෝධතා ඉදිරිපත් වෙන්නත් පුළුවන්.

යූ.ජී.ඩී.ආරියතිලක අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, මම මේකට යම් කරුණු පැහැදිලි කිරීමක් කරන්න ඕන. ගරු චමිලි මන්ත්‍රීතුමා සඳහන් කළා අධිකරණ නියෝග සම්බන්ධයෙන්. ඊළඟට නීතිඥයෙක් මේ සභාවට ඇවිල්ලා හිටියා කියන කාරණයක් සඳහන් වුණා. ඊළඟට සභාපතිවරු මේ ප්‍රඥප්තිය එපා කියලා අත්සනක් යවපු ආණ්ඩුකාරතුමාට යවපු දාපු ලිපියක් ගැන සඳහන් වුණා. අද සමුපකාර අටක විතර සභාපතිවරු මාත් එක්ක සාකච්ඡා කළා. ඒ සියළුදෙනා කිව්වා අර උසාවියට ඉදිරිපත් කරලා තියෙන පෙත්සමක් වගේ පෙත්සමකට අපි අත්සන් කළේ නැහැ කියලා. ඔවුන් ඊගාව අධිකරණයකදී අධිකරණයට ඇවිල්ලා ඒක කියන්නත් ලෑස්තියි. එහෙම නැත්නම් දිවුරුම් ප්‍රකාශයකට යන්නත් ලෑස්තියි. ඊළඟට අපි කොහොමත් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න හිටියා. මේ ගරු සභාවට ආවා කෝට් එකක් ඇඳගත්ත, ටයි එකක් දාගත්ත මනුස්සයෙක් නීතීඥයෙක් කියලා, පිස්කල් නියෝගයක් භාරදෙන්න කියලා. මම අවුරුදු 30 ක් මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥයෙක් හැටියට කටයුතු කළා. ජයන්ත ජයවීර මන්ත්‍රීතුමා ඉන්නවා. ලංකාවේ කිසිම උසාවියක් කවදාවත් පිස්කල් නියෝගයක් නීතීඥයෙකුගේ අතට භාරදෙන්නෙ නැහැ, මේක ගෙනිහිල්ලා වගඋත්තරකාරයෙකුට බාරදෙන්න කියලා. ඒක නීති විරෝධී නීතීඥ වෘත්තියේ එක දවසක් හිටිය කෙනෙක් දන්නවා එහෙම කරන්න බලයක් නැහැ, නීතීඥයෙකුට එහෙම හැකියාවක් නැහැ, එහෙම කියලා. මේ නීතීඥයා හැටියට ආවෙ කෝට් අන්දපු එකෙක්. එහෙම නැත්නම් නීතීඥයෙක් නෙවෙයි. ඊළඟට කියනවද නඩු තියනව කියලා දැන දැන කළා කියලා. ගරු සභාපතිතුමනි, ඔබතුමා ගාව තියෙනවා සභාලේකම් ගාව තියෙනවා අර ආපු ෆැක්ස් එක. ෆැක්ස් එකක් ආවානේ ඉස්සෙල්ලා. ඒ ෆැක්ස් එක බලන්න.

එස්. තෙන්නකෝන් නිලමේ මහතා(විපක්ෂනායක):- අධිකරණයට අපහාස කිරීමක්. මේ ආපු පුද්ගලයා පිළිබඳ වහාම සොයන්න.

යූ.ජී.ඩී. ආරියතිලක අමාත්‍යතුමා:- මේ සභාවෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න ඕන. අර සමුපකාර උපදේශක කියන මුණවීර එක්කගෙන ආවෙ මේ සභාවට. ඒක හින්දා මුණවීර දන්නවා ආවෙ කව්ද කියලා. ගරු සභාපතිතුමනි, ඒ විතරක් නෙවෙයි ලේකම්තුමාගේ ගාව තියෙනවා අර ෆැක්ස් එක. කරුණාකරලා ඔබතුමා ඉන්න. මොකාද වගේ කොයි

එකටත් පැනලා වාචාලයෙක් වගේ දොඩවනවා. සභාවේ ගෞරවය කෙලෙසනවා. මන්ත්‍රීවරුන්ගේ ගෞරවය තියාගන්න දන්නෙ නැහැ. පෞද්ගලික වෛරයකින්, ද්වේශයකින් කොයි වෙලෙත් කතා කරනවා. මම කතා කරන එකට එයාට බාධා කරන්න අයිතියක් නැහැ. කියන එක කියන්න කියන්න මගේ පිළිතුරු කතාවෙන් පස්සෙ. ....(ඝෝෂා....අපැහැදිලියි) ...... ගරු සභාපතිතුමනි, මගේ පිළිතුරු කතාව කරන්න ඉඩදෙන්න. මේ වනචාරී පුද්ගලයා වාඩි කරවන්න ගරු සභාපතිතුමනි. දැන්වත් මේක නතර කරන්න කියන්න. ගරු සභාපතිතුමනි, මගේ පිළිතුරු කතාවේ අයිතිය දෙන්න.

සභාපතිතුමා:- පක්ෂව ඡන්දය පාවිච්චි කරන්න, සංශෝධන සහිතව.විපක්ෂව 02යි. වැඩි ඡන්ද 28 කින් සභා සම්මත වෙනවා, සංශෝධන සහිතව. ඊළඟට අමාත්‍යවරුන්ගේ ප්‍රකාශයන්.

## <u>05.ගරු අමාත්‍යවරුන්ගේ ප්‍රකාශයන්.</u>

චන්දිමා රාසපුත්‍ර අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් වෙලාව ගන්නවා විශේෂයෙන්ම අද හත්වෙනි පළාත් සභාවේ අවසාන පළාත් සභා වාරය. අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට දෙවැනි වර කටයුතු කරලා අවසාන වන දෙවැනි දවස. විශේෂයෙන්ම මම මේක අවස්ථාවක් කරගන්නවා අමාත්‍යාංශයේ නිලධාරීන්ට ඒ වගේම අමාත්‍යාංශයේ පද්ධතිය තුළ ඉන්න සියළුම ගුරුවරුන් විදුහල්පතිවරු ගුරු උපදේශකවරු ඒ සියළුම දෙනාට ගෞරවයක් ස්තුතියක් කරන්න පළාත් සභාවේ විෂය භාර අධ්‍යාපන ඇමතිවරයා හැටියට. මම සතුටුයි නැවත වරක් කියන්න මේ සභාවේ දකුණු පළාත තමුන්නාන්සේලා කවුරුත් දන්න දෙයක් මේ වෙනකොට. ඒ වගේම මම නම් සැකයකින් තොරව මොකද ප්‍රකාශ කළා අනිවාර්යයෙන්ම ඒ ජයග්‍රහණය එනවාමයි කියලා. දකුණු පළාත නැවත වරක් ලංකාවේ පළවෙනියා වුණා. ඒකත් කිව්වා. මාතර දිස්ත්‍රික්කය ලංකාවේ පළවෙනියා වෙයි කියන එක ජේන්න තිබුණා. ඒකත් කිව්වා. එතකොට අපි නැවත වරක් පළාතක් දිස්ත්‍රික්කයක් වශයෙන් අපේ දිස්ත්‍රික්කයක් පළවෙනි තැනට කලාපයක් හැටියට වලස්මුල්ල කලාපය නැවත වරක් පළවෙනි තැනටත් අරගෙන ඇවිල්ලා ඉහලම ප්‍රතිඵලයක් වාතර්‍ා කරලා තියෙනවා. ඒ නිසා ඒ වෙනුවෙන් කැපකිරීම් කරපු සියළුම නිලධාරීන් සමහර වෙලාවට අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්, දෙපාතර්මේන්තුවේ නිලධාරීන් ඒ වගේම අනුබද්ධ මගේ යටතේ තියෙන අනෙකුත් ආයතනවල ඉහළ නිලධාරීනුත් කැප කිරීම් කරලා තියෙනවා. මාගර් සංවධර්න අධිකාරිය සමහර වෙලාවට අවශ්‍යතාවයන් සඳහා පාසැල්වල කටයුතු කරගෙන යෑමට, ඒ වගේම ඉඩම් අමාත්‍යාංශය යම් අවස්ථාවලදී යම් කටයුතු සඳහා උදව් කිරීම. විශේෂයෙන්ම අමාත්‍යාංශ ලේකම්තුමාට ඒ වගේම පළාත් අධ්‍යක්ෂකතුමාට සැලසුම් අධ්‍යක්ෂකතුමිය ඒ වගේම සුවිශේෂී කාරණාවක් කරපු අපේ සිසුතරණ ව්‍යාපෘතිය භාරව කටයුතු කරපු සංවධර්න අධ්‍යක්ෂකතුමිය පලාවෙල මැතිනිය. නමින්ම මතක් කරන්න ඕන. ඒ වගේම පද්ධතිය තුළ ඉන්න සියළුම ගුරුවරුන් සමහර වෙලාවට ඉතාමත් දක්ෂ ඇති, සමහර වෙලාවට සාමාන්‍ය දක්ෂ ඇති. තවමත් සමහර ගුරුවරු ඇති යම්කිසි ඉදිරියට යෑමක් විය යුතු ගුරුවරු ඇති. මේ සියළුම දෙනා පද්ධතියක් හැටියට ඉතාමත්ම හොඳ කටයුත්තක් කළා කියන එක මේ අවස්ථාවේදී අධ්‍යාපන ඇමතිවරයා හැටියට නැවත වරක් මතක් කරන්න ඒන. ඒ අනුව අධ්‍යක්ෂකවරුන් තමන්ගේ කායර්ය ඉතාම හොඳින් කළා. ගුරු විදුහල්පතිවරු පාසැල් හැටියට ගරු සභාපතිතුමනි, පාසැල්වල ප්‍රතිඵල ඉහළට ගෙනඒමට අවශ්‍ය සියළුම කාරණා පාසැල් කීපයක් විතරක් ඕන නම් අපිට අවධානය යොමුකළ යුතු මට්ටමට අපිට අපේ සියළුම පාසැල් ඉතා හොඳ ප්‍රතිඵල වාතර්‍ා කළා. සමහර වෙලාවට ජාතික පාසැල්වලත් අපිට ඇවිල්ලා තිබුණ ජාතික පාසැල්වල වැඩසටහන් ක්‍රියාත්මක කළා. විදුහල්පතිවරු නැති තැන්වලට පළාත් සභාවේ විදුහල්පතිවරු වැඩ බලන්න දාගෙන වැඩසටහන ක්‍රියාත්මක කළා. ඔබතුමන්ලාට බලන්න ඕන නම් බලන්න පුළුවන් වැලිගම සිද්ධාථර් විද්‍යාලය. අවුරුදු දෙකකට කලින් 45% යි ප්‍රතිඵල. මෙදා ගමන 84% යි. ඒ 84 ගත්තෙ මෙදා ගමන එන්න තිබුණ 50% 60% ක් අතර අවසාන මාසය වෙනකොට. විශේෂයෙන්ම කියන්න ඕන සිසුතරණ වැඩසටහනට අමතරව මේ ගෞරවයක් හැටියට කියන්නෙ. රටේ ඉන්න හොඳම ප්‍රතිඵල ගත්ත එළියේ ඉන්න උපාධිධාරීන් රැකියා විරහිතව. අපේක්ෂාභංගත්වයෙන් හිටපු උපාධිධාරීන් සම්බන්ධ කරගත්ත වැඩසටහනක්. පාඩම් කියාදීමේ වැඩසටහන තමයි වැලිගම සිද්ධාථෙර් 84% ට ගෙනාවෙ. ඒ වගේම ලුණුගම්වෙහෙර කොට්ඨාශයේ කවදාවත් ජාතික මට්ටම පන්නලා තිබුණෙ නැහැ පසුගිය කාලෙ. මෙදා ගමන තමයි පළවෙනි වතාවට ලුණුගම්වෙහෙර ජාතික කොට්ඨාශය පන්නන්නෙ.

ඒකත් ඒ පාඩම් කියාදීමේ වැඩසටහන යටතේ එකම දරුවෙක් ඒ වගේම සමස්ථ ගුරු පද්ධතිය ඇතුලේ ඉන්න කෙනෙක් කියන්න ඕන. මොකද ඇමතිතුමාට මම ඔබතුමා හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කළ නිසාත් විශේෂයෙන්නම තිස්සමහාරාමය අධ්‍යාපන කොට්ඨාශය ලුණුගම්වෙහෙර කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරු මෙතන ඉන්න නිසා අපේ මුතුකුමාරණ මන්ත්‍රිතුමා ඉන්නවා. එතුමා ඒ ආසන්නයේ නියෝජනය කරන නිසා මම පෙන්වන්නම් හරි ගිය තැනත්, වැරදීච්ච තැනක්. කණගාටුවෙන් කියන්නෙ ගරු සභාපතිතුමනි. ලුණුගම්වෙහෙර කොට්ඨාශය තමයි පළමුවෙන්ම තෝරාගත්තෙ ඒ ආදශර් වැඩසටහන කරන්න. මාස දෙකයි. ඊට වැඩිය කරන්න බැහැ ඒවා. ළමයි ටික එක තැනකට ඒකරාශී කරලා කරවන්න කියලා පුළුවන් තරම් අපේ තියෙන සම්පත් වලින් හොඳම ගුරුවරු උදේට උගන්වන්නත් කුඩා කණ්ඩායම් අරගෙන ඒ උපාධිධාරීන් යොදවලා පාඩම් කියලා දෙන්නත්. සභාපතිතුමනි, ඇත්තටම පෙළඹවීමක් කරලා එක තාත්තා කෙනෙක් පෙළඹවීම කළේ. මොකද මම ආයෙ ගියා දෙවැනි වතාවට ලුණුගම්වෙහෙර ආයෙ කතාකළා ලුණුගම්වෙහෙරට. ඒක වැඩසටහන පොඩ්ඩක් කැඩුණා. කැඩුණත් තැන් දෙකක පටන් ගත්තා. දරුවො විතරක් නෙමෙයි ප්‍රජා මට්ටමට යම් සම්බන්ධතාවයක් තිබුණා. ළමයි 14 ක් ඒකෙන් අසමත්. ඒක නොවෙන්න ලුණුගම්හෙර තවත් ඉස්සරහට යනවා. මම ඒක ඇත්තටම වෙලාවක් තිබුණා නම් 28 වෙනිදා ප්‍රතිඵල එන්නෙ. 29 අපි දැනගන්නෙ. අවසාන වෙලාවේ කායර් බහුලත්වය හින්දා යන්න බැහැ.මම හැදුවෙ දෙමව්පියන්ට ගෙනල්ලා පෙන්වන්න ඇයි මේක කරගත්තෙ එහෙම නොවුනා නම් තමන්ගේ දරුවන්ට කියලා. එහෙම නොවුණා නම් බෙරලිහෙල කණිෂ්ඨ විද්‍යාලයත්, බෙරලිහෙල මහා විද්‍යාලයත් දැවැන්ත ලෙස ඉස්සරහට යනවා. ඒ වගේම ඒ ආසන්නයේ තියෙන සියළුම පාසැල් 75%, 76% පැනලා යනවා. ඒ වගේම දෙණියාය කලාපයේ අපේ ජනතා විමුක්ති පෙරමුණේ ලාල් ප්‍රේමනාත් මන්ත්‍රිතුමාගේ ගම. ගියපාර පළාතේ 10 වෙනියා. 74.8 යි. මෙදා ගමන වෙනකොට 81% පැනලා ඉන්නෙ. පාඩම් කියාදීමේ වැඩසටහන. එතුමත් ඉන්නවා, ඔබතුමාත් ඉන්නවා. මෙදා ගමන පළාතේ පස්වෙනියා. වරක් පළවෙනියාට ආපු අකුරැස්ස පැරැද්දුවා. දිස්ත්‍රික්කයේ තුන්වෙනියාට ආවා. මම හිතුවා දිස්ත්‍රික්කයේ දෙවැනියාටත් එන්න බැරි නැ කියලා. මාතර විතරයි ඒගොල්ලොන්ට පනින්න බැරි දුරක පේන්න තිබුණෙ. ගරු සභාපතිතුමනි, ගියපාර රටේ 24 වෙනියා මෙදා වෙනකොට 12 වෙනියා. මම සතුටින් කියන්නෙ. මොකද අපේ තියෙන වැරදිවලින් තමයි මේවා නොඑන්නෙ. අපේ අවධානය යොමුකළොත් ඒ වැඩසටහන හරියාකාරව මාස දෙකයි කළේ. ඒ ප්‍රතිඵල ගන්න පුළුවන්කම ලැබුණා. තමුන්නාන්සේට මේ දේ කිව්වෙ. මම මෙතන පුරසාරම් දොඩවන්න නෙවෙයි. මේකට ගොඩක් අය මහන්සි වුණා. මම කිව්වා වගේ ලේකම්තුමාට විවිධ ගැටළු මැද්දේ මේක ක්‍රියාත්මක කරවා ගැනීම සංවධර්න අධ්‍යක්ෂකතුමිය සැලසුම් අධ්‍යක්ෂකතුමිය ඒ අය. ඒ වගේම විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන් පළාත් අධ්‍යක්ෂකතුමා කීප වරක් ලුණුගම්වෙහෙරට ගියා. කීප වරක් අනෙකුත් කොට්ඨාශවලට ගියා. ගුරුවරු තෝරාගැනීම්වලදී ඉතාමත්ම වෙහෙසකර කායර්යක් කළා. ඒ වගේම පරිපාලනය කර ගැනීමේදී. මේකයි සභාපතිතුමනි, අවශ්‍ය වෙන්නෙ. දක්ෂම දරුවන් එළියේ ඉඳිද්දි නලින් මන්ත්‍රීතුමා දක්ෂම දරුවන් එළියේ ඉඳිද්දි, පාරවල්වල ඇවිද ඇවිද ඉඳිද්දි සමහර අය පළවෙනි පන්ති සාමාථර් තියාගෙන සමහර අය දෙවන පන්ති සාමාථර් තියාගෙන අපි රටේ මුදල් වැයකරලා කාගෙවත් මුදල් නෙවෙයි. අපේ මුදල් වැයකරලා ශිෂ්‍යත්වය දීලා, ශිෂ්‍යාධාර දීලා, නේවාසිකාගාරවල තියලා අවශ්‍ය සියළු දේ ලබාදීලා ආයෝජනය කරලා ඉවරවෙලා හොඳම ප්‍රතිඵලය, හොඳම බුද්ධිමත් මට්ටමට ආවම දරුවා පාරෙ ඇවිද ඇවිද ඉන්න රටක්. ඒ දරුවන්ගේ තියෙන වටිනාකම් පෙන්වන්න. අපිට කරන්න බැරුව නෙවෙයි ගුරුවරු ලවා. ඒ දරුවන්ගේ තියෙන වටිනාකම පෙන්වන්න කළේ. අන්න ඒක නිසා නැවත වරක් මගේ අධ්‍යාපන ඇමති කාලය තුළ සාථර්කම වෙච්ච වැඩසටහනක් හැටියට ගුරුවරුන්ටත් විශේෂයෙන් දරුවන්ටත් මගේ ගෞරවය ප්‍රණාමය පළවෙනි තැනට එන එක අතර ප්‍රකාශ කරමින් මට විශේෂයෙන්ම අපේ සියළුම ගරු මන්ත්‍රීවරු පක්ෂ විපක්ෂ බේදයකින් තොරව තමුන්නාන්සේලා සමහර අවස්ථාවල්වල විපක්ෂයෙන් ලැබිච්ච සහයෝගය මගේ සහෝදර මන්ත්‍රිවරුන්ට ලැබිච්ච සහයෝගයටත් වඩා ලැබෙන්න ඇති සමහර වෙලාවලට. ගෞරවයෙන් සිහිපත් කරනවා. තමුන්නාන්සේලාගේ තියෙන ප්‍රතිපත්ති අනුව සමහර වෙලාවට ඡන්දය දීමෙන් වැලකී සිටියා නම් ඇරෙන්න හැම අවස්ථාවකම හොඳ දේ කරන්න තමුන්නාන්සේලා උදව් කිරීම සම්බන්ධව අධ්‍යාපන ඇමතිවරයා හැටියට මගේ ගෞරවය, ස්තුතිය

විශේෂයෙන්ම මගේ සහෝදර මන්ත්‍රිවරුන් සියළුදෙනා වෙනුවෙන් මේක කරගෙන යන්න කටයුතු කරපු අපේ උදව් කරපු අපේ අධීක්ෂණ මන්ත්‍රීවරු සමහර වෙලාවල්වල නොයෙකුත් වාද විවාදවල පැටලිච්ච අපේ අධීක්ෂණ මන්ත්‍රිවරු ඒ අය ගෞරවයෙන් සිහිපත් කරනවා. ඉඳලා හිටලා පොඩි පොඩි දේවල්. හැබැයි මම සමස්ථයක් හැටියට දකුණු පළාත ඉස්සරහට ගෙනියන්න, මම අද අවසාන දවසේ කියන්න දෙයක් තියෙනවා. අවසාන දවසේ. සිහිපත් කළයුතු දෙයක් තියෙනවා නලින්. ඇයි අපට සභාවක් හැටියට එකට නැගිටින්න බැරිවුණේ කියලා. එහෙම වෙන්න හේතුවක් නැහැ. මම තමුන්නාන්සේට කියනවා ඇස්දෙක බලාගෙන. මගේ දේශපාලනය පක්ෂයක් ඇතුලේ කරපු එක ඇත්ත. පක්ෂ රාමුවක් ඇතුලේ කරපු එක ඇත්ත. හැබැයි හැම වෙලාවෙම බැලුවෙ ස්වාධීනව කටයුතු කරන්න පුළුවන්ද කියන එක. ඉඩක් ලැබුණ හැම වෙලාවෙම ස්වාධීනව කටයුතු කළා කියන එක. මම ඇත්තටම හිතාගෙන ඉන්නෙ දේශපාලනයේ ඉන්නවා නම් ඉන්න ඕන ස්වාධීනව කියන එක. පක්ෂයක් ඇතුලේ තරඟ කරන්න නෙවෙයි.සම්ප්‍රදායිකව දේශපාලනයේ ඉන්නවා නම් පක්ෂයක් ඇතුලේ, තරඟ කරන්නේ මගේ පක්ෂයේ ඇතුලේ තමයි. හැබැයි ස්වාධීනව. අපි එක එක්කෙනාගේ වටිනාකම් බලාගෙන කටයුතු කළොත් මේ අද රට වැටිලා තියෙන අගාධයෙන් ගලවා ගන්න පුළුවන් කියන එක මම විශ්වාස කරනවා. ඒ සඳහා අපි සියළුමදෙනාට යෝධ ශක්තියක් ලැබේවා! යෝධ දැක්මක් ලැබේවා! කියලා ගරු සභාපතිතුමනි, ප්‍රාථර්නා කරමින් තමුන්නාන්සේලා සියළුමදෙනාට සුභ අලුත් අවුරුද්දක් ප්‍රාථර්නා කරමින් මම නවතිනවා. සියළු දෙනාටම ස්තුතියි.

යූ.ජී.ඩී.ආරියතිලක අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, අද අපි මේ පළාත් සභාවේ අවසන් රැස්වීම පවත්වන්නෙ. මේ වෙලාවේ පහුගිය අවුරුදු පහක කාලය තුළ මගේ අමාත්‍යාංශයේත් කායර්භාරයන් ඉටුකරලීමේදී මෙම ගරු සභාවේ ගරු සභාපතිතුමා හැටියට ඔබතුමන් මේ ගරු සභාවේ විපක්ෂනායකතුමන් ඇතුළු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන් ආණ්ඩු පක්ෂයේ සියළුම මන්ත්‍රීතුමන් ලබාදුන් සහාය පිළිබඳව මගේ ගෞරවය මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පල කරනවා. ඒ වගේම කැබිනට් මණ්ඩලයේ සියළු අමාත්‍යවරුන් මීට පෙර අපිත් සමඟ කැබිනට් මණ්ඩලය තුළ කටයුතු කරපු වීරසුමන වීරසිංහ ගරු මන්ත්‍රීතුමා, ඩී.වී. උපුල් මන්ත්‍රිතුමා ඇතුළු ඒ හිටපු අමාත්‍යවරුන් දෙපලත් වත්මන් අමාත්‍යවරුන් සියළු දෙනාටත් ලබාදුන් සහාය පිළිබඳව මගේ ගෞරවය පල කරනවා. ඒ වගේම සභාලේකම් ඇතුළු සභාලේකම් කායර් මණ්ඩලය ආණ්ඩුකාරවරුන් කීප දෙනෙක් යටතේ කටයුතු කළා. ඒ සියළුදෙනා ආණ්ඩුකාර ලේකම්වරුන් ඇතුළු කායර් මණ්ඩලයත් ප්‍රධාන ලේකම්තුමා ඇතුළු ඒ සියළුම නිලධාරීන් මගේ අමාත්‍යාංශයේ දෙපාතර්මේන්තු ප්‍රධානීන් අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු සියළුම කායර් මණ්ඩලයන් සමහර විටෙක අපට පළාත් සභාවෙන් බැහැර වූ ආයතනවල සහාය ලබාගැනිම අත්‍යාවශ්‍ය වුණා. නොපැකිලව ඒ සහයෝගය ලබාදුන් දිස්ත්‍රික්කවල සියළුම දිස්ත්‍රික් ලේකම්තුමන්ලා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, වෙනත් රාජ්‍ය ආයතනවල සියළුම විධායක ශ්‍රේණිවල කායර් මණ්ඩලවලටත් මගේ කෘතඥතාවය මගේ ගෞරවය මේ අවස්ථාවේ පලකර සිටිනවා. ගරු සභාපතිතුමනි, මා එක කාරණයක් මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕන.පසුගිය 26 වෙනිදා සමහරු දැක්කෙ සමුපකාර ප්‍රඥප්තිය සම්මත කිරීම සමුපකාර අමාත්‍යවරයා පිළිබඳ ප්‍රශ්නයක් හැටියට. නැත්නම් ප්‍රඥප්තිය පිළිබඳව වූ කාරණයක් හැටියට. නමුත් ඒ මොහොතේ අභියෝගයට ලක්වෙලා තිබුණේ දකුණු පළාත් සභාවට ප්‍රඥප්තීන් සම්මත කිරීමට තිබෙන නීතිමය බලය තිබෙන පිළිබඳ කාරණය.ඒකෙදි සමහර වෙලාවට යම් අවදානමකට ලක්වෙනවා කියලා පෙනුනා අපි හැමෝටම. ඒ වගේම අසීරුතාවයන්ට පත්වෙන්න පුළුවන් නේද කියලා හිතෙද්දි දකුණු පළාත් සභාවේ විපක්ෂනායකතුමා ඇතුළු කණ්ඩායමත් ඒ මන්ත්‍රීවරුනුත් ඒ වෙලාවේ ප්‍රඥප්ති සම්මත කිරීමට දකුණු පළාත් සභාවට තියෙන නිත්‍යානුකූල බලයආරක්ෂා කරන්න කටයුතු කිරීම තියෙන බලය පිළිබඳව මගේ විශේෂ ගෞරවය පිරිනමනවා. එහෙම ආදශර්යක් මේ සියළුම ගරු මන්ත්‍රීවරුන්ට පෞද්ගලික ඊෂ්‍යාර්‍ාව, කුහකකම් මේවා මත කතා කරනවා අපි දකිනවා. නමුත් පහුගිය දවස්වල ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ රිපබ්ලිකන් පක්ෂයේ සෙනෙට් සභා මන්ත්‍රීවරු කොන්ග්‍රස් සභිකයෙක්. 12 දෙනෙක් රිපබ්ලිකන් පක්ෂයේ ඩොනල්ඩ් ට්‍රම්ප්ට විරුද්ධව ඡන්දයක් දුන්නා. ඔවුන් කිව්වේ මොකක්ද? කොන්ග්‍රස් මණ්ඩලයට මූල්‍ය පාලනය පිළිබඳව තියෙන බලය අපේ පක්ෂයේ ජනාධිපති කෙනෙක්වත් ඉදිරියේ කත් අදින්න අපි ලැස්ති නැහැ. එහෙම කරනවා නම් විතරයි ප්‍රජාතන්ත්‍රවාදය

රැකෙන්නෙ රටක. නීතියේ පාලනය රැකෙන්නෙ රටක. ඒකනිසා මේ 26 වෙනිදා මහ අරින්නේ නැතුව නොබියව ඇවිල්ලා ඒ සහයෝගය ලබාදීපු සියළුම මන්ත්‍රීවරුන්ට මම ප්‍රඥප්තියට සම්බන්ධවීම පිළිබඳව මම සමුපකාර ඇමතිවරයා හැටියට ගෞරවය පලකරනවා. ඊට එහා ගිහිල්ලා පුළුල් චිත්‍රය දිහා බලලා ප්‍රඥප්ති සම්මත කිරීමට සභාවට තියෙන බලය ආරක්ෂා කිරීමට තියෙන බලය පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඊළඟට මම කියන්න ඕන, මම කියන්න උත්සාහ ගත්තා සභාපතිතුමනි, ඔබතුමා නීතිමය පියවරක් ගත යුතුව තියෙනවා. ෆැක්ස් පණිවුඩයක් එනවා ඉස්සරින්දා සභාලේකම්වරයාට ප්‍රයිවට් කමියුනිකේෂන් එකකින් මාතර. අධිකරණ නියෝගයක් කියලා. අධිකරණ නියෝගයක පාශර්වකරුවන් නොමැතිව අතුරු තහනම් නියෝගයක් දීපු වෙලාවක අධකරණයේ විනිසුරුතුමා, අපේ ජයන්ත ජයවීර මන්ත්‍රීතුමා, ජයන්ත පතිරණ මන්ත්‍රීතුමා හොඳටම දන්නවා ඒ අවස්ථාවේදී උසාවියේ අධිකරණයේ නොසිටි වගඋත්තරකරුවන්ට දිනයක් නොමැතිව නියෝගයක් දෙනවා අහවල් දවසට ඇවිල්ලා මේකට නඩුවට කරුණු කියන්න කියලා. එතකොට ෆැක්ස් පණිවුඩ එන්නෙ කොහොමද? 2019 තියෙනවා, මාසෙ නැහැ, දිනය නැහැ. ඊටපස්සෙ අපි ප්‍රඥප්තිය සම්මත කළාට පස්සෙ එනවා නිත්‍යානුකූලව පිස්කල්ගේ නියෝගය. ඒකෙ තියෙනවා ලේඛනයක්. ඒ හා සමාන ලේඛනයක් ෆැක්ස් එකෙන් එන්නෙ අත්සන් දෙක බැලුවම අත්සන් දෙක බරපතල විදියට වෙනස්. මම අපේ වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාට ඒ අත්සන් දෙක පෙන්නලා කිව්වා ඔබතුමාට ජේනවද මොනව හරි වරදක් කියලා. බලපු ගමන් එතුමා කිව්වෙ මේ දෙකේ තියෙන්නෙ අත්සන් දෙකක්, එකක් හොර අත්සනක් කියලා. දැන් මේ සභාවේ අපේ සමහර මන්ත්‍රීවරු කියනවා මේවා එකක්වත් නොදැන, පරීක්ෂා කරන්නෙ නැතුව කියනවා අධිකරණ නියෝගයකුත් තිබුණා. ඒක මෙහෙමයි. එතකොට ඒවා අධිකරණ නියෝගද? අධිකරණයට අපහාස කිරීමක්, වංචා කිරීමක්. ඒකනිසා ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව ගාල්ල පොලිසියේ වංචා විමෂර්ණ අංශයට අපේ සභාවේ ලේකම්තුමා පැමිණිල්ලක් ඉදිරිපත් කළයුතුව තියෙනවා, ඔබතුමාට එදාට තියෙනවා නිත්‍යානුකූලව ලැබිච්ච පිටපත්. ෆැක්ස් එකේ තියෙන අත්සනයි දෙක බලන්න. සංසන්දනය කරලා බලන්න. බැලූ ගමන් ඔබතුමාට පැහැදිලි වෙයි ෆැක්ස් එකේ තියෙන්නෙ හොර අත්සනක් කියලා. මම එහෙම කියන්නෙ පිස්කල් මඟින් හොර අත්සන් සහිතව එන්න පුළුවන් නිසා. ඒක වෙන්නෙ නැති නිසා. ඒක තමයි. නිත්‍යානුකූල ලේඛනයේ දිනයක් දාලා තියෙනවා පස්වෙනි මාසෙ 15 වෙනිදා 2019. හැබැයි ෆැක්ස් එකේ දිනයක් නැහැනේ. හිස් තැනක් තියෙන්නෙ. මෙන්න ව්‍යාජ ලේඛන. මේ සභාවට ප්‍රඥප්තිය සම්මත කරන්න අයිතිය නැති කරන්න හැදුවා. ඔය කියන මහ සභාපතිවරුයි, සමහර මහත්වරුයි. මේකෙත් සමහරුන්ගේ සහයෝගයකුත් තිබුණා. තියෙද්දි උත්සාහයක් ගත්තා ප්‍රඥප්ති සම්මත කරන්න තියෙන බලය ව්‍යාජ ලේඛන ඉදිරිපත් කරලා අපට විරුද්ධව ගන්න. ඒ අධිකරණ නඩුව ගැන මම කියන්නෙ නැහැ. ඒ අධිකරණ නඩුව ගෙනිච්ච දවසකට අපිව උසාවියට අපහාස කළා කියලා පෙනෙයි කව්ද උසාවියට අපහාස කරලා තියෙන්නෙ කියලා. ජයන්ත මන්ත්‍රීතුමා පෙත්සමක අත්සනක් නැහැ. අධිකරණයට ඉදිරිපත් කරපු දිවුරුම් ප්‍රකාශයේ අත්සනක් නැහැ. පෙත්සම්කරුවගේ නීතීඥයෙකුගේ අත්සනක් නැහැ. මේවා නඩුද? මේවා නඩුද? ඔබතුමාත් උසාවියේ නඩු පවරනවානේ. සුප්‍රිම් කෝට් රීතිය. ශ්‍රේෂ්ඨාධිකරණ රීති මාලාවට අනුව අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරපු ආකාරයත් සඳහන් කරලා තියෙනවා. ඒ සියල්ල උල්ලංඝනය වෙලා තියෙන්නෙ. ඒ නිසා ඔය නඩුවට කිසි බයක් නැහැ. කිසිම බයක් නැහැ. මේ කිසි කෙනෙකුට ඒ නඩුව සම්බන්ධයෙන් කිසිම දඩුවමක් දෙන්න ඉඩක් නැහැ. මේ රටේ නීතියක් ක්‍රියාත්මක වෙනවා නම්. ඊළඟට ගරු සභාපතිතුමනි, අර ව්‍යාජ ලේඛන මෙතෙන්ට ගෙනාපු එක ගැනත් පරීක්ෂණයක් පවත්වන්න ඕන. ඒ කියන්නෙ මේක නිසා. හෙට අවශ්‍ය නම් මෙතන මේ ගරු මන්ත්‍රීවරයෙක් හෝ කවුරුහරි මරලා දාන්න. ටයි කෝට් ඇඳන් ඇවිල්ලා මෙතනට කවුරුහරි ගෙනාවොත් කොහොමද වැඬේ? කොහොමද වැඬේ. ඒක හින්දා මේ ආරක්ෂාව පිළිබඳව මෙතන මීට වැඩිය වෙලාවට අනුගමනය කරන්න අවශ්‍ය වෙයි. මම මීට වඩා කතා කරන්නෙ නැහැ ගරු සභාපතිතුමනි. අදත් සාධරණ යුක්ති සහගත දෙයට මේ ගරු සභාව තුළ ඉඩක් තියෙනවා කියන එක තමුන්නාන්සේලා පැහැදිලි කරන්න. බොහොම ස්තුතියි, ඔබ සියළු දෙනාටම. ගරු සභාපතිතුමනි, ඔබතුමා ඇතුළු කායර් මණ්ඩලයටත් බොහොම ස්තුතියි. අවසානයේ එකක් කියනවා. අවුරුදු 25 ක් මේ පළාත් සභාවේ හිටපු කෙනෙක්. අපේ ජීවිත කාලය තුළ ගරු සභාපතිතුමනි, සමහර දේවල් මැරෙනකම් අමතක කරන්න උත්සාහ කළත්

අමතක කරගන්න බැහැ. අමතක කරන්න බැහැ. විවිධ ගැටුම්කාරී තත්ත්වයන් තුළත් මේ සභාවේ හිටියා අපි. අපට වඩා මහා දැණුම ඇති විශිෂ්ඨ දේශපාලනඥයින් එක්ක අපි මේ සභාවේ හිටියා. ඔවුන්ගෙන් ඉගෙන ගත්තා. කතා කරන හැටි ඉගෙන ගත්තා. මේකෙ හැසිරෙන හැටි ඉගෙන ගත්තා. කරුණක් ඉදිරිපත් කරන්නෙ කොහොමද කියන එක ඉගෙන ගත්තා. නමුත් ගරු සභාපතිතුමනි, මරණය දක්වාම මම මෙතනින් යන්නෙ වේදනාවත් අරගෙන. මම දකින විදියට කිසිම සාධාරණ හේතුවක් නොමැතිව එක් වැය ශීෂර්යක් පරාජය වුණා. ඒක මට මරණය දක්වාම අමතක වෙන්නෙ නැහැ. මහ වේදනාකාරී දෙයක්. මොකද මේ ගරු මන්ත්‍රීවරුන්ට මගේ අමාත්‍යාංශයේ වැය ශීෂර්යක් පරාජය කරන්න තියෙන සාධාරණ හේතුව මොකක්ද කියලා. හැබැයි ඒක මගේ දේශපාලන ජීවිතයේ ඇතිවෙච්ච මහාම ඛේදවාචකාරී සිද්ධියක් හැටියට මම මරණය දක්වාම ගෙනියනවා. මම කොච්චර අමතක කරන්න හැදුවත් මේ සභාවට එනකොටම ඉස්සෙල්ලා මතක් වෙන්නෙ ඕක. ඉතින් මම ඊට වඩා කතා කරන්නෙ නැහැ. නමුත් එහෙම දේවල් ජීවිත කාලය තුළම සිද්ධ වෙනවා. ඒවා දරාගන්න අපට පුළුවන් වෙන්න ඕන. ඒවා දිහා උපේක්ෂා සහගතව අපට බලන්න පුළුවන් වෙන්න ඕන. ඒ ගරු මන්ත්‍රීතුමන්ලා මට විරුද්ධව ඡන්දයක් දුන්නා කියලා ඊටපස්සෙන්දා මට ඇවිල්ලා මගේ වැය ශීෂර්ය පරාජය කලා නේද කියලා කිසි කෙනෙකුට කිව්වෙ නැහැ. ඒකනිසා ගරු සභාපතිතුමනි, සමහරවිට මම හිතන්නෙ වැඩිම වයස කෙනා මම වෙන්න ඇති. සමහර විට වයසත් එක්ක වෙන්න පුළුවන්. කොහොම වුණත් එහෙම නම් ඔබ සියළුදෙනාට ස්තුතියි. එළඹෙන්නේ නව අවුරුදු සමයක්. සියළු දෙනාටම සුභ අලුත් අවුරුද්දක් ප්‍රාථර්නා කරනවා. ඒ වගේම ඔබ සියළුදෙනාට ඉතාම වාසනාවන්ත වූ සුභ නව වසරක් ප්‍රාථර්නා කරමින් මම නිහඬ වෙනවා.

සභාපතිතුමා:- මීළඟට පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම්. ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා.

## 06. පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම්.

වීරසුමන වීරසිංහ මහතා:- ගරු සභාපතිතුමනි, පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම් යටතේ ඔබතුමා අවස්ථාව ලබාදීම සම්බන්ධව මගේ ගෞරවයත් ස්තුතියත් පුද කරනවා. මේ මොහොතේදී මේ කරුණුවලට අදාළ විෂයභාර ගරු අමාත්‍ය චන්දිම රාසපුත්‍ර අමාත්‍යතුමා මේ ස්ථානයේ නොසිටියා වුණත් එතුමාට මේ තොරතුරු ලැබේවි. මා කතා කරන්නේ එතුමාගේ විෂය භාර අධ්‍යාපන අමාත්‍යාංශයේ කතාවක් නෙවෙයි. මහාමාගර් අමාත්‍යාංශයේ කාරණාවක්. දකුණු පළාතේ මාගර් පද්ධතිය ඉතාමත් හොඳ මට්ටමට සංවධර්නය වෙලා තියෙනවා. ඒ මාගර් පද්ධතිය තුළ තිබ්ච්ච ප්‍රාදේශීය සභා ගත පාරවල් රාශියක් විශේෂයෙන් පළාත් සභාගත පාරවල් රාශියක් පහුගිය කාලසීමාව තුළ කාපට් මාගර් බවට පත්වෙලා සංවධර්නය වුණා. ඒ වගේම මාගර් රාශියක් ඉතාමත් හොඳ මට්ටමකින් තියෙනවා. නමුත් අවාසනාවට අදටත් පාරවල් රාශියක් නඩත්තු කටයුතු තවමත් අවිධිමත් ආකාරයෙන් සහ ප්‍රමාණවත් නොවන ආකාරයෙන් සිදුවෙනවා. ඒකට ප්‍රධාන හේතුව පළාත් මාගර් සංවධර්න අධිකාරියට වෙන්වෙච්ච මුදල් ප්‍රතිපාදන ඉතාමත් අවම සීමාවක් තමයි පහුගිය අවසාන අවුරුදු කීපයේම ඒ වෙන්වෙච්ච මුදල් ප්‍රමාණය ඉතාමත් අවම මුදල් ප්‍රමාණයක් බවට පත්වෙච්ච නිසා ඒ මාගර් විශාල ප්‍රමාණයක් නඩත්තු කිරීමේ ගැටළු තියෙනවා. 2017 මැයි මාසෙ 25 වෙනිදා ඇතිවෙච්ච ගංවතුරෙන් පස්සෙ මේ මාගර්වලින් ගොඩක් මාගර් නැවත වතාවක් තිබුණු තත්ත්වයටත් වඩා විනාශ වුණා. ඒ විනාශ වෙච්ච නිසාවෙන් බරපතල ඛේදවාචකයකට පත්වුණා. ඒ මාගර් නඩත්තු කිරීම වගේම වෙනත් කාරණා. ඒ වෙලාවේ විනාශ වෙච්ච මාගර් පද්ධතිය සංවධර්නය කරන්න මධ්‍යම රජය යටතේ පැච් ඩැමේජ් ප්‍රෝගෑම් කියලා කියලා ගංවතුරින් හානිවෙච්ච මාගර් සංවධර්නය කිරීම සඳහා වෙන්වෙච්ච වෙනම ව්‍යාපෘතියක් ආවා. ඒ ව්‍යාපෘතිය ඇතුලේ මම හිතන්නෙ පාරවල් ගණනාවක් සංවධර්නය කරන්න වැඩ ආරම්භ කළා. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේත්, මාතර දිස්ත්‍රික්කයේත් මේ විශාල මාගර් ප්‍රමාණයක් සංවධර්නය කරන්න වැඩ ආරම්භ කළා. දකුණු පළාතේ විශේෂයෙන් ගාල්ල දිස්ත්‍රික්කයේත්, මාතර දිස්ත්‍රික්කයේත් තමයි මේ විශාල මාගර් ප්‍රමාණයක් දකුණු පළාත තුළ ක්‍රියාත්මක වුණේ. හම්බන්තොට පාරවල් ප්‍රමාණයක් තියෙන්න ඇති. ඒ මාගර් සංවධර්නය සඳහා අතරමැදි මුදල් ලැබෙනකොට දකුණු පළාත් මාගර් සංවධර්න අධිකාරිය මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්න මුදල් ප්‍රතිපාදන ලබාදෙන්න දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා සහ වෙනත් රැඳවියන් තුළ මුදල් ලැබෙනකොට ඒ මාගර් සංවධර්නය කිරීමේ ක්‍රමවේදය පිළිබඳව ඉහළ දෙපාතර්මේන්තුවලින් යම් ප්‍රශ්න කිරීමක් කළා. ඒ

ප්‍රශ්න කිරීමට ප්‍රධාන කාරණාවක් විදියට මා දකින විදියට තියෙන්නේ මේ සඳහා ඇස්තමේන්තුගත කරන්න ඒ වගේම කටයුතු කිරීම අධීක්ෂණය කිරීම සියල්ල කරන්නේ මාගර් සංවර්ධන අධිකාරිය. ඒ ව්‍යාපෘතියේ කොටසක් තියෙනවා උපදේශණය දෙන්න යම් ආයතනයක් නම් කරන්න ඕන. ඒ උපදේශණය දෙන ආයතනයත් දකුණු පළාත් මාගර් සංවර්ධන අධිකාරිය නම්කර නිසා එකම ආයතනයක් මේ කටයුතු දෙකම කිරීම විගණනයට ලක්වෙන කාරණාවක් විදියට මතුකරලා තිබුණා. නමුත් මේ අවාසනාවම කාරණාව තමයි මේ ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක දෙකේම මේ කටයුතු කළේ. හැබැයි ගාල්ල දිස්ත්‍රික්කයේ දෙවැනි පාර සංවර්ධනය කළා. ඒකට කිසිම ගැටළුවක් වුණේ නැහැ. හැබැයි මාතර දිස්ත්‍රික්කයේ මේ විගණන ප්‍රශ්නය බලපෑම නිසාවෙන් සංවර්ධනය කරන්න වැඩ ආරම්භ කරපු පාරවල් 2017 අවසාන වෙද්දි අතරමඟ නතර කළා. දැන් මේ අතරමඟ නතර කිරීමේ ප්‍රධාන වෙනකොට පාරවල් කාපට් කරන්න බඩු ගෙනත් දාලා ගෙවීම් කටයුතු කරලා සාමාන්‍ය තත්ත්වයට තිබ්බව හොඳ පාරවල් සභාපතිතුමනි, ඔබතුමා දන්නවා සාමාන්‍ය පාරක් කාපට් කරනකොට ඒ පාර ඩැමේජ් කරනවා. ඒ තියෙන පාරවල් ඩැමේජ් කරනවා. අර කාපට් එක හොඳට අල්ලන්න ඕන නිසා. දැන් එහෙම කරලා කාපට් කරන්න ඔන්න මෙන්න තියාගෙන යම් ප්‍රමාණයක් කාපට් කරලා තියෙද්දි ඒ පාරවල් ඉදිකිරීම නතර කළා. දැන් 2017 නොවැම්බර් මාසෙ දෙසැම්බර් මාසෙ වෙනකොට කරපු මේ කටයුත්ත දැන් අවුරුදු එකහමාරක් වෙනවා. අද වෙනතුරු ඒ සංවර්ධන කටයුතු නිමකරලා නැහැ. දැන් මේ කාරණාව මීට කලිනුත් මේ සභාවේ මේ මාස කීපයකට කලිනුත් ඒකෙන් පීඩාවට පත්වෙලා තියෙන කාරණාවන් දෙකක් සම්බන්ධව එකක් දෙණියාය පල්ලෙගම ඉඳලා මෙදේරිපිටිය දක්වා තියෙන පාර. ඒ මාගර්ය තමයි ගරු සභාපතිතුමනි, ලංකාවේ සිංහරාජයට පිවිසෙන්න තියෙන ප්‍රධාන පිවිසුම් මාගර්ය. අවුරුද්දකට දේශීය සහ විදේශීය සංචාරකයන් 25,000 ක් විතර විදේශීය සංචාරකයන් 15,000 ක් විතර ඒ ප්‍රවේශ මාගර්යට ඇතුල් වෙනවා. බරපතල පීඩාවට ලක්වෙනවා. ඒ මාගර්ය සහ විශේෂයෙන් මෙතන ඉන්න ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා හොඳින්ම දන්නවා ගරු සරත් යාපා මන්ත්‍රීතුමා ඇතුළු මාතර දිස්ත්‍රික්කයේ සරත්ද අල්විස් මන්ත්‍රීතුමන්ලා දන්නවා. තිබ්බොටුවාව දංකොළුව මාගර්ය දෙහිගස්පේ කොටසේ මාගර්යේ කොටසක් කාපට් කරගෙන ඇවිල්ලා අර මා කලින් කියපුව වගේ ඩැමේජ් කරපු කොටස නතර කරන්න සිදුවුණා මේ තීන්දුවත් එක්ක. දැන් ඩැමේජ් කරපු කොටසේ යම් ප්‍රමාණයක් විතරයි කළේ. ඒ නැවත ඇතිවෙච්ච ගංවතුරින් අද වාහනයක් තියා ගරු සභාපතිතුමනි, මිනිස්සුන්ට පයින්වත් යන්න බැරි තත්තවයට පාර විනාශ වෙලා දැන් අවුරුදු එකහමාරක් වෙනවා. මේකට පළාත් මාගර් සංවර්ධන අධිකාරියට කරන්න දෙයක් නැහැ. පළාත් මාගර් සංවර්ධන අධිකාරියට කරන්න දෙයක් නැහැ. මේකෙ තත්ත්වය වෙනස් කරලා නිත්‍යානුකූල තත්ත්වයන් වෙනස් කරලා කටයුතු කරනකොට මේකට ආපු මුදල් ටික ආපස්සට හැරිලා ගියා. ඒ ලැබිච්ච මුදල් ටික 2018 අවුරුද්දට ආවෙ නැහැ. 2019 දෙන්න පොරොන්දු වෙලා තියෙන කටයුත්ත මේ අයවැය සම්මත වෙන්න මේ අප්‍රේල් මාසෙ පස්වෙනිදාට කල්ගිය නිසා අතුරු සම්මත ගිණුම තුළ ඒක දෙන්න බැහැ කියන කාරණාව තමයි දිස්ත්‍රික් ලේකම්වරයා විසින් සඳහන් කරන්නේ. අතුරු සම්මත ගිණුම කාලසිමාව තුල අවිච්ඡේදයක් කරන්න බැහැ. තව අවුරුදු එකහමාරකින් මේක පීඩාවට ලක්වෙනවා. මාතර දිස්ත්‍රික් ලේකම්තුමාගෙන් මේක විමසනකොට එතුමා සඳහන් කළේ මේක සාමාන්‍ය ක්‍රමවේදයන් තුළ මේක ක්‍රියාත්මක වෙනවා නම් සැප්තැම්බර් මාසෙවත් ගතවේවි මේක සාමාන්‍ය ක්‍රමය තුළ ක්‍රියාත්මක කරන්න. දැන් මේ අවුරුදු දෙකකට අධික කාලයක් මේ පීඩාවට පත්වෙනවා. මේකට මම ස්තුතිවන්ත වෙනවා චන්දිම රාසපුත්‍ර විෂයභාර අමාත්‍යතුමාට. දකුණු පළාත් මාගර් සංවර්ධන අධිකාරියේ සභාපති අමිල විජේසිංහ මහත්මාට ස්තුතිවන්ත වෙනවා මේ මාගර් දෙකෙන් එක් මාගර්යක්, විශේෂයෙන්ම දෙණියාය පල්ලේගම මෙදේරිපිටිය මාගර්ය මම හිතන්නෙ අර ක්‍රමවේදය තුළ ක්‍රියාත්මක වුණා නම් අර කියනවා වගේ සැප්තැම්බර් මාසෙ දක්වා ක්‍රියාත්මක වෙන කටයුත්ත එතුමන්ලා පෞද්ගලිකව මැදිහත්වෙලා විශේෂයෙන් විෂයභාර අමාත්‍යතුමා සභාපතිතුමන් මැදිහත්වෙලා ඒ පාර අද පළාත් මාගර් සංවර්ධන අධිකාරිය මැදිහත්වීමෙන් සංවර්ධනය කරන්න පටන්ගෙන තියෙනවා. තව සල්ලි එනකම් වෙනත් ක්‍රමයකින් සල්ලි හොයාගෙන ඒ කටයුත්ත කරන්න මොකක්ද මම දන්නෙ නැහැ ක්‍රමවේදය මොකක්ද කියලා. ඒ කටයුත්ත ආරම්භ කරලා තියෙනවා, එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. දැන් ඒ හා සමානවම මගේ ඉල්ලීම ගරු සභාපතිතුමනි, මේ මොහොතේදී දෙහිගස්පෙ හරහා යන තිබ්බොටුවාව දංකොලුව මාගර්ය මේ මාගර්යත් කුමන් හෝ

ක්‍රමයකින් හැකි කඩිනමින් සංවර්ධනය කරලා දෙන්න කියලා කියනවා. මම මාගර් සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් ඉංජිනේරුතුමාගෙන් ඉල්ලුවා මේක හදනකම් අඩුම ගානෙ මේකෙ පැච් ටික හරි දාලා දෙන්න කියලා. අර ඩැමේජ් වෙච්ච කඩපු ටික පැච් ටික දාලා දෙන්න ගරු සභාපතිතුමනි, පුෂ් බයිසිකලයක්වත් යන්න බැහැ යටවෙනවා. මෝටර් බයිසිකලයක් යන්න බැහැ රිම් එක ඇද වෙනවා. ඒ කියන්නෙ එච්චර ඩැමේජ් කොටසක් තියෙනවා. මිනිස්සුන්ට හරියට පයින් යන්නවත් බැරි මාගර්යක්, කිසිම වාහනයක් යන්න බැරුව මිනිස්සු දහස් ගණනක් එහා මෙහා යන මාගර්යක්. ඒක නිසා සැප්තැම්බර් මාසෙ වෙනකම් මේ කටයුත්තට ඉන්න ගියොත් මේ කටයුත්තෙන් අවුරුදු දෙකක් පීඩාවට පත්වෙන නිසා ගරු සභාපතිතුමනි, ගරු විෂයභාර අමාත්‍යතුමා පළාත් සභාවේ කටයුතු අනිද්දාට අවසන් වෙනවා. නමුත් මාගර් සංවර්ධන අධිකාරිය පවත්වාගෙන යනවා. විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්තුමා මේ සභාව නිසා මේ සභාවේ ධූරකාලයේ ඉන්නවා. ඒ නිසා මේ සභාවේ විශේෂ අවධානයට යොමුකරලා මේ කටයුත්ත ඉතාමත්ම ඉක්මණින් පටන් ගන්න. අලුත් අවුරුදු සමය එනවා, මිනිස්සු බරපතල පීඩාවන්ට ලක්වෙනවා. මේ චෝදනාවන් පළාත් සභාවට අම්මා මුත්තා සියල්ලන්ටම බැන බැන ඉන්නවා මේ කාරණාව නිසා. ඒ නිසා අඩුම ගානෙ මුල් වටේදි හරි පැච් ටික දාලා පිළිසකර කරලා දෙන්න. ඒ කටයුත්ත නියමානුකූල කරනකම් පළාත් සභා මට්ටමින් කරන්න පුළුවන් දේ අර දෙණියාය මෙදේරිපිටිය පාර හරිගස්සන වැඩේ කරන්න කියන කරුණ අවධානය යොමු කරනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමත් පෞද්ගලිකව මොකද අපි අනිද්දා ගියාට පස්සෙ අපිට ඉන්නෙ ඔබතුමා විතරයි. ගරු සභාපතිතුමනි, ඔබතුමා කවද පළාත් සභා තිබ්බත් ආණ්ඩුකාරතුමා ගාව ඔබතුමාට මේක කරන්න තියෙන්නෙ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාටත් බලයක් නිමර්ාණය වෙන කාලයක්. අපිට මේ පළාත් සභාව විසුරුවාට පස්සෙ අපිට යම් ප්‍රශ්නයක් කියන්න කෙනෙක් නැහැ. සම්බන්ධීකරණ කමිටුවට ගිහිල්ලා විපක්ෂනායකතුමනි, මිනිස්සුන්ගේ ප්‍රශ්න විසඳන්න හම්බ වෙන්නෙ නැහැ. මිනිස්සුන්ගේ දුක් ගැනවිලි කියන්න ඉඩකඩක් හම්බ වෙන්නෙ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපට ඉන්න දුක්ගන්නාරාළ ඔම්බුඩ්ස්මන්ට්වරයා විදියට ඉන්නෙ ගරු සභාපතිතුමනි, පළාත් සභාව ස්ථාපිත කරනකම් ඔබතුමා. ඒ නිසා මේ මොහොතේ ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා මෙතනත් සඳහන් වෙච්ච කාරණාවක්. මේ මෙතන ඉන්න මහජන නියෝජිතයන්, මහජන නියෝජිතයන් සේ සළකලා ඒ වැටුප් ගෙවන කාරණා නෙවෙයිනේ කියන්නෙ. අපේ ඉල්ලීම් සහ අපේ කාරණා ඇහුම්කන් දෙන්න කියලා මේ නිලධාරීන්ගෙන් ගෞරවයෙන් ඉල්ලුවා. අපේ මනෝජ් සිරිසේන මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ නිලධාරීන්ට ප්‍රධාන ලේකම්තුමා ඇතුළු පළාත් සභාවේ අපේ සියළුම නිලධාරීන් අපිට දීඝර් කාලයක් වැඩ කරපු අය. ඒ නිසා අපි කියන්නෙ මිනිසුන්ගේ දුක්ගැනවිල්ලක් ප්‍රශ්නයක් යම් සහනයක් දෙන්න ඕන මිසක් වැරදි දේවල් කවදාවත් කියන්නෙත් නැහැ. ඒ නිසා ඒ මිනිසුන්ගේ ප්‍රශ්න පිළිබඳව යම් ප්‍රමාණයකට මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරු 55 දෙනාටම ඒ ඉල්ලීම්වලට ඇහුම්කන් දෙන්නත් නිලධාරීන්ගෙන් ගෞරවයෙන් ඉල්ලමින් ඒ ඇහුම්කන් දීමේ අපේ දුක්ගන්නාරාළ විදියට ඔම්බුඩ්ස්මන්ට්වරයා විදියට ගරු සභාපතිතුමනි, ඊළඟ පළාත් සභා මැතිවරණය තියනකම් ඔබතුමා කටයුතු කරලා මේ ප්‍රශ්න පිළිබඳව ඔබතුමාට ලිඛිතව දැනුම් දෙන්නම්. හිටපු මන්ත්‍රීවරුන්, හිටපු ඇමතිවරුන් විදියට. අපිට ඒකට අයිතියක් තියෙනවා. මේ පළාත් සභාව තුළින් කෙරෙන්න ඕන යම් කාරණාවක් තියෙනවා නම් යම් යම් දේ සම්බන්ධව ඔබතුමාට අපි දැනුම් දෙන්න සූදානම් වෙනවා. ඔබතුමා මේ සම්බන්ධව යම් මැදිහත්වීමක් වෙන්න. සමහර විට පහුගිය කාලෙ කරගන්න බැරිවෙච්ච දේවලුත් ඔබතුමා ලච්චා කරගන්න පුළුවන්. මේ ආණ්ඩු පක්ෂයේ ඉඳලා කරගන්න බැරිවෙච්ච දේවල් සමහර විට කරගන්න පුළුවන්කම ලැබේවි. ඔබතුමා හරි මැදිහත්වීමක් වුණෝතින්. ඒ නිසා මේ කාරණාව සම්බන්ධවත් ඔබතුමා 10 වෙනිදයින් පස්සෙ 55 දෙනාගේ අයිතිකාරයා බවට පත්වෙන වෙලාවේ මේ කාරණාව ඔබතුමා ප්‍රමුඛ කාරණාවක් බවට පත්කරලා පළාත් මාගර් සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා ඉතා මැදිහත්වීමක් වුණා මේ කාරණාව සම්බන්ධව. ඔබතුමාගේ අවධානයත් අවධානය යොමු කරලා මේ කාරණාව යොමු කරනවා. බොහොමත්ම ස්තුතියි ඉඩකඩ ලබාදීම සම්බන්ධව.

ලාල් ප්‍රේමනාත් මහතා:- ගරු සභාපතිතුමනි, චූටි අදහසක් ප්‍රකාශ කරන්න ඕන මගේ නමත් කියවුණ නිසා. එකක් මේ අවස්ථාව ගන්න හදන්නෙ. ඒ පාර කෙරුණ එකේ ප්‍රධාන හේතුව තමයි මහා දැවැන්ත උද්ඝෝෂණයක් කළා ඒ පැත්තෙ කට්ටිය

එකතු වෙලා වටේ තියෙන සියළුම පාරවල් වහලා. තුන් හතර දෙනෙක් පොලිස් අත්අඩංගුවටත් පත්වුණා. එහෙම කරලා සතියයි ගියේ. පාර හැදුවා. කොහොමද මේ උද්ඝෝෂණවලින් හදන්න පුළුවන් පාරවල් අලුතින් ඇයි හැදුවෙ නැත්තෙ. මෙතන තියෙන්නෙ වෙන ප්‍රශ්නයක්, සරළ ප්‍රශ්නයක්. තිබුණාට මේක විසඳන්නෙ නැහැ. උද්ඝෝෂණයක් වෙන්න ඕන පාර හැදෙන්න.

සභාපතිතුමා:- චමිලි විතානාච්චි සභානායකතුමා.

චමිලි විතානාච්චි මහතා(සභානායක):- ගරු සභාපතිතුමනි, මම ස්තුතිවන්ත වෙනවා පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම් යටතේ මගේ අදහස් කීපයක් දක්වන්නට අවස්ථාව ලබාදීම පිළිබඳව. ගරු සභාපතිතුමනි, මට පෞද්ගලික කරුණු කිසිවක් නැහැ. මොකද අපි පසුගිය කාලසීමාව තුළ පෞද්ගලික කරුණු රාශියක් මේ සභාවට කිව්වා. එකක්වත් වැඩක් වුණේ නැහැ. මේ වෙලාවේ අද දවසේ මේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීමේ කාරණාවත් එක්ක ඉන්නෙ කට්ටියට ස්තුති කරන්න. ඒ මගේ පෞද්ගලික කාරණාවක් හින්දා. මොකද අපි මේ සභාවේ කාලය තුළ මේ සභාව තුළ ඔබතුමා දුන්න සහයෝගය මේ වෙලාවේ සභාවේ අපේ අදහස් ප්‍රකාශ කරන්න බොහෝ සභාවල අපි අදහස් ප්‍රකාශ කළා. ඔබතුමා දුන්න සහයෝගය අපි ඉතාමත්ම ගෞරවයෙන් සිහිපත් කරනවා. ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම අපි මේ පළාත් සභා කාලය තුළ විවෘත හදවතින් විවිධ ප්‍රශ්න මේ සභාව හමුවේ මේ ගෙවී ගිය වසර පහ තුළ මේ සභාව තුළ බොහෝ වෙලාවට සිදුවුණා. ප්‍රධාන හේතුව දේශපාලන වෙනසත් එක්ක සභාපතිතුමනි, අපේ ආණ්ඩු පක්ෂයේම යම් යම් කොටස් අපි සංශෝධනය කරමින් හිටියා. ආණ්ඩු පක්ෂය තුළ විවිධ ප්‍රශ්න ගැටළු රාශියක් මතුවුණා. මේ විරුද්ධ පක්ෂය ලබාගත්ත දේ තමයි අපි සමහරක් වෙලාවට අපේ ආරියතිලක ඇමතිතුමාගේ වැය ශීෂර්යත් පරාජය කළා. සමහරක් වෙලාවට අපි ඇමතිවරුන්ට විරුද්ධව කතා බහ කළා. සමහරක් වෙලාවට අපි ඡන්දය නොදී හිටියා. ඒවා සමහර වෙලාවට ගරු සභාපතිතුමනි, බොහෝ වෙලාවට මෙතන තිබ්බ්ච යම් දේශපාලන කාරණාත් එක්ක අපිට ඒ යම් යම් දේශපාලන තීන්දුවලට එන්න සිදු වෙච්ච නිසා නොයෙකුත් ගැටළු ප්‍රශ්න වලට මුහුණ දෙන්න සිදුවුණා. ඒ සිදුවීම තුළ කොහොමවුණත් අපේ මේ කාලසීමාව තුළ මේ අවුරුදු කාලසීමාවේ අවුරුදු පහ මේ පළාත් සභාවේ වෙනසකට භාජනය නොවී,දැන් ඌව පළාත් සභාව එහෙම වෙනසකට භාජනය වුණා. නමුත් දකුණු පළාත් සභාවෙ එහෙම වුණේ නැහැ. මේ පළාත් සභාව පවත්වාගෙන යන්න අපේ පොහොට්ටුවේ නියෝජනය කරන මන්ත්‍රීවරු විදියට අපි විශාල සහයෝගයක් අපේ ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රධාන ගරු ඇමතිවරුන්ට ලබාදුන්නා. ඌව පළාත් සභාවේ 2015 ජනවාරි 08 වෙනිදා සිදුවෙච්ච වෙනසත් එක්ක පළාත් සභාවත් වෙනසකට භාජනය වුණා. ඒකට අහුවුණේ නැහැ ගරු සභාපතිතුමනි. ඒ නිසා දකුණු පළාතේ ආණ්ඩු පක්ෂයේ ඉඳගෙන ආණ්ඩු පක්ෂය තුළ ඉඳගෙන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත් එක්ක මත ගැටුම් ආණ්ඩු පක්ෂ කණ්ඩායම රැස්වීමේදි මේ දේවල් විසඳගත්ත නිසා මේ සභාවට යම් යම් දේවල් ආවා මිසක් මීට වඩා එහා ගියපු අපේ කණ්ඩායම් හැඟීම කණ්ඩායමේ වගකීම අපි කොහොම හරි ආරක්ෂා කරන්න අපි හැමදාම කටයුතු කළා ගරු සභාපතිතුමනි. ඒ වගේම ඒ හිටිය අවුරුදු පහ තුළ මම හිතන්නෙ දකුණු පළාත් සභාවේ පළාත් සභා මන්ත්‍රීවරු මුහුණ දුන්න ප්‍රශ්න ගැටළු අනන්තයි. දකුණු පළාත් සභා මන්ත්‍රීවරුන්ට සභාපතිතුමනි, හරියට අපිට මුදලක් ලැබුණෙ නැහැ ඇත්තටම. මුදලක් ලැබුණෙ නැහැ. ගරු සභාපතිතුමනි, අපේ විදේශ සංචාරය තනිකරම නැවැත්තුවා. අපේ වාහන පමරීට් එක දුන්නෙ නැහැ. මෙවැනි ගැටළු රාශියකට පළාත් සභාවේ මන්ත්‍රීවරු සම්ප්‍රදායිකව අපට ලබාදුන්න දේවල් අපිට කප්පාදු කළා, අපිට අහිමි වුණා. ඒ සියල්ල අපි ඉවසගෙන මේ සභාව තුල සුහදත්වයෙන් දකුණු පළාත් ප්‍රධාන ඇමතිතුමා සභාව තුළ සුහදත්වයෙන් දකුණු පළාත් ප්‍රධාන ඇමතිතුමා ආරියතිලක ඇමතිතුමා ඒ වගේම මනෝජ් ඇමතිතුමා රාසපුත්‍ර ඇමතිතුමා, ගුණසේන ඇමතිතුමා එක්ක කටයුතු කළා. අපිට මගේ දේශපාලන ඉතිහාසයේ දකුණු පළාත් සභාවේ අපට මුහුණ දෙන්න වුණේ මාසයයි. අපේ දක්ෂ ඇමතිවරු දෙන්නෙක් කලින් වැඩ කළා. ඩී.වී. උපුල් ඇමතිතුමා අද වීරසුමන වීරසිංහ ඇමතිතුමා ඒ අයින් කළේ, එහෙම නැත්නම් මේ පළාත් සභාවේ යම් යම් පළාත් සභාවල පාඩුකරලා පළාත් සභාව නැති නාස්ති කරලා මේ වගේ දේශපාලන වාතාවරණ හින්දා එතුමන්ලාට ගෙනෙන ලද ඒ පුටු දාලා යන්න සිදුවුණා. නව කෙනෙක් මේකට පත්වුණා. හැබැයි ඒ පත්වෙච්ච ඇමතිවරු දෙන්නත් අපිත් එක්ක ටික කාලයක් ඒ මන්ත්‍රීවරුන් එක්ක කටයුතු කරපු හින්දා අපි ඒ දෙන්නට ඒ මුල් අවස්ථාවේ එතුමන්ලාට කරගෙන යන්න ඉඩදීලා ඒවාට විරෝධය පානවද ඒවාට

ආරක්ෂකයින් ඒවාට කරගෙන යන්න ඉඩදීලා අපේ පැත්තෙන් අද අපේ සහයෝගය ලබාදුන්නා ගරු සභාපතිතුමනි. මේ වෙලාවේ ඒක සිහිපත් කරනවා. මේ දකුණු පළාත් දේශපාලන ඉතිහාසයේ මේ ගෙවී ගිය වසර පහ තමයි මේ ආණ්ඩු පක්ෂයට තියෙන දරුණුම ප්‍රශ්නයකට ගැටළුවකට මුහුණ දුන්න පළාත් සභා ඉතිහාසයේ හිටිය අවුරුදු පහ තමයි අපේ ආණ්ඩු පක්ෂයක් විදියට මුහුණ දෙන්න මේ එක්සත් ජනතා නිදහස් සන්ධාන කණ්ඩායම. ගරු සභාපතිතුමනි, විපක්ෂනායකතුමා, විපක්ෂ සංවිධායකතුමා බොහොම සුහදත්වයෙන් ඒ වගේම නලින් හේවගේ මන්ත්‍රීතුමා ප්‍රධාන අය අපි සියළුදෙනාම මෙතන වාද විවාද කර ගත්තත් අපි එළියට ගිහිල්ලා, මෙතනින් එහාට ගිහිල්ලා ඒ වාද විවාද පැත්තකට දාලා සහෝදරත්වයෙන් අපි මහත්වරු විදියට සභාවේ හිටපු කණ්ඩායමක් මෙවර පළාත් සභාවේ හිටියා කියන බොහොම සතුටින් මතක් කරනවා. අපි අනන්ත ප්‍රශ්න ගැටළු ඇතිකර ගත්තා. අපි බැන ගත්තා, වාද විවාද කර ගත්තා. පළමුවෙන් සියල්ල අමතක කරලා අපි එළියට ගියාම අපි පහුගිය කාලසීමාව තුළ වැඩ කළා. ඒ වගේම ගරු සභාපතිතුමනි, ප්‍රධාන ලේකම්තුමා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරු හතරදෙනා ඒ වගේම පළාත් අධ්‍යක්ෂකතුමන්ලා, අධ්‍යක්ෂකතුමිය නිලධාරීන් අපේ සියළුම ක්ෂේත්‍රවල නිලධාරීන් දකුණු පළාත් සභාවේ ඒ වගේම සභාලේකම්තුමා ඒ වගේම සභාවේ නිලධාරීන් මේ අපිට පහුගිය කාලෙ අපිත් එක්ක බොහොම සුහදත්වයෙන් කටයුතු කරපු බවත් අපේ අදහස් ප්‍රකාශ කරන්න තමයි පෞද්ගලික කරුණු යටතේ අපි මෙය අවස්ථාවක් කරගත්තෙ. වීරසුමන මන්ත්‍රීතුමා කියූ විදියට හෙටින් පස්සෙ ඔබතුමා තමයි බලධාරියා මෙතන. ඔබතුමා වාසනාවන්තයි. සමහරක් විට මට මතකයි ඔබතුමා ඇමතිකමක් බලාපොරොත්තුවෙන් හිටියා අපේ ඒ කාලෙ. හිතේ අමනාපයෙන් හිටියෙ. පොඩි වේදනාවකුත් තිබුණා. හැබැයි බලනකොට මේ ඔක්කොටම මාස 15 ක් 16 ක් යනකම් ඔබතුමා තමයි ජයග්‍රහණය කරපු ජයග්‍රාහකයා. අමාත්‍යාංශයකට ගියා නම් ඒක වෙන්නෙ නැහැ.දැන් ඔබතුමාට අවුරුදු එකහමාරක් විතර කරගෙන යන්න පුළුවන්. ඒ කරගෙන යනකොට අපිව අමතක කරන්න එපා. අපේ ප්‍රශ්නවලටත් මැදිහත්වෙලා රටේ මහජන නියෝජිතයින් විදියට අපේ මන්ත්‍රිකම නැතිවුණාට මිනිස්සු අපිව අමතක කරන්නෙ නැහැ. එහෙම ඉන්න කියලා කියනකොට සමහර වෙලාවට ඔබතුමා හරහා යම් යම් දේවල් කරන්න පුළුවන්. කට අපට සහයෝගය ලබාදෙන්න. කාලයක් අපිට හිටිය හිතවත්ම මන්ත්‍රීවරයා සභාපතිවරයා. ඒක මතක් කරන්න ඕන බොහොම ගෞරවයෙන්. මොකද කාලයක් තිස්සේ අපි එකට හිටියෙ. ඒ නිසා ඒක මතක් කරමින් මේ වෙලාවේ අපට සහයෝගය ලබාදුන්න දකුණු පළාත් සභාවේ සියළුම පළාත් සභාවේ ලේකම්තුමා ඇතුළු ලේකම්තුමාත් පුදුම සහයෝගයක් ලබාදුන්නෙ සභාවේ ඉදන්. ඒ වගේම අපි මේ අංශය ආරක්ෂාව සම්බන්ධව මේ ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධව මේ අපේ සභා ගොඩනැගිල්ල මේ අවුරුද්දේ මේ අපේ නේවාසිකාගාරය මේ පළාත් සභාවට යම් යම් දේවල් එකතුවුණා. ඒ ගැනත් මේ වෙලාවේ මතක් කරමින් අපට සහයෝගය ලබාදුන්න සියළුම දෙනාට මේ වෙලාවේ අපේ හිටපු ජනාධිපතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමා අපේ පොහොට්ටුවේ කණ්ඩායමේ නායකයා විදියට අජිත් රාජපක්ෂ මැතිතුමා ඇතුළු සියළුම දෙනාම සිහිපත් කරමින් සභාව අවසන් වුණත් අපි ප්‍රාථ්ර්නා කරන්නෙ.මේ සියලු දෙනා, අපි බලාපොරොත්තු වෙනවා ඊගාව කොයි මොහොතක මැතිවරණයක් තිබේය කියා, නැවත මේ පළාත් සභාව නියෝජනය කරන්න ඉඩ ප්‍රස්ථාව අපේ හදවතේ තියෙනවා. එසේ ප්‍රකාශ කරමින් මැතිවරණ එන තෙක් ජනතාව ඉන්නවා. නිකම් ඉන්නෙ නැහැ. ජනාධිපතිවරණය පස්සට දානවා කියලා. මැතිවරණයක් නැති කොම්ෂමක දේශප්‍රිය මහත්තයා දකුණු පළාතේ අපේ අම්බලන්ගොඩ. එතුමා ඉතිහාසයට එක්වෙයි කියලා අපේ බලාපොරොත්තුවක් තියෙනවා. එසේ ප්‍රකාශ කරමින් සියළු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාථ්ර්නා කරමින් මම නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

සභාපතිතුමා:- සභානායකතුමාට බොහොම ස්තූතියි. චන්න සාලිය මන්ත්‍රීතුමා.

චන්න සාලිය මහතා:- ගරු සභාපතිතුමනි, පෞද්ගලික කරුණු යටතේ ඔබතුමා අවස්ථාව ලබාදීම සම්බන්ධව මම ස්තූතිවන්ත වෙනවා. මම අවධානය යොමු කරන්නෙ ගරු සභාපතිතුමනි, පහුගිය වසර පහකට ආසන්න කාලය තුළ ගරු සභාපතිතුමනි, පළාත් සභාවේ විශේෂයෙන්ම ගරු මහඇමතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලය ඒ වගේම විපක්ෂ අපේ ගරු නායකතුමා විශේෂයි. විපක්ෂනායකතුමා අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මගේ මාමා, ඇතුළු විපක්ෂයේ අපේ

සියළු සහෝදරයන් එක්ක මේ අවුරුදු පහකට ආසන්න කාලයක් මේ පළාතේ ජනතාව වෙනුවෙන් සේවා සපයන්න, යටිතල පහසුකම් සපයන්න සහ අනෙකුත් උපකාර කරන්න කටයුතු කළා. නමුත් අපි ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම මෙතන අපේ ගරු අමාත්‍යවරු නැහැ. සිරිසේන ඇමතිතුමා මේක තොප්පිය දාගන්න එපා ගරු ඇමතිතුමනි. ඔබතුමා ජනතාවත් එක්ක ඉන්න ඔබතුමාට මම මේ කතා කරන්නෙ. ඔබතුමාට නෙවෙයි. ගරු සභාපතිතුමනි, අපි පහුගිය කාලෙ විශේෂයෙන්ම අපේ ගරු සම්මු ආරියවංශ මැතිතුමා එතුමා ජාතික ප්‍රතිපත්තියක් ගැන කතා කළා. ජාතික ප්‍රතිපත්තියේ හොඳ යෝජනා ඉදිරිපත් කළා. නමුත් අපි හිතුවා මම හිතුවා මේ යෝජනා ටික මධ්‍යම රජයේ නෙවෙයි මුලින්ම පළාත් සභාවෙන් පටන් ගනියි කියලා. මම හිතුවා අදින් අවසන් වුණාට පස්සෙ ආරම්භ වුණ කාලෙදි මේ ජාතික ප්‍රතිපත්තිය පළාත් සභා ප්‍රතිපත්තියක් විදියට අඩු ගානෙ අමාත්‍යාංශ මට්ටමින් පටන් ගනියි කියලා. එහෙම එකක්වත් පේන්නෙ නැහැ ගරු සභාපතිතුමනි, ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි දිගින් දිගටම කතා කළා පෙර පාසැල් අධිකාරියක අවශ්‍යතාවය. එහෙම එකකුත් පේන්න නැහැ ගරු සභාපතිතුමනි, කීප විටෙක අපි යෝජනා කළා ගරු සභාපතිතුමනි, ආපදා කළමනාකරණ ඒකකයක් මේ දකුණු පළාත තුළ පිහිටුවන්න ඕන කියලා. හදිසි ආපදාවක් වුණාම ඒක ගංවතුරක්ද, ඒක සුළි සුළඟක්ද, ඒක මුහුද ගොඩ ගැලීමක්ද ඒක නැත්නම් වෙනත් විදියකින් ආපදාවක්ද ඒ ආපදාවට මුහුණ දෙන්න පළාත් සභාව තුළින් ආපදා ඒකකයක් පිහිටුවීම ඒ ඒකකය යොමුකරලා ඒ ඒකකයේ නිලධාරීන්ට ඒ ඒකකයේ නිලදාරීන්ට සම්පත් යවලා මේ පළාත්සභාවේ ඒ ඒකකය තුළින් කටයුතු කරන්න තිබුණා ගරු සභාපතිතුමනි, ඒ එහෙම වුණා හරි නැතා හරි අපි මේ පහුගිය කාලෙ මේ කටයුතු කළා ගරු සභාපතිතුමනි. ඒ එක්කම කියන්න කැමතියි අපේ දකුණේ ජනතාව බලාපොරොත්තු වුණා එතුමන්ලාගේ යටිතල පහසුකම් දියුණුව, සේවා දියුණුව. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, පහුගිය අවුරුදු පහ තුළ අපේ ගරු නලින් හේවගේ මන්ත්‍රීතුමාත් දිගින් දිගටම සටන් කළා. මොකක්ද ගරු සභාපතිතුමනි, සම්මාන සහ උත්සව සඳහා අපේ ජනතාව කියනවා කෝටි මිලියන වලින් කිව්වොත් 150 ක් 200 ක් විතර වියදම් කළා ගරු සභාපතිතුමනි. නමුත් බස්නාහිර පළාත් සභාව අපේ පළාත් සභාවට වඩා ආදායම වැඩි පළාත් සභාව. නමුත් ඒකෙ මේ තරම් මුදල් සම්මාන දෙන්න උත්සව සඳහා වියදම් කළේ නැහැ ගරු සභාපතිතුමනි. ඒත් ජනතාවගේ සල්ලි. අපේ සල්ලි නෙවෙයි. මේ මහජන නියෝජිතයින් පත්වුණාම අපි වැඩ කළ යුත්තේ ඔවුන්ගේ අවශ්‍යතා ගැන හිතලා වුණත් මේ උත්සව සම්මාන සහ මේ වෙනුවෙන් නෙවෙයි ගරු සභාපතිතුමනි. එමනිසා විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, ඒ එක්කම මම මතක් කරනවා ගරු සභාපතිතුමනි, අපේ විපක්ෂනායකතුමාත් ඉන්න වෙලාවේ මම හැමදාම කිව්වෙ ගරු සභාපතිතුමනි, සමහර විට මේ පළාත් සභාව තුළින් අපි ලබන පාර මේ සභාවට එන එකද නැති එකද නෙවෙයි ගරු සභාපතිතුමනි, අපි මහජන නියෝජිතයො හැටියට අපිට අසාධාරණයක් වුණා. මේ සම්බන්ධව අවස්ථාව දෙන්න ඕන. එතෙන්දි ඔබතුමා ගරු සභාපතිතුමා විදියට වරප්‍රසාද කමිටුවේදී ඒ මහජනතා නියෝජිතයින්ගේ වරප්‍රසාද සඳහා කටයුතු කළා. ඒ නිසා අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත් එක කරුණක් තියෙනවා. මම මේ කරුණු කියන්නෙ හිතේ දුකේ වේදනාවෙන් නෙවෙයි. මම දුක් වෙන්නෙත් නැහැ, හිනා වෙන්නෙත් නැහැ. පළාත් සභාවේ ගරු අමාත්‍යවරු රැකියා ලබාදෙන කොට ගරු සභාපතිතුමනි, අපිට විශේෂයෙන්ම අපට කරපු සැළකිල්ල මම නම් ගණන් ගන්නෙත් නැහැ. මේවාට දුක් වෙන්නෙත් නැහැ. හැබැයි එහෙම නෙවෙයි ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි දන්නවා ගරු සභාපතිතුමනි, මහජන නියෝජිතයෙකුට පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකුට ආණ්ඩු පක්ෂ සාමාජිකයෙක් වෙනකොට අපිට ලැබිය යුතු දෙයක් තියෙනවා. ඒ ලැබිය යුතු දේ නොලැබෙනකොට තමයි අපි මේවා කතා කරන්නෙ ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි දන්නවා ගරු සභාපතිතුමනි, රැකියා දුන්නෙ දන්සැල් දීලා. මම කියන්න ඕන අපේ ප්‍රධාන අමාත්‍ය සෞඛ්‍ය ඇමතිතුමා විදියට මම හිතනවා රෝහල්වල ඉඩ නැහැ. ඒ කාඩර් එකක් නැහැ. නමුත් පසුගිය සතියේ විතරක් දුන්නා. සතියකට 250 ක් දුන්නා. නමුත් සභාපතිතුමනි, දෙන්නෙ නැහැ. අපි දිය යුත්තේ දකුණු පළාතේ පුරවැසියෙකුට. නමුත් ඒක දෙන ක්‍රමවේදයක් තියෙනවා. අපේ ඇමතිතුමාගේ කාලය අවසන් කලා අපේ කාලය ඉවරයි කියලා අමාත්‍යාංශ විදියට මුදල් නැත්නම් ජනතාවගේ මුදල් කාබාසිනියා කරලා මේ රැකියා දීම තමයි විරුද්ධ ගරු සභාපතිතුමනි, ඒකනිසා අපි කියනවා එතුමා රැකියා ලබලා දීලා පසුගිය සතියේ ගරු සභාපතිතුමනි, රැස්වීම් මාලාවක් කළා. එක රැස්වීමකට සෙනඟ එකොළහයි හිටියෙ. අනිත් රැස්වීම පටන් ගන්න

කලින් ගිනිමැල්ලගහ අපේ අධිකාරියේ සභාපති නිහාල් මහත්තයාගේ ඉස්සරහ තුන්දෙනයි හිටියෙ රැස්වීම පටන් ගන්න බැරුව. ඔහොම තමයි. ඕක තමයි යහපාලන ගතවීමේ ප්‍රතිඵලය. ඒකනිසා අපි කියනවා ගරු සභාපතිතුමනි, අපේ පත්වන අනාගත පොහොට්ටුවේ මහඇමතිතුමා මෙතන ඉන්නවා. අපේ පත්වන අනාගතයේ අධ්‍යාපන ඇමතිතුමා සෞඛ්‍ය ඇමතිතුමා මෙතන ඉන්නවා. එතකොට හරි අපිට සාධාරණයක් ඉෂ්ඨ කරන්න කියලා තමයි ඉල්ලන්නෙ ගරු සභාපතිතුමනි, ඒකනිසා ජනතාව බලන් ඉන්නවා සභාපතිතුමනි, ඒක පෙන්නලා මෙතන මහඇමතිතුමා නැති තැන කියන එක හරි නැහැ. මම නැති තැන කතා කරන්නෙ නැහැ. ඒකනිසා මම ඒ කතා කරන එක හරි නැහැ. ඒකනිසා මම ඒ ගැන කතා කරන්නෙ නැහැ. ඒක නිසා ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මෙතන ඉන්න අපේ අධ්‍යාපන ඇමතිතුමා මෙතනින් පත්වෙන අලුත් මහඇමතිතුමා අලුතින් පත්වන කෘෂිකමර් ඇමතිතුමනි, මින් ඉදිරියට මෙහෙම වැඩ කරන්න එපා. අපේ සෝ්ඨාභය රාජපක්ෂ මැතිතුමාගෙ කාලෙ ඇවිල්ලා මේ කරන වැඩපිළිවෙලේදී සාධාරණ ඉල්ලීමක් කරනවා. එහෙම නැතුව මංගල සහෝදරයාට 250 යි, අර ඇමතිතුමාට 25 යි දෙනකොට අපේ සන්ධානයට මොකද වෙන්නෙ. සන්ධානයක් නැහැ දැන්. බුලත් කොලෙන් පත්වුණේ. මාතර, ගාල්ල, හම්බන්තොට දිස්ත්‍රික්කවලට පළාතටම වැඩ කරන්න සාධාරණයක් මේ පළාතට කරන්න. මම ඉල්ලීමක් කරනවා. අපේ ඊෂ්‍යාර්ාවක් නැහැ. ඔබතුමන්ලාගේ යූ.එන්.පී. ආණ්ඩුවක් තිබුණා නම් යූ.එන්.පී. පළාත් සභාවක් තිබුණා නම් අපේ මන්ත්‍රීවරුන්ට රැකියාවක් නෙවෙයි, අමාත්‍යාංශ දොරෙන් ඇතුලට ගන්නෙ නැහැ. ලියුමක්වත් ගහගන්න. පහුගිය කාලෙ ඔබතුමන්ලා අපිට කියන්න එන්න එපා. යූ.එන්.පී. පළාත් සභාවක් තිබුණා නම්,

එස්. තෙන්නකෝන් නිලමේ මහතා(විපක්ෂනායක):- එම්.එස්. අමරසිරි මහඇමතිතුමා මේ පළාත් සභාවේ මහඇමතිවරයා හැටියට හිටියා. අපේ බී.වයි. තුඩාවේ විපක්ෂනායකතුමා ඒ කාලෙ හිටියෙ. විපක්ෂනායකතුමාට විපක්ෂයට කරන්න පුළුවන් උපරිම, ආණ්ඩු පක්ෂයට වගේම මේ පළාත් සභාව තමයි ... (සභාවේ සෝෂා) ..........

වීරසුමන වීරසිංහ මහතා:- එහෙම තමයි. එහෙම යූ.එන්.පී. එකක් ඉස්සර තිබුණා. දැන් එහෙම එකක් නැහැ.

චන්න සාලිය මහතා:- ඒකනිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා කාලවේලාව ලබාදීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. එමනිසා මේ ලබන අලුත් අවුරුද්දයි ලබන පාලන කාලයේදී අපේ දකුණු පළාතේ ජනතාවට සෙතක් වේවා! කියලා ප්‍රාථර්නය කරමින් ලබන්නාවූ නව වසර විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, සභා ගහර්යේ සිටින ඔබතුමාටත් මහජන ඉල්ලීම් අයිතීන් ආරක්ෂා කිරීමට ඔබතුමාටත් ගරු ප්‍රධාන ඇමතිතුමා ඇතුළු ඇමති මණ්ඩලයටත් විපක්ෂනායකතුමා ඇතුළු අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු සියළුම පක්ෂ විපක්ෂ මන්ත්‍රිවරුන්ටත් ලබන්නාවූ නව වසර සුභ නව වසරක් වෙන්න කියලා. අමාත්‍යාංශ ලේකම්වරු. අපේ සභාලේකම්තුමා ඇතුළු කායර් මණ්ඩලය, අනිත් අධ්‍යක්ෂකවරු සියළු දෙනාටම සුළු සේවක මහත්තයා දක්වා මාධ්‍යවේදී මහත්තයා දක්වා සියළු දෙනාටම ලබන්නාවූ නව වසර සුභ අලුත් අවුරුද්දක් වේවා! කියලා ප්‍රාථර්නය කරනවා. හැබැයි ලබන පළාත් සභා කාලය මම නම් කියන්නෙ මීට වඩා ස්වණර්මය වූ ජනතාවට වැඩ කරන පොහොට්ටුවේ පාලන කාලයක් ලැබේවා කියා ප්‍රාථර්නා කරමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

සභාපතිතුමා:- නිවේදනයක් තියෙනවා. ප්‍රගති සමාලෝචන රැස්වීම සහ ක්‍රිකට් තරගය. 2019.04.10 වෙනි දින දකුණු පළාත් සභාවේ නිල කාලය අවසන් වන බැවින්, දකුණු පළාත් සභාවේ ගරු ඇමතිතුමන්ලා ගරු මන්ත්‍රීතුමන්ලා හා ඔවුන්ගේ පෞද්ගලික කායර් මණ්ඩලය හා දකුණු පළාත් මාණ්ඩලික ජෝෂ්ඨ නිලධාරීන් හා ප්‍රගති සමාලෝචන රැස්වීමක් හා රාත්‍රි භෝජන සංග්‍රහයක් 4.8 වන දින කොග්ගල නිදහස් වෙළඳ කලාපය, බීච් රිසෝට් හෝටලයේදී පැවැත්වීමට යෝජනා කොට ඇත. ඊට සමගාමීව දිවා කාලයේදී කොග්ගල නිදහස් වෙළඳ කලාප ක්‍රීඩාංගනයේදී ක්‍රිකට් තරගයක් පැවැත්වීමට කටයුතු සූදානම් කොට ඇත. ඒ අනුව ඉහත කටයුතු සංවිධානය කිරීම පිළිබඳව ගරු ඇමතිවරුන් හා මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි. - ප්‍රධාන ලේකම්තුමා. එය පැවැත්වෙන බව සඳහන් කරමින් වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කර ඇති ප්‍රශ්න.

ප්‍ර/07/05/19/03_බී.එල්. ලාල් ප්‍රේමනාත් මැතිතුමා ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන්.

**<u>07.වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කර ඇති ප්‍රශ්න.</u>**

01. <u>ප්‍ර/07/05/19/03</u>
බී.එල්. ලාල් ප්‍රේමනාත් මැතිතුමා: අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහාමාර්ග සහ ප්‍රවෘත්ති ගරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,

(අ) මේ වසර තුළ දකුණු පළාත් පාසැල් සඳහා අනධ්‍යන කාර්ය මණ්ඩල බඳවා ගනු ලැබුයේ කුමන තනතුරු සඳහාද?

(ආ) අධ්‍යාපන කලාප අනුව වෙන් වෙන් වශයෙන් බඳවා ගත් මුළු නිලධාරී ප්‍රමාණය කොපමණද?

(ඇ) එක් එක් පාසැල සඳහා පත්කරන ලද නිලධාරීන් සංඛ්‍යාව ඔවුන්ගේ තනතුරු අනුව වෙන් වෙන් වශයෙන් මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නේද?

(ඈ) එම නිලධාරීන් බඳවා ගැනීම සඳහා අනුගමනය කළ විධිමත් ක්‍රියාමාර්ගය කුමක්ද?

(ඉ) එම නිලධාරීන්ගේ වැටුප් ගෙවීම සඳහා දකුණු පළාත් සභාවට අලුතෙන් වැයවන මුදල කොපමණද?

(ඊ) එම මුදල් ප්‍රමාණය ස්ථිර ලෙස සපයා ගැනීමේ සභාව සතු හැකියාව පැහැදිලි කරන්නේද?

(උ) බඳවාගත් මෙම නිලධාරීතුමන්ලාගේ රැකියාවේ ස්ථිර බව තහවුරු කිරීමට ඔබතුමාට හැකියාවක් පවතින්නේද? එය මෙම සභාවට පැහැදිලි කරන්නේද?

චන්දිමා රාසපුත්‍ර අමාත්‍යතුමා:- මෙතුමා ඇත්තටම ගිය සභාවේ ක්ෂණිකව අහපු ප්‍රශ්නයක්. අදටත් ඇත්තටම කියන්න ඕන මේකට නිලධාරීන් අවශ්‍ය විස්තර අරගෙන නැහැ. අරගන්න අවස්ථාවක් තිබුණෙත් නැහැ මේ කාර්ය බහුලත්වය නිසා. හැබැයි සාමාන්‍ය උත්තරයක් ඔබතුමාට කැමති නම් ලබාදෙන්න කටයුතු කරන්නම්. නැත්නම් කල් ඉල්ලනවා. කල් ඉල්ලනවා කියන්නේ මේ සභාවේදී උත්තර දෙන්න හම්බ වෙන්නෙ නැහැ කියන එක. දැන් සාමාන්‍යයෙන් ඔබතුමා සංඛ්‍යාව කීයද කියලා ඇහුවම සංඛ්‍යාව මේ වෙනකොට කියන්නෙ.

සභාපතිතුමා:- එහෙම බැහැ ගරු ඇමතිතුමා, මේ උත්තර දෙනවා නම් මේ ප්‍රශ්නයට උත්තර දෙන්න ඕන.

චන්දිමා රාසපුත්‍ර අමාත්‍යතුමා:- එහෙම නම් හරි.

සභාපතිතුමා:- ඊළඟට ඔබතුමන්ලාට, ප්‍රේමනාත් මන්ත්‍රීතුමා ඔබතුමා සභාව කල් තියන අවස්ථාවේ යෝජනාවක් කියලා කියනවා. ඒක සභා සම්මත වෙන එකක් නෙවෙයි කියලා කියනවා. ඒක ඔබතුමාට අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්. අවස්ථාව තියෙනවා. මේ යෝජනාවක් විදියට නෙවෙයි. ඒක යෝජනා සම්මතයක් වෙන්නෙ නැහැ. ඒ නිසා සභාව කල් තියන යෝජනා එන්නෙත් නැහැ මෙතන. ඒ නිසා ඔබතුමාගේ කාලවේලාවේදී අදහස් ප්‍රකාශ කරලා මේ කටයුත්ත කරන්න පුළුවන්. මීළඟට ජයන්ත ජයවීර මන්ත්‍රීතුමා, විනාඩි පහයි.

ජයන්ත ජයවීර මහතා:- ගරු සභාපතිතුමනි, හත්වෙනි පළාත් සභා නිල කාලය අවසන් වෙන මොහොතේ මම නැඟී සිටියේ දේශපාලන කතාවක් කරන්න නෙවෙයි. නමුත් මම 1991 දකුණු පළාත් සභාවට ඇවිල්ලා 1991 පත්වෙලා මම හිතන්නෙ එක පළාත් සභාවකට මම පත්වුණේ නැහැ. ඉතින් මගේ යුතුකමක් තියෙනවා මේ අපි පත්කරපු ජනතාවටත් ඒ වගේම ඒ සඳහා කටයුතු කරමු හැමදෙනාටමත් ස්තූති කරන්න. මේ පළාත් සභාවට පත්වෙච්ච උදවිය හිටියෙ. වර්තමාන මහඇමතිතුමා හිටියෙ, ආරියතිලක ඇමතිතුමා ඒ පැත්තෙ. මේ පැත්තෙන් අශෝක ධනවංශ මන්ත්‍රීතුමා හිටියෙ. ඒ නිසා එදා ඉඳන් අපි මේ සභාවේ අපි දැක්කා මේ සභාවේ වැඩ කටයුතු කරන ආකාරය. මට අර කලින් කතා කළා වගේ මට කියන්න තියෙන්නෙ රටේ හැමතැනම අර ගුණාත්මකභාවය අඩුවෙනකොට පළාත් සභාවේ ගුණාත්මකභාවය අපි අඩුවීමක් දැක්කා. ඒ නිසා අපි අද මේ පළාත් සභාවට නැවත එන්න පුළුවන්ද එනවද නැද්ද කියන එක පසුව තීරණය කරනවා. නමුත් අපි සාමාන්‍යයෙන් මේ සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු හැටියට අපිටත් කියන්න තියෙන්නෙ මේ මන්ත්‍රීවරුන්ට මේ සභාවේ ගෞරවය ආරක්ෂා වෙන විදියට පුළුවන් විදියට එහෙම කටයුතු කළා නම් ඉස්සරහට වැඩිය හොඳයි කියන එක. මොකද අපි

මේ සභාවේ එම්.එස්. අමරසිරි මහත්තයා, අනිත් පැත්තෙන් තුඩාවේ මහත්තයා, ඒ වගේ ටෙනිසන් ජයසූරිය මහත්තයා, ඒ වගේ ජෝෂ්ඨ අශෝක වීරසිංහ මහත්තයා වගේ ජෝෂ්ඨයො ටිකක් වැඩ කළා. ඔවුන් මේ සභාවේ කටයුතු කළ ආකාරය මා කලින් කිව්ව වගේ අපි දැක්කා. ඒ නිසා හැම වෙලාවෙම පොතපත කියවලා තකර්ානුකූලව කරුණු ඉදිරිපත් කළා. ඊට අමතරව හුඟක් වෙලාවට අනවශ්‍ය දේවල් කතා කරන්නෙ කලාතුරකින්. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපිට කියන්න තියෙන්නෙ මේ සභාවේ කටයුතු කල කාලය තුළදී මේ සභාවේ පහුගිය අවුරුදු පහ කාලය තුළදී අපි විශේෂයෙන් කටයුතු කරන කොට අපට ඔබතුමාගේ ඒ වගේම අපේ ප්‍රධාන මැති ඇමතිවරුන්ගේ ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් සහයෝගය ලැබුණා. ඒ කටයුතු අපි ඉෂ්ඨ කරන්න ඕන. අනිත් පැත්තෙන් අපි පළාත් සභාවක් හැටියට බොහෝ දෙනෙක් කියනවා සුදු අලියෙක් කියන එක. අපේ වගකීම තමයි සුදු අලියෙක් නෙවෙයි කියන එක ඔප්පු කරන එක. ඕනම ආයතනයක් අපි මෙතන වගකීම හරියට කළා නම් මේ සුදු අලියෙක් කියන කතාව වෙනස් කරන්න පුළුවන්. දැන් අපට පේන්න තියෙනවා අධ්‍යාපන ඇමතිතුමාගේ වැඩපිළිවෙල හරහා දකුණේ අධ්‍යාපනය ඉස්සරහට ගෙනත් තියෙනවා. දකුණේ අධ්‍යාපනය ඉස්සරහට ගේනකොට ඒ හරහා රටේ අධ්‍යාපනයටත් බලපෑමක් ඇතිවෙනවා. ඒ වගේ ආදශර් දෙන්න පුළුවන් නම් මේ සභාව බලාපොරොත්තු වන සේවය ඉලක්කයට අපිට යන්න පුළුවන්. මේ වෙලාවේදී අපි විශේෂයෙන් බලාපොරොත්තු වෙන්නෙ නැහැ හැමදෙනාටම විශේෂයෙන්ම ඔබතුමා, සභාලේකම්තුමා ඇතුළු ඒ සියළුම කායර් මණ්ඩලයට, අනිත් පැත්තෙන් ප්‍රධාන ලේකම්තුමා ඇතුළු කායර් මණ්ඩලයට අපේ පළාත් සභාවේ ඉන්න සියළුම ලේකම්තුමන්ලා ඇතුළු සියළුම කායර් මණ්ඩලයට ඒ වගේම අපේ සභාවේ ඇමතිතුමන්ලා සහ මන්ත්‍රිතුමන්ලාට දීපු සහයෝගය පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම අපට මේ අවස්ථාව ලබාදීපු අපේ පක්ෂයේ නායකතුමා ඇතුළු හැමදෙනාටමත් ඒ වගේම අපි පත්කරපු ජනතාවටත් ස්තුතිවන්ත වෙමින් මගේ කතාව නතර කරනවා. බොහොම ස්තුතියි.

සභාපතිතුමා:- ඊළඟට අපේ දේනෙත්ති ගරු මන්ත්‍රීතුමා.

ගා.දේනෙත්ති මහතා:- ගරු සභාපතිතුමනි, මම හිතන්නේ 1988 පළවෙනි පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට ඉඳලා මේ ඒ ආරම්භයේ ඉඳලා මේ වතාවේ අවසන් වෙන දවසේ දින කීපයකට කලින් මන්ත්‍රී වෙන්න ලැබීම ගැන මම එක පැත්තකින් ගාලු දිස්ත්‍රික්කයේ 18523 ක් මනාප දීපු ජනතාවට ඒ වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා අපේ ගරු සභාපතිතුමා පුංචි වේලාවක් ලබාදීම ගැන. ඇත්තෙන්ම තමුන්නාන්සේලා දන්නවා අපේ ගරු මන්ත්‍රීතුමන්ලා දන්නවා අපේ මන්ත්‍රීවරයෙක් පහුගිය 18 වෙනිදා ඉවත්වුණා. ඒ අනුව පළාත් සභාවෙන් මේ හිස්වෙච්ච බව 21 වෙනිදා මැතිවරණ කොමිසමට දැන්වුවා. ඒ අනුව 23 වෙනිදා ඒ අදාළ එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ලේකම් ලියුමක් අරගෙන දේනෙත්ති පත් කරන්න කියලා ගියාම අපි බොහොම අගයට කතා කරනවා මේ රටේ කොමිෂන් දැම්ම වැඩ පිළිවෙලක් කරන්න. වැඩ වේගවත් කරන්න, ජනතාවට ලොකු සහනයක් දෙන්න කියන එක. මට කණගාටුයි කියන්න 23 වෙනිදා ඒ ලියුම දෙනකොට මැතිවරණ සභාපතිතුමා සූදානම් වුණා මේක ගැසට් කරන්න. නමුත් නීති ප්‍රශ්නයක් මතුවුණා කොමසාරිස්වරුන් තුන්දෙනාම අත්සන් කළොත් තමයි මන්ත්‍රී වෙන්න පුළුවන් කියලා. මොකක්ද වුණේ එක කොමසාරිස් කෙනෙක් රට ගිහින්. ඒ රට ගිහිල්ලා එනකම් මට ඉන්න වුණා ගාලු දිස්ත්‍රික්කයේ ජනතාවගේ මානව හිමිකමක් උල්ලංඝණය වුණා මැතිවරණ කොමිසමෙන්. ඒ නිසා එතුමා ආවෙ. ඊත් මම ඇහුවා මැතිවරණ සභාපතිතුමාගෙන් මේ ගියපු මනුස්සයාගේ කකුලක් කැඩුණොත් කකුල පෙරලුනොත් එතකොට වෙන්නෙ 10 වෙනිදාට නැත්නම් 09 වෙනිදා මම මන්ත්‍රීකමේ ඉන්නෙ කොහොමද කියලා. ඒකට උත්තරයක් නැහැ කොමිසම. සන පූරණය තුනයි. කොමසාරිස්වරු තුනයි. ඒ නිසා එතුමත් අසරණයි. කරකියා ගන්න දෙයක් නැහනැ. මේක තමයි සමහර කොමිෂන් වල තත්ත්වය. ඒ නිසා මම කියන්න ඕන 23 වෙනිදා මන්ත්‍රීවරයෙක් වෙන්න තිබ්බ්ව ඉඩකඩ අහෝසි වුණා මේ ඊනියා කොමිසම නිසා. මැතිවරණ කොමිසම දැන් අපි කතා කරන ගමන් කිව්වා චම්ලි විතානාච්චි මන්ත්‍රීතුමා මැතිවරණ නොතියන කොමිසම කියලා. වැඩ ඒ වගේ මන්ත්‍රීවරයෙක්වත් පත් නොකරන කොමිසම කියනවා ඒකට තව කැල්ලක් එකතු කරන්න ඕන ඒක. ඒ නිසා 23 වෙනිදා මන්ත්‍රී වෙන්න ඕන මම 04 වෙනිදා වාසනාවට තමයි ගරු සභාපතිතුමන්ලා ඔබතුමාලා මේ 08 වෙනිදාත් සභාවක් දාගත්ත නිසා මට අද ඇවිල්ලා කතා කරන්න පුළුවන්කම ලැබුණා. ඒ

නිසා මම දිගට කතා කරන්නෙ නැහැ. මට පැහැදිලිව මතක් කරන්න ඕන මේ රටේ මැතිවරණයකින් ඒක, මම හිතන්නෙ අලුත් පළාත් සභා හයක මැතිවරණ කල් දාලා. මේ අපි අනිද්දායින් ඉවරවෙන අපේ පළාත් සභාවක් හරියට ඡන්දෙ තියනවද කියන්න බැහැ. එහෙම ඉතිහාසයක් මේ රටේ තිබුණෙ නැහැ. ඡන්ද පහුගිය කාලෙ වැඩියෙන් ඡන්ද තියනවා කියලා තමයි යෝජනා කළේ. වාසනාවයි. වාසනාවයි. ඡන්ද නැත. මන්ත්‍රීවරු අද ඉඳන් මොකක්ද කරන්නෙ කියලා පුද්ගලිකව හම්බ වුණාම කියනවා දැන් අනිද්දා ඉඳලා මොකක්ද කරන්නෙ? දැන් මොකක්ද කරන්නෙ? එහෙම කතා කරන තත්ත්වයක් ඒ මන්ත්‍රීවරුත් අසරණ කරලා තියෙනවා. මට එහෙම එකක් නොතිබුණු නිසා මම හිතන්නෙ මට ලොකුවට කණගාටු වෙන්න දෙයක් නැහැ. අර කකුලක් දැන් නැති එකෙක් සපත්තු දෙකක් නැති එකෙක් දැක්කා වගේ තමයි මට මතක් වෙන්නෙ. ඒ හින්දා දුක මට අඩුයි. ඒ නිසා මම පැහැදිලිව කියන්න ඕන පහුගිය කාලෙ අර මතක් කළා 88 මහා භීෂණ කාලෙ අපි පළාත් සභාවට ඇවිත්, ඒ වෙනකම් පහුගිය කාලෙ මම ගැන කිව්වොත් මම පහුගිය වතාවෙත් පළාත් සභා මන්ත්‍රීවරයෙක් වුණා. පැරදිච්ච හැමවෙලාවෙම අපේ තුඩාවේ සහෝදරයාගේ ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් වුණා. ඊළඟට ඩැනී හිත්තැටියගේ සහෝදරයාගේ පෞද්ගලික ලේකම්. ඊළඟට පියසිරි සහෝදරයාගේ පෞද්ගලික ලේකම්. වීරසුමන සහෝදරයාගේ පෞද්ගලික ලේකම්. මම හිතන්නෙ මට තරම් පළාත් සභාවත් එක්ක අයිතියක්, ඇයි හොඳයිකමක් කිසිම මන්ත්‍රීවරයෙකුට නැහැ කියන එක ඊෂාර්‍යා හිතන්න එපා. ආඩම්බරයක් ඇතිවෙනවා අර වන්න සාලිය සහෝදරයා වගේ පළාත් සභාවට බනිනකොටත් අපට මතක් වෙනවා සමහර කාලවල් අනේ ඒ කාලෙත් අපි ඒ කාලෙ අපි ඇඳුම් ඇඳගත්තෙ ස්ටේෂන් එකේදි. වෙන ඇඳුමක් ඇඳන් ඇවිල්ලා ස්ටේෂන් එකේ ටොයිලට් එකේදි තමයි හරි මන්ත්‍රීගේ කිට් එක ඇඳගත්තෙ. එහෙම කාලයකුත් තිබුණා. ගරු මන්ත්‍රීතුමන්ලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම දිගට කතා කරන්නෙ නැහැ. එක පැත්තකින් අර කිව්ව වගේ මේ සභාවේ ලොකුවට කතා කරන්න දෙයක් නැහැ. අපි අදින් මේ කටයුත්ත හමාර වෙනවා. ඒ නිසා කවුරුත් අපේ ඇයි හොඳයිකම මෙතෙක් තිබුණා වගේ අන්තිමට කියනවා ඇහුණා මේ අපේ සභාපතිතුමාට අපි කවුරුත් මන්ත්‍රීවරු විදියට ඉදිරියේ දෙයක් කරගන්න ආවොත් ඒකට ඉඩ දෙන්න කියලා. මම තමයි ඒකට වැඩියෙන්ම කැමති කෙනා. එහෙම දෙයක් ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් අපි ඉතිරි කාලෙත් පුළුවන් තරම් අපි පුළුවන් තරම් අපි හැමෝම මහන්සි ගනිමු, හයක් විසුරුවලා තියෙනවා, අපේ එකත් අනිද්දා විසිරෙනවා. අපි හැමෝම එකතුවෙලා රටේ ප්‍රජාතන්ත්‍රවාදය කියන්නෙ ඡන්දෙ නැත්නම් ප්‍රජාතන්ත්‍රවාදය මූලික කාරණයත් නැතිවෙනවා. ඒක ඇති කරන්න කටයුතු කරමු කියමින් ඔබ සියළුදෙනාටම ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී දේශයක් ගොඩනඟන්න කටයුතු කරමු කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

සභාපතිතුමා:- බොහොම ස්තුතියි. මීළඟට නලින් හේවගේ මන්ත්‍රීතුමා.

නලින් හේවගේ මහතා:- ගරු සභාපතිතුමනි, හත්වන පළාත් සභාව අවසන් වන මේ මොහොතේ විශේෂ ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබාදීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මමත් පළාත් සභාවට ආවෙ ගරු මන්ත්‍රීතුමනි, 2004 වෂර්යේ. දැන් අවුරුදු 15 ක්. මහජන නියෝජිතයෙක් හැටියට හිටිය කාලෙ ඇති කියලා හිතෙනවා. දැන්. දේශපාලනයට යන්න අදහසක් නැහැ. මම හිතන්නෙ මන්ත්‍රීකම් කරපු කාලෙ ඇතියි කියලා හිතෙනවා. කාලයත් එක්ක බැලුවට පස්සෙ. ඉතින් අපි දැන් කොහොම හරි කණ්ඩායමක් හැටියට අපේ 2007 දහහතරක් වගේ පිරිසක් හිටියා. දැනට පස්දෙනෙක් අපේ කණ්ඩායම නියෝජනය කරනවා. එතකොට අපි කණ්ඩායමක් හැටියට ඇත්තටම පළාත් සභාව නියෝජනය කළේ ඔබතුමා දන්නවා මේ පළාත් සභා ක්‍රමය රටට අවශ්‍ය නැහැ කියන ස්ථාවරයේ ඉඳගෙන. ඒ නිසා ප්‍රඥප්ති හදන ඕනම මොහොතක නැත්නම් පළාත් සභාව බලාගන්න ඕන මොහොතක අපි එදා ඉඳන් අද දක්වාම අපේ පොදු ස්ථාවරයේ ඉඳලා පළාත් සභා ශක්තිමත් කරන්න අපේ එහෙම දායකත්වයක් ලබාදුන්නෙ නැහැ. මොකද යම් ස්ථාවරයක එදා ඉඳලා අද දක්වාම අපි කාලය ගත කළා. මම විශ්වාස කරන්නේ පොදුවේ ගත්තොත් ඇත්තටම ලංකාවට ඕන පාලර්මේන්තු මන්ත්‍රීවරු 50 ක් විතරයි. කොට්ඨාශ මන්ත්‍රීවරු 13,000 ක් හිටියම මේකට ඇති කියලා. ඉතින් අපි කල්පනා කරලා බැලුවොත් මේ වසර ගණනාවක් තිස්සේ පළාත් සභාවේ මොකක්ද වුණේ කියලා තවමත් මම හිතන්නෙ වැසිකිලි නැති 23000 ක් විතර ජනතාවක් දකුණු පළාතේ ඉන්නවා. අපි අවුරුදු 26 ක 30 ක දකුණු පළාත් සභාවේ හිටියාට තවමත් 23,000කට වැසිකිලි පහසුකම් දෙන්න බැරිවෙලා තියෙනවා. ඒ යම් යම් දේ සාධක

නැතුව නෙවෙයි. ඉතින් මම කොහොම හරි දිගට කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. අපි ඇත්තටම දිගටම ඔබතුමන්ලාත් එක්ක පසුගිය කාලෙ විවිධ ගැටුම් වාචිකව විවිධ ගැටුම්වලින් නැත්නම් තකර්වලින් එක තැනකට ඇවිල්ලා තියෙනවා. අපි විශ්වාසයක් තියෙනවා මෙන්න මේ සමාජ ක්‍රමය පිළිබඳව අපට වෙනත් කියලා ඉඩක් තියෙනවා. අපි හිතන්නෙ නැහැ මෙතන ඉන්න ඔබතුමන්ලා මේ දේශපාලනය ඇතුලේ මේ සමාජ නියමයන් නැත්නම් සමාජය කොහොමද ගමන් කරන්නෙ? සමාජය කොහොමද හැදිලා තියෙන්නෙ කියලා බැරෑරුම් දේශපාලනයකට අත තියලා ඇතියි කියලා අපි විශ්වාස කරන්නෙ නැහැ. කීප දෙනෙක් හැර. මම ඊයේ රාවය පත්තරේ කියෙව්වා. ඒ රාවය පත්තරේ තියෙනවා ලෝකේ ප්‍රධාන සමාගම් හයක් විශේෂයෙන් ගත්තොත් ඇමේසන්, මයික්‍රොසොෆ්ට්, ගූගල්, යූ ටියුබ්. ඒ වගේ ප්‍රධාන සමාගම් හයක් ගත්තොත් ඒ සමාගම් හයේ ආදායම සමානයි ලෝකයේ ලංකාව ඇතුළු රටවල් 90ක ආදායම. ඒ කියන්නෙ ලෝකෙ රටවල් භාගයක ආදායම සමානයි ලෝකෙ ප්‍රධානම සමාගම් හයක ආදායම. ප්‍රධාන සමාගම් හයක්. ඒක තමයි ලෝකෙ වෙලා තියෙන්නෙ. මම හිතන්නෙ මේක මෛත්‍රීපාල මහත්තයාත් කිව්වා ලංකාවේ ඉහළ ආදායම ලබන 20 ක තත්ත්වය. ලංකාවෙන් බාගයක් විතර මේ 20 ගන්නවා කියලා. මම ඊයේ පෙරේදා ටී.වී. දෙරණටත් කිව්වා මේ 20 හෝ 21 ඇතුලේ මම හිතන්නෙ ධම්මි මහත්තයාත් ඉන්නවා කියලා. ධම්මි සිරිසේන මහත්තයා. ලංකාවේ පවුල්වලින් භාගයක ආදායම 20 ක් ගන්නවා කියලා තිබුණා. 19 හෝ 20 හෝ 21 අතරේ ධම්මි සිරිසේන මහත්තයාත් ඇතියි කියලා මම හිතනවා. ඉතින් ඕක තමයි දේශපාලනයේ තත්ත්වය. ලෝකය ගමන් කරමින් සිටින හැටි සහ ලංකාව ගමන් කරමින් සිටින හැටි. ඉතින් මෙන්න මේකට ප්‍රතිවිරුද්ධ දේශපාලනයකට තමයි ජනතා විමුක්ති පෙරමුණ නියැලෙන්නෙ. ඉතින් අපි මොකක්වත් අත්පත් කරගත්තෙ නැහැ. 2004 මම මේ පළාත් සභාවට අවෙ ඡන්දයකින්. ගරු ඇමතිතුමා අදත් බයිසිකලයෙන් ආවෙ. යන්නෙත් බයිසිකලයෙන්. වාහන බලපත්‍ර තුනක් හම්බ වුණා. අපේ මන්ත්‍රීවරු කවුරුවත් වාහන බලපත්‍රයක් ගත්තෙ නැහැ. 2,50,000/- ක විතර වැටුපක් හම්බ වුණා. අපි කවදාවත් එක තඹ සත පහක් අපි අරගෙන නැහැ. විදේශ සංචාර ගියා, අපි එකක්වත් ගියේ නැහැ. ඉතින් අපිට වසර 15 ක දේශපාලනයකින් පස්සෙ යන්නෙ බොහොම සතුටින්. ජනතාව වෙනුවෙන් යම් කායර් භාරයක්, ජනතාව වෙනුවෙන් යම් කායර් භාරයක් කළා. ගාල්ලෙ ගොඩක් දේවල් විකුණනකොට අපි ගිහිල්ලා නවත්වා ගත්තා. කටුපොල් වගාව කරන්න බැරිවෙලා තියෙනවා. ඒ නිසා අපි සතුටින් යන්නෙ. පෞද්ගලික මොනවහරි නැහැ. මට පවර්ස් 08 ක් තිබුණා. එනකොට තිබුණා. ඒ අටත් නැහැ, විකුණලා. මේ මන්ත්‍රීවරු ගත්තත් එහෙමයි අපේ. මොනවහරි ඇතිවෙච්ච දෙයක් අපිට මෙහේ නැහැ. පුද්ගලිකව. හැබැයි අපි උත්සාහයක් ගත්තෙ මේ සමාජ ක්‍රමය සම්බන්ධයෙන් ජනතාවට කියාදෙන්න වේදිකාවක් කරගන්න විතරයි. ජනතාවට මොනව හරි කියාදෙන්න වේදිකාවක් කරගත්තා. මම පාවිච්චි කළේ. ඉන් එහාට මොනවත් පාවිච්චි කළේ නැහැ. අපි දන්නවා මෙතන කවුරුවත් අර කියන ධනපති පන්තිය නියෝජනය කරන කවුරුවක් නැහැ. ඔබතුමන්ලාත් ඔක්කොම එක පන්තියේ. අපි ඔක්කොම එක පන්තියේ. හැබැයි සේවාව ගත්තොත් ඔබතුමන්ලා දැනුවත්ව හෝ නොදැනුවත්ව වෙන තැනකට සේවාවක් වෙනවා. වෙන තැනකට සේවාවක් වෙනවා. ඉතින් මම හිතන්නෙ නැහැ ඔබතුමන්ලා දැනුවත්ව කරනවා කියලා. ඉතින් මේ ගමනේදී මම හිතන්නෙ ඔබතුමන්ලා සාකච්ඡා කරද්දි අර වම්ලි මන්ත්‍රීතුමන්ලා කිව්වා වගේ මන්ත්‍රීවරුන්ගේ හිත් රිදෙන ගොඩක් දේවල් වුණා. අපි දන්නවා. අපි විශේෂයෙන්ම මහඇමතිතුමාට බරපතල චෝදනා කළා. කරනකොට මුහුණ කලුවෙන අවස්ථාවල් අපි දැකලා තියෙනවා. අනිත් මන්ත්‍රීවරුත් කට්ටියත් එක්ක අපි ගොඩක් හැපුනා. අපි අර කිව්වා වගේ අපි දැක්කා. අපි ගොඩක් මේක ඇතුලේ ගැටුම් ඇතිකරගෙන වාචිකව ගැටුම් ඇතිකර ගත්තා. එළියට ගියාට පස්සෙ අපේ විපක්ෂනායකතුමා ධනවංශ මන්ත්‍රීතුමාත් එක්ක අපි ගැටුම් ඇතිකර ගත්තානේ. ගොඩක් කට්ටිය ඉන්නවා. අපි එහෙම වුණාට එළියට ගියාට පස්සෙ එහෙම එකක් තිබුණෙ නැහැ. ඒක තමයි දේශපාලනය. අපි කවුරුවත් විවේචනය කරගත්තෙ පුද්ගලිකව නෙවෙයි. පක්ෂයක් හැටියට විවේචනය කරගත්තෙ, පුද්ගලිකව නෙවෙයි. ඉතින් ඒක නිසා අපි සමාජ ක්‍රමය සම්බන්ධයෙන් විවේචනයක් ඉදිරිපත් කළේ. ඉතින් අපි අද දවසේ අපිට තව අවුරුද්දක විතර කාලයක් ඉන්න වෙනවා පළාත් සභා මැතිවරණයකට ඉදිරිපත් වෙන්න. ඒ බව සිහිපත් කරමින් මේ කාලපරිච්ඡේදය තුළ අපිට ගොඩක් දෙනා උදව් කළා. ඇත්තටම

සභාපතිතුමා ඔබතුමාගේ පැත්තෙන් යම්කිසි සාධාරණයක් මත මේක මෙහෙයවූවා. අපිට විශ්වාසයක් තියෙනවා. මැති ඇමතිවරුන්ගේ පැත්තෙන් යම් සාධනීය ලක්ෂණ ටිකක් ඉටුවුණා. සභාලේකම්තුමා අපිට ඒ කාලෙ ඉඳන් මේ දක්වාම සහයෝගයක් දැක්වූවා. ප්‍රධාන ලේකම්තුමා ඒ වගේම අමාත්‍යාංශ ලේකම්තුමන්ලා ඒ නිලධාරී මණ්ඩලය සියළුදෙනාටමත් උදව් උපකාර කරපු මේ සමාජේ කතර්ව්‍යය කරන්න උදව් කරපු සියළු දෙනාටම ස්තුතිවන්ත වෙමින් අපි සමු ගන්නවා. බොහොම ස්තුතියි.

සභාපතිතුමා:- මීළඟට ආණ්ඩු පක්ෂ සංවිධායක අජිත් රාජපක්ෂ මන්ත්‍රිතුමා.

අජිත් රාජපක්ෂ මහතා(ආණ්ඩුපක්ෂ ප්‍රධාන සංවිධායක):- ගරු සභාපතිතුමනි, පළාත් සභාවට ඇවිල්ලා දැන් මම වසර 20 කට ආසන්න කාලයක් වෙනවා. ඒ කාලසීමාව තුළ මේ වගේ පළාත් සභාව අවසන් වෙන අවස්ථාවක කතාවක් කරන්න ලැබිච්ච පළවෙනි අවස්ථාව මේ. මීට කලින් බොහෝ වෙලාවට මට මතකයි දැන් පළාත් සභාව අවසාන වෙන්නෙ අපිට නිලකාලය තව මාස 10 ක් විතර තියෙද්දි තමයි පළාත් සභාව අවසන් වෙන්නෙ. ඒ වෙලාවේ අපේ මන්ත්‍රීවරු කතා කළේ අපරාදේනේ තව මාස 10 ක් තියෙද්දි මේ විසිරෙව්වෙ. අපරාදේනේ කියලා. ඊට කලින් තිබිච්ච පළාත් සභාවලත් බෙහෝ වෙලාවට මේ නිලකාලය අවසන් වෙනකම් අපි හිටියෙ නැහැ. හැමදාම නිල කාලයට කලින් මැතිවරණයකට යන්න අපට අවස්ථාව ලැබුණා. නමුත් මෙවර අපි මේ පළාත් සභාවෙන් එළියට යන්නෙ මේ රටේ ජනතාවගේ මූලික අයිතිවාසිකමක් අහිමි කරපු කාලෙක. සවර්ජන ඡන්ද බලය කියන්නෙ රටේ ජනතාවට තියෙන්න ඕන අයිතියක්. ඒ අයිතිය අහිමි කරලයි අපේ පළාත් සභාව මේ නිල කාලය අවසන් වෙන්නෙ. ඒ නිසා අපිට ගරු සභාපතිතුමනි, මේ කාලපරිච්ඡේදය තුළ අපි හැමෝම දන්නවා හිතට එකඟව අපිට කරන්න පුළුවන් කැපවීම් සියල්ලම මේ පළාත් සභාවේ වගකීම් අපි හරියාකාරව ඉෂ්ඨ කරන්න. ඊට අමතරව පෞද්ගලිකව අපිට කරන්න තියෙන කැපවීම් ඒ පුළුවන් උපරිමයෙන් ඉෂ්ඨ කරන්න. දැන් මම නම් දන්නෙ නැහැ සභාපතිතුමනි, අත්සන් ලේඛනය ගත්තත් ගොඩක් වෙලාවට ඒකෙත් තුනට නැත්නම් හතරට මම අත්සන් කරලා තියෙන්නෙ. මම පළාත් සභාවට කවදාවත් විනාඩි පහක්වත් පහුවෙලා ඇවිල්ලා නැහැ. ඒ වගේම මේ පළාත් සභාව ඉවර වෙනකම්ම ඉඳලා තමයි මේ පළාත් සභාවෙන් එළියට බැහැලා යන්නෙ. ඒ විදියට ජනතාව අපිට දීපු යුතුකම ඉෂ්ඨ කළා. පෙත්සම් කාරක සභාවේවත් කවදාවත් විනාඩි පහක්වත් පහුවෙලා ඇවිල්ලා නැහැ. ඒක අවසන් කරලා යන්නෙ. ඊට අමතරව අනිත් පැවරිච්ච හැම වගකීමකින්ම පුළුවන් උපරිම විදියට අපේ කැපවීම වඩාත් ඵලදායී වඩාත් ජනතා විශ්වාසය ඇතිවෙන විදියට ඉෂ්ඨ කරන්න පුළුවන් උපරිම කායර් භාරය අපි මේ වෙනකොට ඉෂ්ඨ කරලා තියෙනවා. ඊට අමතරව ගරු සභාපතිතුමනි, අපි මේ පළාතේ ජනතාව තුළ මේ පළාතේ රාමුව තුළ අපිට මන්ත්‍රීවරු හැටියට අපිට කරන්න තියෙන වගකීම ඒ උපරිම විදියට ඉෂ්ඨ කරන්න අපි කටයුතු කරලා තියෙනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි දැක්ක දෙයක් තමයි මේ පළාත් සභාව අද නිල වශයෙන් අවසන් වෙනවා වගේම අපි වෙනදා යන්නෙ මැතිවරණයකට. නමුත් මේ ගතවෙච්ච පස් අවුරුද්ද තුළ අපි දැක්ක දෙයක් තමයි මේ පළාත් සභා ඉතිහාසයේ මේ තරම් නොසැලකිලිමත් විදියට මන්ත්‍රීවරුන්ට නොසලකපු යුගයක් තවත් නැහැ කියන එකත් අපි මේ අවස්ථාවේ කියන්න ඕන. ඒක තමයි ගරු සභාපතිතුමනි, අපි මට මතකයි අපි වරප්‍රසාද නෙවෙයි. හැබැයි අපි හැමදෙයක්ම ජනතාව වෙනුවෙන් කරලා තියෙනවා. මීට අමතරව ඒ ක්‍රියාවලියන් පහසු කරන්න ඒ දැණුම ලබාදෙන්න රජයේ විවිධ දේවල් ක්‍රියාත්මක වෙනවා. ඒවා මේ කාලපරිච්ඡේදය තුළ සිදුවුණේ නැහැ. දැන් කවුරුත් කාටවත් වාහන බලපත්‍රය නැහැ. දැන් හඩක්වත් නැහැ. හැබැයි මේ රටේ මේක ලබාගෙන අනිත් හැමෝටම දීලා. දැන් රාජ්‍ය සේවකයොන්ට නවත්තලා තිබුණා දැන් ඒකත් දුන්නා. කාලය දික් කරපු ඒක ඒකත් දුන්නා. ඒ නිසා මේ මන්ත්‍රීවරු කීප දෙනාට තමයි මේ සියල්ලම. රටේ ආර්ථිකයට මේ හැම එකටම බලපෑම් වෙන්නෙ මන්ත්‍රීවරුන්ට. ඒකත් නැත්තටම නැතිකරලා දැන්. ඊටපස්සෙ මන්ත්‍රීවරුන්ට මේ ළිඳේ ඉන්න ගෙම්බො වගේ මේකෙ ඇතුලෙම බල්ටි ගගහා ඉන්න නෙවෙයි. මීට වඩා එහාට ගිහිල්ලා යම් දැණුමක් ගන්න තිබිච්ච අවස්ථාවන්, දැන් ඒකත් නැතිකරලා තියෙනවා. ඊට අමතරව දැන් ඡන්ද බලයත් නැතිකරලා දාලා. අවසානයට අපිට දුන්නා පිස්තෝලයක් දුන්නා. දැන් ඒ පිස්තෝලයට ලයිෂන් එකක් දුන්නෙ නැහැ, මාස හතරක් වෙනවා. දැන් මේ පිස්තෝලය හොර පිස්තෝලයක් වෙලා තියෙනවා. මේ ඉන්න මන්ත්‍රීවරු හිරේ දාන්න පුළුවන් දැන් හොර

පිස්තෝලයක් ළඟ තියාගෙන ඉන්නවා කියලා. ඒ බලපත්‍රයේ අත්සන ගහලා දෙන්නවත් ශීලාචාරකමක් වතර්මානයේ පාලකයන්ට නැහැ සභාපතිතුමනි. ඒක තමයි ඇත්ත කතාව. ඒ නිසා දැන් අපිව වට කරන්න අපිව පීඩාවට පත් කරන්න පුළුවන් හැමදෙයක්ම කරලා ඉවරයි. මේක මම දන්නවා ආණ්ඩු පක්ෂයද විපක්ෂයද කියලා නැහැ. දෙකටම එකයි. දැන් අපේ විපක්ෂනායකතුමන්ලා ඊයේ පෙරේදා ගියා හම්බන්තොට තෙල් පිරිපහදුවට මුල්ගල තියන්න. වාඩිවෙන්න පුටුවක්වත් නැහැ. පළාත් සභාවට බිංදුවයි තැන. පළාත් සභා මන්ත්‍රීවරුන්ට වාඩිවෙන්නවත් තැනක් නැහැ. එහෙම තමයි පළාත් සභාවට සැළකිල්ල. ඊටපස්සෙ මේ පළාත් සභාව නියෝජනය කරලා පළාත් සභාවෙන් ගියා පාලර්මේන්තුවට මන්ත්‍රීවරු. එක වචනයක් පළාත් සභාව වෙනුවෙන් කතාකරලා නැහැ. මේ පළාත් සභා මන්ත්‍රීවරු වෙනුවෙන් කවදාවත් කතා කරලා නැහැ. මෙතන ඉඳිද්දි කොයිතරම් කයිවාරු ගැහුවත් මේකෙන් එළියට ගියාට පස්සෙ මේ පළාත් සභාවල් ගැන කතා කරලා නැහැ. ඒ නිසා එහෙම සිස්ටම් එකක් තමයි මේකෙ තියෙන්නෙ. දැන් අපි කවුරුත් කතා කරනවා පළාත් සභා මැතිවරණය ගැන. නමුත් අපිට පේන දේ තමයි පාලර්මේන්තුවේ එහෙම පළාත් සභා මැතිවරණයක් තියන්න උවමනාවක්, හැඟීමක් කිසි කෙනෙකුට නැහැ. කිසිම කෙනෙකුට නැහැ. ආණ්ඩු පක්ෂයද, විපක්ෂයද දෙගොල්ලම එකයි. ඒ නිසා එහෙම උවමනාවක් නැහැ. නැත්නම් ගරු සභාපතිතුමනි, මගේ පෞද්ගලික මතය. මම මනෝජ් ඇමතිතුමාත් එක්කත් උදේ කතා කළා. පෞද්ගලික මතය. මේ පළාත් සභාව අද විසිරෙන්නෙ නැහැ. මේ පළාත් සභාව තවදුරටත් තියෙනවා. ඒක තමයි මගේ තකර්ය. හේතුව ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාව අහෝසිකරලා අලුත් ඡන්ද ක්‍රමයක් ගේන්න යෝජනා වෙනකොට තියෙන ඒවාට මොකක්ද වෙන්නෙ කියලා රටෙ තියෙන්න ඕන දැණුමක්. තියෙන එකට මොකක්ද වෙන්නෙ කියලා ක්‍රමයක් නැහැ. තියෙන පළාත් සභාව නැති වෙනවද, ඇති වෙනවද, මොකක්ද කියලා ක්‍රමයක් නැහැ. ඒ නිසා මැතිවරණ ක්‍රමයක් ගෙනාවා. තිබ්බව එක අහෝසි කළා, අලුත් එකක් යෝජනා කළා. ඒක දැන් නීතියක් බවට පත්වෙලා. ඒක එහෙම වෙනකොට පළාත් සභාවත් එක්කෝ නිල කාලය අවසන් වෙන්න ඕන. කොන්දේසිවල සඳහන් වෙන්න ඕන. එහෙම එකක් නැහැ. ඒ නිසා මගේ පෞද්ගලික මතය නම් මේ පළාත් සභාව තවදුරටත් ක්‍රියාත්මකයි. ඔබතුමා කැදෙව්වත් ඒකට අපිට උසාවි යන්න පුළුවන්. මොකද ජනතාවගේ අයිතිය. ඡන්ද බල අයිතිය. ජනතාව පත්කරපු පළාත් සභාව. මේක මේ මට්ටමට කිසිම වැදගම්මකට නැති පල්ලෙහා මට්ටමකට ඇදලා දාලා කාටවත් කටයුතු කරන්න පුළුවන්කමක් නැහැ. ලක්ෂ ගණනක් ජනතාවගේ ඡන්දවලින් පත්වෙච්ච පළාත් සභාව මේ පළාත් සභාව ඉස්සරහට යන්නෙ කෙසේද කියන එක මේ පාලර්මේන්තුවේ මේවා ක්‍රියාත්මක රටේ ඒ විදියට සඳහන් වෙන්න ඕන. එහෙම සඳහනක් නැහැ. මේ මැතිවරණ ක්‍රමය අවසන් කරලා ඊළඟ එක යෝජනා වෙයි. ඒ නිසා මගේ පෞද්ගලික මතය මේ පළාත් සභාව අදින් අවසන් වෙන්නෙ නැහැ. මේ පළාත් සභාව ඊළඟ ඡන්දෙ වෙනකම් තියන්න පුළුවන්. බැරිනම් ඕන කෙනෙකුට උසාවි යන්න. උසාවි ගිහිල්ලා උසාවියෙන් අහමු මොකක්ද ඇත්ත කියලා. ඒ මගේ පෞද්ගලික මතය. ඒ නිසා ගරු සභාපතිතුමනි, අද මේ රටේ කිසි නීතියක් විනයක් ක්‍රියාමාගර්යක් නැති කාලපරිච්ඡේදයක් මේ ගතවෙන්නෙ. ඒ නිසා එක එක්කෙනාට ඕන විදියට එක එක නීති ගෙනවා, එක එක අණපනත් ගේනවා. මේවා මේ මහ පොලොවේ ක්‍රියාත්මක කරන්න පුළුවන්කමක් නැහැ. කිසිම දෙයක් නැහැ. දැන් සමහර මන්ත්‍රීවරුන්ට වාහන බලපත්‍ර තියෙනවා. සමහර මන්ත්‍රීවරුන්ට වාහන බලපත්‍ර නැහැ. ඉතින් මේක තමයි තත්ත්වය. මේ දකුණේ විතරක් නෙවෙයි, උතුරෙත් එහෙමයි. නැගෙනහිරත් එහෙමයි, සබරගමුවෙත් එහෙමයි. මේක තමයි මේ රටේ තත්ත්වය. ඒ නිසා ගරු සභාපතිතුමනි, අද මේ පළාත් සභාව හදපු මහ මේ මේ රටේ ජනතාවට මේ පාලනය ගමට ගෙනියන්න. මේවායේ මේ ගොඩනගාපු ශක්තිය අද මහා කැත විදියට, නීච විදියට විනාශ කරලා තියෙන්නෙ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපේ කණගාටුව ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කරලා සවර්ජන ඡන්ද බලය නැතිකරපු කාලපරිච්ඡේදයක් මේක. ඔය මහලොකුවට කතා කරන සමහර රාජ්‍ය නොවන සංවිධාන එක්සත් ජාතීන්ගේ සංවිධාන මේ ලෝකයම ප්‍රජාතන්ත්‍රවාදයන් ගැන කතා කරන්නෙ. අද මේ කවුරුවත් මේ අහිමිවීම් ගැන කතා කරන්නෙ නැහැ. ඒක තමයි ඇත්ත. ඒ නිසා හැම සංවිධානයක්ම මම තමන්ට ලැබෙන වරප්‍රසාද එක්කයි කටයුතු කරන්නෙ. ඒ නිසා ජනතාවගේ අයිතීන් තවමත් එතනම මේ එන්න එන්න වල පල්ලට යනවා. කවුරුවත් මේ ගැන කතා කරන්නෙ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, රට, ලෝකය යන්නෙ මේ විදියට

නම් ඒක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. මේ තත්ත්වයන් වෙනස් කරන්න අපි පුළුවන් විදියට කැප වෙන්න ඕන. ඒ නිසා අපි පහුගිය කාලෙ මේ පළාත් සභාව තුළ අපේ කාලය අපි උපරිම තරම් කැපකරලා සියළු දේවල් කළා. පෞද්ගලිකවත් එහෙමයි. ගරු සභාපතිතුමනි, මම දුවපු එක වාහනයක් කිලෝ මීටර් 2,40,000 ක් දුවලා තියෙනවා. නමුත් මගේ එක වාහනයක් දුවලා තියෙනවා. ඒ වාහනයට මම අතින් තෙල් ගහලා තියෙනවා. එතකොට ගණන හදලා බලන්න 2,40,000 ක තෙල් තියෙන ගණනෙන් වැඩි කළාට පස්සෙ ලක්ෂ කීයක තෙල් ගහලා තියෙනවද කියලා. මේ කවුරුවත් ගෙනත් දීපුවා නෙවෙයි. අපි හම්බ කරපු පෞද්ගලික දේවලුත් මේ වෙනුවෙන් දුන්නා. ලක්ෂ දෙකහමාරෙ ඒවා නම් අපිට හම්බ වෙලා නැහැ. අපිට දීපු දීමනාව අපි දන්නෙ. ඒවා අපි කායර් මණ්ඩලයට දෙන්න ඕන දීමනාව අපි ගෙවලා තියෙනවා. ඒ අයට ඊ.පී.එෆ්, ඊ.ටී.එෆ්. මේ සභාවෙන් ගෙවලා තියෙනවා. ඒ විදියට අපි මේවා නිත්‍යානුකූලව ගෙවලා තියෙනවා. මේවා හංගලා ගහලා අත්සන් අරගෙන වෙන කාටවත් දීලා නැහැ. ඒ නිසා මේ ජනතාවගේ වගකීම් අපි ඒ ආකාරයෙන් ඉෂ්ඨ කරලා තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, හෙට දවසෙත් අපිට පැවරෙන වගකීම මොකක්ද? ඒක වඩාත් ඵලදායී ලෙස අපි ජනතාවගේ සුබසෙත වෙනුවෙන් අපේ කැපවීම අපි කරනවා. ඒ නිසා අපි කරන ව්‍යාපාරත් එක්ක අපිට කායර් භාරයක් වගකීමක් දරාගන්න පුළුවන්. ඒ නිසා හෙට දවසෙත් අපි අපේ වගකීමත් අපි ඒ ආකාරයෙන් ඉෂ්ඨ කරන එක මේ ගරු සභාවට සිහිපත් කරමින් මේ ගරු සභාවේ මන්ත්‍රීවරු 55 දෙනාම අපි දන්නවා පෞද්ගලිකවත් තමන් කරපු කායර් භාරය මොකක්ද මේ පළාතේ ජනතාවගේ උවමනා එපාකම් වෙනුවෙන් ඒ යුතුකම් කොටස තමන්ට හැකි පමණින් ඉෂ්ඨ කළා. ඒ නිසා ඒ තත්ත්වය හමුවේ අපි ක්‍රියාත්මක වුණා. ඒ නිසා හෙට දවසේ සිදුවෙන අවාසනාවන්ත සිදුවීම් අපි ඉතාමත් කණගාටුවෙන් හෙළා දකිමින් ඔබතුමා ඇතුළු මේ අපේ පළාත් සභාවේ කායර් මණ්ඩලයට ඒ වගේම අමාත්‍යාංශවල සියළුදෙනාට අපට සහයෝගය දුන්න සියළු දෙනාට ගෞරවනීය ප්‍රණාමය පුද කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

සභාපතිතුමා:- බොහොම ස්තුතියි. මීළඟට ටී.වී.කේ. ගාමිණී මන්ත්‍රීතුමා.

ටී.වී.කේ. ගාමිණී මහතා:- ගරු සභාපතිතුමනි, හත්වන පළාත් සභාවේ අවසාන සභා වාරය කතා කිරීමට මට අවස්ථාව ලබාදීම ගැන ගරු විපක්ෂනායකතුමාටත්, ගරු විපක්ෂයේ සංවිධායකතුමාටත් මගේ ස්තුතිය මේ අවස්ථාවේ පුද කරනවා. ගරු සභාපතිතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ දශක දෙකක කාලයක් තුළ දේශපාලනයේ සිටි මම 2014 පළාත් සභා නියෝජිතයෙක් වශයෙන් තේරී පත්වෙලා මේ පළාත් සභාවට ඇවිල්ලා පළාත් සභාවෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් කළහැකි උපරිම සේවාව ඉෂ්ඨ කළා කියන එක මගේ හදවතට එකහව මට සන්තෝෂ වෙන්න පුළුවන්. ඇත්තෙන්ම පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් 2014 මේ පළාත් සභාවට තේරී පත්වෙලා මේ පළාත් සභාවෙන් ලබාදෙන පළාත් සභා ප්‍රතිපාදන නිසියාකාරව ජනතාව අතර බෙදා දෙන්න කටයුතු කළා. නිසියාකාරව බෙදා දුන්නා. ඒ තුළ ඇත්තටම මම සන්තෝෂ වෙනවා මේ පළාත් සභාවේ ගරු අමාත්‍යතුමන්ලා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් මාගේ ඉල්ලීම්වලට ඇහුම්කන් දීලා ගරු අමාත්‍යතුමන්ලා මට උදව් කළා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා පාරවල් කීපයකට ප්‍රතිපාදන ලබාදුන්නා. ඒ අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ යන්න බැරි පාරවල්වලට පාරවල් සාදා ගන්න ප්‍රධාන අමාත්‍යතුමා ලොකු ශක්තියක් වුණා. ඒ විතරක් නෙවෙයි ගරු අධ්‍යාපන අමාත්‍යතුමා එතුමා මට සහයෝගයක් දුන්නා විශාල වශයෙන් මාතර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් ඒ පාරවල් කීපයක් සාදා දීමට රැකීරක්ෂා කීපයකුත් ලබාදුන්නා. මගේ ස්තුතිය එතුමාට පුද කරනවා. ඒ විතරක් නෙවෙයි. මගේ පළාත් සභා ප්‍රතිපාදන බෙදාදීමේ උත්සවය වෙනුවෙන් ගරු අමාත්‍යතුමා අවුරුදු තුනක් තුළ නොකඩවා මට ශක්තියක් වුණා. උත්සවයට සහභාගි වෙලා එතුමන්ට මගේ ප්‍රණාමය ස්තුතිය පුද කරනවා. ගුණසේන ඇමතිතුමා මම මේ අවස්ථාවේ මතක් කරනවා. ධීවර ජනතාව වෙනුවෙන් ඔරු දෙකකුත් ධීවර ආම්පන්න කීපයකුත් ලබාදීලා මගේ ජනතාව වෙනුවෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවට සේවාවක් කරන්න එතුමාගේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන තුළින් මට හැකිවුණා. මම මගේ ස්තුතිය එතුමාටත් මේ අවස්ථාවේ පුද කරනවා. ඒ විතරක් නෙවෙයි, ගරු සිරිසේන අමාත්‍යතුමා අක්ෂි සායන දෙකක් පවත්වලා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් කණ්නාඩි ලබාදීමට එතුමා මට සහයෝගය ලබාදුන්නා. මම එතුමාටත් මගේ හෘදයාංගම ස්තුතිය මේ අවස්ථාවේ පුද කරනවා. අපේ යූ.ජී.ඩී. ආරියතිලක කෘෂිකමර් අමාත්‍යතුමා.

එතුමත් එක්ක අපේ දේශපාලන වශයෙන් මත ගැටුම් තිබුණත් ඇත්තටම ද්වේශයකින් එතුමත් එක්ක කටයුතු කළේ නැහැ.මෙතන හිටපු ඇමතිවරුන්ගෙන් පළාත් සභාවේ මන්ත්‍රීවරුන් කීප දෙනෙකුට සහයෝගය ලබාදුන්නත් පොඩි කිසි කෙනෙකුට සහයෝගයක් එතුමා ලබාදීලා නැහැ. ඇත්තෙන්ම ඒක තමයි අපිට කණගාටු වෙන්න තියෙන එකම කාරණය. අපේ හිටපු වීරසුමන ඇමතිතුමා මේ සභාවේ අපි සහයෝගයෙන් කටයුතු කළා. අපිට කණ්නාඩි සායන ඉල්ලලා ඇරියත් අපේ කිසි තරහක් නැහැ, ද්වේශයක් නැහැ. අපි එතුමා ඇත්ත වශයෙන්ම මේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රීඩාව වෙනුවෙන් ලොකු සේවාවක් කළා එතුමාගේ අමාත්‍ය ධූරය කාලෙ. ඉතින් මම එතුමාට හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් එතුමාටත් මම හදවතින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ විතරක් නෙවෙයි අද මේ අවසාන වෙන පළාත් සභාවේ අවසන් වෙන මොහොතේ අපිට කියන්න තියෙන්නෙ අපේ රජය යටතේ ඇත්තටම අපි කණගාටු වෙන්න ඕන එක්සත් ජාතික පාක්ෂිකයො වශයෙන් පළාත් සභා මැතිවරණය කාලයක් නැතුව මැතිවරණයක් නොපවත්වා කටයුතු කරන්න අපේ රජය කටයුතු කරනවා. ඒ ජනතාවගේ අයිතිවාසිකම් අමු අමුවේ විනාශ කරන ක්‍රමවේදයකට අපේ යූ.එන්.පී. රජය කටයුතු කරන එක ගැන මම පෞද්ගලිකව කණගාටු වෙන අතර, මම අප්‍රසාදය පල කරනවා මේ අවස්ථාවේ මගේ රජයට. එසේ ප්‍රකාශ කරමින් රටේ ජනතාවගේ අයිතිවාසිකම් ඡන්ද බලය නිසි කාලයට ලබා දෙන්න අපේ රජයට ඇස් කන් ඇරේවා! ප්‍රාර්ථනා කරමින් එදා ජනතාවගේ අයිතිවාසිකම් නිසියාකාරයට නොලැබීම නිසා ජනතා විමුක්ති පෙරමුණ අවි ආයුධ ගත්තා. අපේ එක්සත් ජාතික පක්ෂයේ නායකයින්ට කියන්න තියෙන්නෙ එක දෙයයි. යූ.එන්.පී. කාරයො අවි ආයුධ ගන්න තැනට මෙහෙයවන්න කියන එක ඉල්ලා සිටිමින් මා ස්තුතිවන්ත වෙනවා මේකට සහයෝගය ලබාදීලා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් සේවාවක් කරන්න සහයෝගය දීපු සියළු දෙනාටම මගේ හෘදයාංගම ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

සභාපතිතුමා:- මීළඟට සිංහ සමන් කුමාර ගරු මන්ත්‍රීතුමා.

සිංහ සමන් කුමාර මහතා:- ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන්. අද අවසාන පළාත් සභාවේ කරුණු විවරණයක් කිරීම සඳහා. ඇත්තෙන්ම අපේ ගාමිණී මන්ත්‍රිතුමාගේ හෘද සාක්ෂිය එතුමා අවසාන මොහොතේ හෙළි කළා. ඒ වගේම තමයි විපක්ෂනායකතුමා. විපක්ෂනායකතුමා පසුගිය සභා වාරයේදී එතුමා දැඩි ලෙස මේ රජයට, ජනාධිපතිතුමාට, අගමැතිතුමාට බලවත් අප්‍රසාදය පල කළා. හැබැයි කණගාටු වෙනවා කිසිම මාධ්‍යයක් කිසිම රූපවාහිනී මාධ්‍යයක එතුමාගේ ප්‍රකාශය දැම්මෙ නැහැ. මොකද ස්වාධීනයි කියන ඒ මාධ්‍ය කිසිම ආයතනයක් එතුමාගේ ප්‍රකාශය රටට හෙළි කළේ නැහැ. මොකද මාධ්‍ය ස්වාධීන නම් අන්න අපේ විපක්ෂනායකතුමාගේ හෘද සාක්ෂිය හෙළි කරන්න තිබුණා. එහෙම කළේ නැහැ. ගරු සභාපතිතුමනි, ඒ එක්කම, හැබැයි ඒ වගේම මාධ්‍යයට ස්තුති කරන්නත් ඕන. මොකද පසුගිය වසර පහ පුරාවටම පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට පත්වුණා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ දවස් 40 ක් වැනි කෙටි කාලයක් තුළ පස්වෙනි විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ඉල්ලීමක් පරිදි කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයෙක් හැටියට හිටපු මට කතා කරලා කිව්වා උපන් ගමෙන් ඡන්දෙ ඉල්ලන්න කියලා. දවස් 40 ක් වගේ කෙටි කාලයක් තුළ, ඒ කෙටි කාලය තුළ මගේ අරමුණ, මගේ උපන් ගමේ ජනතාවට ප්‍රදේශයේ ජනතාවට කිව්වා මට පුළුවන් වුණා මේ පළාත් සභාව නියෝජනය කිරීම සඳහා අවස්ථාව ලබාගැනීමට. ඒ වගේම මගේ මෙහෙය මට හැකි ආකාරයෙන් මගේ ශක්තිය උපයෝගී කරගෙන මගේ හැම ශක්තියෙන්ම උපයෝගී කරගෙන මම කළා. ඒ අතරේ මට සිහිපත් වෙනවා අපේ අවාසනාවකට අපි කරගෙන ආපු වැඩපිළිවෙල අපි දියත් කරපු වැඩපිළිවෙල දකුණ දියුණු කරන්න රට දියුණු කරන්න රට නංවන්න හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපල ඒ ආශ්‍රිත කර්මාන්ත ශාලා ඒ සියළු දෑ නිර්මාණය කරන ඒ කඳවුරේ ඉන්න අපිට සිදුවුණා. ඒ සියල්ල අත අරින්න 2015 ජනවාරි 08 වෙනිදා. ඒ 2015 ජනවාරි 08 වෙනිදා ඒ සියල්ල අත අරිනකොට ගරු සභාපතිතුමනි, සිහිපත් කරන්න ඕන මම ගෙනාවා හැන්සාඩ් වාතර්‍ාවක්. කියවන්න වෙලාවක් නැහැ. 2015.01.27 වෙනිදා. මම මේක අද උදේ එන ගමන් කියව කියවා ආවා. මේකෙදි යෝජනාවක් ඉදිරිපත් වුණා අපේ ගරු නලින් හේවගේ ගරු මන්ත්‍රීතුමා. එදා එතුමා යෝජනා කරලා එතුමා පතපු ලෝකය නලින් හේවගේ ගරු මන්ත්‍රීතුමා එතුමා පතපු ලෝකය යහපාලන ලෝකය ඒ දිව්‍ය ලෝකය ගැන ඉතාමත්ම තියෙනවා හොඳ

විවරණයක් කරලා තියෙනවා. මොකක්ද එතුමා බලාපොරොත්තු වුණා 1.27 වෙනිදා. අනේ දෙයියනේ ගරු සභාපතිතුමනි, අද වෙනකොට මොකක්ද වෙලා තියෙන්නෙ? ඒ යහපාලනය කියන ප්‍රජාතන්ත්‍රවාදී රාමුව ඇතුලේ අද ඡන්ද කල් දාලා. ඡන්ද නැහැ පළාත් සභාවේ මන්ත්‍රිවරුන්ට. 89 ඉඳලා පටන් ගත්ත පළාත් සභාවේ මන්ත්‍රිවරුන් නික්මුණේ මෙතනින් ඊළඟ ඡන්දයේදී ජනතාව අපිට කැමැත්ත දෙයිද නැද්ද. එහෙම නම් අපි එනවා කියන පරමාථර්ය ඇතුව. නමුත් මේ මන්ත්‍රීවරු අද යන්නෙ හිස් අතින්. හිස් අතින් යන්නෙ. ප්‍රජාතන්ත්‍රවාදය මංකොල්ල කාපු ඒ වතර්මාන ආණ්ඩුව තුළ. අර නලින් හේවගේ ගරු මන්ත්‍රීතුමා ඒ පතපු ලෝකය අද කලු වලාවක් වෙච්ච ලෝකයක්. අද කලුවරේ අතපත ගානවා. ඒ වුණාට ගරු සභාපතිතුමනි, අපි කරන්න ඕන දේවල් කළා. මට මතක් වෙනවා .

නලින් හේවගේ මහතා:- මේ අවුරුදු පහක් ඉඳලා අද මුසාවාද කියන්න එපා. මොකක්ද මම කියපු එක බලන්න.

සිංහ සමන් කුමාර මහතා:- ගරු සභාපතිතුමනි, ඔබතුමා කියපු වෙලාව නැහැනේ. මේ සිහිපත් කරලා දෙන්නම් මේ වාතර්ාව.

නලින් හේවගේ මහතා:- එක තැනකින් කියන්න. යහපාලනය හොඳයි කියපු තැන.

සිංහ සමන් කුමාර මහතා:- ඔබතුමන්ලා මේ යහපාලන ආණ්ඩුව හැදුවා කියන එකත් තියෙනවා.

නලින් හේවගේ මහතා:- නෑ. නෑ. වැරදියි.

සිංහ සමන් කුමාර මහතා:- එක තැනක තියෙනවා මෙහෙම. අපි දකිනවා මේ වෙලාවේ කොතනකවත් ආථර්කය ඉස්සරහට ආවෙ නැහැ. මේ වෙලාවේ ජනතාවට තිබුණෙ ඊට වඩා ප්‍රධාන ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය තමයි ඒකාධිපති යන ගමනක් යමින් පවතින සියළුම අංග අපි පරාජය කළා.

නලින් හේවගේ මහතා:- හරි. ඒකනේ.

සිංහ සමන් කුමාර මහතා:- මේ වෙලාවේ ඡන්ද නොතියපු විදියට ....(අපහැදිලියි)..... ඔබතුමා ...

නලින් හේවගේ මහතා:- ඡන්ද නෙවෙයි. .... ඕක වැරදියි. .......(ඝෝෂා) ........ රූපවාහිනියේ දාලා තියෙනවා අදටත් ණය.

සිංහ සමන් කුමාර මහතා:- 2017 ඔබතුමා කියපු කතාව අද තියෙනවද කියලා බලන්න. ඔබතුමා බොහොම උජාරුවෙන් එදා කතා කළේ. .......(ඝෝෂා) ........ මේ ගන්ධබ්බ කාලෙ නෙවෙයි. ඔබතුමන්ලාට තේරෙන්නෙ නැහැ. මේ රටේ විපක්ෂනායකතුමා කියනවා මේක ආණ්ඩුවක් කියලා. ඊට වැඩිය මොනවද තවත්.

එස්. තෙන්නකෝන් නිලමේ මහතා(විපක්ෂනායක):- අපි කතා කළේ මේ පමරීට් එක සම්බන්ධව. .......(ඝෝෂා) ........

සිංහ සමන් කුමාර මහතා:- මේ අවුරුදු පහක කාලය තුළ ගරු සභාපතිතුමනි, මට කරන්න පුළුවන් මෙහෙය රටේ විශාලම මෙහෙය මට කරන්න පුළුවන් පළවෙනි වතාවට පුළුවන් වුණා බැඳුම්කර වංචාව මේ සභාවේ හෙළි කරන්න. ඒ හැන්සාඩ් එක මගේ ගාව තියෙනවා. 2015.03.10 වෙනිදා. මේක පළවෙනි වතාවට මේ හැන්සාඩ් එක තුළ, හැබැයි කිසිම මාධ්‍යයක් මේක හෙළි කළේ නැහැ. කිසිම මාධ්‍යයක් හෙළි කළේ නැහැ. ඒ කරපු ප්‍රවෘත්ති සාකච්ඡා තමයි ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු එකතුවෙලා කරපු ප්‍රවෘත්ති සාකච්ඡාව තමයි මේ තුන්වෙනි මාසෙ 10 වෙනිදා කරපු මගේ හෙළිකිරීම පිළිබඳ ඕන නම් මාධ්‍යයට අවස්ථාව තියෙනවා කියවලා බලන්න මම මේ අවස්ථාව හෙළි කරන්නෙ නැද්ද කියලා. හැබැයි ලංකාදීප පත්‍රයට ස්තුතිවන්ත වෙනවා. දිවයින පත්‍රයට ස්තුතිවන්ත වෙනවා. මව්බිම පත්‍රයට ස්තුතිවන්ත වෙනවා. මෙන්න බැඳුම්කර වංචාව පිළිබඳව වාද විවාද ගියා. කව්ද හෙළිකළේ කියලා. මෙන්න පත්තර පිටුවේ දැම්මා නයා මැරුණ අභිගුණ්ඨිකයා වගේ ආණ්ඩුවේ ඇමතිවරු දැන් බැඳුම්කරය ගැන කතා කරනවා. අජර්ුන් මහේන්ද්‍රන් යන්න හදන වෙලාවේ දකුණු පළාත් සභා මන්ත්‍රී සිංහ සමන් කුමාර තමයි වංචාව මුලින්ම හෙළි කළේ. අමරවීර නෙමෙයි මමයි. ලංකාදීප පත්‍රයෙන් අභිමානයක් ගෙන දුන්නා. ස්තුතිවන්ත වෙනවා. මව්බිම පත්තරෙනුත් ඒ වගේම කියලා තියෙනවා. ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මේ හොරකම විතරක් නෙවෙයි. මම හැමදාම කිව්වා බැඳුම්කර වංචාව හෙළි කරන වෙලාවේ මම කිව්වා ගැබ්වෙලා තියෙනවා හැන්සාඩ් එකේ මීට වඩා දැවැන්ත හොරකමක් මේ රටේ මේ 2015 ජනවාරි 08 වෙනිදා ආරම්භ වෙච්ච ආණ්ඩුව කරලා තියෙනවා. ඒ මොකක්ද? මුළු රටේම බැංකු ගැරන්ටි ඇපේට තියලා ලෝකයෙන් මුදල් අරගෙන ඒ මුදල් බැංකු එකවුන්ට් එකට දාගෙන තියෙනවා.

මේක හෙළි කරන්න මට කවදාවත් දුන්නෙ නැහැ. අවස්ථාව දීලා වැඩකුත් නැහැ. මොකද බැඳුම්කරයට දඬුවම් නොකරපු ආණ්ඩුව බැන්ක් ගැරන්ටි එකට උත්තර දෙන්නෙ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අවශ්‍ය වෙන්නෙ නැහැ. ඇත්තටම ස්තුතිවන්ත වෙනවා. මාධ්‍ය සගයන්ට. අපිත් එක්ක බොහොම කුළුපගව මේ හැම තත්ත්පරයකම අපිත් එක්ක හිටියා. මේ සභාවේ කරුණු සම්බන්ධව ඒ සියළු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියළුම ලේකම්තුමන්ලා, තුමියන්ලා සහයෝගය දුන්නා, අධ්‍යක්ෂකතුමන්ලා, තුමියන්ලා සහයෝගය දුන්නා. ඒ සියළු දෙනාටම මගේ හෘදයාංගම ස්තුතිය පුද කරනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ දූප්පත් ජනතාව වෙනුවෙන් පානීය ජල ව්‍යාපෘතියක් දියත් කළා. ඒ ව්‍යාපෘතිය දියත් කරන අවස්ථාවේදී ගරු ඇමතිතුමන්ලාගෙන් මම ඉල්ලුවා උදව්.ඒ අවස්ථාවේ ගරු ආරියතිලක ඇමතිතුමා මට ලක්ෂ 25 ක මුදලක් දුන්නා. ඊටපස්සෙ මහඇමතිතුමා ලක්ෂ 10 ක මුදලක් දුන්නා. අපේ ගුණසේන ඇමතිතුමා ලක්ෂ 05 ක මුදලක් දුන්නා. ඉතුරු සියල්ල සොයාගෙන මිලියන 12 ක ව්‍යාපෘතිය නිමකරලා අද දූප්පත් ගම්මානයක ජනතාව අද ජල පරිභෝජනය ලබනවා. ඒ විතරක් නෙවෙයි, ඒ ව්‍යාපෘතියෙන් පවුල් 2000 ක් දක්වා දියත් කරන්න විශාල කරන්න පුළුවන් හැකියාව තියෙනවා. නමුත් ගැටළුවක් තියෙනවා. මෙහෙමයි ගරු සභාපතිතුමනි. ඒ වගේම තමයි මම දියත් කරපු අනිත් වැඩපිළිවෙළ අපේ අමාත්‍යාංශවල අය උදව් කළා. විශේෂයෙන්ම අධ්‍යාපන අධීක්ෂණ මන්ත්‍රීවරයා හැටියට අපේ රාජපුත්‍ර ඇමතිතුමා, එතුමා විශේෂ සහයෝගයක් මට දුන්නා. එතුමා මට මේ විෂය භාරදෙන වෙලාවේ මම එතුමාට කිව්වා මට වැඩ කරන්න ඕන ඇමතිතුමා, මට මගේ ප්‍රදේශය බලන්න ඕන. මට ඒ ප්‍රදේශයට වැඩ කරන්න ඕන. මට නිකම්ම ලිපියක් අරගෙන මුදලක් ගන්න මම බලාපොරොත්තුවක් නැහැ. මට එහෙම අවශ්‍ය නැහැ. මට අවශ්‍ය වැඩ කරන්න කියලා. එතුමා සියළු කරුණු පවරා දුන්නා. උදාහරණයක් හැටියට එහි අවශ්‍යතාවයක් හැටියට පාසැල් සංවධර්නය කිරීමේ මට හැකියාව, ශක්තිය ලැබුණා ඒ ප්‍රදේශවල අය පාසැල්වල අවශ්‍ය ඒ අඩුලුහුඩුකම් සපුරා ගන්න. විශේෂයෙන්ම ගොඩනැගිලි. ඒ වගේ සියළු දේ උදව් කරන්න අපේ ඇමතිතුමා පසුබට වුණේ නැහැ. ඒ එක්කම අපේ අධ්‍යාපන ඇමතිතුමාට විශේෂ ස්තුතියක් පුද කරන්න ඕන. මොකද එතුමා මේ අධ්‍යාපන තලය ඉහළටම ගෙනාවා. අද ලංකාවේ කලාප 95 අතරින් පළවෙනි කලාපය මගේ කලාපය, වලස්මුල්ල කලාපය. ඒ වලස්මුල්ල කලාපය තුන්වන වරටත් ප්‍රථම ස්ථානය ලැබුවා. අධ්‍යාපනයේ ප්‍රතිඵල අනුව. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපේ ඇමතිතුමාගේ දැක්ම එතුමා විශාල බාධක මැද්දේ තමයි මේ ගමන ආවෙ. ඒ ගමන එතුමා ඉතාමත්ම හොඳින් විවරණය කළා එතුමාගේ ඒ පැහැදිලි කිරීම. හම්බන්තොට තිබ්ච්ච ඒ ගුරු උපහාර උළෙලේදී. විශේෂයෙන් සිසු තරණ උපහාර උළෙලේ. එතුමා ඇත්තටම ඉතාමත්ම සංවේදී ලෙස ඒ කරුණු පැහැදිලි කළා. එතුමා ගත්ත ක්‍රියාමාගර්යන් සම්බන්ධව. ඇත්තටම ඒ අවස්ථාවේදී අති දක්ෂ ඒ වගේම උපක්‍රමශීලී ඉතාමත් දක්ෂ ක්‍රියාමාගර්යක්. එතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා අපට අභිමානයක් ගෙන දුන්නා. එතුමාගේ ක්‍රියාකලාපය හම්බන්තොට දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට අභිමානයක් ගෙනියන්න කටයුතු කළා. එතුමාගේ ඒ සහයෝගය. ඒ එක්කම අනිත් සියළුම මැති ඇමතිවරු මහඇමතිතුමා ඇතුළු සියළුම ඇමතිවරුන්ට මනෝජ් සිරිසේන ඇමතිතුමාට, ඒ සියළු දෙනාට විශේෂ ස්තුතියක් පුද කරනවා. මොකද අමාත්‍ය ප්‍රතිපාදන යම් යම් අවස්ථාවලදී ලබාදීලා අපිට මන්ත්‍රී ධූරයේ අභිමානයට යම් උදව් කිරීම සම්බන්ධයෙන්. ඒ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවට යම් සේවයක් උදව් උපකාරයක් කිරීම සම්බන්ධයෙන්. එහෙම නම් මම හිතන්නෙ අද නික්ම යන දවසේ අපි ගොඩක් දේවල් කතා කළා. සභාවේ ගොඩක් දේවල් කතා කළා. සමහර විට අපිට අපි එකට ආපහු මූණ නොගැහෙන්න පුළුවන්. ආපහු පළාත් සභාවක් නොමැති වෙන්න පුළුවන්. අපිට මේ යන විදියට මේ ප්‍රජාතන්ත්‍රවාදය අකා මකා දාලා ඉවරයි. මේ රටේ නිදහස ගැන කතා කරපු මේ රටේ පරමාධිපත්‍ය ගැන කතා කරපු ඒ සියළු දෙනා අද ගොළුවත රැකිලා තියෙන්නෙ. ඔක්කොම ගොලුවෝ කරලා තියෙන්නෙ. උපක්‍රමශීලීවලින් ධෛයර්ය පමණක් රැකගන්න පුළුවන් පරදේශක්කාර, පරගැති ආණ්ඩුවක් තමයි මේ තියෙන්නෙ කියන එක මම අවිවාදයෙන් අවසාන මොහොතේ කියනවා. මොකද රටට ආදරේ නැහැ. රටට ආදරේ කියනවා නම් අර හම්බන්තොට විකුණලා ජනතාවට කන්න දෙන්නෙ නැහැ. හම්බන්තොට විකුණමින් ණය ටික ගෙවන්න බැහැ කියලා. නමුත් ඒ ණය සත පහක් ගෙවලා නැහැ ගරු සභාපතිතුමනි. ඒ නිසා කියනවා මේ වගේ පරගැති ආණ්ඩුවක් එළවා අදා මම 2015 ජනවාරි 08 වෙනිදයින් පස්සෙ තිබ්ච්ච පළමු පළාත් සභාවේදී

කිව්වා මේ රට නැවතත් මහින්ද රාජපක්ෂ යුගයකට එන්න ඕන. මේක පහදන්න නම් එන්න ඕන මේක ජනතාව කරගත්ත වැරැද්දක් කියලා. බලන්න හැන්සාඩ් එකේ ඇති. කියවලා බලන්න. මම කිව්වා ආපහු යුග පුරුෂයෙක් නැවතත් එන්න ඕන. මොකද යුග පුරුෂයා කියන්නෙ වසර 2500 ක ඉතිහාසයක් තුළ රට එක්සේසත් කරපු රජවරු අට දෙනයි ඉන්නෙ. ඒ රජවරු අට දෙනාට එක හඩින් කියනවා ගරු සභාපතිතුමනි, අපේ ඇස් දෙක පිංකරලා තියෙනවා ඒ රජෙක් දකින්න. ඒ වෙන කවුරුත් නෙවෙයි මහින්ද රාජපක්ෂ කියන යුග පුරුෂයා දකින්න අපි පිං කරලා තියෙනවා. අන්න ඒ යුග පුරුෂයාට නැවතත් බලය දුන්න දවසක එතන ඉඳලා මේ රට දියත් කරන්න හදන්න පුළුවන් වෙනවා. ඒක ඔහුගේ හැකියාව තුළින්ම ඒ පාලන තන්ත්‍රය තුළ ඔප්පු කරලා තියෙනවා. යම් යම් වැරදි වුණා. අපි පිළිගන්නවා. යම් යම් වැරදි වුණා. නමුත් මේ සංසන්දනය කළාම 2015 ජනවාරි 08 යි අදයි සංසන්දනය කළාම ගරු සභාපතිතුමනි, මේ කරපු වැරදි වලට දඩුවම් දෙන්න, එහෙම නැත්නම් මේ කරපු විනාශයට දඩුවම් දෙන්න සභාපතිතුමනි. 225 ක් සිටුවන්න ඕන. මේ කරපු විනාශයට දඩුවම් දෙන්න. ඒ නිසා ගරු සභාපතිතුමනි, මගේ කතාව අවසන් කරනවා මෙන්න මේ ආකාරයට. හැමදාම පළාත් සභාවේ ......... (ඝෝෂා)...අපහැදිලියි) ..... මම අවසන් කරන්නෙ කවියක් කියලා. සභාව අවසන් කරන්නම්.

වොක්ස් වැගන්වලින් පාර පිරී ඇත - කුලියාපිටියෙලු සාදන්නේ

ගුගල් බැලුමක් අහසට විදලා - ෆ්‍රී වයිෆයි විඳිමින් ඉන්නේ

රැකියා දශ ලක්ෂයකුත් ලැබිලා සැම රිසි සැම තුටුවී ඉන්නේ

විදුලිය වෙනුවට කලුවර ලැබිලා යහපාලුවො හෙළුවෙන් ඉන්නේ. ස්තුතියි.

අමරසිරි කුරුවේගෙයි මහතා:- ගරු සභාපතිතුමනි, පළාත් සභාවේ අවසන් සැසි වාරයේ අද අවසන් රැස්වීම පත්වන වෙලාවේ අවස්ථාවක් ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. මම හිතනවා අපි 55 දෙනාගෙන් වැඩිදෙනෙක් සභාවේ ඉන්න වෙලාවේ ඉතාම කෙටියෙන් මගේ කතාව අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම මම ඔබතුමාට මේ පළාත් සභාවට මම පැමිණියේ 2014 අප්‍රේල් මාසෙ 10 වෙනිදා. මම පැමිණෙනකොට මේ පළාත් සභාවේ දෙවැනි පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට පත්වුණු අමරසිරි දොඩංගොඩ ඒ අපේ නායකතුමාගේ ප්‍රධාන ගෝලයා යූ.ජී.ඩී. ආරියතිලක ඇමතිතුමා මේ පළාත් සභාවේ හිටියා. ඒ මම පැමිණි පළාත් සභාවට 2014 එතුමාගේ පුත්‍ර රත්නය ඉසුරු දොඩංගොඩ මන්ත්‍රීතුමා, පද්මසිරි ද සිල්වා මන්ත්‍රීතුමා මමත් අපි තුන් දෙනෙක් මේ පළාත් සභාවට පත්වුණා. අපි සිහිපත් කරන්න ඕන ඒ ආදශර්මත් පිවිතුරු, අවංක දේශපාලනඥයෙක් හැටියට මේ රටේ ජනතාවගේ සිත් සතන් තුළ තාමත් අමරණීයව ජීවත් වන ඒ අපේ නායකතුමාගේ ගෞරවය ආරක්ෂා වෙන විදියට අපි හතරදෙනාම මේ පළාත් සභාව තුළ හැසිරුණා කියන එක ඔබතුමාට කියන්න ඕන. ඒ වගේම ඔබතුමා මේ සභාව තුළ සභාපතිතුමා හැටියට නායකයා හැටියට මේක මෙහෙයවන්නා, මඟපෙන්වන්නා හැටියට අපේ හතර දෙනාගෙන් කිසිම කෙනෙක් ඔබතුමාට කරදරයක් වෙන විදියට අපි කොයිම වෙලාවකවත් අපි හැසිරිලා නැහැ. අපි ඉතාමත්ම ආඩම්බර වෙනවා අපි වපසරිය තේරුම් අරගෙන අපි අපේ සීමාව තේරුම් අරගෙන අපේ අනිත් අයටත් බාධාවක් නොවෙන විදියට අපේ යුතුකම අපේ රාජකාරිය අපි විසින් ඒ ජනතාවට පොරොන්දු වූ ඒ කායර්භාරය ඉෂ්ඨ කරන්නට ඔබතුමා විශාල මෙහෙයක්, විශාල සහයෝගයක්, විශාල දැණුමක්, විශාල මඟපෙන්වීමක් අපට ලබාදුන්නා. වෘත්තියෙන් ගුරුවරයෙක් හැටියට විදුහල්පතිවරයෙක් හැටියටත් ඔබතුමා ඉතාමත්ම ඉවසිලිවන්තව මේ සභාව පවත්වාගෙන ගිය එක ගැන සමහර වෙලාවල්වල මට පුදුම හිතුනා, ඔබතුමාගේ ඉවසීමේ ගුණය ගැන. මොන විදියට කිව්වත් මාළු කෑලි හතර නම් තියෙන්නෙ හතර දෙනා නම් බත් කන්න වාඩිවෙලා ඉන්නෙ. එක්කෙනෙක් මාළු කෑලි දෙකක් දාගත්තොත් එක්කෙනාට මාළු කෑල්ලක් නැතිවෙනවා කියන එක කල්පනා කරන්නෙ නැතුව මාළු කෑලි තුනක් දාගෙන හතරම දාගෙනත් කන වෙලාවල් අපි දැක්කා. අපේ විදේශ ඇමතිවරයෙක් හිටියා ඒ.සී.එස්. හමීඩ්. 77 ඉඳලා. හැම වෙලාවෙම එක එක රටවල. එහෙම නැත්නම උඩුගුවනේ. කොයි වෙලාවකවත් ලංකාවේ නැහැ. සමහර අය හිටියා, කොයි වෙලාවකවත් පුටුවේ නැහැ. හැම වෙලාවෙම නැගිටලා මයික් එකේ. අනිත් මිනිහෙකුට කතා කරන්න දෙන්නෙත් නැහැ, මේ අවුරුදු පහක කාලය

තුළ, ඕනම නම් මම දවස් පහක් කතා කරලා ඇති. ඒ අත්‍යාවශ්‍ය කාරණයක් සඳහා. අපි විපක්ෂනායකතුමා හරි, විපක්ෂ සංවිධායකතුමා හරි නම දැම්මොත් ඒ අවශ්‍ය කාරණය තුළ, කාරණය ගැන ඒ කාලය තුළ කාලයට සීමාවෙලා කතා කරනවා. ඒ නිසා මම අද දිනයේත් ඒ ගෞරවය රැකගෙන මගේ කතාව කෙටි කරන්න මම කැමතියි. ගරු සභාපතිතුමනි, ඔබතුමාට ඒ වගේම සභාවේ ලේකම්තුමාට, ඒ වගේම සභා නිලධාරීන් සියළු දෙනාට, කායර් මණ්ඩලයට අපට මේ ජනතාවගේ කායර්යන් ඉෂ්ඨ කිරීමට අපට දුන් සහයෝගය නොදන්නා කරුණු කියාදීම පිළිබඳව අපි නවකයන් හැටියට පළාත් සභාවට ආවට පස්සෙ බොහෝ දේවල් දැනගත යුතු කරුණු කාරණා රාශියක් තිබුණා. ඒ සියළු දේ දී ඔබතුමා ප්‍රමුඛ ඔබතුමාගේ කායර් මණ්ඩලය ලේකම්තුමා ඇතුළු සියළු දෙනා අපට දුන් සහයෝගය අනගිභවනීයයි. ඒ නිසා ඒ සියළු දෙනාටම මම මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරනවා. ඒ වගේම තවත් කාරණයක් මම සඳහන් කරන්න ඕන. මේ පළාත් සභාවට මම පැමිණියේ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට. ඒ පක්ෂයට නායකත්වය දුන්නෙ මේ රටේ යුද්ධය නිම කරන්නට. යුධ හමුදාපතිවරයා හැටියට, ලෝකයේ හොඳම යුධ හමුදාපතිවරයා හැටියට ඒ නිලධාරියා කීතරීයට පත් ෆීල්ඩ් මාෂර්ල් සරත් ෆොන්සේකා පිහිටුවන ලද ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියටයි මම මේ පළාත් සභාවට පැමිණියේ. මේ අවස්ථාවේ මම නැවත වාරයක් එතුමා සිහිපත් කරමින් එතුමාට ඒ ගෞරවය ලබාදීමට කැමතියි. මම කැමතියි පටන් ගන්න ප්‍රධාන ඇමතිතුමාගෙන්. ප්‍රධාන අමාත්‍යතුමා, නිලධාරීන්, ප්‍රධාන ලේකම්තුමා, ප්‍රධාන අමාත්‍යාංශයේ නිලධාරීන්, එතුමාගේ අමාත්‍යාංශය යටතේ සිටින නිලධාරීන්, ඇතුළු සියළු ආයතනවල නිලධාරීන් ඇතුළු කායර් මණ්ඩලය අපට අපේ ජනතාවගේ කායර්යන් ඉෂ්ඨ කිරීමේදී අපට සහයෝගය ලබාදුන්නා. ඒ ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ ප්‍රධාන ඇමතිතුමා ගැන වචනයක් කිව්වොත් අද ප්‍රධාන අමාත්‍යවරු ඉන්නවා. ලංකාවේ ප්‍රධාන අමාත්‍යවරු ඉන්නවා. සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන බලවේගය කියන පක්ෂයෙන් පත්වෙලා ගුරුවරු දණ ගස්සනවා, වෙද මහත්වරුත්, වෛද්‍යවරුන් එක්ක රණ්ඩු වෙනවා. පටලවා ගන්නවා. පංච මහා බලවේගයත් එක්ක සටන පටන් අරගෙන. ප්‍රධාන අමාත්‍ය තනතුරේ තියෙන ගෞරවය නැති කරන තැනට අපේ ප්‍රධාන අමාත්‍යතුමා අපට ආඩම්බරයක් කියන එක මම කියන්න ඕන.එතුමා ප්‍රධාන අමාත්‍ය ධූරයේ ගෞරවය ආරක්ෂා කරගෙන කටයුතු කළා. ඒ වගේම යූ.ජී.ඩී. ආරියතිලක ඇමතිතුමා මම සළකන්නෙ එතුමා වැඩිමහල් සහෝදරයෙක් හැටියට. දොඩංගොඩ ඇමතිතුමාගේ පළවෙනි ගෝලයා හැටියට. එතුමා ඇමතිවරයෙක් හැටියට එතුමාට පැවරිච්ච රාජකාරිය එතුමා පළපුරුදු දේශපාලනඥයෙකු හැටියට ජෝෂ්ඨ නීතිඥයෙක් හැටියට ඉතා හොඳ යහපත් මනුස්සයෙක් හැටියට සමාජයේ නමක් තියාගෙන ඉන්න කෙනෙක්. එතුමාගේ සහයෝගය අපට පුළුවන් ආකාරයෙන් ලබා දුන්නා. ඒ වගේම තමයි ගුණසේන ඇමතිතුමා. කෙටි කාලයක් ඇමති කෙනෙක් හැටියට කටයුතු කළා. එතුමා අපට කරන්න පුළුවන් දෙයක් එතුමාගේ අමාත්‍යාංශයෙන් අපට ලබාදුන්නා. ඒකට අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕන. ඒ වගේම මනෝජ් සිරිසේන ඇමතිතුමා කෙටි කාලයක් ඇමති කෙනෙක් හැටියට කටයුතු කළත් එතුමාට පුළුවන් දෙයක් අපි වෙනුවෙන් ලබාදෙන්න එතුමා අමතක කළේ නැහැ. හැමදෙනාටම සමසේ සැලකුවා. මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕන කෙනෙක් ඉන්නවා. එතුමා ගැන විශේෂ සඳහනක් කළාට අනිත් අය මම හිතන්නෙ නැහැ අකමැති වෙයි කියලා, අමනාප වෙයි කියලා. අපේ දකුණු පළාත් සභාවේ විතරක් නෙවෙයි, දකුණු පළාතේ ගෞරවය ආරක්ෂා කරලා දුන්න මේ රටට සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා එතුමා මේ රටට නිදහස් අධ්‍යාපනය ලබාදුන්නට පස්සෙ, එතුමා යුග පුරුෂයෙක්, එතුමා දකුණු පළාතේ කෙනෙක්. ඒ වගේම මේ චන්දිමා රාසපුත්‍ර මැතිතුමා උගත් ඇමතිවරයෙක් හැටියට එතුමා අධ්‍යාපන ඇමතිවරයා හැටියට පත්කළේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා. එතුමා කරපු වැදගත් කායර්යක් හැටියට, යහපත් කායර්යක් හැටියට මම සඳහන් කරන්න ඕන. එතුමා අධ්‍යාපන ඇමතිවරයා හැටියට දකුණු පළාතේ පත්කරපු නිසා එදා බොහොම දුෂ්කර පළාතක් හැටියට තිබිච්ච ලංකාවේ දුෂ්කරම දිස්ත්‍රික්කය මොණරාගලටත් වඩා දුෂ්කරතාවයන් වලින් පෙලිච්ච හම්බන්තොට දිස්ත්‍රික්කය ලංකාවේ පළමු තැනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල කලාපය හොඳම පළවෙනි අධ්‍යාපන කලාපය හැටියට පළවෙනි තැනට පත් කරන්න කටයුතු කළේ එතුමා. ගුරුවරයෙකු ගෙනල්ලා පාස් වෙන්න පුළුවන්. ඉංජිනේරුවරයෙකුට පුළුවන්, වෛද්‍යවරයෙකුට පුළුවන්. ඒත් ළමයි විභාගයට ලියලා ළමයි පාස්කරවීමේ කායර්යට ගුරුවරුන් යොදාගත්තෙ

එතුමා. එතුමා ගුරුවරයෙකුත් නෙවෙයි, අධ්‍යාපනඥයෙකුත් නෙවෙයි. එතුමා ඉංජිනේරුවරයෙක්. මෘදුකාංග පිළිබඳ ඉංජිනේරුවරයෙක්. ඒ වුණාට එතුමාගේ දැණුම එතුමා ප්‍රායෝගිකව පාවිච්චි කරලා එතුමා ගුරුවරුන්ගෙන් විදුහල්පතිවරුන්ගෙන් බැනුම් අහගෙන වැඩ අරගෙන එතුමා දකුණේ දුප්පත් දරුවන්ට උසස් අධ්‍යාපනය ලබාගන්න දොරටු විවෘත කරලා දුන්නා. ඒ නිසා අපි එතුමා අගය කරන්න ඕන. නමුත් මම කණගාටු වෙනවා එතුමා මෙවැනි සේවයක් කළා කියන කාරණය අපේ ජනාධිපතිතුමා දන්නෙත් නැහැ, අගමැතිතුමා දන්නෙත් නැහැ, කැබිනට් මණ්ඩලය දන්නෙත් නැහැ, පාලරීමේන්තුව දන්නෙත් නැහැ. මාධ්‍ය විසින් එතුමාට ප්‍රචාරයක් ලබාදුන්නෙත් නැහැ. ඒ විතරක් නෙවෙයි අපට ප්‍රශ්න තියෙනවා. මන්ත්‍රීවරු හැටියට ජනතාව අපි ළඟට එනවා. රැකී රක්ෂා ඉල්ලනවා. නොයෙකුත් දේවල් ඉල්ලගෙන අපි ළඟට එනවා. එතුමා අපේ ආත්ම ගරුත්වය නැති නොකර මා වැනි බිළින්දා - වර වර ළඟට කැන්දා - දුක් සැප කුමන්දා - අසන නිරිඳෝ වෙන කොයින්දා. කිව්වා වගේ අපිට කතා කරලා යම් යම් දේවල් අපට ලබාදුන්නේ. එතුමා ඒ වගේ ප්‍රජාතන්ත්‍රවාදී පුද්ගලයෙක්. එතුමා ඇමෙරිකාවේ වැඩිකලක් ජීවත්වුණ නිසාදෝ මම දන්නෙ නැහැ එතුමා සියළුදෙනාට සමානව සළකන වැදගත් මහත්මයෙක්, වැදගත් ඇමති කෙනෙක් හැටියට විශේෂ ගෞරවයක් ලබාදෙන්නට ඕන මේ වෙලාවේ. ඒ වගේම අපේ විපක්ෂනායකතුමා, විපක්ෂ සංවිධායකතුමා, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා සියළුදෙනාම විපක්ෂයේ නායකතුමන්ලා වගේම ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා ඒ සියළුදෙනා වගේම ඉතාමත්ම සහයෝගයෙන් කටයුතු කළා. අපට අවස්ථාවක් ලැබුණා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුත් එක්ක වැඩ කරන්න, ජ්‍යෙෂ්ඨ නීතිඥ මහත්වරුත් එක්ක වැඩ කරන්න. පළාත් සභාව තුළ අත්දැකීම් බහුල විශාල පිරිසක් සමඟ දැණුම හුවමාරු කරගෙන, දැණුම ලබාගෙන වැඩ කිරීමේ අවස්ථාව අපට ලැබුණා. විශේෂයෙන්ම සඳහන් කරන්න ඕන කාරණයක් තියෙනවා. අපි දේශපාලන පක්ෂවලට සම්බන්ධ වෙච්ච නිසා සමහර වෙලාවලට අපට කටයුතු කිරීමේදී ඒ පක්ෂවල නායකයන්ගේ ප්‍රතිපත්තිවලට අනුව කටයුතු කරන්න සිදුවෙනවා. නමුත් මා ඉතාමත්ම වැදගත් කාරණයක් හැටියට මේ වෙලාවේ සඳහන් කරන්න ඕන ජනතා විමුක්ති පෙරමුණ අපට කරන්න බැරි කාර්යයක් මේ සභාව තුළ ඉෂ්ඨ කළා. ඒ කාරණය මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕන. මේ පාර කිසිම බයක් සැකක් නැතුව වැරැද්දට වැරදියි කියන්න වැරදි පුද්ගලයා වැරැද්ද කළා කියන්න හොරකම කළා කියන්න ඇඟිල්ල දික් කරලා තමන්ගේ පක්ෂය බය නැතුව පක්ෂයේ අවසරය ඇතුව මේ පක්ෂයෙ පෙනී සිටින්න ඕන කියලා වැරදි කරන පාලරීමේන්තුවේ හෝ පළාත් සභා මන්ත්‍රීවරු කිසියම් තැනක යම් කෙනෙක් යම් ආයතනයක් යම් ඇමති කෙනෙක් යම් දේශපාලන පක්ෂයක් අධිකරණයක් හෝ වෙනත් ආයතනයක් වැරදි කරනවා නම් වැරැද්ද වැරැද්ද හැටියට පෙන්වාදීමට නිභර්යව කටයුතු කළා ජනතා විමුක්ති පෙරමුණ. එතුමන්ලාට මම මේ අවස්ථාවේදී විශේෂ ස්තුතියක් කරන්න මේ අවස්ථාව යොදා ගන්නවා. මේ සියළු දෙනාටම මේ අවස්ථාවේදී ඔබතුමා ඇතුළු පළාත් සභාවේ ආණ්ඩු පක්ෂ, විපක්ෂ සියළුමදෙනාට අප සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ගැන යම් යම් අවස්ථාවල ඔබතුමන්ලා සතු දේවල් අපට සාධාරණව බෙදාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ කතාව සමාප්ත කරනවා. ඔබසැමට සුභ අනාගතයක්, නැවත වරක් පළාත් සභා මැතිවරණයක් පැවැත්වූවොත් නැවත හමුවීමේ බලාපොරොත්තුව ඇතුව මම සමුගන්නවා. ඔබතුමන්ලාට සුභ අලුත් අවුරුද්දක් වේවා!.

සභාපතිතුමා:- ඔබතුමාට බොහොම ස්තුතියි. මීළඟට බද්දේගම සමිත ගරු ස්වාමීන් වහන්සේ.

බද්දේගම සමිත හිමි:- ගරු සභාපතිතුමනි, මම ඉතාම සතුටු වෙනවා ඔබතුමාට කෙටියෙන් හෝ වචන ස්වල්පයක් කතා කරන්නට අවස්ථාව ලබාදීම පිළිබඳව. අපි දකුණු පළාත් සභාවේ මහජන නියෝජිතයන් හැටියට මේ මුළු කාලය තුළම ජනතාව වෙනුවෙන් අපෙන් කෙරෙන්න ඕන කාර්ය භාරය අපි උපරිම ආකාරයෙන් ඉෂ්ඨ කළා කියලා අපිට විශාල තෘප්තියක් තියෙනවා. ඒ නිසා ඒ තෘප්තිය සමඟ අපි අද මේ සභාවෙන් පිටවෙන්නෙ. අපේ සභාවේ කාලය මෙතනින් අවසන් වුණාට අපේ කාර්ය්භාරය අපි විශ්වාස කරන්නේ අපි අවසන් කරලා නැහැ. ඒ නිසා මේ රටේ ජනතාව වෙනුවෙන් අපේ කැපවීම අපි දිගටම සිදුකරන බව විශේෂයෙන් ප්‍රකාශ කරමින් මුළු කාලය තුළ පළාත් සභාවේ සභාපතිතුමා හැටියට ඔබතුමා ඒ සභාව තුළ කෙරෙන්න ඕන රාජකාරී කටයුතු සම්බන්ධව මන්ත්‍රීවරුන් හැටියට අපට ලබාදුන්න සහයෝගය අපි ඉතාම ඉහලින් අගය කරනවා. ඒ වගේම ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය අපි අතරේ

විවිධ අවස්ථාවල විවිධ ගැටුම් ඇතිවුණා. විවිධ මතබේද ඇතිවුණා. දේශපාලනයේ ස්වභාවය තමයි ඒ. ඒ සියල්ල අපි සමනය කරගෙන අපි ඒ මුළු කාලය තුළ අපෙන් කෙරෙන්න ඕන ජනතා කාර්‍ය භාරය අපි ඉෂ්ඨ කළා කියන එක අපි විශ්වාස කරනවා. මන්ත්‍රීතුමන්ලා හැටියටත් අපි අපේ කාර්‍ය භාරය අපි අතරේ වාද විවාද ඇතිවුණා. ඒ සියල්ලේ අරමුණ වුණේ වඩා වැඩි සේවාවක් දකුණේ ජනතාවට ඉෂ්ඨ කිරීම. එහිදී විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය ගැන කතා කරද්දි අපි ඉතාම තෘප්තිමත්. හම්බන්තොට, මාතර දිස්ත්‍රික්කය, ගාල්ල දිස්ත්‍රික්කය ඒ දිස්ත්‍රික්ක තුනේ කටයුතුවලදී විශේෂයෙන්ම චන්දිමා රාසපුත්‍ර අධ්‍යාපන ඇමතිතුමාගේ කාලය තුළ එතුමා ඉතාම විධිමත් ලෙස ආචාර්‍ය මණ්ඩලය, විදුහල්පතිවරුන් මෙහෙයවලා දරුවන්ට අවශ්‍ය වන විධිමත් දැණුම ලබාදීලා ඉතාම විද්‍යාත්මක ලෙස එතුමාගේ කාර්‍ය භාරය ඉතාම හොඳින් ඉෂ්ඨ කළා. ඒ නිසා අද අපි එළියට බහින්නෙ දකුණු පළාත හැටියට අපේ අධ්‍යාපනය අහස උසට ඔසවලා තබලා අපේ කාර්‍ය භාරය ඉෂ්ඨ කරලා ඉතාම තෘප්තියෙන් තමයි අපි මේ ගමන අපි සභාවේ කටයුතු අවසන් කරන්නේ. ඒ නිසා ඒ කටයුතු සාර්ථක කරගන්න අපට ප්‍රධාන ලේකම්තුමා ප්‍රමුඛ ප්‍රධාන ලේකම් කාර්‍යාලයේ සියළුම නිලධාරීන් අපි ඉතාම ඉහළ සහයෝගයක් ලබාදුන්නා. ඒ වගේම සභාලේකම්තුමා සහ සභාලේකම් කාර්‍යාලයේ කාර්‍ය මණ්ඩලය අපිට නියමිත වෙලාවලට අවශ්‍ය දැනුම්දීම් කරලා අපිට උපරිම සහාය ලබාදුන්නා. ඒ නිසා අපි ඒ ගැන ඉතාමත් තෘප්තිමත් බවක් ප්‍රකාශ කරමින් අපි විශේෂයෙන්ම අපේ රටේ තියෙන තත්ත්වය පිළිබඳව කල්පනා කරද්දි අපි විශ්වාස කරන්නේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අපි එළියට බැස්සට අපි දන්නවා මැතිවරණයක් නැහැ කියලා. මැතිවරණය නැහැ කියලා කියන්නෙ ප්‍රජාතන්ත්‍රවාදය නැහැ කියන එක. ඒ නිසා අපි කණගාටු වෙනවා. අපි සෑම වෙලාවකම අපි කොච්චරම තනතුරුවල නොසිටියට පළාත් සභාවේ අපි තනතුරු නොදැරුවාට අපි එළියට බැහැලා එළියේ ලොකු අරගලයක් කරලා ජනතාවගේ ජනවරම ආරක්ෂා කිරීමට අප ක්‍රියාකල යුතුයි. ඒ සඳහා රජයට සම්බන්ධ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලන්නේ පක්ෂයේ කාරණයට වඩා අපි ඔබතුමන්ලාගේ හෘද සාක්ෂිය අමතලා ඒ හෘද සාක්ෂිය ජනතාවගේ හෘද සාක්ෂිය බවට පත්කරගෙන ජනතාවට අවශ්‍ය වෙලාවට ජනතාව කැමති පරිදි මේ විසිරී තියෙන සියළු පළාත් සභාවල එක දිනයෙක නැත්නම් එක පැයක් තුළ හරි හැකි ඉක්මණින් මැතිවරණ පවත්වන්න ඔබ කැමති විදියට මැතිවරණය පවත්වන්න අද ප්‍රජාතන්ත්‍රවාදය විධිවිධාන ආරක්ෂා කරමින් ක්‍රියා කරන්න කියන කාරණය අපි මේ වෙලාවේදී විශේෂයෙන්ම සිහිපත් කරනවා. ඒ සඳහා සියළු මන්ත්‍රීතුමන්ලාගෙන් අපි ඉල්ලනවා ඒ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කරන අරගලයට සියළුදෙනා පක්ෂ බේදයෙන් තොරව සහභාගි වෙලා නැවත අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිහිටුවීමේ කාර්‍ය භාරය ඉෂ්ඨ කරන්න ක්‍රියා කරන්න කියලා. එසේ සඳහන් කරමින් විශේෂයෙන් හෙට අනිද්දා වෙනකොට සිංහල හින්දු අලුත් අවුරුද්ද සමරනවා. ඒ කාලය තුළ ඒ පියවර තබන ඒ සිංහල හින්දු අලුත් අවුරුද්දට මුහුණ දෙන්නට ක්‍රියා කරන අපි ඒ උපරිම ආකාරයෙන් ජනතාව අතරේ සහයෝගයෙන් ක්‍රියා කරන්නට ඒ වගේම ජනතාව සමඟ එකතු වෙලා ඔබ සැමට මා ප්‍රාර්ථනා කරනවා ඔබ සැමටම සිංහල හින්දු අලුත් අවුරුද්ද සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් සියළු දෙනාටම බොහොම ස්තුතියි.

සභාපතිතුමා:- ගෞරවනීය ස්වාමීන්වහන්සේට ස්තුතියි. මීළඟට ගරු සංජීව කරුණාතිලක මන්ත්‍රීතුමා.

සංජීව කරුණාතිලක මහතා:- ගරු සභාපතිතුමනි, හත්වන දකුණු පළාත් සභාවේ නිල කාලය වගේම අවසන් සභා වාරයේ කතාවක් කිරීමට ලැබීම සතුටකි. පුරා වසර හතරකට ආසන්න කාලයක් ගාලු දිසාවේ ජනතාවට වගේම මාගේ ශක්ති ප්‍රමාණයෙන් මගෙන් ජනතාවට සේවය කළ බව මට විශ්වාසයයි. ඒ වගේම මේ ගෞරවනීය සභාව නියෝජනය කිරීමට මට අවස්ථාවක් ලබාදුන් ගාලු දිසාවේ ගෞරවනීය ජනතාවට මගේ ස්තුතිය පුද කරන්න ඕන. දකුණු පළාත් සභාව තුළ මා සිතූ තරම් ජනතාවට සේවාවක් ඉටු කරන්නට අවස්ථාවක් ලැබුණත් මාගෙන් යම් සේවාවක් බලාපොරොත්තුව සිටි සියළු දෙනාටම සේවය කරන්නට නොහැකි වෙන්න ඇති නොවුණත් මන්ත්‍රී ධූරයේ කිසිදු අයෙකුට පීඩනයක් බලපෑමක් ඇති නොකරන්නට වගබලා ගත්තෙමි. මේ ගෞරවනීය සභාවටත් රජයටත් කිසිදු අලාභයක් නොකිරීමට 100% ක් මම වගබලා ගත්තෙමි. 2014 වර්ෂයේදී දකුණු පළාත් සභාවට පත්වීමෙන් අනතුරුව එක්සත් ජාතික පාක්ෂිකයන් ඇතුළු ගාලු දිසාවේ ජනතාවට ඒ වගේම ගෞරවනීය මහත්මා දේශපාලනයක් කරන්නට මට මඟ කියා දුන් මාගේ පියාණන් වූ දිවංගත රූපා

කරුණාතිලක මැතිතුමන්ටත් මාගේ ආදරණීය මැණියන්ටත් ගෞරවය ස්තුතිය පුද කරන්න අවස්ථාවක් කරගන්නවා. ඒ වගේම මන්ත්‍රීධුරයේ කටයුතු ඉටු කිරීමටත් සභාය වූ සැමට වගේම මිනිස්සුන්ට යමක් කරන්නට දේශපාලනයට පිවිසි මා දේශපාලනඥයන් විසින්ම දේශපාලනය ජරා ගොඩක් බවට පත්කරන්නට සභාය දුන් කියා දුන් අයටත් ඒ වගේම ස්තුතියක් පුද කරනවා. දකුණු පළාත් සභාවේ පොදුජන සුභ සිද්ධිය උදෙසා කැපවීමට මාහට සහාය දුන් සහෝදර මැති ඇමතිවරුන් රාජ්‍ය නිලධාරීන් පළාත් සභාවේ නියෝජනය සභාවේ ජනමාධ්‍යවේදීන් මිතුරන් ඇතුළු සියළුම සුභසාධන ක්‍රියාකාරීන් හා මා කෙරෙහි අපරිමිත විශ්වාසයක් තැබූ ගාලු දිස්ත්‍රික්කයේ ජනතාවට මගේ හදපිරි ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

සභාපතිතුමා:- බොහොම ස්තුතියි. කරුණාතිලක මන්ත්‍රීතුමා. මීළඟට අපේ ගුණසේන ගරු අමාත්‍යතුමා.

එච්.ඩබ්ලිව්. ගුණසේන අමාත්‍යතුමා:- ගරු සභාපතිතුමනි, වැඩි වෙලාවක් කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මම අසනීප තත්ත්වයෙන් ඉන්නෙ. මට අද උදේ නියමිත වෙලාවට පළාත් සභාවට එන්න හැකියාවක් නොමැති වුණා. මොකද අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ කායර් මණ්ඩලය අද විශේෂ තේ පැන් සංග්‍රහයක් සහ රැස්වීමක් පැවැත්වූවා. ඒ සඳහා සම්බන්ධ වුණා. ඒ නිසා ප්‍රමාදයක් සිදුවුණා.ඒ සම්බන්ධයෙන් සිහිපත් කරන ගමන් පහුගිය පළාත් සභාවේ අපේ අමාත්‍යාංශ වැය ශීෂර් සම්බන්ධව මම මේ සභාව තුළ ඉදිරිපත් කළා. මම එක පැත්තකින් සතුටු වෙනවා විශේෂයෙන්ම මේ දේශපාලන ගමන ආරම්භ කරලා අද වනවිට වසර 22 ක් ගත්වෙලා හමාරයි. අපි දේශපාලන ගමන ආරම්භ කළේ එදා අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවෙන්. මට මතකයි එදා මම 1994 දේශපාලනය ආරම්භ කරනකොට ගරු සභාපතිතුමා විදියට ඔබතුමා 1991 බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව ජයග්‍රහණය කරමින් එහි සභාපති ධුරය දරමින් 1997 වසරේ ඔබතුමත් මමත් අපි අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමා ඒ වගේම ආනන්ද ගරු මන්ත්‍රීතුමා අපි සියළුදෙනාම පළාත් සභාවේත් ප්‍රාදේශීය සභාවෙත් සභාපතිවරුන් විදියට පත්වුණා. විශේෂ හේතුවක් වුණා එදා අපට නාමයෝජනා අහිමි වුණාට පසුව අපි අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව ස්වාධීනව ජයග්‍රහණය කළා. ඒ වගේ එදා දේශපාලන ගමනේ විශේෂයෙන්ම 1977 වසර වනවිට අපේ දේශපාලන ගමනේ මහා පෙරළි ඇති කරමින් දේශපාලන ගමනට ප්‍රවිෂ්ඨ වෙලා අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව ඒ වගේම අපි අම්බලන්තොට ප්‍රාදේශීය සභාව නියෝජනය කළා අපේ අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ආනන්ද මන්ත්‍රීතුමා ඒ වගේම තංගල්ල ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා විදියට ඩී.වී. උපුල් මන්ත්‍රීතුමා අපි කීපදෙනාම පළාත් සභාවට තරඟ වැදුණා 1999 වෂර්යේ. ඒ තරඟ වැදෙනකොට අපිට හැකියාව ලැබුණෙ අපේ අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමාටත් මටත් පමණයි පළාත් සභාව ජයග්‍රහණය කළේ 1999. අපේ කාලෙ ආරම්භ කරපු දේශපාලන ගමනින් විශේෂයෙන්ම නවක මන්ත්‍රීවරුන් විදියට මේ පළාත් සභාවට තේරී පත්වෙලා පළාත් සභාවේ මන්ත්‍රීවරුන් විදියට සැම මැතිවරණයක්ම සියළු මැතිවරණයක්ම ජයග්‍රහණය කරගෙන ඉස්සරහට එන්න හැකියාව ලැබුණා. ජනතාවට අපි අවංකව සේවය කළා. ඒ වගේම කළහැකි දේ මිනිසුන් වෙනුවෙන් ඉටුකළා. අපි අපේ පුටුවේ ඉන්නෙ නැතුව බිමට බැහැලා වීදියට බැහැලා අපේ දේශපාලන ගමනේ අපි මිනිසුන් වෙනුවෙන් උදව් කළා. උදව් කළ නිසා එදා අපිට මතකයි අපි පළාත් සභාව නියෝජනය කරන කාලෙ අධ්‍යාපන ක්ෂේත්‍රය ඉතාම පහළ මට්ටමට වැටිලා තිබුණා. මට මතකයි 2004 අවුරුද්දෙත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබුණ අධ්‍යාපන තත්ත්වය තුළ පළාත් සභාව එතකොට හිල්ටොප් මන්දිරයේ තිබුණෙ. එදා මමත් අපේ අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් ප්‍රියංක ධීරසිංහ මන්ත්‍රීතුමාත් පළාත් සභාව වජර්නය කරමින් එළියට බැස්සා, අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය ගැන තිබ්බ්ච මහා දැවැන්ත ගැටළුවට විසඳුමක් ලබාදෙන්න කියලා. එදා ගුරුභවතුන් හිටියෙ නැහැ, එදා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඒ වගේම පළාත් සභා පාසැල් ගණනාවක්ම වැහිලා ගියා. ගුරුවරුන් නැතුව. අන්න ඒ වගේ තත්ත්වයක් තියෙන කාලවකවානුවක අපි තීන්දු තීරණ අරගෙන ජනතාව වෙනුවෙන් අවංක සේවාවක් කරන්න හැකියාවක් ලැබුණා. ඒ වගේම දිගින් දිගටම අපි ඉතාම සහෝදරත්වයෙන් දේශපාලන ගමනේ මේ පළාත් සභාව නියෝජනය කළා. මම දැක්කෙ නැහැ කවදාවත් අපි මේ දකුණු පළාත් සභාවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් මේ සභා ගභර්ය තුලදී එකිනෙකා විවේචනය කර ගත්තත් මෙතනින් එළියට බහිනකොට ඉතාම සහෝදරත්වයෙන් ඒ කටයුතු කරපු ආකාරය අපට සිහිපත් වෙනවා.

කවදාවත් එහෙම ගැටුම් ඇතිකර ගත්තෙ නැහැ. ඒ වගේම හොඳ විනීත ගති පැවතුම් තියෙන මන්ත්‍රීතුමන්ලා ඒ වගේම දකුණු පළාත් සභාවක් විදියට අපේ මහජන නියෝජිතයන් හැසිරුණ ආකාරයත් අපි මේ වෙලාවේදී සිහිපත් කරනවා. එහෙම කටයුතු කරන අවදියක තමයි එදා 2016 ජූලි මාසෙ 20 වෙනිදා මම බලාපොරොත්තු නොවෙච්ච අවස්ථාවක මෛත්‍රීපාල සිරිසේන ගරු ජනාධිපතිතුමා මට එන්න කියලා එදා මේ අමාත්‍යාංශය භාරදුන්නා ධීවර සහ පශු සම්පත් අමාත්‍යාංශය. ඒ අමාත්‍යාංශයේ ආයතන හයක් සහිත ඒ අමාත්‍යාංශයේ වගකීම මට භාරදුන්නා. ඒ භාරදුන්නයින් පසුව මම ඉතාමත්ම නිහතමානීව විශේෂයෙන්ම අමාත්‍යවරයෙක් විදියට ලේකම්තුමා ඒ වගේම ඒ නිලධාරී මණ්ඩලය සමඟ ඉතාම සුහදශීලීත්වයෙන් කටයුතු කරන්න මට හැකියාව ලැබුණා. ඒ රාජකාරියේ කටයුතු. මම කවදාවත් මගේ අමාත්‍යාංශය තුළ අපේ වේලාරත්න මහත්තයා සාක්ෂි දරනවා. කවදාවත් එතුමන්ට බලපෑම් කළේ නැහැ මෙහෙම කරන්න කියලා. වැරදි දෙයක් කරන්න උපදෙස් දුන්නෙ නැහැ මම කවදාවත්. නීතිරීතිත් එක්ක ඉතාම සුහදශීලීව කටයුතු කරපු නිසා අපට හැකියාව ලැබුණා 2016 වෂර්යේ විශේෂයෙන්ම 2017 වෂර්යේ 2018 වෂර්යේ ඒ වෂර් දෙකම 100% ක් අපට ලැබුණ මුදල් ප්‍රතිපාදන වැය කරමින් ඉතාම ප්‍රබෝධමත් අමාත්‍යාංශයක්. ඒ වගේම ලාභ ලබන අමාත්‍යාංශයක්. ඒ වගේම ඵලදායී සේවාවන් රාශියක් කරපු අමාත්‍යාංශයක්. ඒ වගේම ජනතාව බලාපොරොත්තු වුණ විදියට කටයුතු කරපු අමාත්‍යාංශයක් බවට මේ අමාත්‍යාංශය පත් කළා. විශේෂයෙන් මට මතකයි අපේ අමාත්‍යාංශය ධීවර අමාත්‍යාංශය තුළ අපේ හම්බන්තොට දිස්ත්‍රික්කය තමයි වැඩිම මාළු නිෂ්පාදනයක් සිදුවෙන්නෙ මිරිදිය කමර්ාන්තයේ. මොකද වැව් පද්ධතියේ විශාල ප්‍රමාණයක් තියෙන්නෙ හම්බන්තොට දිස්ත්‍රික්කයේ. ඒ අනුව මාළු පැටව් යෙදවීම, ඒ වගේම ඔරු ලබාදීම, ඒ වගේම දැල් ලබාදීම, ඒ වගේම කරදිය කමර්ාන්තය සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම, ආරක්ෂක කබා ලබාදීම, දැල් ලබාදීම ආදී විදියට ඒ ධීවර අමාත්‍යාංශයෙන් විශාල වූ සේවාවක් කරන්න අපට හැකියාව ලැබුණා. අපට මතකයි මම එදා මේ අමාත්‍යාංශය භාරගන්නකොට අපි මාළු පැටව් ගෙනාවේ ඉඟිනියාගමට ගිහිල්ලා. ඒ වගේම උඩවලවට ගිහිල්ලා. ඒ වගේ ස්ථානවලින් තමයි වැඩිපුරම අපි, අපිට වාහනයක් තිබුණෙ නැහැ. බවුසරයක් තිබුණෙ නැහැ. අපි කුලියට බවුසර් අරගෙන ගිහිල්ලා ඒ ආයතනවලින් මාළු පැටව් ගෙනල්ලා දිස්ත්‍රික්කයේ විතරක් නෙවෙයි ඒ පළාත තුළම වැව් පද්ධතියට ඒ කාලෙ මාළු පැටව් එකතු කළා. හැබැයි ඒ අනුව අපිට හැකියාව ලැබුණා ඒ කාලවකවානුව තුළ රිදියගම මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් අලුතින් ආරම්භ කරන්න. අපි රිදියගම මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් ආරම්භ කරලා ඇසිත්තන් ගෙනල්ලා අද හම්බන්තොට දිස්ත්‍රික්කයට විතරක් නෙවෙයි, දකුණු පළාතටම අවශ්‍ය මාළු ප්‍රමාණය ඒ ඇසිත්තන් බවට පත්කරන්න ඒ ආයතනයට හැකියාව ලැබීම ඒ තුළින් අපිට හැකියාව ලැබුණා යම් ප්‍රමාණයක්, අවශ්‍ය ප්‍රමාණයක් අපේම ආයතනයක් බිහිකරලා නිෂ්පාදනය කරන්න, මාළු පැටවුන්. ඒ වගේම අපි සූදානම් වෙලා තියනවා අක්කර අටක ප්‍රමාණයක් මිලදී අරගෙන මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් පුළුල් ආයතනයක් බවට පත් කරන්න. එහෙමනම් අපිට පස්සෙ ඉඟිනියාගමින්වත් ඒ වගේම උඩවලවෙන්වත් මාළු පැටවුන් ගේන්න අවශ්‍ය වෙන්නෙ නැහැ. අපේම ආයතනයක ඒ මාළු පැටව් යෙදවීම කාය්‍ර්ය සිදුකරන්න හැකියාව ලැබුණා. මොකද විශේෂයෙන්ම අපි දකිනවා වැව් පද්ධතිය තුළ මාළු පැටවුන් යෙදවීම නිසාම මිනිස්සුන්ගේ ආථර්ිකය ඉතාමත්ම පොහොසත් වෙනවා. ඒ වගේම ඔවුන්ගේ අවශ්‍යතාවය සම්පූණර්යෙන්ම සෑහෙන ප්‍රමාණයකට අවශ්‍යතාවය සම්පූණර් වෙනවා මාළු අනුභව කිරීම තුළින්. ඒ වගේම ධීවර අමාත්‍යාංශය ගැන සතුටු වෙන්න පුළුවන් වැඩ කොටසක් කරන්න අපට හැකියාව ලැබුණා. ඒ වගේම කමර්ාන්ත දෙපාතර්මේන්තුව තුළ යම් කාලයක් දකින ආකාරයටම මම හිතන්නෙ පළවෙනි ස්ථානය සම්මාන පිට සම්මාන ලැබූ ආයතනයක් බවට ඒ ආයතනයත් පත්වෙලා තියෙනවා. ඒ වගේම ලාභ උපද්දන ආයතනයක් බවට පත්වෙලා තියෙනවා. රුපියල් බිලියන 20 ක් ලක්ෂ 200 ක මුදලක් රටේ ජාතික ධනයට එකතු කරන්න මේ ආයතනයට හැකියාව ලැබිලා තියෙනවා. සම්මාන රාශියක් සෑම වෂර්යකදීම පසුගිය වෂර්වල ලබා ගනිමින් යම් පළාත් අතරින් පළවෙනි පළාත බවට දකුණු පළාත අද පත්වෙලා තියෙනවා. අපි ඒ සම්බන්ධව දැන් හෙට දවසෙත් තියෙනවා අපේ සේවය ඇගයීම් රැස්වීම්. ඒවාට සම්මාන ප්‍රදානය කිරීම. ඒ වගේම මුදල් තෑගි ප්‍රදානය කිරීම. මේ ආදී විදියට ඒ අය දිරිමත් කිරීම සඳහා කටයුතු කරනවා. ඒ වගේම මම මේ අමාත්‍යාංශය භාරගන්නකොට කමර්ාන්ත

අධිකාරිය ඉතාම පහළ මට්ටමට වැටිලා තිබුණෙ. අපේ ලේකම්තුමා සමඟ කතා කරනකොට ලේකම්තුමා කිසිසේත්ම කැමති නැහැ මුදල් ලබාදෙන්න. කමර්ාන්ත අධිකාරියට. අධිකාරිය පාඩු ලබන ආයතනයක් විදියට ඒ ආයතනයේ සේවය කරන නිලධාරීන් වැටුප රටට බරක් වෙන විදියට තිබ්ච්ච ආයතනයක් තමයි අපේ කමර්ාන්ත අධිකාරිය. හැබැයි අද කමර්ාන්ත අධිකාරිය තුළ විශාල පිබිදීමක් ප්‍රබෝධයක් ඇති කරන්න අපිට හැකියාව ලැබිලා තියෙනවා. අද මම සතුටුවෙන්නෙ කමර්ාන්ත අධිකාරිය ගැන මිලියන පහක මුදලක්, ලක්ෂ 50 ක මුදලක් ජාතික ධනයට එකතු කරන්න කමර්ාන්ත අධිකාරියට අද හැකියාව ලැබිලා තියෙනවා. අන්න ඒ නිසා මම විශ්වාස කරනවා මේ ගතවුණ කාලවකවානුව තුළ අපේ අමාත්‍යාංශ වලින් සුවිශාල සේවාවක් ජනතාවට ඉටු කරන්න හැකියාව ලැබුණා. ඒ වගේම තමයි අනිකුත් අමාත්‍යාංශ දිහා බැලුවම විශේෂයෙන්ම පශු සම්පත් අමාත්‍යාංශය, ඒ වගේම ග්‍රාමීය කමර්ාන්ත අමාත්‍යාංශය. අපි කමර්ාන්ත රාශියක් ආරම්භ කළා. ග්‍රාමීය කමර්ාන්ත වැඩි දියුණු කරන්න කටයුතු කළා. ඒ වගේම ග්‍රාමීය ජනතාවගේ ආථර්ිකය සකස් කරගන්න පවුලේ ආථර්ිකයට ශක්තියක් ලබාදෙන්න අපි කමර්ාන්ත ආරම්භ කළා. අන්න ඒ වගේ සුවිශාල සේවාවක් ඉටු කරන්න පහුගිය කාලවකවානුව තුළ ඒ කෙටි කාලය තුළ හැකියාව ලැබුණා. ඒ වගේම තමයි ගරු මන්ත්‍රීතුමන්ලා ස්තුති කළා. මම පක්ෂ බේදයක් බැලුවෙ නැහැ. මම පක්ෂ විපක්ෂ සියළු දෙනාටම ඒ වගේම ගරු මන්ත්‍රීතුමන්ලාට ඒ අමාත්‍යාංශයෙන් ලැබිය යුතු හිමිකම් වරප්‍රසාද ඒ උදව් උපකාර සියල්ලක්ම සිදු කළා. යම් ආකාරයක පසුබෑමක් සිදුවුණා නම් මම කණගාටු වෙනවා. ඒකත් තමුන්නාන්සේලාට කියන්න ඕන. අද මේ අවස්ථාවට සම්බන්ධ වෙන අපේ මන්ත්‍රීතුමන්ලා කීප පොලක් ඉන්නවා. අපට මතකයි අපි 1999 මේ පළාත් සභාව නියෝජනය කරනකොට එදා අපේ ගරු සභාපතිතුමාත් සාක්ෂි දරනවා. අපිට ලැබෙන ප්‍රතිපාදන ටික විතරක්මයි අපි මේ වියදම් කළේ. කිසිම අමාත්‍යාංශයකින්වත් අපට එක සත පහක්වත් ලැබුණෙ නැහැ එදා. මට මතකයි මහින්ද යාපා අබේවධර්න ගරු ප්‍රධාන ඇමතිතුමා විතරක් අපිට විදුලි යෝජනා සඳහා අපිට සල්ලි දුන්නා. ඒ ඇරෙන්න අපට සල්ලි ලබාදෙන්න කටයුතු කළේ නැහැ. එක වතාවක් ආරියතිලක ඇමතිතුමාත් හිටපු අමාත්‍යවරයා විදියට මුදල් ප්‍රතිපාදන ලබා දුන්නා. ඒ ඇරෙන්න වෙන අමාත්‍යාංශවලින් අපට මුදල් ලැබුණෙ නැහැ. හැබැයි මේ අමාත්‍යාංශවලත් ඇත්තටම තිබුණ මුදල් ප්‍රමාණය තුළ ගත්ත පුටු, වගේම බුෆේ සෙට්, ඒ වගේම ස්පීකර් සෙට් මේ මන්ත්‍රීතුමන්ලාට ලබා දුන්නා වගේම විදුලි ආලෝකය ලබාදෙන්න විදුලි යෝජනා ක්‍රම විශේෂයෙන්ම අනාරක්ෂිත විදුලි යෝජනා ක්‍රම ඉවත් කරන්න මේ ආදී විදියට ප්‍රජා ශාලාවලට විදුලි ආලෝකය ලබාදෙන්න වගේ ඒ සඳහා ගරු මන්ත්‍රීතුමන්ලා හරහා සියළුම මුදල් ලබාදුන්නා. ඉතාම සාධාරණව වැය කරන්න හැකියාව ලැබුණා. ඒ නිසා අපි විශ්වාස කරනවා මේ කාලපරිච්ඡේදය තුළ වුණේ නැහැ. අපිට උදව් කළේ නැහැ කියලා කාටවත් කියන්න හැකියාවක් නැහැ. ඒ නිසා අපි සහෝදර අමාත්‍ය මණ්ඩලය සමඟ ඉතාම ලෙන්ගතුව කටයුතු කරමින් අපි පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සමඟ කටයුතු කරමින් විපක්ෂනායකතුමා ප්‍රධාන අනිත් මන්ත්‍රීතුමන්ලා සමඟ ඉතාමත්ම ලෙන්ගතුව සහයෝගයෙන් මිත්‍රත්වයෙන් අපි මේ කාලවකවානුව තුළ කටයුතු කළා. හෙට දවස වෙනකොට වසර 22 ක් ගතවෙලා හමාරයි. අපි හෙට දවසේ හෝරා කීපයකින් අපේ පළාත් සභාවේ නිල කාලය අවසාන වෙනවා. ඊට පස්සෙ අපි හිටපු ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් බවට කවුරුත් පත් වෙනවා. හැබැයි අපි කණගාටු වෙනවා පළාත් සභා මැතිවරණයක් තියන ආකාරයක් පැහැදිලිව පේන්න නැහැ. ඒ නිසා අපි සියළු දෙනාටම ප්‍රාථර්නා කරන්නෙ ඉතාමත් කඩිනමින් පළාත් සභා මැතිවරණයක් පවත්වලා නැවත වරක් මේ මහජන සේවාව දකුණු පළාතේ ජනතාව වෙනුවෙන් ඉටු කරන්න ඒ සියළු දෙනාටම හැකියාව ලැබෙයි කියලා ප්‍රාථර්නා කරනවා. විශේෂයෙන්ම මම ප්‍රාථර්නා කරනවා සහෝදර අමාත්‍යතුමන්ලා ඒ වගේම සහෝදර මන්ත්‍රීතුමන්ලා සියළුදෙනාටම නැවත පත්වෙන පළාත් සභාවේ සියළු දෙනාටම මේ ආකාරයෙන්ම නියෝජනය කරන වාසනාව, ශක්තිය, ධෛර්යය ලැබේවා! යි ප්‍රාථර්නා කරමින් විශේෂයෙන්ම අපේ පළාත් සභාවේ ගරු සභාපතිතුමා, සෝමවංශ කෝදාගොඩ මැතිතුමා ඉතාම සාධාරණව පක්ෂ විපක්ෂ සියළුදෙනාටම ඉතාම සාධාරණව මේ පළාත් සභාව ඉතාම ඉහළින් තියෙන කළමනාකාරිත්වය තුළින් එතුමන්ගේ ඒ දැණුම් සම්භාරය තුළින් මේ පළාත් සභාව ඉදිරියට අරගෙන ගියා. කිසිම කෙනෙකුට ඇඟිල්ලක් දික් කරන්න හැකියාවක් නැහැ. ඔහු අර පක්ෂයට, අර මන්ත්‍රීවරයාට වෙනම මුදල් දුන්නා, නැත්නම් එයාට අවස්ථාවක් දුන්නෙ නැහැ කියලා ඉතාම සාධාරණව

කටයුතු කළා. ඒ වගේම නියෝජ්‍ය සභාපතිතුමාටත් අපේ ගෞරවය ප්‍රණාමය ස්තුතිය පුද කරනවා. ඒ වගේම සහෝදර අමාත්‍යතුමන්ලාටත් ගරු ප්‍රධාන ඇමතිතුමා ප්‍රධාන සහෝදර අමාත්‍යතුමන්ලාටත් ඒ වගේම සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාටත් මගේ ගෞරවනීය ස්තුතිය ප්‍රණාමය පුද කරමින් තවත් දින කීපයකින් ලබන්නාවූ සිංහල අලුත් අවුරුද්ද සියළු දෙනාටම කිරි පැණි ඉතිරෙන සාමය සතුට පිරිපුන් කිසිම කරදරයකින් තොර හොඳ සුභ අලුත් අවුරුද්දක් ගත කරන්න හේතු වාසනා වේවා! යි ප්‍රාර්ථනා කරමින් සියළු දෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින් සමු ගන්නවා.

සභාපතිතුමා:- බොහොම ස්තුතියි ගරු ඇමතිතුමාට. මීළඟට රංජිත් මුණසිංහ ගරු මන්ත්‍රීතුමා.

රංජිත් මුණසිංහ මහතා:- ගරු සභාපතිතුමනි, අවසරයි. 2014 අප්‍රේල් මාසෙ අද වගේ දිනයක 10 වෙනිදා අපි දකුණු පළාත් සභාවට පළාත් සභා මන්ත්‍රීවරයෙකු විදියට, ආධුනික මන්ත්‍රීවරයෙක් විදියට පැමිණියා. එදා ඉඳලා අද දක්වාම පළාත් සභාව තුළ පළාත් සභා මන්ත්‍රීවරයෙක් විදියට කටයුතු කරද්දි විශේෂයෙන්ම ගරු සභාපතිවරයා වශයෙන් ලැබුණු සහයෝගයත් ඇමතිවරුන්ගෙන් ඒ ලැබුණු සහයෝගයත් අපේ සහෝදර කණ්ඩායමක් විදියට කටයුතු කිරීම පිළිබඳව මගේ සතුට ඉස්සෙල්ලාම මම පුද කරනවා. 2014 පළාත් සභාවට ආවෙ අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රිවරු කිව්වා වගේම මෝටර් සයිකලයෙන් එන්නෙ. මම මාස අටක් මෝටර් සයිකලයෙන් පළාත් සභාවට ආවා. ඊටපස්සෙ මම විකල්ප මාගර්යක් යොදා ගත්තා. කොහොම වුණත් අපි අනිද්දා මේ පළාත් සභාවෙන් බැහැරව යද්දි නැවත ගුරු උපදේශකවරයෙක් විදියට නැවත ඉස්කෝලවලට යන්න වෙන්නෙත් මෝටර් සයිකලයෙන්. ඒ ගෞරවය වතර්මාන රජයට අපි පුද කරනවා. අපි ගාව තිබුණා සිහින. වාහනයක් පිළිබඳව සිහිනයක් තිබුණා. ඒක සිහිනයකටම සීමා කිරීම පිළිබඳව අපේ ටී.වී.කේ. ගාමිණී මන්ත්‍රිතුමා කිව්වා වගේ මම මගේ ගෞරවය පුද කරනවා අපේ රජයට. ඒ වගේම මට කියන්න තියෙන්නෙ පළාත් සභාවට ආවම අපේ ජීවිතේ අපි කවදාවත් බලාපොරොත්තු නොවුණු තැනක්. මම ප්‍රාදේශීය සභාවට එන්නෙත් ඉතාම දුප්පත් පවුලකින්. ප්‍රාදේශීය සභාවට ඇවිල්ලා ප්‍රාදේශීය සභාවේ විපක්ෂනායකවරයා විදියට ඉඳලා ඊට පස්සෙ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය නියෝජනය කරමින් ෆීල්ඩ් මාෂර්ල් සරත් ෆොන්සේකා මැතිතුමාගේ පක්ෂයෙන් පළාත් සභාවට එනවා. පළාත් සභාවට ඇවිල්ලා මම එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා හැටියට කටයුතු කරනවා. ඒ දේශපාලන ගමන් මඟට ශක්තියක් වුණේ මට ෆීල්ඩ් මාෂර්ල් සරත් ෆොන්සේකා මැතිතුමා. එතුමාත් සිහි කරනවා මේ අවස්ථාවේදී. එතුමා සිහි කරමින් විශේෂයෙන්ම ආධුනික මන්ත්‍රීවරයෙක් විදියට පළාත් සභාවට ආපු දවසේ ඉඳලම ප්‍රධාන අමාත්‍යවරයා විදියට ගරු ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමා ආධුනික මන්ත්‍රීවරයෙක් කියන එක නොසලකා හරිමින් අපට අනිකුත් මන්ත්‍රීවරුන්ට ලබාදෙන සියළු පහසුකම් ලබාදුන්නා. ඒ වගේම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕන වීරසුමන වීරසිංහ ගරු ඇමතිවරයා එදා. අද ඒ වුණාට මන්ත්‍රීවරයෙක් වුණත් එතුමා ක්‍රීඩා අමාත්‍යවරයා විදියට කටයුතු කරන කාලය තුළ මම බලාපොරොත්තුවුණා යම්කිසි මට්ටමේ නායකත්වයක් මටත් එතුමත් එක්ක එකතුවෙලා කටයුතු කරන්න ශක්තිය ලැබුණා. එතුමාගෙන් ක්‍රීඩා ක්ෂේත්‍රයට ලැබුණු ඒ දැවැන්ත ශක්තිය ඉතාමත්ම අගය කරනවා. ඒ වගේම ඉන් පස්සෙ ක්‍රීඩා අමාත්‍යධූරය භාරගන්න මනෝජ් සිරිසේන මැතිතුමා එතුමා මම පෞද්ගලිකව ආදරය කරන නායකයෙක්. එතුමාගේ පෞරුෂයට, එතුමාගේ ඒ දේශපාලන ක්‍රියාදාමයට. එතුමාගේ හැසිරීමට. අද දවසේ එතුමාට මගේ ගෞරවය සහ ප්‍රණාමය පුද කරනවා. ඒ වගේම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕන හිටපු අපේ ඩී.වී. උපුල් ඇමතිතුමා. එතුමා අමාත්‍යවරයා විදියට කටයුතු කරන කාලසීමාව තුළ අපි යම්කිසි ඉල්ලීමක් ඉල්ලුවා නම් ඒ හැම වෙලාවකම එතුමා බැහැ කියන්නෙ නැතුව දේශපාලන මතිමතාන්තර ගැන හිතන්නෙ නැතුව අපට උදව් කළා. එතුමාට අපේ ප්‍රණාමය පුද කරනවා. ඒ වගේම ගුණසේන ඇමතිතුමාටත්, ඒ වගේම අපේ ගෞරවය සහ ප්‍රණාමය පුද කරනවා. අපේ ගාමිණී මන්ත්‍රිතුමා කිව්වා වගේම අපට එක අමාත්‍යාංශයකින් විතරයි උදව් නොලැබුණේ. ඒත් අපි කිසිම වෙලාවක ඒ අමාත්‍යාංශයට හානියක් වෙන ආකාරයෙන් හැසිරුණේ නැහැ. ඒ පිළිබඳව සඳහන් කරමින්, මට විශේෂයෙන්ම සඳහන් කරන්න තියෙන්නෙ මම ගුරුවරයෙක් වශයෙන් අවුරුදු 20 ක සේවා කාලයක් ගුරු වෘත්තියේ හිටියා. පළාත් තුනක අධ්‍යාපන අමාත්‍යවරු යටතේ සේවය කළා. ඒ නිසා මට අත්දැකීම් තියෙනවා ගුරු සේවය පිළිබඳව. දකුණු පළාතේ ගුරුවරයෙක් හැටියට මම සේවය කරපු කාලය තුළ අධ්‍යාපන අමාත්‍යවරයා විදියට,

චම්ලි විතානාච්චි මහතා(සභානායක):- ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තියෙනවා. මේ ආණ්ඩුකාරතුමා පැමිණිලා ඉන්නවා කියලා පණිවුඩයක් ඇවිල්ලා තියෙනවා මේ සභාවට පින්තූර කතාවට. දැන් උදේ ගන්නවා කියලා කිව්වා, ඊට පස්සෙ දොළහට එනවා කියලා කිව්වා. සභාව විනාඩි 15 කට කල් තියලා යනවද?

රංජිත් මුණසිංහ මහතා:- මගේ කතාව අවසන් කරන්නම්. පොඩි අවස්ථාවක් දෙන්න. ගරු සභාපතිතුමනි, මම කියාගෙන ආවෙ මම ගුරුවරයෙක් හැටියට සේවය කරන කාලෙ ඉඳලා දකුණේ අධ්‍යාපනය ගැන මට යමක් කියන්නම ඕන. මම හිතනවා මෑත ඉතිහාසයේ මම දන්න පළාත් තුනක සේවය කළා. ඒ පළාත් තුනේම අධ්‍යාපන ඇමතිවරුත් සමඟ කටයුතු කළා. මෑත ඉතිහාසයේ මම දන්න ඉතිහාසය තුළ දකුණු පළාතේ වතර්මාන අධ්‍යාපන අමාත්‍යවරයා තරම් අධ්‍යාපන ක්ෂේත්‍රයට සේවයක් කරපු, දූවා දරුවන්ට ඒ ජයග්‍රහණය වෙනුවෙන් කටයුතු කරපු කිසිම අමාත්‍යවරයෙක් මම දැකලා නැහැ. සමහරු යෝජනා කළත් නැවත අධ්‍යාපන ඇමතිවරයෙක් පත්කර ගන්නවා, අපේ කෙනෙක් පත්කර ගන්නවා කියලා. මම කියනවා ආදේශකයෙක් නැහැ රාසපුත්‍ර ඇමතිතුමාට. ඕන දෙයකට ආදේශකයක් ගන්න පුළුවන්. හැබැයි රාසපුත්‍ර ඇමතිතුමාට ආදේශකයක් ගන්න බැහැ. ඒක සුවිශේෂී කාරණයක්. හැබැයි ඒ ඔබතුමන්ලා ඒ දකින විදිය. මේ මම දකින විදිය. කොහොම වුණත් ඒකයි ඇත්ත, යතාථර්ය. ඒ නිසා මම ස්තූතිවන්ත වෙනවා දකුණේ අධ්‍යාපන ඇමතිවරයා විදියට චන්දිමා රාසපුත්‍ර ඇමතිතුමා දකුණේ අපිට ආඩම්බරය, ගෞරවය ලබාදෙමින් අපේ දූවා දරුවන්ගේ අධ්‍යාපන ප්‍රතිඵල ඉහළ නංවන්න ගත්ත උත්සාහය. ඒ වගේම ගුරුවරුන්ගේ අභිමානය පෞරුෂය ගොඩනැඟෙන ආකාරයට ගුරු ඇගයීම් කරමින් ඔවුන්ට විශේෂ වරප්‍රසාද ලබාදෙමින් ඔවුන් දිරි ගැන්වීම පිළිබඳව අගය කරමින් ඒ වගේම කලාප අධ්‍යාපන කායර්ාලවල සේවය කරන අධ්‍යයන සහ අනධ්‍යයන කායර් මණ්ඩල සියළුදෙනා ශක්තිමත් කරමින් එතුමා දැක්වූ උත්සාහය ඉතාමත්ම අගය කරනවා. ඒ පිළිබඳව සඳහන් කරමින් විශේෂයෙන්ම අපේ සභාවේ ගරු සභාපතිතුමා මට දැනෙන්නෙ ගුරුවරයෙක් වගේ. එතුමා ඒ තරමටම ඉතාම සංයමයෙන් මගේ ගුරුවරයෙක් බව මට දැනෙනවා කියලා කිව්වෙ. ගුරුවරයෙක් බව මම දන්නවා. මට දැනේනෙ එහෙමයි. නැතුව ගුරුවරයෙක් බව මම දන්නවා. ඉතින් ඒ තරමටම එතුමා මේ වසර පහක කාලය තුළ හොඳ නායකත්වයක් ලබාදෙමින් අපි සියළුදෙනා මෙහෙයවමින් කටයුතු කළා. එතුමාටත්, විශේෂයෙන්ම අපේ විපක්ෂනායකතුමා තෙන්නකෝන් නිලමේ මැතිතුමා කණ්ඩායමේ නායකයා විදියට අශෝක ධනවංශ මැතිතුමා අපේ කණ්ඩායමට නායකත්වය දෙමින් අපට දුන් ශක්තිය ඉතාමත් අගය කරමින් ඒ වගේම මම සඳහන් කරන්නම ඕන ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා, එතුමන්ලා අපි එක සහෝදර කණ්ඩායමක් විදියට කටයුතු කළා. කිසි වෙලාවක අපි වාද බේද ඇතිකර ගත්තෙ නැහැ. එතුමන්ලා මම හිතන්නෙ පළාත් සභාව තුල සිටිය යුතුමයි. ඕනම දේශපාලන ප්‍රවාහයක එතුමන්ලා සිටිය යුතුමයි. ඒ පිළිබඳව සතුට ප්‍රකාශ කරමින් සියළුම රාජ්‍ය නිලධාරීන්ට ගෞරවය සහ ප්‍රණාමය පුද කරමින් මගේ කතාව අවසන් කරනවා. ආධුනික මන්ත්‍රීවරයෙක් විදියට අපි බලාපොරොත්තුවන ඉලක්කවලට අපට යන්න හැකියාව ලැබුණේ නැහැ. ඒක පිළිබඳව කණගාටුවකුත් තියෙනවා. මොකද අපි දේශපාලනය ඉදිරියට කරගෙන යනවා නම් අපි ආථර්ික වශයෙන් ශක්තිමත් වෙන්න ඕන. අපිට එහෙම ශක්තිමත් වෙන්න, අපිට තවම කොහොමවත්ම හම්බ වුණේ නැහැ. නැවත හෙට දවසේ අපි ගුරු උපදේශකවරයෙක් විදියට අපිට යන්න සිදුවෙලා තියෙන්නෙ මෝටර් සයිකලයෙන්. ඒ පිළිබඳව නැවත නැවතත් වතර්මාන ආණ්ඩුව පිළිබඳව, අපි බලාපොරොත්තු වුණේ එකම දෙයයි. ඒ වාහන බලපත්‍රය. ඒක නොදීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරමින් මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

සභාපතිතුමා:- බොහොම ස්තූතියි ගරු රංජිත් මුණසිංහ මන්ත්‍රීතුමා. සභාව විනාඩි පහකට කල් තියනවා. ආපහු එන්න කවුරුත්. මොකද අවසාන සභාව නිසා. සභාව විනාඩි පහකට කල් තබනවා.

(විනාඩි පහකට සභාව කල් තැබීමෙන් අනතුරුව),

සභාපතිතුමා:- මීළඟට වීරසුමන වීරසිංහ ගරු මන්ත්‍රීතුමා.

වීරසුමන වීරසිංහ මහතා:- ගරු සභාපතිතුමනි, මම හිතන්නෙ අන්තිම සභාව නිකම් අන්තිම සභාව විදියටම තියෙනවා. මම දන්නෙ නැහැ, මම හිතුවේ මේ සභාවේ අවසාන භාගයේවත් අන්තිම දවසේවත් යම් උද්යෝගයකින් අවසන් වෙයි කියලා. මම

හිතන්නෙ අවුරුදු පහක මේ කාලපරිච්ඡේදයේ සැබෑ චිත්‍රය තමයි මේ සභාවේ දිස්වෙන්නෙ. මේ සභාවේ කොයි කාලෙ ඡන්දෙ තියේවිද දන්නෙත් නැහැ. මේ අවසාන විනාඩි 15, 20 වත් ඇමති මණ්ඩලය බැලුවම ගුණසේන ඇමතිතුමා විතරයි ඉතුරු වෙලා ඉන්නෙ. මන්ත්‍රීවරු පක්ෂ විපක්ෂ බේදයෙන් තොරව බැලුවම ගොඩක් එහෙමයි. මේකෙ තවත් කාරණා කීපයක් තියෙනවා. මම ඒ ගැන කතා කරන්න යන්නෙ නැහැ. මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා විශේෂයෙන්ම මේ කාලපරිච්ඡේදයේ 2014 මාතර්ු මාසෙ තිබිච්ච මැතිවරණය ඊටපස්සෙ මේ පත්වෙච්ච හත්වෙනි පළාත් සභා සැසිවාරය මගේ දේශපාලන ජීවිතයේ ඉතාමත් වැදගත් සන්දිස්ථානයක් සටහන් කරපු කාලපරිච්ඡේදයක්. අපි දේශපාලනයට ඇවිල්ලා දැන් මහජන නියෝජිත භූමිකාවේ අවුරුදු 22 ක් අඛණ්ඩව මිනිසුන්ගේ ඡන්දයෙන් පත්වෙලා කටයුතු කරපු කෙනෙක්. මගේ ජීවිතයේ පළවෙනි තැනට මට වඩා කෙනෙක් 1997 දි ආපු පළවෙනි මැතිවරණයේ ඉඳලා ඒ හැම මැතිවරණයක්ම පියවරෙන් පියවර ඉස්සරහට ඇවිල්ලා පහුගිය පළාත් සභා මැතිවරණයෙන් පස්සෙ මේ පළාත් සභාවේ ඇමතිවරයෙක් විදියට කෙටි කාලයක්, අවුරුදු තුනහමාරක් කාලයක් කටයුතු කරලා ඊටපස්සෙ නැවත වතාවක් මන්ත්‍රීවරයෙක් බවට පත්වෙලා ආයෙත් ඡන්දයක් තියෙන දින සීමාවක් දන්නෙ නැති කාලපරිච්ඡේදයක් තුළ හෙටින් පස්සෙ මේ පළාත් සභාවේ කාලසීමාව තුළ අවසන් වෙනවා. මේ කාලපරිච්ඡේදය තුළ අපි දේශපාලනය හැප්පීම්, වැටීම් ගොඩක් දේවල් නැගීම්, වැටීම් සියල්ල එක්ක කටයුතු කරපු කාලපරිච්ඡදෙයක්. ඔබතුමා දන්නවා ගරු සභාපතිතුමනි, අපි තනතුරු තාන්න මාන්න කියන එක පැත්තකින් තියලා දේශපාලන කටයුතු කරපු කණ්ඩායමක්. පළවෙනි දේශපාලන මැතිවරණයේදී වැඩිම මනාප අරගෙන එදා ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය අහිමි වෙච්ච කෙනෙක්. ඊටපස්සෙ කවදාවත් දේශපාලන තනතුරු හම්බ වුණේ නැහැ. හම්බ වෙච්ච අමාත්‍ය තනතුරත් ඒ අවුරුදු පහ අවසන් වෙනකම් කරන්න ඉඩකඩ හම්බ වුණේ නැහැ. ඒ නිසා ඒවා ගැන සැලීමක් මේ දේශපාලනයේ කවදාවත් නැහැ. තනතුර අපි දාලා යන්න බලාගෙන තමයි අපි මේ දේශපාලනයට ආවෙ. හැබැයි දේශපාලනය දිහා බැලුවයින් පස්සෙ අවුරුදු 22 ක කාලසීමාව තුළ මේ අවසාන මාස දෙක තුන ගත්තම මහා දැවැන්ත කලකිරීම් රාශියක් එකතු කරපු කාලපරිච්ඡේදයක් බවට පත්වුණා. එක පැත්තකින් මේ පළාත් සභාවේ වටිනාකම මහජන නියෝජිතයින්ගේ කායර් භාරය පිළිබඳව හැඟීමක් නැති හැසිරීම් අපි දැක්කා. සාමූහික වගකීමක් දරන්නෙ නැති නායකත්වයන් දැක්කා. ඒ වගේම අපි විශ්වාස කරනවා නායකයන් මේ කටයුතු කරපු ආකාරය දිහා බැලුවම දේශපාලන වශයෙන් සමස්ථ කලකිරීමක් ඇතිවෙච්ච කාලපරිච්ඡේදයක්. මම ඒවා එකින් එක කතා කරන්න යන්නෙ නැහැ. අවසාන මොහොතේදී මේ කාරණා කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. අජිත් රාජපක්ෂ අපේ ආණ්ඩු පක්ෂ සංවිධායකතුමා එතුමාගේ කතාවේදී සියළු කාරණා මා විශ්වාස කරනවා එතුමා ඉතාමත් හදවතින් කතා කරපු කාරණා සියල්ල මේ මොහොතේදී පිළිගන්නවා. මේ යන ක්‍රමය පිළිබඳව සහ මේ කාරණා සම්බන්ධව. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන හැමදාම කතා කරපු කාරණාව. රජ සමයේ සිට රාජාත්වය තිබිච්ච කාලපරිච්ඡේදයේ එදා රජවරුන්ට විරුද්ධව මිනිස්සු කැරලි ගැහුවා ඒ රාජාත්වයට එරෙහිව. එහි මූලික සංකල්පය සමහර විට ප්‍රජාතන්ත්‍රවාදය එදා රට තුල නැති වුණත් ඒ බලය පිළිබඳව සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කාරණා රජවරුන්ගේ හැසිරීම් සහ අනෙකුත් කාරණාවට එදා ඉඳලම මේ ප්‍රජාතන්ත්‍රවාදය කියන වචනය ඉස්සරහට ඇවිල්ලා පහුගිය කාලෙ ඒක රස වචනයක් බවට පත්වුණා. මාකට් කරන්න, අලෙවි කරන්න මිනිස්සුන්ට සල්ලි හම්බ කරන්න පුළුවන් වචනයක් බවට පත්වුණා. ඒ කාලපරිච්ඡේදය අවසන් කරලා දැන් මේක කතා කරනකොට අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමා කියනවා වගේම කිසිවෙක් මේ ගැන කතා කරනවද? පළාත් සභා තුනක් විසුරුවලා හැරලා දැන් අවුරුදු එකහමාරකට වැඩියි. සබරගමුව, උතුර සහ නැගෙනහිර පළාත් සභා. තව පළාත් සභා තුනක් විසුරුවා හැරලා මාස හයකට වඩා වැඩියි. මේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන මහත්වරු එක්කෙනෙක්වත් මේ ගැන කතා කරනවද? සිවිල් සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන එක්කෙනෙක්වත් කතා කරනවද? මේ රටේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබිච්ච එක්සත් ජාතික පෙරමුණ එහෙම නැත්නම් යහ පාලන ආණ්ඩුව පහුගිය කාලෙ කළා නම් යම් ප්‍රමාණයකට හොඳයි කියන්න පුළුවන් හදවතින් අවමයක් වෙච්ච වැඩවලින් එකක් තමයි 19 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් යම් කාරණා. ඒකෙත් විවේචනයන් ගොඩක් තියෙනවා. ඒකෙන් ලැබිච්ච ස්වාධීන කොමිෂන් සභා ස්වාධීනත්වය නැතිවෙලා මැතිවරණ කොමිෂන් සභාව පඹයෙක් බවට පත්වෙලා. මැතිවරණ කොමිසමේ සභාපතිවරයා නිකම්ම නිකම් පඹයෙක් බවට පත්කරපු

කාලපරිච්ඡේදයන් නිමර්ාණය වෙලා තියෙන්නෙ. කවුරුහරි කියනවා නම් තියන ජන්දය තියන්න නිලධාරියෙක් මිසක් ස්වාධීන කොමිෂන් සභාවේ සභාපති ධුරයේ කිසිම බලතලයක් නැති කොමිෂන් සභා බවට පත්වෙලා. එදා ප්‍රජාතන්ත්‍රවාදය කියන කාරණාව වල පල්ලට ගියපු කාලපරිච්ඡේදයක් තමයි අපි ගත කරමින් ඉන්නෙ. මෙයින් ඉස්සරහට මොනවයින් මොනවා වෙයිද දන්නෙ නැහැ. පළාත් පාලන ආයතන විසුරුවා හැරලා අවුරුදු තුනක් තිබුණා ඡන්දෙ තියන්නෙ නැතුව. මේ පළාත් සභා යන්නෙත් එහෙමයි. සහ සුද්දයෙන්ම ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ සභාපති ධුරයේ කිසිම අතුරු ආන්තරාවක් නැතුව ලබන අවුරුද්දේ අප්‍රේල් මාසෙ වෙනකම් ඉන්න පුළුවන්. ලබන අවුරුද්දේ අප්‍රේල් මාසෙ වෙනකම්. මම ලබන අවුරුද්දේ අප්‍රේල් මාසෙන් මෙහා මම විශ්වාස කරන්නෙ නැහැ පළාත් සභා මැතිවරණයක් තියයි කියලා. මේ යන ගමන් මඟ තුළ මුහුණ දීම අනුව. අපි විශ්වාස කරනවා අධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය, මා විශ්වාස කරන්නෙ මේ යන ගමන් මඟට තල්ලුවක් දෙනවා, උදව් කරන ආයතනයක් බවට නිමර්ාණය වෙලා. අද ඒවයින්වත් සහනයක්වත් මිනිස්සුන්ට ලැබෙන්නෙ නැති තත්ත්වයක් නිමර්ාණය වෙලා. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය වලපල්ලට දාපු කාලපරිච්ඡේදයක් තමයි ගරු විපක්ෂනායකතුමනි, මේ අපි කවුරුත් ගත කරමින් සිටින්නේ. ඔබතුමාට කරන්න දෙයක් නැහැ. මේ බෝට්ටුව ගේනකොට ඔබතුමන්ලා අපි කවුරුත් එකට මිනිසුන් ගැන කතා කළා. අනිත් එක මේ පාලන තන්ත්‍රය තුල මේ කිසිම ක්‍රියාකාරකමක් සිදුවෙන්නෙ නැහැ. මේ රටේ අභිමානයෙන් අපි කතා කරනවා අධ්‍යාපනයේ ජයග්‍රහණ ගැන, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ජයග්‍රහණ ගැන. මිනිස්සුන්ගේ සංවධර්නයේ ජයග්‍රහණ ගැන. තුන්වන ලෝකයේ රටක් වෙච්ච අද ලංකාව අද මැදි ආදායම් ලබන රටක් බවට පත්වෙලා තියෙනවා ආඩම්බරයෙන් කියනවා. මේ හැම ජයග්‍රහණයකම වැඩිම කොටස පළාත් සභා ක්‍රමය කියන කාරණාව කවුරුවත් විශ්වාස කරන්නෙ නැහැ. ඒක පිළිගන්න සූදානම් නැහැ. මේ පළාත් සභාවේ ඉස්සරහට ගියපු පළාත් සභාවෙන් දේශපාලනයට ආපු පළාත් සභාවෙන් ගමන් මඟ ආරම්භ කිරිම සම්බන්ධව කිසිම සූදානමක් තියෙන බවක් පේන්න නැහැ. ඒකනිසා ගරු සභාපතිතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය වල පල්ලට දාපු කාලපරිච්ඡේදයක් මේ ගැන කතා කරන්නෙ. මා මේ මොහොතේ අවස්ථාවක් කරගන්නෙ පහුගිය කාලපවර්ඡේදය තුළ පෞද්ගලිකව අපට උදව් කරපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලය, මම එක එක්කෙනා ගැන කියන්නෙ නැහැ. කියන්න ගියෝතින් ගොඩක් දේවල් කියන්න සිදුවෙනවා. අපි 2014 දි කණ්ඩායමක් විදියට ඉදිරිපත් වුණා. එදා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ බුලත් කොලය යටතේ අපි 33 දෙනෙක් පත්වුනේ ශ්‍රී ලංකා නිදහස් සන්ධානය යටතේ. ඒ 33 දෙනා වග කියන්නෙ මේ දකුණු පළාතේ ජනතාවට. නමුත් මාස කීපයයි ඒ වගකීම තිබුණෙ. ගිය 2015 ජනවාරි මාසයෙන් පස්සෙ ඒ වගකීම ගියා. ඇතැම් අයගේ හැසිරීම් මම මේ අවසාන මොහොතේ මම ඒවා එකිනෙක සඳහන් කරන්නෙ නැහැ. ඒ තියෙන කලකිරීම් ඉදිරියේදී කියන්නම්. අපි මේ අවුරුදු පහම, ගරු සභාපතිතුමනි, මම මේ කාරණාව කියන්නම ඕන. මොන අලාභ සිදුවුණා වුණත් මොන අවාසි සිදුවුණා වුණත් මොන දේ කැප කරන්න සිදුවුණා වුණත් 2014 එදා තිබිච්ච අපට ලැබිච්ච වරම අපි කෙරේ විශ්වාසය තියලා තියපු වරම ආරක්ෂා කරමින් අපි කටයුතු කළා. එක පැත්තකින් එක්සත් ජාතික නිදහස් සන්ධානයේ සාමූහික වගකීම අපි ආරක්ෂා කළා. පෞද්ගලික මොන අලාභ සිදුවුණා වුණත්. මේ ඉස්සරහ ඉඳගෙන ඉන්න ඇමතිවරු පස්දෙනා ගැන අනන්ත අප්‍රමාණ විවේචන එල්ල කරන්න තිබුණා. අපිටත් එහෙම විවේචන තියෙනවා. නමුත් අපි ඒවායේ සාමූහික වගකීම ආරක්ෂා කළා. හැබැයි ඒවා හැදුනෙත් නැහැ. මේ වරද නිවැරදි වුණෙත් නැහැ. ඒ නිසා මේ ගතකරන කාලපවර්ඡේදය මේ දේශපාලන කාලය මහ නරක කාලපවර්ඡේදයක් කියලා කිව්වෙ ඒකයි. නමුත් යම් ප්‍රමාණයකට හරි උදව් කරපු සියළු දෙනාටම ස්තුතියක් පුද කරනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා උප සභාපතිතුමා ඇතුළු මේ සභාවේ මන්ත්‍රීතුමන්ලා සියළුදෙනාටම මගේ ගෞරවයත් ස්තුතියත් පුද කරනවා. විශේෂයෙන්ම අමාත්‍යවරයෙක් විදියට කටයුතු කරපු ඒ කෙටි කාලය තුළ මම දන්නවා මෙතන ඉන්න පළාත් සභාවේ මන්ත්‍රීවරු 55 දෙනා කිසිම කෙනෙක් මම කටයුතු කරපු කාලපවර්ඡේදය තුළ වැරදි විවේචනයක් කරන්න මැදිහත් වුණේ නැහැ. පෞද්ගලිකව මාත් එක්ක කිසිම කෙනෙක් නැහැ. මොකද ඒ කාලපවර්ඡේදය තුළ මට කළ උපරිම දේ තරම්. අවුරුදු දෙකක කාලපවර්ඡේදය තුළ පළාත් සභාව තුළ නිමර්ාණය නොවෙච්ච දේවල් නිමර්ාණය කරන්න ඒ කරන්න පුළුවන් කෙටි කාලය තුළ සල්ලි නැතුව අමාත්‍යාංශ පහෙන් අඩුවෙන්ම සල්ලි දුන්න අමාත්‍යාංශය. අඩුම බලතල ප්‍රමාණයක් තියෙන අමාත්‍යාංශය. අඩුම ආයතන ප්‍රමාණයක් තියෙන

අමාත්‍යාංශය වුණත් මේ පළාත් සභාවේ ගෞරවය ආරක්ෂා කරන්න පුළුවන් වෙන ආකාරයට අමාත්‍යාංශය තුළ වැඩ කළා. ඒ කටයුත්තේදී උදව් කරපු සියළු දෙනාටම මගේ ගෞරවයත් ස්තුතියත් පුද කරනවා. කිසි කෙනෙක් පෞද්ගලික විවේචන තිබුණෙ නැහැ. අපේ හිතවත් ටී.වී.කේ. ගාමිණී මන්ත්‍රීතුමා හැමදාම කණ්නාඩි සායන ගැන කතා කළා. ගරු ගාමිණී මන්ත්‍රීතුමා කණ්නාඩි සායනයක්වත් දුන්නෙ නැහැ කියලා කතා කළා. ගරු මන්ත්‍රීතුමනි, මම දේශපාලනයක් කළේ. මම එක්සත් ජනතා නිදහස් සන්ධානය විදියට තමයි මගේ ඇමති ධූරය හම්බවුණේ. සන්ධානයට හම්බවෙන අමාත්‍යධූර පහෙන් මගේ පක්ෂයට හම්බ වෙච්ච ඇමතිකම මම නිදෙර්ශ කරපු නිසා මම අමාත්‍යධූරයේ කටයුතු කළා. ඒකනිසා අපි යහපාලනයට විරුද්ධව දේශපාලනය කරපු පක්ෂයක්. යහපාලනය විවේචනය කරපු කණ්ඩායමක්. ඒකනිසා දවල් මිගෙල් රෑ දනියෙල් චරිතය රඟපාන්න මා සූදානම් වුණේ නැහැ. ඒ නිසා එළියේ යූ.එන්.පී. එකට බනිමින්, එක්සත් ජාතික පක්ෂයට බනිමින්, ඔවුන් විවේචනය කරමින් යටින් ගණුදෙණු කරන සිරිතක් මගේ තිබුණෙ නැහැ. ඒ නිසා ප්‍රතිපත්තියක් විදියට අපේ කණ්ඩායම සිටින නිසා අනිත් තැන්වල මම කිව්වා මම කිසිම දෙයක් එක්සත් ජාතික පක්ෂයට එහෙම වරප්‍රසාද ලබාදෙන්න සූදානම් නැහැ කියන කාරණාව. ඒක මම ප්‍රතිපත්තියක් විදියට කරපු මිසක් පෞද්ගලික කරුණු කාරණා නෙවෙයි. හැබැයි පෞද්ගලිකව මොනව හරි පොදු කාරණාවලදී උදව් කරපු හැමදෙයක්ම මට කළහැකි හැම දෙයක්ම කළා. හැම දෙයක්ම කළා. පොදුවේ කරන්න පුළුවන් දේවල් කළා. ඒ ඇරෙන්න මගේ තනතුර ආරක්ෂා කරගන්න මම කිසි අවස්ථාවක කටයුතු කළේ නැහැ. මට මතකයි 2016 වෙලාවෙදි 2017 අයවැය වෙලාවෙදි එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු මට ඡන්දය දුන්නෙ නැහැ. අනිත් සියළු වැය ශීෂර්වලට ඡන්දය දුන්නා. මගේ වැය ශීෂර්යට ඡන්දෙ දුන්නෙ නැහැ. මම ඇහුවා ඇයි මොකක්ද හේතුව කියලා. අදත් ආණ්ඩුවට බැන්නා කිව්වා. අදත් ආණ්ඩුවට බැන්නා කිව්වා. ඒ නිසා ඡන්දෙ දුන්න නැහැ කියලා කිව්වා. අවසාන මොහොතේ මම දන්නෙ තීන්දුව ගත්ත එක. හැබැයි ආණ්ඩුවට බැන්නෙ, විවේචනය කළේ මගේ ප්‍රතිපත්තියත් එක්ක. ඒක නිසා ඒකට උදව් කරපු සියළුදෙනාටම මගේ ගෞරවය ස්තුතිය පුද කරනවා. මහජන නියෝජිතයෙක් හැටියට. ප්‍රධාන ලේකම්තුමා ඇතුළු ලේකම්තුමන්ලා, සභාලේකම්තුමා ඇතුළු සභා ලේකම් කායර්ාලයේ සියළුම දෙනාට මගේ ගෞරවයත් ස්තුතියත් මේ මොහොතේ පුද කරන්න බලාපොරොත්තු වෙනවා. අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි, එක් කාරණාවක් පැහැදිලි කරන්න ඕන. මේ යන එන මොහොතේ වගකීමත් එක්ක යන කාරණාවක්. අද නලින් හේවගේ මන්ත්‍රිතුමා මේ සභාවේ මේ මොහොතේ නැහැ. අපේ මන්ත්‍රීවරුන් දෙපලක් ඉන්නවා. අදත් මෙතන කියලා ගියා මන්ත්‍රීවරු ලක්ෂ දෙකහමාරක් පඩි ගන්නවා. අපි නම් ගන්නෙ නැහැ කියලා. පසුගිය කාලෙ රැස්වීමක් රැස්වීමක් ගානෙ වේදිකාවල මේක කිව්වා. ෆේස් බුක් එකේ ගියා පළාත් සභා මන්ත්‍රීවරයෙකුට මාසෙකට ලක්ෂ පහයි. ඒත් මොකක්ද කරන්නෙ කියලා ඇහුවා. අර ඔබතුමා කිව්වා මේ පාලර්මේන්තුවට හෙණ ගහන්න ඕන කියලා කව්ද කිව්වා කියලා. පළාත් සභාවටත් මේ හෙණ ගහන්න කියලා කොයි තරම් කියනවද මේකෙන් පස්සෙ. ඒක නෙවෙයි ගරු සභාපතිතුමනි, මම වැරදි නම් නිවැරදි කරන්න. මගේ ළඟ තියනවා ගිය මාසෙ මගේ පේ ස්ලිප් එක. පඩි වාතර්ාව. මම දන්නෙ නැහැ කොහෙන්ද ලක්ෂ දෙකහමාරක් හම්බ වෙන්නෙ කියලා. මේ පඩි වාතර්ාවේ මන්ත්‍රීවරයාගේ වැටුප කීයද? රුපියල් 27,500/- යි. අපේ සාමාන්‍ය කම්කරුවෙක් කීයක් ගන්නවද? අනිත් සේරම එකතු වෙන්නෙ අපි පාවිච්චි කරන දීමනා සහ අනෙකුත් කාරණා එක්ක. සභාපතිතුමනි. 27,500/- යි. අවසාන අවුරුදු දෙකහමාරෙදි තමයි කායර්ාල දීමනාව 50,000/- ක් එකතු වෙන්නෙ. ඉන්ධන දීමනාවත් එකතු වෙනවා. තෙල් දීමනාව එකතු වෙනවා. ඉන්ධන දීමනාවත් එකතු වෙනවා. මේ සියල්ල එකතුවුණාම ගරු සභාපතිතුමනි, 155,000/- යි. මේ පේ ෂීට් එකේ තියෙන්නෙ. මම දන්නෙ නැහැ ලක්ෂ එකහමාරක් මොන විදියට හම්බ වෙනවද කියලා. ඊටත් ගරු සභාපතිතුමනි, ලංකාවේ හැම පළාත් සභාවකම හැම මන්ත්‍රීවරයෙකුටම ලැබෙනවා කායර් මණ්ඩලය තුන් දෙනෙක්. ඒ කායර් මණ්ඩලය තුන් දෙනෙක් පත්කරලා තියෙනවා. කායර් මණ්ඩලය පත්කරලා තියෙනවා. ඒ කායර් මණ්ඩලයේ වැටුප සාක්කුවේ දාගන්න අයට නම් මම දන්නෙ නැහැ ඒ අයට ලක්ෂ දෙකහමාර හම්බ වෙනවද කියලා. හැබැයි මේ ඉන්න පළාත් සභා මන්ත්‍රිවරුන් වෙනුවෙන් සියළුදෙනාම වාගේ කායර් මණ්ඩලයේ වැටුප් ඔවුන්ට ලබාදෙනවා. ඒකනිසා මේක පෞද්ගලික දීමනාවක් නෙවෙයි ගරු සභාපතිතුමනි. ඔබතුමා විශ්වාස කරන්න, මම යමක් කමක් තියෙන පවුලක

ඉපදිච්ච කෙනෙක්. තවම අවුරුදු 22 ක් දේශපාලනය කරනවා. අවුරුදු 22 ක් ඉවරවෙලා බලනකොට මේ මන්ත්‍රීවරයා වෙලා හිටපු ඇමතිවරයා වෙලා මන්ත්‍රීවරයා වෙනකොට ආපස්සට හැරිලා බලනකොට අවුරුදු 22 කට පස්සෙ එක බිම් අඟලක් නැති මිනිහෙක් මම. ගරු සභාපතිතුමනි, මම මේ පළාත් සභාවේ හිටපු අවුරුදු 15 ක කාලසීමාව තුළ මට හම්බ වෙච්ච හැම සල්ලිම ඇමතිවරයා වෙලා ඉන්න කාලෙ මන්ත්‍රීවරයා වෙලා ඉන්න කාලෙත් හැම සල්ලිම වියදම් කළේ එක්කෝ තෙල් ගහන්න, එක්කො මළ ගෙවල්, මඟුල් ගෙවල් වලට ඔය වගේ දේකට මිසක් එක රුපියලක දෙයක් පෞද්ගලිකව පරිහරණය කරලා නැහැ ගරු සභාපතිතුමනි. මොනවහරි දේකට හැමදාම මේ දේවල්. ඒවා නොකරන අයට දැනෙන්නෙ නැති වෙන්න පුළුවන්. හැම දෙයක්ම. අනිද්දායින් පස්සෙ පළාත් සභා කාලසීමාව අවසන් වුණාම ඔබතුමා විශ්වාස කරනවා ඇති අපට ඒ ආපු ගමන ආපස්සට හරවන්න බැහැ. යන්නෙ නැති මඟුල් ගෙවල්. යන්න තියෙන මඟුල් ගෙවල්වලට යන්නෙ නැතුව ඉන්න පුළුවන්ද මට? මේ මාසෙ මඟුල් ගෙවල් හතර පහක්ම තියෙනවා. අදත් එකක් හම්බ වුණා. අදත් දෙකක්. මේ සභා ගැහර්යේ ඉඳිද්දි මඟුල් ගෙවල් දෙකකට ආරාධනා හම්බ වුණා. අපි ඒවාට ගිහිල්ලා පිනට කාලා එන්නෙ නැහැ. අපේ සිංහල පුරුද්දක් තියෙනවා මඟුල් ගෙදරකට ගියාම දෙන පුරුද්දක් තියෙනවා. හැම මාසෙකට සැරයක්ම අපේ හිතවතෙකුගේ මළ ගෙයක් වුණාම උදව්වක් කරන්න. වාහන, අපි දිස්ත්‍රික් දේශපාලනයක් කරන්නෙ.අපි ජාතික මට්ටමේ යම් යම් වැඩවලට කොළඹ යන්න අරෙහෙ මෙහේ. අපි හැමදාම අවුරුද්දකට මාසෙකට තෙල් ලීටර් කීයක් ගහනවද? ඔබතුමා අපිට දෙන්නෙ මාසෙකට 25,000/- යි තෙල් දීමනාව. 25,000/- යි. ඔබතුමා විශ්වාස කරන්න මම මාසෙකට 75,000/- ක තෙල් පුච්චනවා දැනටත් ඇමතිකම් නැතුවත්. අතින් සල්ලි දාලා තමයි අනිත් ටික ගහන්නෙ. ඒ නිසා මේවා සාක්කුවේ දාගන්නෙ නැහැ. හැබැයි අනිත් වෙලාවට ජනතා විමුක්ති පෙරමුණ පුද්ගලිකව පරිහරණය කරන්නෙ නැතුව වෙන්න පුළුවන්. හැබැයි මම සහසුද්දයෙන්ම කියනවා, මොකද හැන්සාඩ් ගතවෙන්න ලියන්න. මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරු පස්දෙනාම සභාලේකම් කායර්ාලයන් අත්සන් කරලා තමන්ගේ පඩිපත, චෙක්පත ගන්නවා. අපිට හම්බ වෙන එකම එයාලා ගන්නවා. සභාලේකම්තුමා සාක්ෂි දරාවි. මේ පස්දෙනාම සල්ලි ටික ගන්නවා. ඒක කොහේ යනවද කියන අදාළ නැහැ. අපට හම්බ වෙන හැම දෙයක්ම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා ගන්නවා. අපිට ලක්ෂ දෙකද, දෙකහමාරද? ඒ හැමදෙයම ගන්නවා. ඒ අයට හිමි දේ ගන්නවා. පෞද්ගලිකව පරිහරණය කරනවද නැද්ද කියන කාරණාව නෙවෙයි. හැබැයි ඒ අය වංචාවක් කරනවා. ඒක මතක තියාගන්න. වංචා කරලා අපිට මේ පඩි පත හම්බ වෙනවා. තෙල් සඳහා දීමනාවක්. ඒ රුපියල් 25,000/- යි. තෙල් ගහන්න ඕන වාහනයකට. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රිවරුන්ගෙන් එක මන්ත්‍රිතුමයි වාහනයක් පාවිච්චි කරන්නෙ. අනිත් හතර දෙනාම මෝටර් බයිසිකලය. මෝටර් බයිසිකලයට රුපියල් 25,000/- ක තෙල් ගන්නවා මේ දීමනාව ලැබෙනවා රියදුරු දීමනාව රුපියල් 30,000/- ක්. මම දන්නවා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රිවරුන්ගෙන් එක්කෙනෙක්වත් රියදුරෙක් පාවිච්චි කරන්නෙ නැහැ. පස්දෙනාම රියදුරු දීමනාව ගන්නවා. දැන් මේ සල්ලි ගන්නෙ නැත්නම් පඩි ගන්නෙ නැත්නම් ඒ සල්ලි නැවත භාණ්ඩාගාරයට යන්න ඕන. සභාලේකම්තුමා මෙතන ඉන්නවා, සභාලේකම්තුමා උත්තර දෙන්න. එක රුපියලක්වත් ආපහු භාණ්ඩාගාරයට යන්නෙ නැහැ. එතුමන්ලා පෞද්ගලිකව පරිහරණය නොකරනවා නම් වෙන්න පුළුවන්. ඒත් බරපතල විදියට ගන්නවා. අන්න එතන වෙන්නෙ වංචාවක්. දකුණු පළාතේ මිනිස්සුන්ගේ ඡන්දයෙන් පත්වෙලා දකුණු පළාතේ ඡන්දයෙන් ආපු අය ඒ සල්ලි ටික කොහේ යනවද කියලා දන්නෙ නැහැ. අපි නම් මඟුල් ගෙදර, දානෙ ගෙදර, පිංකම් ගෙදර, මළ ගෙදර මොකකට හරි වියදම් කරනවා. දැන් මෙතන වංචාවකුත් කරලා රියදුරු දීමනාව අරගන්නවා, වාහනයක් නැතුව තෙල් දීමනාව ගන්නවා. බයිසිකලයට රුපියල් 25,000/- ක තෙල් ගහන්නෙ නැහැනේ කවුරුවත්. ඒකත් අරගෙන තමයි මේ අනිත් අයට ඇඟිල්ල දික් කරන්නෙ. පහුගිය මැතිවරණ හැම එකකදිම මේ ගැන කතා කළා. අවසාන මොහොතෙදි කතා කළා. ගොඩක් අය මේ සම්බන්ධව කියනකොට තමන්ගේ දේවල් විශ්වාස කරන්නෙ නැහැ. මේ තියෙන කාරණාවක් නෙවෙයි. ඔවුන් කරන කැපකිරීම අපට වඩා වැඩියි. ඒක පිළිගන්නවා. හැබැයි මේක දේශපාලනයට ගන්න එපා. වාහන බලපත්‍ර ගැන කතා කරනවා. ලොකු වියදමක් තියෙනවා. ගරු සභාපතිතුමනි, ගියවර දකුණු පළාත් සභාවේ මන්ත්‍රීවරු 55 දෙනාගේ මේ ටික දෙනෙක් වාහන බලපත්‍රය ගත්තා. පමණක් අය පෞද්ගලික වාහන

දෙන්න ඕන. පමණක් අය වාහන බලපත්‍රය කාට හරි දීලා ඒ සල්ලි ටික අරගෙන වෙන වාහනයක් ගන්නවා. බලපත්‍රය දෙන්නෙ වාහන නැති මිනිස්සු. මේ හැමදෙනාම ඔය වගේ වැඩ කළා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුත් වාහන බලපත්‍රය ගත්තා. පෞද්ගලිකව පක්ෂයේ අරමුදලින් වෙන වාහන ගෙන්නුවා.

ජයන්ත පතිරණ මහතා:- පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් හිටියට මම වාහන බලපත්‍රයක් ගත්තෙ නැහැ.

වීරසුමන වීරසිංහ මහතා:- පස් දෙනාම ගත්තෙ නැද්ද? මම ඔබතුමාට පෙන්වන්නද අනිත් අය ගත්ත වාහන ටිකයි බලපත්‍ර ටිකයි. ගරු සභාපතිතුමනි, මම කියන්නෙ මේක ඒක නොගන්නවා නම් ආපහු හැරිලා භාණ්ඩාගාරයට යන්න ඕන. එහෙම දෙයක් වුණේ නැහැ. ඒ කියන්නෙ ඒ කාරණාව අවසාන දවසෙත් මේ කාරණාව ඇවිස්සිච්ච නිසා. දේශපාලනයේ මෙතන ඉන්නවා එක එක තරාතිරම්වල අය. ගොඩක් කැපකිරීම් කරලා ආපු අය ඉන්නවා. පෞද්ගලික කැපකිරීම් කරලා සියළු දේ නැතිකරගෙන ආපු අය ඉන්නවා. එක එක්කෙනාගේ මට්ටම් වෙනස්. දේශපාලනඥයො සමස්ථයක් විදියට ගත්තම හැම එක්කෙනාම හොඳයි කියලා කියනකොට අර පාලරීමේන්තුවේ 225 ට බෝම්බ ගහන්න ඕන කියලා කියනවා. අපේම කට්ටියත් කියනවා. ඒ තමයි මතය. ඒ මතය වෙන්න හේතුව, හැබැයි මේ හැම දෙනෙක්ම එහෙම මනින්න එපා. මේ සමාජයේ වෙනස් කරන්න එක එක කැපකිරීම් කරන අය ඉන්නවා. අවංකද වංකද කියන කාරණාව ජනතාවට තියෙන්න ඕන ගරු සභාපතිතුමනි. ඒකනිසා මේ වැරැද්ද හැමදාම නිවැරදි වෙන්න ඕන. අපිට ලක්ෂ දෙකහමාරක් සල්ලි හම්බ වෙනවා නම් ගරු සභාපතිතුමනි, අපි 55 දෙනෙක් ඉඳලා තියෙනවා ගරු සභාපතිතුමනි. ඇරියස් එක දෙන්න පුළුවන් නම් දෙන්න. ලක්ෂ දෙකහමාර අපිට හම්බ වෙනවා නම්. අපි කායර් මණ්ඩලය නඩත්තු කරනවා. සියළු කටයුතු කරන ගමන් තමයි මේ හැම දෙයක්ම කරන්නෙ. ඒ නිසා මේ සල්ලි අපි ගත්තෙ නැත්නම් මහා භාණ්ඩාගාරයට යන්න ඕන. මම දන්නවා දකුණු පළාත් සභාවේ එක රුපියලක්වත් මන්ත්‍රී දීමනාවෙන් මහා භාණ්ඩාගාරයට යන්නෙ නැහැ. ඒකනිසා ගරු සභාපතිතුමනි, මම මේක කතා කළේ මේක පහුගිය මැතිවරණයේදී බරපතල විදියට කතා කළා. පෞද්ගලිකව මිනිස්සු අපෙන් ඇහුවා ඇත්තද මේ කියන්නෙ කියලා. අන්තජර්ාලෙ දිගින් දිගටම ඇහුවා. මම මගේ ජේ ෂීට් එක සාක්කුවේ දාගෙන ඉන්නවා. මගෙන් හිතවතුන් අහන වෙලාවට මේක කියන්න. ඇයි මේක සමාජයේ මතය වෙනස් කරන්න පැතිකඩක් හම්බ වෙන නිසා. ඒ නිසා අවසාන වශයෙන් මීට වඩා කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මෙතන එක එක්කෙනාගේ කැපකිරීම් වෙනස්. ඕනෑකම් වෙනස්. බලාපොරොත්තු වෙනස්. ඔවුන් මේ ගමන් කරන ආකාරය වෙනස්. 55 දෙනා පනස් පස් විදියක්. හැබැයි හැමදෙනාම එක පවුලකට දාලා මනින්න හදන්න එපා ගරු සභාපතිතුමනි. ඒ නිසා අපි පළාත් සභාවේ අපිත් මේ පළාත් සභාවේ අවුරුදු 15 ක් මේ දේශපාලනයේ ඉඳලා තියෙනවා. ප්‍රාදේශීය සභාවෙත් ටික කාලයක් ඉඳලා තියෙනවා. ඒ හැම කාලයකම අපි දැනුවත්ව මිනිස්සු අපෙන් බලාපොරොත්තු වෙන දෙයක් තියෙනවා. අපි හැමදාම ගෙදර ගිහිල්ලා රෑට නිදාගන්නකොට ගරු සභාපතිතුමනි, පෞද්ගලික මගේ පුරුද්දක් තියෙනවා මොකක්ද මම අද දවසේ කරපු මිනිස්සුන්ට කරපු උදව්ව කියලා කල්පනා කරලා සිහිපත් කරන එක මගේ පෞද්ගලික පුරුද්දක්. මම මහ ලොකු බලාපොරොත්තු තියෙන කෙනෙක් නෙවෙයි. මම විශ්වාස කරන්නෙ එක දවසක කාටහරි අවම වශයෙන් උදව්වක් කරන්න. ඒක විතරයි අපිට ඉතුරු වෙලා තියෙන්නෙ. අනිත් පැත්තට අපට කවදාවත් ප්‍රතිලාභ එන්නෙ නැහැ. අපි කරපු කැපකිරීම්වලට කිසිම දෙයක් ජනතාව පැත්තෙන් එන්නෙ නැහැ ඇත්ත. ඒ හා සමාන බරකින් ප්‍රතික්‍රියාවන් එන්නෙ නැහැ. අපි මහන්සි වෙලා ඉස්කෝල හදලා, ගුරුවරු දීලා, සේරම කරලා අධ්‍යාපනය වෙනස් කරන්න හැදුවාට ඡන්දෙට කලින් දවසේ කොපි පොත් 06ක් දීපු කෙනාත් ඡන්දෙ දෙනවා. එහෙම තමයි ඡන්ද ක්‍රමය හැදිලා තියෙන්නෙ. ඒක නිසා තමයි මේ බෙදීම්,මේ දවස්වල නත්තල් පප්පලා බුදුඅප්පොච්චියේ අම්මා අප්පා විතරයි බෙදන්නෙ නැත්තෙ. ඒ තමන්ගේ සල්ලිවලින් කරන්නෙ. ඒකනිසා මේ දේශපාලනය වෙනස් ගමනක් යන කණ්ඩායමකුත් සිටින බව සිහිපත් කරමින් මේ කාලසීමාව තුළ මේ පළාත් සභාවේ අපි කවුරුත් කණ්ඩායමක් විදියට අඩුපාඩුකම් තියෙන්න පුළුවන්. මේ සහෝදරත්වයන් ආරක්ෂා කරන්න කටයුතු කළා. ඒ අය සියළු දෙනාටම මගේ ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබාදීම සම්බන්ධව ඔබතුමාටත් ස්තූතිය පුද කරමින් මීට කලින් උදේ වරුවේ ගරු සභාපතිතුමා කිව්වා වගේ ඊළඟ ඡන්දෙ

කවදා එයිද දන්නෙ නැහැ. ඉදිරි කාලසීමාව තුළ ඔබතුමා මේ සභාපති තනතුරේ ඉන්නවා. ඔබතුමා විතරයි මහජන නියෝජිතයෙක් විදියට ඊළඟ මැතිවරණය දක්වා අපේ මේ දුක්ගන්නාරාළ විදියට ඉන්නෙ. ඒ නිසා මේ පළාත් සභාවේ යම් යම් කාරණා වෙන්න ඕන කාරණා නිලධාරීන් සම්බන්ධ කරන පුද්ගලයා බවට ඔබතුමා පත්වෙන්න කියන කාරණාව සිහිපත් කරමින් ඔබතුමාට ඒ හැකියාව තියෙනවා. ඒක නිසා මේ කාලසීමාව තුළ අභියෝග මධ්‍යයේ ඉස්සරහට යන සභාපතිවරයෙක් වෙන්නට මේ සභාවේ භූමිකාව මෙතෙක් කාලයක් කරපුවට වඩා මේ කටයුතු කරන්න ශක්තිය ධෛර්ය ලැබේවා! කියා ප්‍රාර්ථනා කරමින් ලබන්නාවූ සිංහල අලුත් අවුරුද්ද ඔබ සියළුදෙනාටම සුභම සුභ අලුත් අවුරුද්දක් වේවා! කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

සභාපතිතුමා:- බොහොම ස්තුතියි. මීළඟට අශෝක ධනවංශ ද සිල්වා විපක්ෂ සංවිධායකතුමා.

පී. අශෝක ධනවංශ ද සිල්වා මහතා(විපක්ෂයේ ප්‍රධාන සංවිධායක):- ගරු සභාපතිතුමනි, අද හත්වෙනි පළාත් සභාවේ අවසාන සැසිවාරයට සහභාගි වෙලා තමුන්නාන්සේලාට වචන කීපයක් කතා කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. මම කිසිම වාදයකට පැටලෙන්න සූදානමක් නැහැ. මගේ පළාත් සභා ජීවිතයේ කරන අවසාන කතාව තමයි මම අද කරන්නෙ. අදින් පස්සෙ මේ පළාත් සභාවට මන්ත්‍රීවරයෙක් වශයෙන් මම පත්වෙලා එන්නෙ නැහැ. ඒ කියන්නෙ මම ඡන්දෙ ඉල්ලන්නෙ නැහැ ගරු සභාපතිතුමනි. මම පාලර්මේන්තු ඡන්දෙ ඉල්ලන්නෙත් නැහැ. මගේ ජීවිතයේ මම මැතිවරණ 12 ක් තරඟ කරලා තියෙනවා. එක ප්‍රාදේශීය සභාවක්, පළාත් සභා හයක්, පාලර්මේන්තු පහක්. පාලර්මේන්තු පහම මම පැරදිලා තියෙනවා. අනිත් මැතිවරණ මම ජයග්‍රහණය කරලා තියෙනවා. මම 2014 මේ පළාත් සභාවට පත්වෙලා ආවම මම එදා ආඩම්බරයෙන් කතාවක් කළා මේ පළාත් සභාවේ වැඩිම කාලයක් ඉන්න මන්ත්‍රීවරයා වැඩිම කාලයකට මේ ඉන්න හැමෝටම කලින් පළාත් සභාවට ආපු මන්ත්‍රීවරයා මමයි කියලා 1991 දි. හැබැයි අද මම සතුටු වෙනවා මටත් කලින් පැමිණි ගා. දේනෙත්ති මන්ත්‍රීතුමා 88 පළවෙනි පළාත් සභාව නියෝජනය කරපු අමාරු කාලයේ ආපු මන්ත්‍රීතුමා අද මෙහාට ආපු නිසා මට අර මගේ වාතර්ාව පොඩ්ඩක් ඇණ හිටිනවා. මොකද 88 පත්වෙච්ච මන්ත්‍රීවරයෙක් දැන් මේ පළාත් සභාවේ ඉන්න නිසා. එතුමාගේ කාලය පිළිබඳව ප්‍රශ්නයක් තියෙන්න පුළුවන්. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තියෙන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම මම 88 පළාත් සභාවට තරඟ කළේ නැහැ. නාම යෝජනා බලාපොරොත්තුවෙන් ඇප්ලිකේෂන් එකක් දැම්මා. නමුත් ඒක මට අවස්ථාව ලැබුණෙ නැහැ ඒ වෙලාවේදී බලපිටිය ආසනයෙන් ඉදිරිපත් වෙච්ච වෙනත් දෙන්නෙකුට අවස්ථාව දුන්නා. ඒ දුන්නහම මම පළාත් සභා මැතිවරණයට වැඩ කළා. ඒ වැඩ කරපු වෙලාවේ පරිසරය ගැන, කියන්න උවමනා නැහැ. මේ රටේ දේශපාලන වශයෙන් එක්සත් ජාතික පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය, ඒ වගේම ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ බොහෝ අපේක්ෂකයින් සහ සාමාජිකයන් මිය ගියා. ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයො විශාල වශයෙන් මියගියා. ඒ වෙලාවේ ඇතිවෙච්ච සිවිල් අරගල තත්ත්වයත් එක්ක. ඒ වෙලාවේදි ඒ ඇතිවුණු අරගලයෙන් එක්සත් ජාතික පක්ෂයට කිසිම වාසියක් ලැබුණෙ නැහැ. ඇත්ත වශයෙන්ම එක්සත් ජාතික පක්ෂය මිනී මරණ කණ්ඩායමක් හැටියට ලේබන ගත වුණා. නමුත් එහෙම ප්‍රතික්‍රියා කිරීම තුළ. අපි බොහොම අමාරුවෙන් ජීවිතය බේරාගත්තා. මම රැවුලක් වවලා සභාපතිතුමනි, හිටියෙ. මම ගම අතඇරලා ගිහින් හිටියා. නමුත් හැබැයි මගේ නිවසට හෝ මගේ සහෝදරයෙකුට හෝ කාටවත් හානියක් සිදුවුණේ නැහැ. අපි මියගිය සාමාජිකයොන්ගේ මළ ගෙවල්වලට ආවා. අපි බොහොම අමාරුවෙන් ඒ තැන්වලට ඇවිල්ලා ගියා. මොකද තජර්න තියෙනවා කියලා අවබෝධ වෙච්ච නිසා. මම කිසිම දවසක වෙනත් කණ්ඩායමක් ඝාතනය කිරීම සඳහා වූ කල්ලියකට බැඳුනෙ නැහැ. මට ආණ්ඩුවේ රන්ජන් විජේරත්න මහත්තයා මහලේකම්තුමා ඒ කාලෙ හයක් දුන්නා. හයම ගෙදර තිබුණෙ. මට ඒ කාලෙ පොලිස් ආරක්ෂාවක් දෙන්න එක්සත් ජාතික පක්ෂයේ තරුණ ලේකම් වශයෙන් හිටිය නිසා. නමුත් ඒ රාළහාමිලාවත් කිසිම වෙලාවක දේශපාලන මදර්නයකට පාවිච්චි කළේ නැහැ. ඒකනිසා අපි ඒ වෙලාවේදී මගේ දේශපාලන වශයෙන් මගේ අවසන් පළාත් සභාවේ කරන කතාව නිසා මම පෝස්ටර් ගහලා වැඩේ පටන් ගත්ත කෙනෙක් ගරු සභාපතිතුමනි. මම එනවුන්සින් කරලා පටන් ගත්ත කෙනෙක්. මම මගේ දේශපාලන රැස්වීම්වල කතා පැවැත්වූවා. මට ඉස්කෝලෙ යන කාලෙ ඉඳලා කතික හැකියාවක් තිබුණා. පත්තරේට ලියන්න පුළුවන්කමක් තිබුණා. එහෙම ගිහිල්ලා පක්ෂයේ අභ්‍යන්තරයේ තිබ්ච්ච

ඡන්දවලින් ඒ කාලෙ ප්‍රජාතන්ත්‍රවාදීව ඉහළට යන්න මාගර් තිබ්බච නිසා මම තරුණ පෙරමුණේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට ගිහිල්ලා ඒ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නිලතල දරලා උප ලේකම් හැටියට කටයුතු කරලා ඉමිටියාස් බාකර් ලේකම් කාලෙ මම උප ලේකම්. එතුමා නිවාස රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් පත්වුණායින් පස්සෙ ඒ තනතුරට පක්ෂයේ නායකයා විසින් පත් කරන්න බලයක් තියෙන්නෙ, එහෙත් එතකොට ප්‍රේමදාස ජනාධිපතිවරයා පක්ෂයේ නායකයා හැටියට එයා කිව්වා අපේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඡන්දයක් තියලා පත් කරන්න කියලා. ඒ ඡන්දයෙන් දිනලා තමයි මම ලේකම්වුණේ. මාත් එක්ක තරඟ කළේ දොස්තර ජයලත් ජයවධර්න, සුජිත් කාරියවසම් කියලා කෙනෙක් සහ වජිර අබේවධර්න. අද ඉන්න ඇමතිතුමා. මම මේ කතාව කොහේවත් කියලා නැහැ. වජිර අබේවධර්න ඇමතිතුමා වේදිකාවක කිව්ව නිසා මම කියනවා. එතුමාගේ ඡන්ද තුනයි. 45 දෙනාගෙන් 26 දෙනෙක් ආවා ඡන්දෙ පාවිච්චි කරන්න. එතුමාට ඡන්ද තුනයි. සුජිත් කාරියවසම් කියන කෙනාට හතරයි. මට 19 යි. ඩොක්ටර් ජයලත් ජයවධර්න තරඟ කරන්න ඒ වෙලාවේ මම ඇප්ලිකේෂන් එක අවලංගු කර ගත්තා. එහෙම තමයි මම ඡන්දෙන් දිනලා ආවෙ. ඒ ඡන්දෙන් දිනලා මම ඉන්නකොට තමයි 91 පළාත් සභාවේ සිරිනාවතී ද සිල්වා මන්ත්‍රිතුමිය බලපිටිය ආසනය නියෝජනය කරපු, රාජාලියා කණ්ඩායමට ගිය නිසා එතුමියගේ මන්ත්‍රීධුරය ආහෝසි වුණා. ලැයිස්තුවේ ඊළඟට හිටියේ ආරියරත්න ලේල්වල කියලා ඒ බද්දේගම. අපේ චම්ලි මන්ත්‍රිතුමා දන්නවා. සභානායකතුමා දන්නවා. එතුමාගේ ගේ ගිනි තිබ්බා ඒ මැතිවරණය වෙලාවේදි. එතුමාගේ ජීවිතය බේරුණේ යන්තම්. හැබැයි ලැයිස්තුවේ ඊළඟ මන්ත්‍රිතුමා එතුමා. එතුමාට මන්ත්‍රිකම දෙන්නෙ නැතුව ප්‍රේමදාස ජනාධිපතිතුමා එදා මට ඒ මන්ත්‍රීකම දුන්නා. හැබැයි ඒ මන්ත්‍රිකම මම ඉල්ලලා ගියේ නැහැ. මට ඕක සිරිසේන කුරේ මැතිතුමා මහලේකම් හැටියට කිව්වම මට කිව්වා ඔන්න ඔයාට චාන්ස් එකක් ඇවිල්ලා තියෙනවා ඔයාගේ නම තමයි යවන්නෙ කියලා. මම කිව්වා සර්, ඕක හරියන්නෙ නැහැ. ඉවසා වදාරා පොඩ්ඩක් අහගෙන ඉන්න. නමුත් එතුමාට නොදී ඒ මන්ත්‍රීකම මට දුන්නා. ඒ මන්ත්‍රීකම අරගෙන තමයි මම මේ පළාත් සභාවට ආවෙ. අද මේ කතාව පවත්වන්නෙ. ඉතින් ඒක නිසා අපි ඒ කාලෙ ඉඳලා හැම දේශපාලන පක්ෂයකම හිටපු, එදා අමරසිරි මහඇමතිතුමාගේ ඉඳලා, අමරසිරි දොඩංගොඩ මහඇමතිතුමා, අපේ සිරිසේන මහඇමතිතුමා, ඊළඟට දිගටම මම හිතන්නෙ අපේ ෂාන් විජයලාල් ද සිල්වා මහඇමතිතුමා. තව මහඇමති කෙනෙක් හිටියද කියලා මට එක පාරට කල්පනාවක් වෙන්නෙ නැහැ. මාව වැරදි නම් නිවැරදි කරන්න කියලා ඉල්ලනවා. මහින්ද යාපා ඇමතිතුමා. ඉතින් අපි මේ ඔක්කොමත් එක්ක කටයුතු කරලා තියෙනවා. ඉතාම හොඳ මානුෂිකවාදී විදියට එතුමන්ලා කටයුතු කළා. අපේ දේශපාලන පක්ෂයක් තිබුණෙ නැහැ. දෙපැත්තෙම අයට හුවමාරු වුණා අමරසිරි මහත්තයා ඉන්න කාලෙ දේනෙත්ති මන්ත්‍රීතුමා දන්නවා. අනිත් අයත් එහෙම කළා. අද වීරසුමන මන්ත්‍රීතුමා කියා හිටියා මම ප්‍රතිපත්තියක් හැටියට දේශපාලන පක්ෂවල අයට උදව් කරන්නෙ නැහැ කියලා. පොඩ්ඩක් වැරදුණා මම හිතන්නෙ. මට ඇස් සායන දීලා තියෙනවා. මට බෝල, බැට් දීලා තියෙනවා. ඒ අවස්ථා දෙකක් තුනක් එහෙම මට දීලා තියෙනවා. හැබැයි බොහොම අමාරුවෙන් ගිහිල්ලා මගේ ලියුමක්වත් නැතුව අර ක්‍රීඩා සමාජ අරවා මේවා නම් දීලා තමයි ඉතින් අරගෙන ආවෙ. ඉතින් ඒ ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමාගේ ප්‍රතිපත්තියට හානි වුණා නම් සමාව හජනය කරනවා.

වීරසුමන වීරසිංහ මහතා:- ගරු සභාපතිතුමනි, ඒක කියන්න ඕන. පෞද්ගලිකව අත යටින් දෙන එකක් නෙවෙයි. එතුමා ගුණ සමරු උත්සවයක් කළා මම හිතන්නෙ ප්‍රේමදාස ගුණ සමරු උත්සවයක් මොකක් හරි ගුණ සමරු උත්සවයක්. ඒ වෙනුවෙන් ඉල්ලීමක් කරා යොවුන් පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගේ ලියුම ආපු වෙලාවේ සංජීව කරුණාතිලක මන්ත්‍රීතුමා සාක්ෂි දරයි. යොවුන් පළාත් සභාවෙන් ලියුමක් ඇවිල්ලා ඒකත් ලබාදුන්නා ඒ වෙලාවේ.

පී. අශෝක ධනවංශ ද සිල්වා මහතා(විපක්ෂයේ ප්‍රධාන සංවිධායක):- අනිත් එක මම ක්‍රීඩා භාණ්ඩ ගත්තෙ මම ක්‍රීඩා මණ්ඩපයක් හදන්න මෙතුමා මුල්ගල් තියන්න එන්න කියලා කිව්වා. ඉතින් මුල්ගල තියන්න එන අමුත්තාට කියලා ක්‍රීඩා භාණ්ඩ ටිකක් ගන්න පුළුවන්නේ. එතුමා ඇවිල්ලා මුල්ගල තියලා ගියා. ඉතින් ඒක නිසා අපිට එහෙම වාද විවාදයක් අවශ්‍ය නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, මම මේ පළාත් සභා ක්‍රමය විශ්වාස කරන කෙනෙක්. මේ පළාත් සභා ක්‍රමයෙන් යමක් කරන්න පුළුවන් කියල විශ්වාස කරන කෙනෙක්. මේ පළාත් සභා ක්‍රමය හදපු වෙලාවේ ජේ.ආර්. ජයවධර්න

ජනාධිපතිතුමා ඒ සංශෝධනයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පාලරීමේන්තුවේ මන්ත්‍රීවරු සංඛ්‍යාව 100 ක් විතර දක්වා අඩුකරලා මේ කැබිනට් එක 15 ක් කියලම දාලා ඒක කළා නම් ඒක ඊට වඩා බොහොම අථර්වත් වෙනවා. ඉතින් අනාගතයේදී එහෙම වෙයිද කියලා මට කියන්න බැහැ. මේක කොහොම නමුත් මේ පළාත් සභා මැතිවරණය කල් ගිහිල්ලා මේ ලොකු විවේචන වලට මුහුණ දෙන්න තියෙන වෙලාවේ අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද අහිමිවුණු අවුරුදු පහ තමයි අපි මේ ගත කරන්නෙ අපේ ආණ්ඩුව යටතේ. ඇත්ත. එදා මෙතුමා කිව්වා. අපි මේ ආණ්ඩුවට විරුද්ධ නැහැ. ආණ්ඩුවේ සම්පූණර් දේවල් අපි ඔක්කොම ප්‍රතික්ෂේප කරන්නෙ නැහැ. හැබැයි මේ වෙද්දි මේ ක්‍රියාවලිය ගැන අපට කණගාටුවක් තියෙනවා. අපි වාහන බලපත්‍රයක් මේ මන්ත්‍රීවරු එකක්, දෙකක්, තුනක්, හතරක් ගත්ත අය ඇති. ජේ.ආර්. ජයවධර්න ජනාධිපතිතුමා දුන්නෙ පැජෙරෝ වාහන, ජීප් එකක්. දේනෙත්ති මන්ත්‍රිතුමාට ඒ ජීප් එකක් හම්බ වුණා. මම පළාත් සභාවට එද්දි ජීප් එක නවත්වලා පමරීට් එකක් දුන්නා. ඊටපස්සෙ අවුරුදු පහකට සැරයක්, ඔව්. පොලිස් ආරක්ෂාවත් දුන්නා. ජේ.ආර්. ජයවධර්න ජනාධිපතිතුමා, ප්‍රේමදාස ජනාධිපතිතුමා, විජේතුංග ජනාධිපතිතුමා ඉන්න කාලෙ පළාත් සභාවට ආවා නම් එයාටත් දුන්නා. ආපු ගමන්ම හම්බ වෙනවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිතුමිය, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඒ හැමෝම දුන්න මේක. හැබැයි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා යටතේ අපේ අගමැතිතුමා යටතේ මේ අවුරුදු පහේ කාටවත් හම්බ වුණේ නැහැ. අපටත් හම්බ වුණේ නැහැ. ඒකෙ දුක, වේදනාව, අමාරුව දන්නෙ මේක කරපු කට්ටිය. උතුරු පළාතට දීලා තියෙනවා. තව අපේ මන්ත්‍රීවරු කීප දෙනෙකුට අයවැය යෝජනාව 2015 ප්‍රකාශයට පත්වෙන්න කලියෙන් අවුරුදු පහ සම්පූණර් වුණා කියලා හතර පස් දෙනෙක් අරන් තියෙනවා. කොහොම හරි අපට හම්බ වුණේ නැහැ. මේකෙදි එක එක්කෙනාට අථර්කථනය කරන්න පුළුවන්, මහා බිස්නස් එකක් හැටියට. අපේ මන්ත්‍රීතුමන්ලා අතට ගත්තොත් මේ වියදම් ඡන්ද ක්‍රමයත් එක්ක ඇතිවෙච්ච දේවල් එක්ක චම්ලි විතානාච්චි සභානායකතුමා මෙතන ඉන්නවා. මගේ තාත්තාට අක්කර අටක් තිබුණු පිටිගල ඉඳිපලේගොඩ. මම ඡන්ද තුන ඉල්ලනකොට ඒක වික්කා. එතකොට මට ප්‍රේමදාස ජනාධිපතිතුමා පිටිගල ගෙයක් දීලා තිබ්බා. තව ඡන්ද දෙකක් තියනකොට ඒක වික්කා. අද මට තියෙන්නෙ තාත්තාගෙන් හම්බ වෙච්ච දෙයක්. අපේ නෝනාගේ ගෙදරත් අපි බැංකු ණයක් අරගෙන ඒක පොඩි සංවධර්නයක් කරපු එක ඇත්ත. ඒවත් මිනිස්සු කියන්නෙ කොහොමද වැඩ කියලා. ඒකෙ බැංකු ණය අලුත් වෙලා අලුතින්, ආපහු. මේ නිසා අපට ලැබුණු වරප්‍රසාද තියෙනවා. මේ දීමනාවල්වලින් අපි කරගත්ත වැඩක් තියෙනවා. හැබැයි අපේ ගියපු වියදම් පැත්තෙනුත් ගත්තොත් මේ මන්ත්‍රීවරුන්ගේ ඔක්කෝගෙම තත්ත්වය ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු ඒක ලබාගන්නෙ නැහැ. එතුමාගේ කතාවෙනුත් කියවුණා පවර්ස් හතර වික්කා කියලා. නලින් හේවගේ මන්ත්‍රීතුමා කිව්වා. එතකොට මේ අනිත් අය ගත්තොත් අපේ රාජකාරීවලට ගොඩක් කැපවෙලා තියෙනවා. මේ අයටත් එහෙමයි. ජීවිතවලින් වන්දි ගෙවපු අය ඉන්නවා, වලින් වන්දි ගෙවපු අය ඉන්නවා. නමුත් මේක මහා සුන්දර හිතවත්කර සංසාර භවේ අපි ලබපු දේ අපට ආසාවක් තියෙනවා මෙහෙම දෙයක් කරන්න ඕන කියලා. මිනිස්සුන්ට උදව් කරන්න ඕන කියලා. අතලොස්සක් මේවාට ඇවිල්ලා මාලිගා හදාගත්තා, ඒත් හැමෝටම ඒ තත්ත්වය නැහැ. හැම පක්ෂයම. ඒකනිසා මම කණගාටු වෙනවා මම ඇත්ත වශයෙන්ම අපට මෙම බලපත්‍රය හා ඒ වරප්‍රසාද කප්පාදුවක් වෙච්ච එක ගැන, අපේ ආණ්ඩුව යටතේ. ඒ නිසා අවසාන වශයෙන් මම හිතන්නෙ මම මීට වඩා කතා කරන්න උවමනා නැහැ. මේ පළාත් සභාවේ හිටපු මහඇමතිවරු වතර්මාන මහඇමතිතුමාලා ඉන්න ඇමතිතුමන්ලා, මනෝජ් සිරිසේන ඇමතිතුමා මෙතන ඉන්නවා. ඒ හැම එක්කෙනාම සේවයක් මේකෙන් කරන්න උත්සාහ කළා. මේ කරපු එක ගැටෙන්නෙ මධ්‍යම රජය සහ මේ අතරේ තියෙන සම්බන්ධීකරණය කරන සම්බන්ධතාවය තියෙන දුවර්ලතාවය නිසා කොයි ආණ්ඩුව වුණත් මෙතන ප්‍රශ්නයක් ඇතිවෙලා තියෙනවා. ඒක හින්දා අවසාන වශයෙන් සභාපතිතුමනි, මම මගේ දේශපාලන වශයෙන් සතුටු වෙන්නෙ මේ රටේ ප්‍රතාපවත් නායකයෙක් වෙච්ච ඩඩ්ලි සේනානායක මහත්තයා දැකලා තියෙනවා. ඩී.එස්. සේනානායක මහත්තයා දැකලා නැහැ. රූපෙ දැකලා තියෙනවා. පණ පිටින් දැකලා තියෙනවා ඩඩ්ලි සේනානායක මහත්තයා. හැබැයි ජේ.ආර්. ජයවධර්න ජනාධිපතිතුමාගේ කාලෙ මගේ මුල්ම කාලෙ මට එතුමාගේ ගෙදර ගිහිල්ලා එතුමා හම්බ වෙන්න පුළුවන් වාසනාවක් තිබුණා. කයිවාරුවට කියනවා නෙවෙයි. මට ඕනෑ මේ කතන්දරේ මෙතන ඉතිහාසෙ කතා පොඩ්ඩක් කියලා ස්වයං තෘප්තියක්

ලබන්න විතරයි. ස්වයං තෘප්තියක්. එතුමා එක්ක කටයුතු කරන්න වාසනාව ලැබුණා. ප්‍රේමදාස ජනාධිපතිතුමා සමඟ කිට්ටුවෙන් ඉන්න හම්බ වුණා. විජේතුංග ජනාධිපතිතුමා හම්බ වෙන්න මට ඇපොයින්ට්මන්ට් ඕන වුණේ නැහැ. අනිත් ගාමිණී, ලලිත් වැනි නායකයො, රනිල් වික්‍රමසිංහ නායකතුමන්ලා අපි බොහොම ළඟින් ඇසුරු කරපු අය.අපේ නිලමේ මැතිතුමා දන්නවා. නිලමේ මැතිතුමා දවසක් අපේ දුවගේ විවාහ මංගල්‍යය උත්සවයේදී කිව්වා එතුමාගේ අතින් අල්ලන් මම ප්‍රේමදාස ජනාධිපතිතුමා ළඟට එක්කන් ගියේ සභාපතිකම ගන්න ඒ කාලෙ. ඉතින් ඒකනිසා එහෙම හිටපු මට පාලර්මේන්තු යන්න බැරි වුණා කියලා මගේ දුකක් නැහැ. හැබැයි මගේ ජීවන දශර්නයක් තිබුණා මම අවුරුදු 60 වෙනකොට මට යන්න පුළුවන් තැනකට යන්න ඕන. අවසාන වශයෙන් තනතුරුවලට.ඉතින් මහජන නියෝජිතයෙක් හැටියට මට යන්න පුළුවන් තැනට මම ඇවිල්ලා තියෙනවා. ඉතින් මේ නොවැම්බර් මාසෙට තමයි මට 60 වෙන්නෙ. ඒ හින්දා කවුරු කිව්වත් මගේ ලොකු දූ ඔට්ටුවක් දාලා ඉන්නෙ. පිස්සු කතා තාත්තලා ඡන්දෙ ඉල්ලන්නෙ නැහැ කියනවා නම් මාළුවා මූදෙ පීනන්නෙ නැහැ කියනවා වගේ කතාවක් තමයි කියලා ඔට්ටුවක් දාලා තියෙනවා. ඉතින් මේ සමාජෙත් එක්ක ඒගොල්ලො බලන්නෙ. හැබැයි මගේ තීරණය වෙනස් කරන්න මම කල්පනා කරන්නෙ නැහැ. ඒක හින්දා මම දේශපාලන වශයෙන් එක්සත් ජාතික පක්ෂයේ මම දේශපාලනයේ ඉන්නවා. පක්ෂය ඇතුලේ විවේචන වෙන්න පුළුවන්. හොඳ වෙන්න පුළුවන්, නරක වෙන්න පුළුවන්. ඒවත් එක්ක ඇඹරි ඇඹරි මැරෙන තුරාවට මේක මේ ඇඟේ තියෙනවා. දේනෙත්ති මැතිතුමාට ඒක එහෙම තියෙනවා. කොමිෂන් කිව්වම ඇත්ත තමයි. කොමිෂන් ඔක්කොම බකල් වෙලා තියෙන්නෙ දැන්. ඒක හින්දා අපි මේ ගරු සභාවට ඇවිල්ලා මම ආපු දවසේ ඉඳලා හිටපු සභාලේකම්තුමාලා ඒ කාර්‍ය මණ්ඩල වෙන්න පුළුවන්. අපේ දීඝර් කාලීනව හිටපු සියළුම අමාත්‍යාංශ ලේකම්වරු මැති ඇමතිවරුන්ට අමතරව ඒ හැම එක්කෙනෙකුම එක්කම කටයුතු කළා. ඒ හැමකෙනාම ස්මරණය කරනවා, මතක් කරනවා මේ වෙලාවේ.වතර්මානයේ ඔබතුමා සභාපතිවරයා හැටියට හිතනවා මම අනිත් සභාපතිවරුත් දැකලා තියෙනවා. ඔබතුමා වගේ ඉවසන සභාපති කෙනෙක් නම් මම දැකලා නැහැ. ඔබතුමා වගේ රීති උල්ලංඝනය කරමින් ඔන්න ඔහේ කතා කරපං කියලා කියපු සභාපතිලා නැහැ. දවසක් මම පෞද්ගලිකව ඇවිල්ලා ඊයේ පෙරේදා ඇහුවම ඔබතුමා කිව්වා මන්ත්‍රීවරයෙකුට අදහසක් කියන්න තියෙන්නෙ සුමනයකට සැරයක් මෙච්චරයිනේ. මන්ත්‍රීතුමා කියලා මට කිව්වා. මට කිව්වා ඔබතුමා. ඉතින් ඒකනිසා මම හිතන්නෙ කුරුවේගෙයි මන්ත්‍රීතුමාගේ මඟුල් ගෙදර ගිහිල්ලා ඉඳිද්දිද කොහේද. ඉතින් ඒකනිසා ඔබතුමාට මම ගෞරව කරනවා. අපේ ආණ්ඩුකාරවරු කීප දෙනෙක් හිටියා. ඒ ඔක්කොම අපි සිහිපත් කරනවා. අද ඉන්න වතර්මාන අවසාන වශයෙන් අවසාන සභාලේකම්තුමා ඉන්නවා. එතුමා මම ගෞරවයෙන් සිහිපත් කරනවා. මොකද වැඩියෙන්ම සමීපතාවයක් පහුගිය කාලෙ තිබ්බා. පෞද්ගලික දේවල් කතා කළා. ආගම දහම ගැන කතා කළා. පළාත් සභාවේ දේවල්වලට අමතරව එහා ගියපු දේවල් අපි දෙන්නා කතා කරලා තියෙනවා. ඉතින් ඒ කාර්‍ය මණ්ඩලවල සියළු දෙනාටම අපේ ගෞරවනීය ස්තූතිය ප්‍රකාශ කරනවා. පළාත් සභාවේ විපක්ෂනායකවරු ආණ්ඩු පක්ෂයේ ඉඳලා තියෙන්නෙ අවුරුදු දෙකයි. විපක්ෂනායකවරු ගණනාවක් එක්ක අපි වැඩකරලා තියෙනවා. ඒ විපක්ෂනායකවරු හැමෝටම මම සහයෝගය දීලා තියෙනවා. මට විපක්ෂනායකකම හම්බ වෙන්න තිබුණත් මට හම්බ වුණේ නැහැ. ඒ අපේ පක්ෂයේ ප්‍රතිපත්ති මත. වතර්මාන විපක්ෂනායකතුමා එක්ක අපි වැඩ කරලා තියෙනවා. එතුමත් ඇත්ත වශයෙන්ම එතුමාගේ පියා 88/89 භීෂණය කාලෙ එතුමා පොඩි ඉලංදාරියා කාලෙ පියා මැරුවා. එතුමා ප්‍රාදේශීය සභාවේ සභාපති වුණේ මම හිතන්නෙ අවුරුදු 20 දි 21 දි 91 පළවෙනි ප්‍රාදේශීය සභා මැතිවරණයේදී සභාපති වෙලා ආවෙ. ඉතින් එතුමා එක්කත් වැඩ කළා. ඉතින් මම එතුමාට මේ වෙලාවේ සුභ පතනවා මේ ලබන වාරයේදී පාලර්මේන්තුවට යන්න ලැබේවා කියලා. එහෙම යන්න බැරිවුණොත් ඔබතුමාට මේ පළාත් සභාවේ බලයක් ලැබිලා තානාන්තරයක් දරන්න වාසනාව ශක්තිය ලැබේවා කියලා ප්‍රාථර්නා කරමින් ඔබ සියළුදෙනාටම තෙරුවන් සරණ ප්‍රාථර්නා කරමින් මගෙන් මේ කාලසීමාව තුළ යම්කිසි අඩුපාඩුවක් වුණා නම් යම් කෙනෙකුට වාදයකට විවාදයකට පැටලුනා නම් ඒ පෞද්ගලික කාරණාවක් නෙවෙයි. හිත් වේදනාවක් ඇතිවුණා නම් සමාව ඉල්ලනවා. අපි නොයෙක් විදියේ වාද විවාදවලට පැටලෙනවා. වන්න මන්ත්‍රීතුමා එක්ක අදින් පස්සෙ පළාත් සභාවේ වාද විවාද කරන්න හම්බ වෙන්නෙ නැහැ. මම කියන්න ඕන ගරු සභාපතිතුමනි, අපේ

අධ්‍යාපන ක්ෂේත්‍රයේ මේ ලොකු ජයග්‍රහණ ලබපු කාලයක්. අම්බලන්ගොඩ කලාපයත් ජයග්‍රහණ ලබලා තියෙනවා. මගේ ගමේ 83% යි ප්‍රතිඵලය. අද ඒ වන්න මන්ත්‍රීතුමා අධීක්ෂණය නොකල නිසා ඒ ප්‍රතිඵලය ලැබුණු බවත් මතක් කරන්න ඕන. අධීක්ෂණය කළා නම් එන්නෙ නැතුව ඉන්න තිබුණා. ඉතින් එතුමාටත් මම ඉල්ලීමක් කරනවා අපේ පවුලේ ඥාතියෙක්. ඔබතුමා තව ටිකක් කල්පනා කරලා ඉවසීමත් ප්‍රගුණ කරගෙන දෙපැත්ත තුන්පැත්ත සමබරව කල්පනා කරගෙන දීඝර් දේශපාලන ගමනක් යන්න පුළුවන්කමක් තියෙනවා. අපේ පළාත්වල ලොකු ජනප්‍රසාදයක් ගොඩනගාගෙන තියෙනවා. ඒක නිසා තව ටිකක් ඔබතුමාගේ උපදේශකයෙක් ඉන්නවා නම් උපදේශකයා ගැන දෙපාරක් තුන්පාරක් කල්පනා කරන්න කියලා පවුලේ ළඟම ඥාතිවරයෙක් හැටියට දේශපාලන අවවාදයකුත් මේ වෙලාවේ දෙන්න කැමතියි. ඒ නිසා අවසාන වශයෙන් සිංහ සමන් මන්ත්‍රීතුමා මේ පළාත් සභාවේදී අඳුනා ගන්න ලැබුණා. එතුමා අපි හිතවත්. මගෙත් මේ පැත්තෙත් ඉන්නවා අජිත් රාජපක්ෂ මැතිතුමා වගේ යාළුවො කීප දෙනෙක්. ඉතින් ඒගොල්ලො ගැන කියන්න ගියොත් එහෙම හැන්සාඩ් මකන්න වෙනවා. ඒ හැම දෙනාම සිහිපත් කරලා සිංහ සමන් මහත්තයාට කවියක් කියන්න ආසාවක් ඇතිවුණා. ඒක හින්දා සිංහ සමන් මහත්තයාට මගේ කවිය ප්‍රකාශ කරලා මගේ කතාව සමාප්ත කරනවා ගරු සභාපතිතුමනි. ඔබතුමාලා සියළු දෙනාටම නිදුක් නිරෝගී සුවය ලැබිලා, ඉදිරි අනාගතයේදී හිතන පතන ප්‍රාර්ථනා ඉෂ්ඨ වෙලා මේ රටට සමාජයට සේවය කරන්න ශක්තිය ධෛයර් ලැබේවා! කියලා ප්‍රාර්ථනා කරනවා.

91 දී මා මෙහි ආවා - වසර 28 ක් ගෙවී ගියා -

සොම්නස දොම්නස එකලෙස විඳගෙන - ඔබ සැම සමඟින් මා සිටියා.

අලුත් අලුත් දේ කරනට සිතුවා - ගමට ගිහින් ජනතාව සොයා - සමුගන්නෙමි මම මන්ත්‍රී ධුරයෙන් ඔබ සැමදෙනහට එලෙස කියා. බොහොම ස්තූතියි.

සභාපතිතුමා:- ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා. විනාඩි පහක් ගන්න ඔබතුමා. කාලය අවසන් වෙලා තියෙන්නෙ.

ලාල් ප්‍රේමනාත් මහතා:- ගරු සභාපතිතුමනි, ඉතාමත් කෙටියෙන් මම මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්නේ පහුගිය සභා වාර තුනේදී මා විසින් ඉදිරිපත් කරපු යෝජනාවක් දිගින් දිගට කල් ගිහිල්ලා ඒක ගන්න බැරිවුණා. ඒ වගේම මවිසින් කල්දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කරපු එකකටත් පිළිතුරු ලබාගන්න බැරිවුණා අවසන් සභා වාරය දක්වා. මගේ අද දවසේ යෝජනාව වෙලා තිබුණේ 1999.05.15 දින ප්‍රමුඛතා කාර්යන් සඳහා බලය ලබාගත් ගුරුවරු පිරිසක් සම්බන්ධව. ඇත්තටම ගරු සභාපතිතුමනි, ඒ සිද්ධිය සිද්ධ වෙන්නෙ එවකට ලෝක බැංකුව විසින් උපාධිධාරී රැකියාවකට ගන්න එපා. රාජ්‍ය සේවය දියකර හැරීමේ තීරණය මත උපාධිධාරීන් ගන්න බැරි තත්ත්වයක් තිබුණා. ඒ උපක්‍රමය යටතේ තමයි එවකට පැවති රජය විසින් ඒ ගුරුවරුන් විශාල ප්‍රමාණයක් බඳවා ගත්තෙ රුපියල් 4000/- ක දීමනාවක් සහිතව. එතකොට ඒ බඳවා ගත්ත අය පාසැල්වලට බඳවා ගත්තෙ. ඒ අය 2016 වෂර්යේ ගුරු සේවයට අන්තර් ග්‍රහණය කරනවා. උපාධිධාරීන් ගුරුවරුන් හැටියට. උපාධිධාරී පත්වීම් හැටියට 1999 සිට 2007 දක්වා වසර හතක කාලයක් ගුරු සේවය තුළ සේවය කළාට ඒ අය ගුරුවරුන් හැටියට ගුරු සේවයට ඇතුලත් කර ගත්තෙ නැහැ. මේ සියළුම දේවල් සිදුවුණේ එවකට තිබ්ච්ච කැබිනට් මණ්ඩල තීරණය අනුවයි. ඉතින් අද දකුණු පළාතේ ඉන්න 600 ක් පමණ වෙච්ච ඒ ගුරුවරු ප්‍රමාණය පසුගිය සභා වාරයට ඇවිල්ලා ඒ අයට උද්ඝෝෂණයක් කරන්න සිදුවුණා. මොකද ඊට කලින් අවස්ථා කීපයකදීම උද්ඝෝෂණය කරමින් සිටියා. එතකොට පසුගිය පෙත්සම් කාරක සභාවේදීත් අපේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ තීරණය අනුව මේ අයට මේක දීම සුදුසුයි කියලා කතාබහ කරලා තීරණය වුණා. ඒ වගේම උතුරු මැද පළාත් සභාවේ ඒ අයගේ පත්වීම් ගුරු සේවයට අන්තග්‍රර්හණය කිරීම පළාත් සභාවට අනුයුක්ත කරපු දා සිටම ක්‍රියාත්මක වන පරිදි පවත්වාගෙන ගියා. ඒ නිසා ඒ අයට හිමි වැටුප ලබාගෙන ඉන්නවා. නමුත් දකුණු පළාතේ 600 ක් වෙච්ච ගුරුවරුන් විශාල ප්‍රමාණයක් දැන් විශ්‍රාම යන්න වයසට ඇවිල්ලා ඉන්නවා. ඔවුන් පත්වීම් ලැබුවේ නැහැ. ඒ නිසා මම ගරු සභාපතිතුමනි, මේකයි මම කියන්න උත්සාහ ගත්තේ. මේ වෙනකොටත් දකුණු පළාත් සභාවේ අනධ්‍යාන කායර් මණ්ඩල විශාල ප්‍රමාණයක් කරනවා. ඒ සම්බන්ධයෙන් දිගින් දිගටම මම ප්‍රශ්න කළා. ඒ ප්‍රශ්නවල අවසාන ප්‍රශ්නය ඇහුවෙ මේ බඳවා ගන්න අයගේ රැකියාවේ ස්ථිර බව

තහවුරු කිරීමට ඔබතුමාට හැකියාවක් පවතීද? එසේ නම් මෙය සභාවට පැහැදිලි කරන්න කියලා. මට ඕනකම තිබුණේ අපේ දේශපාලන උවමනාවන් මත මේ රටේ රැකියා විරහිත තරුණ තරුණියන් මේ සේවාවලට බඳවාගෙන සැලසුමක් නොමැතිව බඳවාගෙන අවසානයේ, අර ගුරුවරුන් අවුරුදු 20 කට පස්සෙ තමයි ඒගොල්ලන්ගේ වැටුප සම්බන්ධයෙන් අවසානයේ උද්ඝෝෂණය කරලා තමයි කරන්න වුණේ. අපි දන්නෙ නැහැ අද අනධ්‍යයන කායර් මණ්ඩලයේ කී දෙනෙක් බඳවා ගන්නවද කියලා. කොයිතරම් ප්‍රමාණයක්ද කියලා. මේ අයටත් මතු දවසක මෙවැනි ඉරණමක් උදාවීම වලක්වා ගැනීමේ උවමනාවෙන් තමයි ඒ ප්‍රශ්න ටික යොමුකළේ ගරු සභාපතිතුමනි. ඒ ප්‍රශ්නවලට උත්තර ලැබුණෙ නැහැ. මම නැවතත් කියන්නේ ඒ ප්‍රශ්නවලින් පලා යන්න ඇමතිවරයෙකුට බැහැ. මොකද ඇමතිවරයා තමන්ගේ කාලය අවසාන දිනයේත් දීපු පත්වීම් ප්‍රමාණය දන්නෙ නැහැ කියන්නෙ විශ්වාස කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. නමුත් ඒ වගේම තමන්ගේ අමාත්‍යාංශය කරන හොඳ වැඩ සම්බන්ධව වගකීම භාරගන්නවා නම් අනිත් සියළු දේත් වගකීම භාරගන්න ඕන. ඇමතිවරයාට පුළුවන්කම තියෙන්න ඕන කියන එක මා විශ්වාස කරනවා. ඔය ආකාරයෙන් තමයි මේ ගැටළු ටික මා ඉදිරිපත කළේ. ඒකට පිළිතුරු ලැබුණෙ නැහැ. නමුත් අවසාන වතාවට මේ යෝජනාව මා සභාවේ හැන්සාඩ් ගත කරන නිසා මා කියවනවා. මම ඉදිරිපත් කරපු යෝජනාව. ඉතාමත් කෙටියෙන්.

සභාපතිතුමා:- කියවන්න ඕන නැහැ. සභාගත කරන්න. එතකොට හැන්සාඩ් ගතවෙනවා.

ලාල් ප්‍රේමනාත් මහතා:- ගරු සභාපතිතුමනි, මේක හැන්සාඩ් ගතවිය යුතුයි. බොහොම ස්තුතියි.

පී. අශෝක ධනවංශ ද සිල්වා මහතා(විපක්ෂයේ ප්‍රධාන සංවිධායක):- ගරු සභාපතිතුමනි, අපේ ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ලිපිය මම කැමතියි මට විරුද්ධත්වයක් වෙන එකක් නැහැ. ඉදිරි කටයුතු සඳහා ආණ්ඩුකාරතුමාට යොමු කරන්න කියලා. මොකද එදා මෙතෙන්ට ආපු වෙලාවේ අධ්‍යාපන ඇමතිතුමත් ඒ අය එක්ක කතා කළා. මහඇමතිතුමාත් කතා කළා. ඒ අය මේක සාධාරණ ප්‍රශ්නයක් හැටියට තමයි පිළිගැනීමක් කළේ. මෙතැන් සිට ඉදිරි කටයුතු කරන්න ආණ්ඩුකාරතුමාට යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

එස්. තෙන්නකෝන් නිලමේ මහතා(විපක්ෂනායක):- විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කයේත් පවතින ප්‍රශ්නයක්.

සභාපතිතුමා:- සංවධර්න නිලධාරීන් වශයෙන් බඳවා ගත්ත ගුරුවරු දැන් උතුරුමැද පළාත් සභාවේ එහෙම ක්‍රියාත්මක කළා කියලා තමයි එක පැත්තකින් තියෙන්නෙ. හැබැයි උතුරු මැද පළාත් සභාවේ නිත්‍යානුකූල නැහැ කියන එක පළාත් සභාවේ සභාපතිවරුන්ගේ සම්මේලනයේදීත් ඒ පිළිබඳව සාකච්ඡා වුණා. හැබැයි එහෙම කරලා තියෙනවා නම් අනිත් ඒවායේ කරන එක ආණ්ඩුකාරයාට බලය තියෙන්නෙ. එහෙම කරයිද මම දන්නෙ නැහැ. නමුත් ඒක මොන ක්‍රමයකින් හරි උතුරු මැද පළාත් සභාවේ ඒ කායර්ය කරලා තියෙනවා. මම සභාගත කරපු ලිපියක් ඒ පිළිබඳව ඔබතුමා ඉදිරිපත් කරපු දේත් ආණ්ඩුකාරතුමාගේ අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. අනිවායර්යෙන් ඒක කරනවා. ඒ වගේම පළාත් සභා ඉතිහාසයේ අපේ වීරසුමන ඇමතිතුමා කිව්වා විදියට අපි මේ ඉතිහාසය තුළ පළාත් සභාවේ යෝජනා, පෙතස්ම කාරක සභා තීන්දු, ගිණුම් කාරක සභා තීන්දු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ඒ සියළුම දේවල් ක්‍රියාත්මක කරන්න කියලා යවන්නෙ අමාත්‍යාංශවල ලේකම්වරුන්ට, ආණ්ඩුකාරවරුන්ට, ආණ්ඩුකාර ලේකම්වරුන්ට, පරිපාලන නිලධාරීන්ට. හැබැයි පළාත් සභාවේ ක්‍රියාත්මක වෙයිද නොවෙයිද කියන එක පිළිබඳව අපට පොඩි තියෙනවා හැම කෙනාටම. මට විතරක් නෙවෙයි. ඔබතුමන්ලා හැමදෙනාටම තියෙනවා දීපු යෝජනාව ක්‍රියාත්මක වුණාද නැද්ද කියන පොඩි සැකයක් තියෙනවා. ඒවා ඔක්කොම ක්‍රියාත්මක වුණා නම් සියළුමදෙනා ලොකු සතුටින් ඉන්නවා. මාත් 15 ක් වෙනවා ඇවිල්ලා. මම ඒක එක මන්ත්‍රීවරයෙකුගේවත් ඒ සතුට දැක්කෙ නැහැ. එහෙම ඉදිරිපත් කරපු යෝජනා පිළිබඳව ඉදිරිපත් කරපු ප්‍රශ්න පිළිබඳව, ඉදිරිපත් කරපු කරුණු පිළිබඳව එක මන්ත්‍රීවරයෙකුවත් සෑහීමකට පත්වෙච්ච බවක් පෙනුනෙ නැහැ මේ අවුරුදු 15 තුළ. ඒ නිසා මම හිතනවා අපි සතුටු වෙනවා මේ පාලන තන්ත්‍රය තුළ ක්‍රියාත්මක වෙච්ච ආකාරය පිළිබඳව කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් යම් යම් අයගේ අසතුට තියෙන බව පේනවා. ඒක මෙතන ඉන්න නිසා මට පේන්නෙ. ඔබතුමන්ලා කතා කරන හැමදෙනා පිළිබඳව යම් මතයක හිටියොත්, අධ්‍යයනයක හිටියොත් ඒ

හැමදෙනා තුලින්ම මතුවෙච්ච කාරණයක්. ඒ නිසා ඔය ප්‍රශ්න පිළිබඳව අපි අපේ සභාලේකම්තුමා මම හිත්නනෙ මටත් වඩා ඒ කායර්ය හරියාකාරව අදාළ ආයතනවලට දැනුම්දීලා තියෙනවා. අපට පිළිතුරු එන ප්‍රමාණය නම් අඩුයි. හැබැයි අපේ වගකීම මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ඉෂ්ඨ සිද්ධ කිරීම සඳහා කටයුතු කිරීම සහ මේ සභාවේ යෝජනා කරපු දේවල් ක්‍රියාත්මක කරවීම. සභාවට පුළුවන්කමක් නැහැ ඒක ක්‍රියාත්මක කරන්න. ඒක අදාළ අමාත්‍යාංශවලට හා නිලධාරීන් විසින් ක්‍රියාත්මක කළ යුතුයි. අද අවසාන සභාව දවසේත් අර වෙනදා වගේ හිස්. ඔබතුමන්ලා තේරුම් ගන්න. අද අවසාන දවසේ මේ පැත්තත් හිස්, අර පැත්තත් හිස්. හැම පැත්තම හිස්. ඒ නිසා මේ පිළිබඳව අද නෙවෙයි හැමදාම තියෙන දෙයක්. ඕක අරුමයක් නෙවෙයි, විපක්ෂනායකතුමනි. මේක පිළිබඳව හැමදෙනාම අද විසිර යන වෙලාවේ මම පොඩ්ඩක් මතක් කළේ අර ආණ්ඩුකාරතුමාට ඉදිරිපත් කිරීම පිළිබඳව. ඊළඟට ආරාධනා කරනවා අපේ විපක්ෂනායක ගරු තෙන්නකෝන් නිලමේ මැතිතුමාට.

එස්. තෙන්නකෝන් නිලමේ මහතා(විපක්ෂනායක):- ගරු සභාපතිතුමනි, හත්වෙනි පළාත් සභාවේ අවසාන පළාත් සභා රැස්වීම පැවැත්වෙන මේ මොහොතේ 1991 මට අවුරුදු 19 වයසේදී ඔබතුමත් පළාත්පාලන මැතිවරණයට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා වෙලා පළාත් සභාවෙත් සභාපති වෙලා මට මේ විපක්ෂනායක හැටියට ආමන්ත්‍රණය කිරීමට ලැබීම මම ඉතා භාග්‍යයක් කොට සලකනවා. ගරු සභාපතිතුමනි, මම 1989 පළාත් සභා මැතිවරණය මේ රටේ ස්ථාපිත කරන වෙලාවේ මගේ පියාණන් වලවේ තෙන්නකෝන් රාළහාමි ඝාතනය වුණා 89 භීෂණය වෙලාවේ. ඒ වෙලාවේදී එම්.එස්. අමරසිරි මහඇමතිතුමාත්, දොස්තර පී.එම්.බී. සිරිල් මැතිතුමාත්, කේ. ආනන්ද කුලරත්න ඇමතිතුමාත්, තිස්ස කුට්ටිආරච්චි එවකට හිටපු ඇමතිතුමාත් අවමංගල්‍යා උත්සවයට සහභාගි වුණ අවස්ථාවේදී මම පොඩි එවකට කාලයක් ජේරපුත්ථ ජාතික පාසැලේ අධ්‍යාපනය ලබලා ඊටපස්සෙ මම ආනන්ද විද්‍යාලයට ගියා. ඒ පස්සෙ ඇහුවා දේශපාලනයට එන්න කැමතිද කියලා. මම එහෙම කැමැත්තක් තිබුණෙ නැහැ. ඒ ආරාධනය කරපු ලොකු ගෞරවයකින් තමයි 1991 ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලෙදි රාජ්‍ය පාලන සමයේදී දොස්තර පී.එම්.බී. සිරිල් ගරු ඇමතිතුමාත්, එම්.එස්. අමරසිරි ගරු මහඇමතිතුමාත්, ආනන්ද කුලරත්න ඇමතිතුමාත්, තිස්ස කුට්ටිආරච්චි මැතිතුමාත්, රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේත් ආශිවර්ාදයෙන් දේශපාලනයට ආවෙ. 1991 මට අවුරුදු වයස 19 යි. සභාපතිතුමා බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ සභාපති. ලංකාවේ අඩුම වයසින් දේශපාලනඥයෙක් බවට පත්වෙන්න පුළුවන්කම ලැබුණා. පසුව මම 1993 පළාත් සභාවට එන්න සූදානම් වෙනකොට මගේ ඒ අවස්ථාව ගරු මර්වින් සිල්වා, ඩී.බී. විජේතුංග එවකට ජනාධිපතිතුමාගේ ඉල්ලීමක් මත මම පරිත්‍යාග කරලා එතුමාට උදව් කළා. ඊටපස්සෙ 1999 පළාත් සභාවට මම ඉදිරිපත් වුණා වැඩිම මනාප ලබාගෙන. මහින්ද යාපා අබේවර්ධන ගරු මහඇමතිතුමා, එච්.ජී. සිරිසේන ගරු මහඇමතිතුමා, වතර්මාන ෂාන් විජයලාල් ද සිල්වා ගරු මහඇමතිතුමා, අවුරුදු 20 ක් මේ පළාත් සභාව නියෝජනය කරන්න පුළුවන්කම ලැබුණා. එම්.එස්. අමරසිරි ගරු මහඇමතිතුමා සමඟ මම යෞවන අවස්ථාවේ හිටියත් ඉතාමත්ම දේශපාලන අත්දැකීම් ලබන්න එතුමා සමඟ ළඟින් ආශ්‍රය කරන්න පුළුවන්කම ලැබුණා. ඒ වගේම බී.වයි. තුඩාවේ විපක්ෂනායකතුමා සමඟත්, මට එතුමා දවසක් මළ ගෙදරක ගිහිල්ලා ඉන්න වෙලාවේ මම එතුමා ඉන්නවා දැකලා මම පුටුවක් තියලා වාඩිවෙන්න කියලා කිව්වා. එතුමා වාඩිවුණේ නැහැ, හිටගෙනම හිටියා. මේ මාතර ප්‍රදේශයේ. මම එතකොට ප්‍රාදේශීය සභාවේ සභාපති. එතුමා බොහොම ආත්ම ශක්තියෙන් යුතුව එදා ඒ පළාත් සභාවේ හිටපු විපක්ෂනායකවරයා විදියට එම්.එස්. අමරසිරි ගරු මහඇමතිතුමා විපක්ෂයට එදා දේනෙත්ති ගරු මන්ත්‍රීතුමා. එතුමා අභිනවයෙන් පත්වෙච්ච එක ගැන මම සතුටු වෙනවා. අපි ඉස්කෝලෙ යන කාලෙ එතුමා මේ පළාත් සභාවේ මන්ත්‍රී. ශාසනික වශයෙන් ගන්නවා නම් උපසම්පදාවෙනුත් වැඩිම උපසම්පදාවක් තියෙන මන්ත්‍රීවරයෙක්. අපි ගරු කරන්න ඕන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. එතුමා අමාත්‍යවරුන් රාශියකගේ ලේකම් වෙලා හිටියා. පළාත් සභාවේ එතුමා කිව්වා වගේ ඒ කාලෙ පළාත් සභාවේ තියෙනවා එම්.එස්. අමරසිරි ගරු මහඇමතිතුමා කියනවා මන්ත්‍රීවරු හිල්ටොප් එකට ගෙන්නලා යටින් තව බේසමක් තියලා ඔලුවෙන් තව කෝප්පයකින් නානවා කියන්නෙ නාන සද්දෙ ඇහුණොත් ජීවිතේ ඉවරයි. ඒ වගේ තමයි ඇඳුම් කලිසම් කියන ඒවා මහට ඇවිල්ලා තමයි ඇඳගෙන පළාත් සභාවට එන්නෙ. ඒ දේනෙත්ති මන්ත්‍රීතුමා වැනි මහජන නියෝජිතයන් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න එදා පළාත් සභාව වෙලාවේ කොමියුනිස්ට් පක්ෂය හැටියට විශාල

කැපකිරීමක් කළා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ආරක්ෂා කරන්න ජේ.ආර්. ජයවධර්න මැතිතුමා මේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරපු වෙලාවේ. අපි මේ වෙලාවේ ගෞරවයෙන් බී.වයි.තුඩාවේ විපක්ෂනායකතුමාත් එම්.එස්.අමරසිරි මහඇමතිතුමාත් සියළුම පළාත් සභා මන්ත්‍රීවරු, දිවංගත අය ඉතාමත් ගෞරවයෙන් මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. ඒ වගේම සභාපතිතුමන්ලා ගරු එච්.ජී. සිරිසේන ගරු මහඇමතිතුමා ඔබතුමා වගේම මේ සභාව මෙහෙයවූවා. ඉතාමත්ම හොඳින්. ඒ වගේම ෂාන් විජයලාල් ද සිල්වා මහඇමතිතුමා මේ සභාව බොහොම මානුෂීය ප්‍රජාතන්ත්‍රවාදීව මෙහෙවූවා. ඔබතුමාගේ පළාත් සභා ස්ථාවර නියෝගවලටත් ඔබතුමා මානුෂීය වශයෙන් දැවැන්ත ලෙස ඉතාමත්ම සභාපති ලෙස ඉවසීමෙන් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න හොඳ ප්‍රජාතන්ත්‍රවාදියෙක් හැටියට අපිට නායකත්වය ලබාදුන්නා. අපේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න මේ අවස්ථාවේ ඉතාමත් ගෞරවයෙන් මම ඔබතුමාට සුභ පතනවා. ඒ වගේම මේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා, අපේ ගරු ඇමතිතුමන්ලා, අපේ විපක්ෂ සංවිධායකතුමා මතක් කරන්න ඕන. එතුමා මතක් කළා. මම 1991 සභාපතිවරයා හැටියට දිවුරුම් දෙන්න ගියාම මට වයස ප්‍රශ්නයක් ආවා. අවුරුදු 19 න් සභාපති හැටියට මේක කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නයක් ආවා. හුඟක් ඇමතිවරු නෑ නෑ. මට කරන්න පුළුවන් කියලා කිව්වා. දේශපාලන පසුබිමත් එක්ක ගිහිල්ලා කිව්වම මට ප්‍රේමදාස ජනාධිපතිතුමා ළඟට යන්න ආසාවක් ඇතිවුණා. ඒ ළඟට යන්න හරි අමාරුයි. මේ අපේ විපක්ෂ සංවිධායකතුමා, අශෝක ධනවංශ සිල්වා මැතිතුමා සිරිකොත එදා ප්‍රබල තරුණ සංවිධායකවරයෙක්. තරුණ පෙරමුණේ නායකයා හැටියට මගේ අත ගාවින් අල්ලගෙන ගිහිල්ලා ප්‍රේමදාස ජනාධිපතිතුමාට හඳුන්වලා දුන්නා. ඔව් ඔව්. මම දන්නවා. එතුමාගේ වයසේ ප්‍රශ්නයක් තියෙනවා කියලා එතුමා බොහොම, මම ඒ වෙලාවේ අශෝක අයියේ කියලා කතා කළේ. මගේ අත ගාවින් අල්ලගෙන ගිහිල්ලා තමයි එතුමා ප්‍රේමදාස ජනාධිපතිතුමාට ගිහිල්ලා වැඩිම මනාපයෙන් ලංකාවේ වැඩිම මනාප අරන් තියෙනවා කියලා ප්‍රේමදාස ජනාධිපතිතුමාත් එක්ක කිව්වා. මම ඒක දන්නවා දන්නවා කියලා ඒකට අපි පත් කරන්නම් යන්න කියලා ඒ වෙලාවේ කිව්වා. ඒ නිසා මම ගෞරවයක් හැටියට අද එතුමා මම හිතන්නෙ මේ දේශපාලන එතුමාගේ කලකිරීමෙන් යුක්තව, ඒ වගේ කලකිරීමක් මටත් තියෙනවා. කලකිරීමක් තියෙනවා. ඉතින් මේ අවස්ථාවේ ඉතාමත්ම හොඳ දේශපාලනඥයෙක්, හොඳ මිනිස් ගුණධමර් තියෙන නායකයෙක් හැටියට මේ පක්ෂයේ හිටපු මම අශෝක ධනවංශ ද සිල්වා මැතිතුමා මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕන. එතුමා කිසිම විටෙක වෙනත් හුඟක් අය තමන්ගේ ජ්‍යෙෂ්ඨත්වය තමන්ගේ පැරණිකම වෙනත් වෙනත් හේතූන් අරගෙන අරගල කරනවා පක්ෂය තුළ. එතුමා එහෙම කරපු කෙනෙක් නෙවෙයි. එතුමා කියන දේ අද මම කරන්නෙ මම එහෙම අරගල කරන්න ගියෙත් නැහැ. අපේ ගාමිණී මන්ත්‍රීතුමා එතුමත් බලන්න එතුමා දන්නවා මටත් එහෙම කලකිරීම් රාශියක් මැද්දේ තමයි අද මමත් කතා කරන්නෙ. ගරු සභාපතිතුමනි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පළාත් සභා ක්‍රමය 1988 දිවංගත ජේ.ආර්. ජයවධර්න මැතිතුමා හඳුන්වලා දුන්නෙ උතුරු නැගෙනහිර ප්‍රශ්නයට. මේ පළාත් සභා ක්‍රමය අහෝසි කරන්න බැහැ ගරු සභාපතිතුමනි, කවදාවත්. මේක කවදාවත් අහෝසි කරන්න බැහැ. මේකට බලය ලබාදිය යුතුයි. එදා කොමියුනිස්ට් පක්ෂය හැටියට කිව්වෙ බලය බෙදිය යුතුයි. රටට ගන්න නෙවෙයි. බලය බෙදිය යුතුයි. අතීතයේත් රටේ බලය බෙදලා තියෙනවා. එදා මාපා, ඇපා, යාපා වරු පත්කරලා, ගමරාළවරු පත්කරලා මේ බලය බෙදලා දීලා තියෙනවා. බලය බෙදන්න ඕන. බලය එක තැනක තිබුණම සිවිල් යුද්ධ ඇතිවෙලා තියෙනවා. අපේ රටේ, තාත්තා පස් ගහලා මැරුවා ධාතුසේන රජතුමා. අර සුගලා දේවිය තමන්ගේ දරුවාට විරුද්ධව ගියා. සුගලා දේවියත් මැරුවා. පුතා යුද්ධ කළා අම්මාට විරුද්ධව. මේ බලයේ හැටි. ඒ නිසා පල්ලෙහාට බලය බෙදෙන්න ඕන. මේ පළාත් සභා ක්‍රමය තුළ ගරු සභාපතිතුමනි, අපේ අජිත් රාජපක්ෂ මැතිතුමාගේ කතාවේදී කිව්වා පළාත් සභා ක්‍රමය ගැන බොහොම කලකිරීමෙන් කතා කළා. වීරසුමන වීරසිංහ ගරු මන්ත්‍රීතුමාත් එහෙමයි. අපිත් එහෙමයි කතා කරන්නෙ. මේ හැම රජයක්ම මේ පළාත් සභා ක්‍රමය ගැන මැතිවරණ වලදී කතා කරන දේවලින් පළාත් සභා බලයට පත්වුණා. මොකද මම දැක්කා පමණක් අමාත්‍යාංශවල ගහලා තියෙනවා මේ විදුලි සෝපානය. අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු සංස්ථා මණ්ඩල සභාපතිවරු. පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ නම නැහැ. පළාත් සභා මන්ත්‍රීවරයාගේ නම නැහැ. ගරු සභාපතිතුමනි. මේ රජයෙත් එහෙමයි. අපි යනවා වෙනම දෙයක්. නම නැහැ ඒ වුණාට. ඒ නිසා අපේ මේ රට කරවන, කරවපු හැම රාජ්‍ය

නායකයෙකුම අහනවා මේ පළාත් සභාව පිළිගන්නෙ නැත්නම් මේක අහෝසිකරලා දාන්න. මේක තියාගෙන ඉන්න එපා. මේකට ඉන්න ඕන පින්නවල අලි අනාථාගාරයේ හරි. දැන් මේ ඊළඟ පාර පාලර්මේන්තුවට යන්න බැරි අය නැවත දකුණු පළාත් සභාවට එනවා. අලි අනාථාගාරය වගේ. මේක නඩත්තු කරන තැනක්. බවට පරිවතර්නය වෙනවා. ඒ වගේම පමණක් තැන්වල වගකීම අජිත් රාජපක්ෂ මන්ත්‍රිතුමා කිව්ව වගේ පුටුව තියන එක වෙනම දෙයක්. මගේ පෞද්ගලිකව. පමණක් තැන්වල පළාත් සභාවේ ධූරධාරීන්ට මේ පවතින හැම රජයකම එහෙමයි. පළාත් සභා ධූරධාරීනට මේ රජයත් එහෙම තමයි. පුටුව නැහැ. කවුරු උනත් සභාපතිතුමාට පුටුව තියෙන්න ඕන. එන්න පුළුවන් නම් එන්න ඕන. ගරු සභාපතිතුමනි, කතානායකවරයා, මහඇමතිවරයා, කැබිනට් මණ්ඩලය විපක්ෂ සංවිධායක, ආණ්ඩු පක්ෂ සංවිධායක විපක්ෂනායක ආණ්ඩු පක්ෂ සංවිධායක, පළාත් සභා මන්ත්‍රී. අපිට වඩා ඉස්සරහයින් තියලා තියෙනවා. මේ කෝටි ගණන් වැටුප් අරගෙන නිකම් කිසිම වැඩක් නැති සංස්ථා මණ්ඩල සභාපති,

චමලි විතානාච්චි මහතා(සභානායක):- ගරු සභාපතිතුමනි, ස්ථාවර නියෝග අත්හිටුවා සභාව ඉදිරියට ගෙනියන්න යෝජනා කරනවා.

එස්. තෙන්නකෝන් නිලමේ මහතා(විපක්ෂනායක):- ඒ නිසා මේ පළාත් සභා ක්‍රමය පිළිබඳව අපිට අර කිව්ව වගේ මුදල් ටිකක් වෙන්කළාම මුදල් ටික අතට දෙනවා. ඊට වඩා නිමර්ාණාත්මක දෙයක් ඒකයි උතුරු නැගෙනහිර හුඟක් අය මුදල් දුන්නහම උතුරු නැගෙනහිර අය වැඩ කළේ නැහැ, මධ්‍යම ආණ්ඩුවට ඇවිල්ලා තියෙනවා. ඒකෙ අභිමානයක් තියෙන්න ඕන ගරු සභාපතිතුමනි. මේ කතාවේදී තේරුණා මේ හැම කෙනෙකුගේම අභිමානයේ ප්‍රශ්නයක් තියෙන්නෙ. දැන් උතුරට මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා පාරවල් හැදුවා, වෙනත් යටිතල පහසුකම් දුන්නා. උතුරේ ඡන්ද අඩුවෙන්න හේතුව දේශපාලනය අතින් තමන් පාලනය කිරීමේ අර දමිල ජනතාව බලාපොරොත්තු වෙනවා. ඒක මේ පළාත් සභා ක්‍රමයේ ඉතාමත්ම හොඳයි. පළාත් සභා ක්‍රමය දුන්නත් උතුර වගේ තමයි දකුණ. අපි කියන්නෙ මොන ආණ්ඩුව ආවත් මොන ක්‍රමයෙන් ආවත් පළාත් සභාවට මුදල් වෙන් කිරීම ඒවා කප්පාදු වෙන්න බැහැ. ඒකයි වෙන්න ඕන. අර ඉන්දියාවේ වගේ, ස්වාධීන මුදල් කොමිසමක් තියෙන්න ඕන. ඉන්දියාවේ එහෙමයි. අපිට දැනගන්න ලැබුණා. මුදල් කොමිසම මොන විදියට තිබුණත් අදාළ පළාත් පාලනයට දෙන්න මුදල් දිය යුතුයි. එහෙම ක්‍රමවේදයක් අපේ රට තුල නැ ගරු සභාපතිතුමනි. අපේ රට තුළ එක දිස්ත්‍රික්කයකට එක විදියකට මධ්‍යම ආණ්ඩුවෙන් කරනවා. අනිත් දිස්ත්‍රික්කයට දෙන්නෙ නැහැ. දිස්ත්‍රික්කයට තුන් විදියටම කරගන්න. භෞතික වශයෙන් මට පේන්නෙ එහෙමයි. ඉතින් මේවා ඉතාමත්ම මහ ම්ලේච්ඡ පහත් ක්‍රියාවක් හැටියට තමයි සළකන්නෙ. දියුණු රටවල මේ ක්‍රම නැහැ. හැබැයි අපි ඉතින් මහ විශාල කතා පවත්වනවා. මහා විශාල කතා පවත්වනවා. ප්‍රජාතන්ත්‍රවාදය සමානාත්මතාවය මේවා කතා කරනවා. මේවා නිකම් අපේ ගා. දේනෙත්ති ගරු මන්ත්‍රිතුමා දිවුරුම් දෙන්න ගියාම මැතිවරණ කොමිසමේ සභාපති නැහැ. රට ගිහින් එනකොට මේක දෙන්න වෙන්නෙ නැහැ. එහෙමද රටකට වෙන්න ඕන.මැතිවරණ කොමිසමේ කොමසාරිස්ලා තුන්දෙනාගෙන් එක්කෙනෙක් නැතිවුණාම දිවුරුම් දෙන්න ගියාම සහකාර මැතිවරණ කොමසාරිස්ට අත්සන් කරන්න දෙන්න ඕන. අද මේ සභාව තිබුණෙ නැත්නම් ජනතා පරමාධිපත්‍ය නියෝජනය වෙන්නෙ නැහැ. ගා. දේනෙත්ති මන්ත්‍රීතුමාගේ. ඒක අසාධාරණයි. ඒකනිසා මැතිවරණ කොමිසමට අපේ අප්‍රසාදය පල කරනවා. දැඩි අප්‍රසාදය. ඒ මන්ත්‍රිතුමාට වෙච්ච අසාධාරණය. එහෙම වෙන්න බැහැ. ප්‍රජාතන්ත්‍රවාදය හොඳින් ක්‍රියාත්මක වෙන රටක ඒක කාටත් සාධාරණව ක්‍රියාත්මක වෙන්න ඕන. ඔබතුමා නෙවෙයි මම ගියත් එහෙමයි. මේ ඉන්න ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් දිවුරුම් දෙන්න ගියත් එහෙමයි. එයා රට ඉඳලා එනකම් අපි ඉන්න ඕන. මැතිවරණකොමිසම පත් කරන්න අපි වඩාත් හොඳින් සිද්ධ වෙයි කියලා බලාපොරොත්තු වෙන්නෙ ගරු සභාපතිතුමනි. වඩාත් ස්වාධීනව, විනිවිදභාවයෙන් කියලා. කෝ? එයා බාත්රූම් එකට ගිහින් එනකම් ඉන්න ඕන, එයා බෙහෙත් අරගෙන එනකම් ඉන්න ඕන. එහෙම නැහැ. එහෙම වෙන්න බැහැ ගරු සභාපතිතුමනි. ඒ නිසා එවැනි දේවල් තියෙනවා නම් මේ අහෝසි කරන්න ඕන කොමිෂන් සභා. මනුෂ්‍ය යෙක් යන්නෙ, මේක රාජාණ්ඩුවක් නෙවෙයි. ඇතැම් කොමිෂන් සභා ක්‍රියාත්මක වෙන්නෙ රාජාණ්ඩු මඟින්. මම කණගාටු වෙනවා ඒ ගැන. කියලා ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, 1988 පළාත් සභා ආරම්භ වෙලා දැන් අවුරුදු 32 ක් වෙනවා. අපේ සවර්ජන ඡන්ද බලය පාලර්මේන්තුවට ආවෙ 1931. එතකොට දැන් අපේ රජයට

පාලරීමේන්තු සම්ප්‍රදායක් රාජ්‍ය මන්ත්‍රණ සභාව ජාතික රාජ සභාව ඇවිල්ලා 88 ක් වෙනවා. දැන් 88 ට වැඩිහිටියෙක්. අපේ පාලරීමේන්තු සම්ප්‍රදායේ. එතකොට 1948 න් පස්සෙ නිදහස ලැබුණට පස්සෙ අපිට පාලරීමේන්තු ක්‍රමයක් තිබුණා අවුරුදු 72 ක් වෙනවා. එතකොට පාලරීමේන්තුවට අපි කියමු 48 ඉඳලා 72 යි කියලා. අපිට 32 ක් වෙනවා. පළාත් සභාවට. අපේ පළාත් සභාව දැන් තරුණයෙක් කියන්නත් බැහැ, යෞවනයෙක් කියන්නත් බැහැ. දැන් මැදි වයසේ ඉන්න හොඳ වැඩිහිටියෙක්. අවුරුදු 32 ක මේ පළාත් සභා ක්‍රමය. ඒ නිසා මින් ඉදිරියටත් ගරු සභාපතිතුමනි, අපි ප්‍රාථර්නා කරන්නේ අපි මොන තනතුරුවල හිටියත් දේශපාලනයේ හිටියත් නැතත් මේවා මිනිස්සුන්ගේ අවස්ථා කඩිනමින් ඉටුවෙන ආයතන බවට ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වෙනවා කියන එක කියන්න ඕන. ප්‍රධානම කාරණය තමයි දැන් පළාත් සභා හයක් විසුරුවලා තියෙනවා. මේක 10 වෙනිදයින් පස්සෙ ඉවරයි. දැන් බලන්න රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරනවා අපේ නායකයො. මේ පළාත් සභාවේ පමරීට් එක දීගන්න බැරිවුණා. වාහන බලපත්‍රය දෙන්න බැරිවුණා. ඒක ගැන අපි කතා කළාම කියනවා වජිර අබේවධර්න ගරු ඇමතිතුමාගේ වැය ශීෂර්ය පැරදුන නිසා දෙන්න බැරිවුණා කියලා. මම කියන්නෙ නැහැ කියපු එක්කෙනා. වැය ශීෂර්ය පැරදුන නිසා දෙන්න බැරිවුණා කියලා. මොනවද මේ කතා. මේකට කවුරුවත් නෙවෙයි ගරු සභාපතිතුමනි, විරුද්ධ වෙන්නෙ. මේ සභාවේ ඉඳලා යන පාලරීමේන්තු මන්ත්‍රිවරුන්ම පළාත් සභාවට දෙනවට විරුද්ධයි. පළවෙනි කාරණය ඒකයි. දෙපැත්තෙම අය එහෙමයි. දෙපැත්තෙම අය එහෙමයි. විරුද්ධයි මේවාට දෙනවට. කිසිම නායකයෙක් මේ පළාත් සභා මන්ත්‍රීවරු මේ වැඩ කරන්නෙ කොහොමද කියන එක මේ මිනිස්සු මොන තරම් අනේක විද දුක් විඳගෙන මේ වැඩ කරනවා නේද කියන එක කවදාවත් සාකච්ඡා කරලා අවශ්‍ය සහන සලසන්නෙ නැහැ ගරු සභාපතිතුමනි. උතුරට මේක දුන්නා දේශපාලන වාසි තකා. උතුරට දුන්නා ඉක්මණට. නැගෙනහිරටත් දුන්නා. දකුණට දුන්නෙ නැහැ. මේ රාජ්‍ය නිලධාරීන්ටත් මේ වාහන බලපත්‍ර ලබාදීලා තියෙනවා. මේ පළාත් සභා මන්ත්‍රිවරුන්ට මේක ලබාදුන්නෙ නැහැ ගරු සභාපතිතුමනි. අපි සන්තෝෂ වෙන්න ඕන අපි දකුණෙන් විතරයි කැගැහුවෙ. ඇතැම් පළාත් සභාවල ඇතැම් විපක්ෂනායකවරුත් කීපදෙනෙක් ඇර මන්ත්‍රීවරුත් මේකට කැගැහුවෙ නැහැ. මම කියන්නෙ එක්සත් ජාතික පක්ෂය. ඒක මතක් කරන්න ඕන. ඒ නිසා ගරු සභාපතිතුමනි. මම ගරු සභාපතිතුමනි, 91 මම දේශපාලනයට ආවම ගරු සභාපතිතුමනි, මම මගේ පෞද්ගලික දේවල් කතා කරනවා නෙවෙයි. මම කුඹුරු අක්කර 180 ක් විකුණලා තියෙනවා ගරු සභාපතිතුමනි. දැනට මා සන්තකයේ තියෙන්නෙ අඳේට තියෙන අක්කර 20 ක් පමණයි. ඒකත් අඳේට අහුවෙලා. එක තැනක අක්කර 20 ක් තියෙනවා. එච්චරමයි තියෙන්නෙ. ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි, අපේ අර වීරසුමන වීරසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්ව වගේ අපි මෙතන ඉඳලා ගෙදර ගියාම ආපු ලියුම් ටික බලන්නෙ මධ්‍යම ආණ්ඩුවෙන් හෝ පළාත් සභාවෙන් සභාගත කරපු දෙයක් හරි අමාත්‍යාංශයකට යවපු දෙයක් හරි තියෙනවා යවපු ලියුමකට පිළිතුරක් එවලා තියෙනවද කියලා. ඒක දැක්කම ලොකු සන්තෝෂයක් ඇතිවෙනවා ගරු සභාපතිතුමනි. මේ වැඩේ කෙරුණා කියලා. ඒක පුදුම තෘප්තියක් තියෙන්නෙ. මම මේක දෙපාරක් විතර කියවනවා. මම පමණක් දවසට ඇවිල්ලා මේ පළාත් සභාවේ මේවාට ස්තුති කරනවා. මම මේ ලියුම සභාගත කරපු කට්ටිය දන්නෙත් නැහැ මේක මම කළාද කියලවත්. ඒක දන්නෙ මමයි මේ අදාළ විෂයභාර නිලධාරීන් විතරයි මේක කළා කියලා. ඒකෙන් පුදුම තෘප්තියක් ලබනවා. මම ආණ්ඩු බලය නැති කාලෙ ඉල්ලීමක් ආවම මම ඒ වෙලාවේ හිටපු ඇමතිවරුන්ට මම යැව්වා ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමාට. චමල් රාජපක්ෂ මැතිතුමාට යැව්වම විදුලි ප්‍රශ්නයක්, ට්‍රාන්ස්ෆෝමරයක් සම්බන්ධයෙන්. චමල් රාජපක්ෂ මැතිතුමා මේක නිදෙර්ශකරලා යවලා මේක ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා පෙරහැර සම්බන්ධව ට්‍රාන්ස්ෆෝමරයත් තියලා මට ලියුම ආවා. මට පුදුම තෘප්තියක් තිබුණෙ ගරු සභාපතිතුමනි. එහෙම ලබන තෘප්තිය එකයි. වෙන දේවල් නෙවෙයි. එහෙම කරන්න අවශ්‍ය වටපිටාව ඒ වටපිටාවේ පළාත් සභාවල අදාළ මන්ත්‍රීවරුන්ට ලබාදෙන්න ඕන. ලබාදෙන්න ඕන. ඒක කුහකකම, ඊෂ්‍යාර්ව ඒ වගේම වෛරවීම් ඇතැම් අය මේවා කරන්න දෙන්නෙ නැහැ ගරු සභාපතිතුමනි, කිසිම දවසක දක්ෂයින්ගේ කකුලෙන් අදින්න හොඳ නැහැ ගරු සභාපතිතුමනි. පමණක් අය බෝලේ කකුලෙන් පාගන්න හදනවා වතුර දාලා. කවදාවත් හරියන්නෙ නැහැ උඩ එනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරපු රටක් තුළ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය තිබ්බ්ච රටක් තුළ ඒ අයට නිතරම අවශ්‍ය මොන පක්ෂයද? එයා ජේ.වී.පී. ද යූ.එන්.පී. ද මොන ඡන්දෙන් පත්වුණා නම් අදාළ

මන්ත්‍රීවරයාගේ ගෞරවය හැම රජයක්ම ලබාදිය යුතුයි. හැම රජයක්ම ලබාදිය යුතුයි ඒක. මම සන්තෝෂ වෙනවා එම්.එස්. අමරසිරි ගරු මහඇමතිතුමා ඉන්න කාලෙ දේනෙත්ති මන්ත්‍රීතුමා දන්නවා ඇති. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් යම්කිසි ප්‍රශ්නයක් අධ්‍යාපන කාරක සභාවත් සූරියවැව තමයි රැස්වුණේ 1992. පත්වුණාම බී.වයි. තුඩාවේ මැතිතුමා තමයි කිව්වෙ සූරියවැව ජාතික පාසැල උදේයි හවසයි කළේ ඒ කාලෙ ගරු සභාපතිතුමනි. එතුමා යෝජනා කළා අර නබඳගස්වැව මමයි ඒ යෝජනාව කළේ. සභාපතිවරයා හැටියට. ඒක මම කළාම ඒක ඉතාමත්ම හොඳ දෙයක්. වහාම ක්‍රියාත්මක කරන්න ඕන කියලා මහඇමතිතුමාට ඉල්ලීමක් කළා. පළාත් අධ්‍යක්ෂ කාන්තාවක් හිටියෙ. එතුමිය කිව්වා නෑ. නෑ. තමුන්නාන්සේ කියන ඒවා කරන්න නෙවෙයි කිව්වා මම මෙතෙන්ට ඇවිල්ලා තියෙන්නෙ. එවෙලෙම දොට්ට දැම්මා එම්.එස්. අමරසිරි මහඇමතිතුමා අර විපක්ෂනායකට එහෙම කතා කළා කියලා. මේ පළාත් සභාවේ විපක්ෂනායකවරයා කිව්වා. තුඩාවේ මහඇමතිතුමා. මෙතුමාගේ විපක්ෂනායකතුමා. වහාම ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න ඕන කිව්වා. සූරියවැව නබඳගස්වැව පාසැල් 550 ක් ක්‍රියාත්මක කරන්නෙ එදා ප්‍රාදේශීය සභා සභාපති හැටියට අපි කරපු යෝජනාව බී.වයි. තුඩාවේ මහඇමතිතුමා තමයි කඩිනමින් එතුමා තමයි පළාත් සභාවටත් ඇවිල්ලා අපිත් සමඟ ලිපි ගනුදෙනු කළා. ඒක වහාම ක්‍රියාත්මක කරන්න කියලා. දේශපාලනඥයො. ඒ පළාත් සභාවේ තිබිච්ච හොඳ දේවල් ගරු සභාපතිතුමනි. ඒ දැවැන්ත දේවල් මේවා. ඒ කාලය තුළ. සිරිසේන ගරු මහඇමතිතුමා ඉන්න කාලෙ මේ පළාත් සභාවේ මහඇමතිවරයාත් හිටියා. ඒ පළාත් සභාව තුළ ගරු සභාපතිතුමනි, අපි යමක් ගිහිල්ලා කිව්වම ඒක එවෙලේ ඉටුකරලා දුන්නා. ඒ කාලය තුල. ඒ නිසා මේ අවස්ථාවේදී මම හිටපු ගරු මහඇමතිතුමන්ලාටත් වතර්මානයේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාටත් මෙතුමාට ස්තුති කළා මීට කලිනුත්. එතුමන්ලාගේ යහපාලනය ගැන කියන්න ඕන. යහපාලනය තුළ ප්‍රජාතන්ත්‍රවාදීව එම්.එස්. අමරසිරි මහඇමතිතුමාගේ තත්ත්වයේ වැඩි කොටසක් විපක්ෂයට කන් දීලා විපක්ෂය කියන්නේ කොන් කරන තැනක් නෙවෙයි. විපක්ෂය කියන්නේ මොනවත් නොගෙන පැත්තකට දාන කණ්ඩායමක් නෙවෙයි. විපක්ෂය කියන්නේ ආණ්ඩු පක්ෂයට හරි මාගර්ය පෙන්වන හරි දේට සහයෝගය ලබාදෙන වැරදි ක්‍රමවේදයක් තියෙනවා නම් ඒ වැරැද්ද පෙන්නලා දෙනවා ප්‍රජාතන්ත්‍රවාදීව. ආයුධ වලින් නෙවෙයි. අතින් පයින් නෙවෙයි. ඇඟේ අමාරුව, බාව ශක්තියෙන් නෙවෙයි. ප්‍රජාතන්ත්‍රවාදීව. මන්ත්‍රී කතා කිරීමට අධිපති. මන්ත්‍රී කියන්නෙ ගරු සභාපතිතුමනි, සංස්කෘත භාෂාවෙන් මන්ත්‍රණය කිරීම. ජනතාව වෙනුවෙන් මන්ත්‍රණය කිරීම. ඒක සංස්කෘත භාෂාවෙන්. මහජන සේවකයා කියන්නෙ සිංහලෙන්. මෙම්බර් කියනවා ඉංග්‍රීසි භාෂාවෙන්. දැන් අපි භාවිතා කරන්නෙ සංස්කෘත භාෂාවෙන්. මන්ත්‍රීවරයා කියන්නෙ ජනතාවගේ ප්‍රශ්න පළාත් සභාවේදී, ප්‍රාදේශීය සභාවේදී, පාලර්මේන්තුවේදී මන්ත්‍රණය කිරීම ඇවිල්ලා. ඒ මන්ත්‍රීකරණ කායර් භාරයට ඇහුම්කන් දෙනවා ආණ්ඩු පක්ෂයෙන්. ඉතින් මේක තමයි එංගලන්තයේ පාලර්මේන්තු සම්ප්‍රදාය මීට කලිනුත් ඉංජිනේරුවරුත් කළේ. ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදාය තුළ ගරු සභාපතිතුමනි, මම කතාව අවසාන කරනවා. එංගලන්තයේ මහ රැජිණිගේ බලය කම්කරු පක්ෂය ඉල්ලුවහම පාලර්මේන්තුවෙ එංගලන්තයේ මහ රැජිණ කිව්වා මම දෙන්නම් කතානායකවරිය. අද ඔබතුමා ඇඳන් ඉන්න ලෝගුව මම යෝජනා කරනකොට අපි උපදේශක කාරක සභාවේදී මම කිව්වා කලු පාටින් දාන්න ඕන නැහැ පාලර්මේන්තුවේ එංගලන්ත ක්‍රමයට යන්න. අපේ පාටින් දාන්න අපේ කොඩිය පාටින් කුරක්කන් පාටයි, කහපාටයි ඉර හඳයි දාන්න කියලා. එංගලන්තයේ ස්වාමිවරයෙක් පත්කළා එංගලන්ත මහරැජිණ වෙනුවෙන් කතානායක කියලා ආසනයක් දාලා අදටත් එංගලන්ත පාලර්මේන්තුවේ ගරු සභාපතිතුමනි, වතුර තියන්නෙ නැහැ මේසවලට විධායකය විවේචනය කරනවට. පුටු වෙන් කරන්නෙත් නැහැ. ගරු සභාපතිතුමනි, සැසිවාරය විවෘත කරන්න එංගලන්ත මහරැජිණ ආවම එතුමිය අහනවා වේත්‍රධාරියාගෙන් අහනවා මම ඇවිල්ලා ඉන්නවා මගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය විතරක් කියලා යන්න කතානායකතුමාගෙන් අවසරය ගන්න කියලා. කතානායකතුමා අවසරයක් එවනවා ප්‍රතිපත්තිය විතරක් කියලා මෙතනින් යන්න කියලා. බලන්න රාජාණ්ඩු ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදය දිනාගත්ත විදිය. එතරම් අමාරුවෙන් දිනාගත්ත දෙයක් මේ ප්‍රජාතන්ත්‍රවාදය කියන්නෙ. මේක පළවෙනුවත්, දෙවනුවත්, තුන්වෙනුවත් අපි ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කරනවා ගරු සභාපතිතුමනි. මොන දේශපාලන පක්ෂය වුණත් කමක් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය බලයට පත්වෙන්න ඕන. ඒ නිසා අපි ඒක ආරක්ෂා කරන්න කැපවෙලා

ඉන්නවා. ගරු සභාපතිතුමනි, මටත් දැන් අවුරුදු 48 ක් විතර වෙනවා. 48 යි. ගරු සභාපතිතුමනි, මගේ ජීවිත කාලයම මම සමාන කරන්න නෙවෙයි, මම මේ ඉන්න ගරු මන්ත්‍රිවරු 55 දෙනාම අඩු වැඩි වශයෙන් ඔබතුමන්ලා හැම දෙනෙක්ම අපේ ජීවිතය අපි මිනිස්සු වෙනුවෙන් කැපකරලා තියෙනවා. අපේ දශර්න තමයි වෙනස් වෙලා තියෙන්නෙ. අපි මේ දශර්නය කියන්නෙ ඔරුවක්. මම තෝරාගන්නවා කොල්ලෑව ඔරුවක්. ඔබතුමන්ලා කියනවා ඔරුව හරි පාරුව හරි. හැබැයි අපි එගොඩ වෙන්න විතරයි පාවිච්චි කරන්න ඕන. මහජනතාවට සේවය කරන්න. හැබැයි අපි ඔරුවවත් කොල්ලෑවවත් ඔලුව උඩ තියාගෙන යන්න හොඳ නැහැ. ඒ නිසා අපේ දකුණු පළාත් සභාව අනිත් පළාත් සභාවලට වඩා ලංකාවේ අනිත් පළාත් සභා අටට වඩා ආදශර්මත් පරමාදශර්ී පළාත් සභාවක්. මේකට හෙණ ගහන්න කියලා කවුරුවත් කියන්නෙ නැහැ. මම දැක්කා පාලර්ිමේන්තුවේ කාරක සභා අවස්ථාවක කියනවා ගරු සභාපතිතුමනි, උඩ ළමයි ඉන්නවා, කරුණාකරලා ළමයි ටික එළියට දාන්න කියලා. ඔබතුමා කවදාවත් එහෙම කිව්වෙ නැහැ. ඔබතුමා මේ සභාව ඉතාමත් හොඳින් මෙහෙයවූවා. අපිට නායකත්වය ලබාදුන්නා. අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ හොඳ විවාද කළා. අපි කෑ ගැහුවෙ පෞද්ගලික ප්‍රශ්නයකට නෙවෙයි. මිනිස්සුන්ගේ ප්‍රශ්නවලට. අපි එළියට යනකොට එක අම්මාගේ දරුවො වගේ යන්නෙ. කවදාවත් ලේ හෙල්ලීම් වෙලා නැහැ. මේ සෙංකෝලය උස්සගෙන ගියා නම් අපි ඒ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කළේ. ඒකට අපි සමාව ගත්තා. ඒවා එංගලන්ත පාලර්ිමේන්තුවෙත් වෙලා තියෙනවා. පාලර්ිමේන්තුව ආරම්භ කරපු කාලෙත් වෙලා තියෙනවා. ලක්ෂ්මන් රාජපක්ෂ මහත්තයත් මම දන්නෙ නැහැ හතලිස් ගණන්වල පාලර්ිමේන්තුවේ වෙලා තියෙනවා. අපි කිසිම දවසක සභාපතිතුමාගේවත් මේ කැබිනට් මණ්ඩලයේවත් ගරු ආණ්ඩු පක්ෂ මන්ත්‍රීතුමන්ලාගේවත් මේ ඉන්න ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලාගේවත් පුද්ගලික ජීවිත අපි කොහේදිවත් විවේචනය කරලා නැහැ. එහෙම කරනවා නම් යම්කිසි මහජන නියෝජිතයෙක් ඒක නොසන්ඩාලකමක්, පහත් ක්‍රියාවක් කැත ක්‍රියාවක් හැටියට සලකන්නෙ. අපි හැම කෙනෙක්ම මෙතෙන්ට ඇවිල්ලා මේ රතු කාපට් එකේ යුක්තිය සාධාරණය නියෝජනය කරනවා. මේක එහෙම නම් එන්න ඕන ඡන්දෙන්, ජනතා පරමාධිපත්‍යයෙන්. ජනතා පරමාධිපත්‍ය කියන්නෙ හරියට ගරු සභාපතිතුමනි, අධ්‍යාත්මික වශයෙන් ගත්තොත් සෝවාන් වෙච්ච කෙනෙක් වගේ. මනෝජ් සිරිසේන ගරු ඇමතිතුමාටවත්, මටවත්, මේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලාටවත් බලෙන් ඒක දෙන්න බැහැ. අපිට කතිරයක් ගහන්න ඕන අර කාමරේ ඇතුලට ගිහිල්ලා. ඒ අහන්නෙ බොහොම කැමැත්තෙන්. අපිට ආයුධයක් දුන්නත් මට ගහපිය කියලා කියන්නෙ නැහැ කොහේවත් ගිහිල්ලා. ජනතා පරමාධිපත්‍ය මෙතෙන්ට ආවහම ඒ හැම මන්ත්‍රීවරයෙකුටම ගරු කිරීම මහජනතාවට කරන ගෞරවයක්. මහජනතාවට කරන ගෞරවයක් ගරු සභාපතිතුමනි. ඒ නිසා මගේ දේශපාලන ජීවිතයේ අවුරුදු 30 ක්. පළාත් සභා ජීවිතයේ අවුරුදු 20 ක්. මම අවුරුදු 30 ක් තුළ මම නිතරම ගරු සභාපතිතුමනි, ප්‍රජාතන්ත්‍රවාදයත් පළාත් සභාවේ ගෞරවයත් ඇමතිවරුන්ගේ ගෞරවය මහඇමතිතුමාගේ ගෞරවය ආණ්ඩුකාරතුමාගේ ගෞරවය විපක්ෂ මන්ත්‍රිවරුන්ගේ ගෞරවය මහජන නියෝජිතයින්ගේ ගෞරවය ආරක්ෂා කරන්න අපි දිවිහිමියෙන් කටයුතු කළා හැම වෙලාවකම. අපේ පළාත් සභාවේ අපේ කැබිනට් මණ්ඩලය. අපේ කිව්වට පනතෙත් මම හිතන්නෙ එහෙම විපක්ෂනායක තනතුර නැහැ. අපි මේක මම හිතන්නෙ 89 ඉඳලා අසූ ගණන්වල ප්‍රේමදාස ජනාධිපතිතුමා ආවට පස්සෙ තමයි විධායක ජනාධිපතිතුමාට මෙහෙම විපක්ෂනායක සඳහා වාහනයක් ලබාදීලා මේ තනතුර හදලා එතුමාගේ කාලෙ තමයි මේක ස්ථාපිත කළේ. ඒ කාලෙදි මම හිතන්නෙ මේක තිබුණෙ නැහැ.

සභාපතිතුමා:- දැනුත් මේකෙ තියෙනවා විගණනයෙන් තියෙනවා ප්‍රශ්නයක්.

එස්. තෙන්නකෝන් නිලමේ මහතා(විපක්ෂනායක):- ඒකෙ සභාපති, උප සභාපති විතරයි ඒ අනුව තියෙන්නෙ. ඒ හැම දෙයක්ම අපි සභානායක තනතුර ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අපි මේ අවුරුදු පහ තුළ ගරු සභාපතිතුමනි, මගෙන් යම්කිසි දැනුවත්ව හෝ නොදැනුවත්ව ඔබතුමාටත් ආණ්ඩු පක්ෂයේ ගරු ඇමතිතුමන්ලාට, මන්ත්‍රීතුමන්ලාට විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට ප්‍රශ්නයක් වුණා නම් සමාවෙන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වගේම සභාලේකම්තුමා අධ්‍යාත්මික ගුණ වගාවෙන් යුක්ත ඉතාමත්ම ඉවසීමෙන් කටයුතු කරන ලේකම්වරයෙක්. අපි ආවම එතුමාත් සමඟ සාකච්ඡා කරන්නේ ධමර්ය ගැන, මන්ත්‍රීවරුත් එක්කත් හොඳට සාකච්ඡා කරන ලේකම්වරයෙක්. එතුමා ඒ

අවස්ථා ඉතාමත්ම හොඳින් නීතිගරුකව ඒ අවශ්‍ය පහසුකම් ලබාදෙන්න එතුමා විශාල කාර්ය භාරයක් පළාත් සභාව තුළ ඉෂ්ඨ සිද්ධ කළා. ප්‍රධාන ලේකම්තුමා අපේ දකුණු පළාතේ සොයිසා මැතිතුමා හම්බන්තොට හිටිය සහකාර ලේකම්. ප්‍රාදේශීය ලේකම්, දිසාපති වෙලා හිටියා. ඉතාමත් දක්ෂ ලේකම්වරයෙක්. එතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට, අමාත්‍යාංශවල ප්‍රධාන ඇමතිතුමා ඇතුළු අධ්‍යාපන අමාත්‍යාංශයේ, සංස්කෘතික අමාත්‍යාංශයේ, ධීවර අමාත්‍යාංශයේ ලේකම්තුමන්ලා නියෝජ්‍ය සැලසුම් ලේකම්තුමාටත් ඒ සියළුම පළාත් සභාවේ සහකාර ලේකම්වරුන්ටත් සියළුම නිලධාරීන්ටත් මගේ ගෞරවනීය ස්තුතිය පිරිනමනවා. ගරු සභාපතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා අපේ මනෝජ් සිරිසේන ඇමතිතුමා ඔබතුමා විතරයි අවසාන මොහොතේ මෙහි රැඳී සිටින්නේ. මොකද ඔබතුමා හොඳ ප්‍රජාතන්ත්‍රවාදියෙක්. වීරසුමන මන්ත්‍රීතුමා කිව්වා වගේ මේ අවසාන දවසෙත් ගරු සභාපතිතුමනි, අපි අසන්තෝෂයෙන් කතා කරනවා නෙවෙයි. මේ අවසාන සුභ පතන දවසේවත් මේ සභාවේ රැඳී ඉන්න ඕන. ඒ නිසා ඔබතුමාගේ අමාත්‍යාංශයේ ඔබතුමා කෙටි කාලයක් පමණයි ඔබතුමාට ලැබුණෙ. රවි කරුණානායක ඇමතිතුමාට අමාත්‍යාංශය ලැබුණා වගේ. ඔබතුමා ඒ කෙටි කාලය තුළ දැවැන්ත කාර්ය භාරයක් කළා. ඔබතුමා හොඳ ප්‍රජාතන්ත්‍රවාදියෙක්. මම පළමුවෙන් ගරු කරන්නෙ ඒකයි. මොනව වුණත් වැඩක් නැහැ ගරු සභාපතුතමනි, අපේ ආඥාදායකයො නම්. මොනව වුණත් වැඩක් නැහැ අපි දූෂිත නම්, හොරු නම්, වංචා කරනවා නම්. අපි භෞතික වශයෙන් පරිපූර්ණ වුණත් වැඩක් නැහැ. හොඳ මිනිසුන් බවට පරිවතර්නය වෙන්න, හොඳ දේශපාලනඥයන් ආරක්ෂා වෙන්න ඕන. අපි නැති වුණත් හොඳ මිනිහෙක් හැටියට රටේ ජීවත් වෙන්න ඕන. එහෙම වුණොත් තමයි රට ලස්සන වෙන්නෙ. රට සෞභාග්‍යමත් වෙන්නෙ. හොඳ දේශපාලනඥයන්ට ,ඇමතිවරයෙක් හැටියට අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට අපේ ස්තුතිය ප්‍රණාමය පිරිනමමින් ජනතා විමුක්ති පෙරමුණටත් මා සමඟ අපේ අශෝක ධනවංශ ද සිල්වා මැතිතුමා සමඟ අපි සමඟ සම්බන්ධ වෙලා විපක්ෂයේ කාර්ය භාරය ජනතා විමුක්ති පෙරමුණ ඉතා හොඳින් ඉෂ්ඨ සිද්ධ කළා. අපේ ගෞරවනීය ප්‍රණාමය එක්සත් ජාතික පක්ෂය මේ අවස්ථාවේදී පිරිනමනවා. ඒ වගේම ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ කණ්ඩායම් නායක අපේ අමරසිරි කුරුවේගෙයි මැතිතුමා කෘතහස්ථ උගතෙක් බුද්ධිමතෙක් හොඳ දේශපාලනඥයෙක්. එතුමාටත් අපේ ස්තුතිය පිරිනමනවා. දක්ෂ කතිකයෙක්. එතුමා අනිත් එක කියන්න ඕන දක්ෂ කතිකයෙක්. එතුමා හොඳ තරුණ කාලෙ පළාත් සභාව නියෝජනය කළා නම් එතුමා විශාල වැඩ කොටසක් කරනවා. මම එතුමා ගැන පුදුම වෙන්නෙ එතුමා අවුරුදු 50 පැන්න වෙලාවෙත් එතුමා සුළු පක්ෂයකින් ඇවිල්ලා මේ පළාත් සභාව නියෝජනය කරන්න දක්ෂ දේශපාලනඥයෙක් බවට පත්වුණා. මේ වයසේ ඉඳගෙන පමණක් අය තරහ කළා නම් එතුමා හොඳ ප්‍රතිපත්ති ගරුක නායකයෙක්. ජනතා විමුක්ති පෙරමුණේ කණ්ඩායම් නායක නලින් හේවගේ ගරු මන්ත්‍රීතුමාටත් මේ අවස්ථාවේදී ස්තුතිය පුද කරනවා, එම කණ්ඩායමටත් අපේ ගෞරවනීය ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කරනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාටත් ඔබතුමා තමයි දැන් අපේ ගැලවුම්කාරයා, අපේ බලධාරියා, අපේ දුක්ගන්නාරාළ. ඒ නිසා ඔබතුමා මේ පළාත් සභාව ඊළඟ මැතිවරණය තියෙනකම් මේ මන්ත්‍රීවරු 55 දෙනාගේ ජනතාවගේ පරමාධිපත්‍යය නියෝජනය කරන ලෙස ඉල්ලමින් මහජන ඉල්ලීම් හැකි පරිදි ඉටුකිරීමට ශක්තිය, ධෛර්ය, බලය ලැබේවා ප්‍රාථර්නා කරමින් ගරු සභානායකතුමා ඔබතුමා නායකයො, දේශපාලනඥයො සාථර්ක වෙනවා, හුඟක් අය කැපකිරීම් කරනවා දේශපාලනයේ. කැපකිරීම් කරලා කැපකිරීම්වලට සාධාරණයක් ඉෂ්ඨ නොවෙනකොට ටිකක් තරහ යනවා. එහෙම ගතියක් තියෙනවා. තමන්ගේ කැපකිරීමත් එක්ක. ඒ නිසා මම ඔබතුමා කියනවා ඉවසීමත් තිබුණම ඔබතුමාට හොඳ අනාගතයක් තියෙනවා. ඒ නිසා සභානායකතුමාටත් මනෝජ් සිරිසේන අපේ ඇමතිතුමාටත් අපේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටත් විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටත් සියළු දෙනාටම අපෙන් යම්කිසි වරදක් වුණා නම් එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමෙන් වරදක් වුණා නම් දැනුවත්ව හෝ නොදැනුවත්ව වුණා නම් අවසන් මොහොතේදී සමාවන්න. අපි සියළුදෙනාම ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් හැමදෙනාම එකතුවෙලා මෙතන අපි මන්ත්‍රණයකරලා සාකච්ඡාකරලා ඒ අභියෝග ජයගෙන රට ගොඩනඟන්න හැමදෙනාම ඒකරාශිව අධිෂ්ඨාන කර ගනිමු කියලා ඉල්ලීමක් කරමින් සියළු දෙනාටම තෙරුවන් සරණ ප්‍රාථර්නා කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. ස්තුතියි.

සභාපතිතුමා:- විපක්ෂනායකතුමාට බොහොම ස්තුතියි.

එස්. තෙන්නකෝන් නිලමේ මහතා(විපක්ෂනායක):- ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ සභාගත කරපු ලිපි සහ මේ හැමදෙයක්ම මම ඉල්ලීමක් කරනවා ඔබතුමා මගින් ගරු ආණ්ඩුකාරතුමාට යවන්න කියලා. ඊළඟට සභා වාතර්ාවත් අපිට නිල වාතර්ාවත් එවන්න.

සභාපතිතුමා:- එවනවා. අනිවායර්යෙන් සභා වාතර්ාව එවනවා. අද මම හිතන්නෙ අවුරුදු පහක් අවසානයේ අවසාන පළාත් සභා රැස්වීමේදී තමුන්නාන්සේලා සියළු දෙනාම මහජනතාව වෙනුවෙන්, දකුණේ ජනතාව වෙනුවෙන් අදහස් ප්‍රකාශ කළා. ඒ අවුරුදු පහ කාලපරිච්ඡේදය තුළම ප්‍රධාන ඇමතිතුමා ඇතුළු අමාත්‍යතුමන්ලාත්, ඒ වගේම ගරු මන්ත්‍රීතුමන්ලාත් විපක්ෂනායකතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලාත් මේ සභාව තුළ අදහස් ප්‍රකාශ කළේ ඔබතුමන්ලාගේ කරුණු නෙවෙයි. දකුණේ ජනතාවගේ අදහස් සහ දකුණේ ජනතාවගේ ප්‍රශ්න. ඒ ඉදිරිපත් කරපු ප්‍රශ්න පිළිබඳව දෙපාශර්වයෙන්ම විවාද කරලා දෙපාශර්වයෙන්ම යෝජනා කරලා ඒ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අපේ ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යතුමන්ලා ඒ වගේම අමාත්‍යාංශ ලේකම්වරු, ප්‍රධාන ලේකම්තුමා ඇතුළු ඒ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු මේ පළාත් සභා කටයුතු පිළිබඳව පසුගිය කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක වුණා. එහිදී මම හිතනවා ඉස්සෙල්ලා මම කියපු විදියටම පළාත් සභා ඉතිහාසය තුළ පළාත් සභාවේ නොයෙක් නොයෙක් වෙනස්කම් සිදුවුණත් අපි අමාත්‍යතුමන්ලා 2015 ජනවාරි අටෙන් පස්සෙ අමාත්‍යවරු දෙදෙනෙක් වෙනස් වුණා. ඒ වෙනස්වීම මම හිතන්නෙ අපි ඒක අකමැත්තෙන් හෝ ක්‍රියාත්මක කරන්න සිදුවුණත් මහජනතාවගේ ඒ පිළිබඳව ප්‍රශ්නයක් තියෙන බව මට දැනෙනවා. ඒ නිසා මම හිතනවා එතුමන්ලා ඒ කායර්භාරය කලා වගේම ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යතුමන්ලා අලුතෙන් පත්වෙච්ච ඒ සියළුදෙනාම පහුගිය කාලපරිච්ඡේදය තුළ කටයුතු කිරීම පිළිබඳව අපි ඇත්ත වශයෙන්ම අපේ ගෞරවය ඒ සියළුදෙනා වෙත පුද කරනවා. ඒ වගේම හිටපු අපේ ඒ තනතුරු වලින් ඉවත් කරපු අපේ වීරසුමන ඇමතිතුමාටත්, ඒ වගේම ඩී.වී. උපුල් ඇමතිතුමාටත් ඒ කාලපරිච්ඡේදය තුළ එතුමන්ලාගේ ශක්තිය යොදවලා ඒ කායර් භාරය ඉෂ්ඨ කළා කියන එක මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කළයුතුව තියෙනවා. ඒ නිසා ප්‍රධාන අමාත්‍යතුමා, ඒ අමාත්‍යතුමන්ලාත් අවුරුදු ගණනක් තිස්සේ මේ පළාත් සභා ඉතිහාසය තුළ එක්සත් ජනතා නිදහස් සන්ධාන ජයග්‍රහණය ලබාගෙන ඒ ජයග්‍රහණය තුළින් ජනතාව වෙත කටයුතු කිරීමේදී අනිකුත් දේශපාලන පක්ෂ, අපේ විපක්ෂයේ නායකතුමා එක්සත් ජාතික පක්ෂය විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණේ ඒ වගේම අපේ ප්‍රජාතන්ත්‍රවාදී අමරසිරි කුරුවේගෙයි ඒ මන්ත්‍රීතුමන්ලා සියළුදෙනාම මේ දේශපාලන ප්‍රවාහය තුළ පළාත් සභාවේ සියළුම දේවල්වලට සහාය දක්වමින් දකුණේ ජනතාව වෙත විශාල කායර් භාරයක් ඉෂ්ඨ සිද්ධ කරන්න සහාය දැක්වූවා කියන එක මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කළයුතුව තියෙනවා. ඒ නිසා මම හිතනවා මම හැම වෙලාවකම සභාපතිවරයා හැටියට මම ස්වාධීනව කටයුතු කරන්න උත්සාහ දැරුවා. ඒ උත්සාහය මම හිතනවා මම ඉතාම අවංකව කටයුතු කළා. සමහර අවස්ථාවලදී ස්ථාවර නියෝග කඩකරලා අවස්ථාව දුන්නා මන්ත්‍රීවරුන්ට. මොකද ගෙදර ගිහිල්ලා කතා කරන්න නෙවෙයි, ගෙදර පවුලත් එක්ක කතා කරනවාට වඩා මෙතන කතා කරන්න අවස්ථාව ලබාදෙන්න ඕන කියන ස්ථාවරයේ හිටියා මම හැම වෙලාවකම. මට නොයෙක් විදියට චෝදනා කළා. චෝදනා කළත් මම සද්භාවයෙන් කළේ. මන්ත්‍රීවරුන්ගේ අදහස් කියන්නෙ මන්ත්‍රීවරයාගේ නෙවෙයි. දකුණේ ජනතාවගේ අදහස් ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් මෙතෙන්ට නැතුව කතා කරලා වැඩක් නැහැ. ඒ නිසා මෙතන කතා කරලත් වැඩක් නැත්නම් එළියේ කතා කළත් කොහොමත් වැඩක් නැහැ කියන ස්ථාවරය තුළ තමයි මේ ප්‍රකාශයන් කරන්න අවස්ථාව ලබාදුන්නෙ. ඒ නිසා මම හිතනවා මම සන්තෝෂ වෙනවා මට මේ ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යතුමන්ලා ඒ වගේම මගේ කායර් මණ්ඩලය ප්‍රධාන අපේ සභා ලේකම්තුමා ඒ වගේම අපේ සභානායකතුමා නියෝජ්‍ය සභාපතිතුමා මට විශාල ශක්තියක් ලබාදුන්නා. මම වෙනුවෙන් ඒ කටයුතු කරන්න. ඒ වගේම අපේ සභානායක චම්ලි විතානාච්චි මැතිතුමා. ආණ්ඩු පක්ෂ සංවිධායක අජිත් රාජපක්ෂ මැතිතුමා සභාව මෙහෙයවීම සඳහා කටයුතු කළා. ඒ වගේම විපක්ෂනායකතුමා විශාල කායර් භාරයක් කළා. මට සහයෝගය දැක්වූවා. සභාවේ කටයුතුවලදී. විපක්ෂ සංවිධායකතුමා. මේ සියළු දෙනාම සහාය දක්වමින් මේ කායර් භාරය කරන්න විශාල ශක්තියක් වුණා. ඒ වගේම අපේ සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා හැමකෙනාම ඉතාමත්

හැමවෙලාවකම මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ ගරුත්වයත් අපේ සියළුම දෙනාගේම ගරුත්වයත් ආරක්ෂා කරමින් කටයුතු කරන්න සහාය දැක්වූ බව මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කළයුතුව තියෙනවා. ඒ නිසා තමයි මම හිතන්නෙ දකුණේ ජනතාව වෙනුවෙන් ඔබතුමන්ලා වාද විවාද කළත් ඔබතුමන්ලා හැමදෙනාම මෙතනින් එළියට බැහැලා යනකොට සහෝදරත්වයෙන් කටයුතු කරන්න අවස්ථාව සලසමින් න්‍යායත්මකව හෝ එහෙම නැත්නම් දකුණේ ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් ඒ මෙතන විවාද කරලා ඒ කටයුතු ඉෂ්ඨ සිද්ධ කිරීමේ පරමාර්ථයෙන් තමයි ඒ කටයුතු කළේ. ඒ කටයුතු කරන්න තමයි මෙතෙන්ට පත්කරලා ඇවිල්ලා ඉන්නෙ. ඒ නිසා ඒ කායර් භාරය ඒ අවුරුදු පහක කාලය තුළ ඉෂ්ඨ සිද්ධ කළා කියලා අපි හැමදෙනාම සන්තෝෂ විය යුතුව තියෙනවා. ඒ නිසා මම හිතනවා විශේෂයෙන්ම වැඩිපුරම මේ පිළිබඳව අදහස් දක්වන්න ඕන නැහැ. හැම මන්ත්‍රීතුමෙක්ම කතා කළා. හැම කෙනෙක්ම අදහස් දැක්වූවා. ඒ හැම වෙලාවකම අදහස් දක්වපු වෙලාවේ විශේෂයෙන්ම මේ පළාත් සභාව තුළ ඇතිවෙච්ච තත්ත්වයන් පිළිබඳව මම අමුතුවෙන් කිවයුතු නැහැ. ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ හෘද සාක්ෂිය දන්නවා. ඒ නිසා මේ අවස්ථාවේදී ප්‍රධාන අමාත්‍යතුමා ඒ වගේම අපේ අමාත්‍යතුමන්ලා සියළුදෙනාම මේ දකුණේ ජනතාව වෙනුවෙන් අමාත්‍යාංශවලින් ලබාදීපු වරප්‍රසාද ලබාදීමට කටයුතු කරන්න. ඒ වගේම දකුණේ සංවධර්නය අනිකුත් වරප්‍රසාද ක්‍රියාත්මක කරන්න කටයුතු කිරීම පිළිබඳ අපේ ගෞරවය මේ අවස්ථාවේදී විශේෂයෙන් පුදකළ යුතුව තියෙනවා. ඒ වගේම අපේ පළාත් සභාවේ සභාලේකම් කායර්ාලයේ අපේ නියෝජ්‍ය සභාපතිතුමා ඒ වගේම සභානායකතුමා ආණ්ඩු පක්ෂ සංවිධායක අජිත් රාජපක්ෂ මැතිතුමා ඒ වගේම විපක්ෂනායකතුමා විපක්ෂ සංවිධායකතුමා ඒ සියළු දෙනාම විශාල කායර් භාරයක් ඉෂ්ඨ සිද්ධ කරමින් මේ පළාත් සභාව තුළ අද පරිපාලන කටයුතුවලට සහාය දැක්වූවා. ඒ පිළිබඳවත් මගේ ගෞරවය ස්තුතිය මේ අවස්ථාවේදී පුදකර යුතුව තියෙනවා. ඒ වගේම සභාලේකම්තුමා පිළිබඳව වචනයක් කිව යුතුව තියෙනවා. මම හිතනවා මේ අවුරුදු පහ කාලපරිච්චේදය තුළ ඒ වගේම මම මේ දෙවැනි වතාවටත් සභාපති. මට කිසිම වෙලාවක විගණනයක් ඇතිවෙන ප්‍රශ්නයක් ඇති නොවෙන්න කටයුතු කිරීම පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද එතුමාට ඒ නීතිමය වශයෙන් මොන ප්‍රශ්න තිබුණත් ඔබතුමන්ලා කළයුතු කායර් භරය ඉෂ්ඨ සිද්ධ කළා. නොයෙක් වරප්‍රසාද නොලැබෙන වෙලාවලදී අපි සාකච්ඡා කරලා ඒවා ලබාදීමට කටයුතු කළා. මම හිතන්නෙ ඉහලින් ලැබෙන්න ඕන දේවල් ලබාගැනීම සඳහා අපි දෙන්නා විශාල සටනක් කළා. මම එකිනෙක කියන්න ඕන නැහැ. ඒ හැම වෙලාවකම ඒ ලබාදීම සඳහා කටයුතු කරන්න එතුමා මූලික වුණා, නිලධාරියෙක් හැටියට. ඒ වගේම ඒ පිළිබඳව මම අගය කරනවා. මොකද පහුගිය දවසෙත් අපි ගිණුම් කාරක සභාවේදී අපට කිසිම චෝදනාවක් නැතුව මේ පළාත් සභාවේ සියළුම මන්ත්‍රීවරුන් වෙනුවෙන් මේ කටයුතු මෙහෙයවීම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද ඉහළින් ලැබෙන්න ඕන වරප්‍රසාද සභාවට ලැබෙන්න ඕන ඒවා සභාවට නොලැබීම වෙන ආයතනවලින් ක්‍රියාත්මක වීම පිළිබඳව මම එහෙම කිව්වෙ. ඒ නිසා ඒ පිළිබඳවත් සිහිපත් කළයුතුව තියෙනවා. ඒ වගේම ඒ කායර් මණ්ඩලය හැම කෙනාම තමුන්නාන්සේලා ඉදිරිපත් කරපු යෝජනාවන් ඒ වගේම ගිණුම් කාරක සභාව, ඒ වගේම පෙත්සම් කාරක සභාවේ සභාපතිතුමා අජිත් රාජපක්ෂ මැතිතුමා මම හිතන්නෙ ඉතාමත් හොඳින් ඔබතුමන්ලා ඉදිරිපත් කරපු පෙත්සම් පිළිබඳව විභාග කරලා ඒ ඒ පෙත්සම් වලට අවශ්‍ය ඒ පෙත්සම්වල කරුණු අධ්‍යයනය කරලා කටයුතු මෙහෙයවලා නීතිමය වශයෙන් වඩා මානුෂික වශයෙන් ඉතාම සාධාරණ ලෙස ඒකට සහභාගි වෙච්ච මන්ත්‍රීවරු සියළු දෙනාම ඒකට ශක්තිය යොදවලා ඒ ප්‍රශ්න විසඳීම පිළිබඳවත් මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕන. ගිණුම් කාරක සභාවේත් එහෙමයි. ගිණුම් කාරක සභාවේ හිටපු අපේ සාමාජික මන්ත්‍රීතුමන්ලා ඒ කටයුත්ත මෙහෙයවූවා. ඒ පිළිබඳවත් සිහිපත් කරන්න ඕන. අනෙක් වරප්‍රසාද ඒ සියළුම දේවල් ඉෂ්ඨ සිද්ධ කළා. මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද මොන හේතු තිබුණත් මොන ප්‍රශ්න තිබුණත් ඒවත් ඉෂ්ඨ සිද්ධ කරන්න කටයුතු කිරීම අපට හැකියාව ලැබුණා. ඒ පිළිබඳවත් විශේෂයෙන්ම සඳහන් කළයුතුව තියෙනවා. ඒ නිසා මේ සියළු දෙයකටම සහාය දැක්වූ සියළු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම ප්‍රධාන ලේකම්තුමා, ඒ වගේම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්තුමන්ලා ඒ සියළුම දෙනාට, ඒ ආයතනවල අදාළ නිලධාරීන්ට, ඒ වගේම අමාත්‍යාංශවල ලේකම්වරු සියළුදෙනාටමත් ඒ අමාත්‍යාංශවල කටයුතු කරපු ඒ සියළුම දෙනාටමත් මගේ ගෞරවනීය ස්තුතිය ඔබතුමන්ලා වෙනුවෙන් ඉෂ්ඨ සිද්ධ කළයුතුව තියෙනවා. මොකද ඒ හැම කෙනාම මේ අපි සභාවේ යෝජනා කරන දේවල්

බහුතරය ඉෂ්ඨ සිද්ධ කරන්න කටයුතු කිරීම පිළිබඳව සහ ඒ අය පළාත් සභාවේ කටයුතු වලට සහාය දැක්වීම පිළිබඳව මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ස්තුතිවන්ත වියයුතුව තියෙනවා. ඒ වගේම පළාත් සභාවට අදාළ අමාත්‍යාංශවලට සම්බන්ධ ඒ වගේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ඒකෙ කොමසාරිස්වරු නිලධාරින් ඒ වගේම අනිකුත් සංස්ථාවල ඒ සියළුම අධිකාරීවල සභාපතිවරු අධ්‍යක්ෂකවරු ඒ සියළුදෙනාමත් මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕන. මේ පළාත් සභාවේ කටයුතුවලට සහාය දැක්වීම පිළිබඳව. ඒ වගේම විශේෂයෙන්ම සඳහන් කළයුතුව තියෙන්නේ පෞද්ගලිකව මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා අපි කටයුතු කළා. ඔබතුමන්ලා ඔබතුමන්ලාගේ ගෞරවය ආරක්ෂා වන පරිදි කටයුතු කළා. ඒ නිසා මම හිතනවා දකුණේ ජනතාව බලාපොරොත්තු වෙච්ච දේ ඉෂ්ඨ සිද්ධ වුණා කියන එක සතුටින් ප්‍රකාශ කළයුතුව තියෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මන්ත්‍රීවරු හැටියට ඔබතුමන්ලා මේ අවුරුදු පහ කාලය තුළ දකුණේ ජනතාව වෙනුවෙන කරන ලද මෙහෙවරට අපේ ගෞරවය මේ අවස්ථාවේදී විශේෂයෙන්ම පුදකළයුතුව තියෙනවා. ඒ නිසා දකුණේ ජනතාව වෙනුවෙන් ඔබතුමන්ලා හැමදෙනාටම ප්‍රධාන ඇමතිතුමා ඇතුළු අමාත්‍යතුමන්ලාට, මන්ත්‍රීතුමන්ලාටත් විපක්ෂනායකතුමා ඇතුළු ඒ සංවිධායකවරුන්ටත් මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ස්තුතිය පුදකළ යුතුව තියෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම මගේ නායකයා මහින්ද රාජපක්ෂ මැතිතුමා.ඒ ජනාධිපතිතුමා මම මෙතෙන්ට අරගෙන ආවෙ. එතුමාට මේ අවස්ථාවේදී මගේ ගෞරවනීය ස්තුතිය පුද කරමින් විශේෂයෙන්ම දේශපාලන වශයෙන් දකුණේ ජනතාව මේ පළාත් සභාවේ අවුරුදු පහක කාලපරිච්ඡේදය තුළ අපට බලය ලබාදීලා මම මෙතෙන්ට ගෙනාවා. මම මෙතෙන්ට ආවයින් පස්සෙ ස්වාධීනව දෙපැත්තටම අවශ්‍ය විදියට කටයුතු කළා. මේ පැත්ත ආණ්ඩු පක්ෂය විදියටත්, මේ පැත්ත විපක්ෂය විදියටත් කටයුතු කළත් මගේ කායර් භාරය ඉෂ්ඨ සිද්ධ කිරීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. යම්කිසි අඩුපාඩුවක් සිදුවුණා නම් සමාව භජනය කරන්න කියලා මතක් කරමින් මම හිතනවා ඒ වගේම අපි මේ සභාව තිබුණද නැද්ද කියලා දැනගන්න විදියක් නැහැ. මාධ්‍යවේදීන් කටයුතු කළේ නැත්නම්. මම එනකොට මම හිතනවා අපේ ලේකම්තුමා මට ඒ වෙලාවේ උපදෙස් දුන්නේ කටයුතු කරන්න කිව්වෙ. අපේ මන්ත්‍රීතුමන්ලාත් ඉදිරිපත් කළේ. මාධ්‍ය වේදීන්ට ඒ දවස්වල තිබුණෙ නැහැ එච්චර වාතර්ා කරන්න. අරෙහෙන් මෙහෙන් තමයි සිදුවුණේ. හැබැයි අපි ඔබතුමන්ලාත් එක්ක සාකච්ඡා කරලා මාධ්‍ය වේදීන්ට ඒ අවස්ථාව ලබාදුන්නා. රූපගත කරන්න ඒ වගේම මාධයයට ඕන ප්‍රකාශයක් කරන්න. අපි යම් වෙලාවක ඒ මාධ්‍ය තහනම් කළා නම් ඒ කටයුත්ත ඒ මාධ්‍යවේදීන් කළේ නැහැ. ඒ නිසා මාධ්‍යවේදීන් ඒ වෙනුවෙන් කටයුතු කිරීම පිළිබඳව ඒ වගේම අපට පළාත් සභාවේ ඇතිවෙන ප්‍රශ්න ගැටළු පිළිබඳව දකුණේ ජනතාව වෙනුවෙන් ඒ මෙහෙවර කළා. ඒ පිළිබඳවත් මේ අවස්ථාවේදී ගෞරවනීය ස්තුතිය පුදකල යුතුව තියෙනවා. ඒ වගේම අපට ආරක්ෂාව සැපයුවා පොලිසිය. නියෝජ්‍ය පොලිස්පතිතුමා ඇතුළු ඒ වගේම පොලිස් ස්ථානාධිපතිතුමා, කායර් මණ්ඩලය, අපට විශාල සහයෝගයක් ලබාදෙනවා. පොලිසිය ආරක්ෂාව සැපයුවා. ඒ ආරක්ෂාව සපයමින් කටයුතු කළා. ඔබතුමන්ලාගේ ආරක්ෂාව ඒ වගේම අපේ සභාවේ ගෞරවය ආරක්ෂා වන පරිදි කටයුතු කළා. ඒ පිළිබඳවත් මේ අවස්ථාවේදී ඔවුන්ට විශේෂ ස්තුතියක් පුදකළ යුතුව තියෙනවා. එසේ ස්තුති පවත්වමින්, ක්‍රීඩා ධාරිතා සංවධර්න වැඩසටහන තියෙනවා. කොග්ගල බීච් රෙසෝට් හෝටලයේදී. ඒ වගේම කොග්ගල නිදහස් වෙළඳ කලාප ක්‍රීඩාංගනයේදී ක්‍රිකට් මැච් එක තියෙනවා. දැන් පටන් ගන්න හදන්නෙ. ඇමතිතුමන්ලා ගිහිල්ලා ඒකට සහභාගි වෙන්න. ඒ වගේම ඔබතුමන්ලා ඉල්ලීමක් කළා මම පළාත් සභාවේ සභාපති හැටියට ඉදිරියේදී ඉන්න එක ඇත්ත. නමුත් මට පුළුවන් හැම උදව්වක්ම මම කරන්නම්. ඉතිහාසයේ ඔබතුමන්ලා ලබපු වරප්‍රසාද හැර මම කිසිම වරප්‍රසාදයක් ලබලා නැහැ කියන එක මේ අවස්ථාවේදී විශේෂයෙන් ප්‍රකාශ කළයුතුව තියෙනවා. ඒ නිසා මන්ත්‍රීවරුන්ට ලැබෙන ඒවා හැර මම කිසිසේත්ම වරප්‍රසාද ලබාගෙන නැහැ. ඒ නිසා ඔබතුමන්ලා වෙනුවෙන් ඕනෑම අවස්ථාවක ඒ අවශ්‍ය ආයතනවලට ගිහිල්ලා කටයුතු කරන්න මට ලැබුණොත් ලිපි ලැබෙනකොට ඒකට අවශ්‍ය කටයුතු කරන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින් අද සභාවේ කටයුතු කරගෙන යාම සඳහා ඒ වගේම මේ පසුගිය කාලපරිච්ඡේදය තුළම සහයෝගය දැක්වූ අපේ සියළුම දෙනාටම ගෞරවනීය ස්තුතිය පුද කරමින් අද සභාවේ කටයුතු අවසන් කරනවා. ඒ වගේම ඊළඟ පළාත් සභා ඡන්දෙ පවත්වලා ඊළඟට එනකොට මෙතන ඉන්න සියළුම 55 දෙනාම නැවත පළාත් සභාවට එන්න කියලා ප්‍රාථර්නා කරනවා. ඒ

55 දෙනාම එන්න බැරිවෙන අනිත් අය පාලරීමේන්තු ඡන්දයේදී පාලරීමේන්තු යනකොට පාලරීමේන්තුවට යන්නත් අවස්ථාව ලැබේවා කියලා ප්‍රාථර්නා කරනවා. එසේ ප්‍රාථර්නා කරමින් නැවත අපි ඊළඟ පළාත් සභාවේදී හමුවෙමු කියලා ආරාධනා කරමින් ඔබට සුභ අනාගතයක් පතමින් සමු ගන්නවා. බොහොම ස්තුතියි.

..............

සැ.යු.:- ස්වකීය කතාවල නිවැරදි කළයුතු තැන් දන්වනු රිසි ගරු මන්ත්‍රීවරුන් ලිඛිතව හෝ මීන් පිටපතක් ගෙන හෝ පැහැදිළිව දන්වා සතියක් ඇතුළත දකුණු පළාත් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතු බව කරුණාවෙන් සැළකුව මැනවි.